2022 ජූලි 28
2022 யூலை 28
28th July 2022

NAOSL

# 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 14 වන වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන විගණකාධිපති ත්‍රෛවාර්ෂික වාර්තාව

# 2018 இன் 19 ஆம் இலக்க தேசிய கணக்காய்வு அதிகாரச்சட்டத்தின் 14 ஆவது பிரிவின் பிரகாரம் பாராளுமன்றத்திற்கு சமர்ப்பிக்கப்படுகின்ற கணக்காய்வாளர் தலைமை அதிபதியின் மூன்றாண்டு அறிக்கை

# Triennial Report of the Auditor General presented in parliament in terms of Section 14 of the National Audit Act, No. 19 of 2018

එකොළොස් වන කාණ්ඩය - 01
பதினோராவது தொகுதி - 01
Eleventh Volume - 01

## දිස්ත්‍රික් ලේකම් කාර්යාල
## மாவட்ட செயலகங்கள்
## District Secretariats

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE



පටුන


| | | |
|---|---|---|
| | හැඳින්වීම | 02 |
| **1.** | කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 03 |
| **2.** | ගම්පහදිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 09 |
| **3.** | කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 17 |
| **4.** | ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 26 |
| **5.** | මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 45 |
| **6.** | හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 69 |
| **7.** | මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 93 |
| **8.** | මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 99 |
| **9.** | නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 109 |
| **10.** | රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 114 |
| **11.** | කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 120 |
| **12.** | බදුලල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 127 |
| **13.** | මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 132 |
| **14.** | අනුරාධපුරය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 148 |
| **15.** | පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 161 |
| **16.** | ත්‍රිකුණාාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 176 |
| **17.** | මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 184 |
| **18.** | අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 189 |
| **19.** | කිලිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 198 |
| **20** | යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 202 |
| **21.** | වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 208 |
| **22.** | මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 211 |
| **23.** | මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 214 |
| **24.** | පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 222 |
| **25.** | කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 235 |

2018, 2019, සහ 2020 වර්ෂවල දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 ක් සහ ඒ යටතේ ක්‍රියාත්මක වන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 328 ක  මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරනු ලබන අතර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කල යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් වාර්තා ඒ ඒ වර්ෂවලදී පාර්ලිමේන්තු සභාගත කර ඇත. එම වාර්තාවල ඇතුලත් මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් අතරින් තවදුරටත් නොවිසඳී ඇති  පාර්ලිමේන්තුවේ අවධානය යොමු කලයුතුයැයි මා අදහස්  කරන වැදගත් නිරීක්ෂණයන් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 14  වන වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන  මෙම ත්‍රෛවාර්ෂික තත්ත්ව වාර්තාව මගින් ඉදිරිපත් කරනු ලැබේ.

## 2 හැඳින්වීම

-----------

දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 යටතේ ප්‍රදේශිය ලේකම් කාර්යාල 328 ක් ක්‍රියාත්මක වන අතර වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන වෙන්කරනු ලබයි. දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 යටතේ පාලනය වන  ප්‍රදේශිය ලේකම් කාර්යාල තුල වෙනත් අමාත්‍යංශ  හා දෙපාර්තමේන්තුවලට අයත් කාර්යාල පවත්වාගෙනයනු ලබයි. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,  සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සමාජසේවා දෙපාර්තමේන්තුව ආදි විවිධ රජයේ ආයතනවලට අදාල මෙහෙයුම් කටයුතු සඳහා කාර්යාල පවත්වාගෙන යනු ලබයි.

2018, 2019 සහ 2020 වර්ෂවල  දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 යටතේ රු. මිලියන 78,728 ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු. මිලියන 72,343 ක් වැය කර තිබුණි. සලසන ලද ප්‍රතිපාදනයෙන් රු. මිලියන 6,385 ක් ඉතිරි වි තිබුණි.

**කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

---

2018 - තත්වාගණනය කළ මතය

2019 - තත්වාගණනය කළ මතය

2020 - තත්වාගණනය කළ මතය

| **විගණකාධිපති වාර්තාවේ ඇතුළත් ප්‍රධාන අඩුපාඩු** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග** | **ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය** |
|---|---|---|---|
| 01. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොත් අනුව රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ 2020 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.208,611,369 ක්වූ අතර භාණ්ඩාගාර පොත් අනුව එම ශේෂය රු.209,560,063 ක් විය. මෙයට හේතු වී තිබුණේ 2013 වර්ෂයේ සිට වර්ෂ 08 ක කාලයක් ඉකුත් වී තිබුණද නිරවුල් කර නොතිබූණු රු.1,150,694 ක් වූ නොසැසඳුණු හර ශේෂයක් සහ සමාලෝචිත වර්ෂයේදී රු.202,000 ක් වූ වැරදි බැර ශේෂයක් පැවතීම බව නිරීක්ෂණය විය. | භාණ්ඩාගාර පොත් හා දෙපාර්තමේන්තු පොත් අනුව වෙනසට අදාල සැසඳුම් නොකළ ශේෂය කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. | රු.1,150,694 ක් වූ නොසැසඳුණු හර ශේෂය සම්බන්ධයෙන් පත්කරන ලද කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අදාල වාර්තාවන් ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙතද රජයේ ගිණුම් කාරක සභාව වෙතද යොමු කර ඇති අතර මෙම සිද්ධියට වගකිවයුතු දැනට රාජ්‍ය සේවයේ සිටින නිලධාරීන්ට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව සහ වැය ශීර්ෂයට කරන ලද රු.202,000 වැරදි බැර කිරීම 2021 මාර්තු මස භාණ්ඩාගාර මුද්‍රිත ප්‍රකාශ මගින් | වර්ෂ 8 ක් ඉක්මවූ රු.1,150,694 ක් වූ නොසැසඳුණු හර ශේෂය නිරවුල් කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | නිවැරදි කර ඇති බව. | |
| 02. | සේවා ස්ථාන මාරු වීම, මිය යාම, විශ්‍රාම යාම, වැඩ තහනම් කිරීම සහ සේවය හැර යාම යනාදී හේතූන් මත දැනට සේවයේ නොමැති නිලධාරීන් හා සේවකයන් 20 දෙනෙකුගෙන් අයකර ගත යුතු හිඟහිටි ණය ශේෂ එකතුව රු.1,389,130 ක් 2021 අප්‍රේල් 30 දින වනවිට පැවති අතර එම ශේෂ වර්ෂ 2 ක් හෝ ඊට වැඩි කාලයක සිට අය විය යුතුව පැවතුණි. | අදාල සේවකයන්ගෙන් හිඟහිටි ණය ශේෂ අයකරගැනීමට කටයුතු කළ යුතුය. | වර්ෂ 10 ක් සම්පූර්ණ රාජ්‍ය සේවකයින්ට ඇප රහිතව ණය ලබාදීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය මත මෙවැනි තත්වයක් ඇතිවී ඇත. ඊට පරිබාහිර හේතු නිසා ඇති වූ හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට අප විසින් සියළු ආයතනික සහ නෛතික ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | 2022 පෙබරවාරි වනවිටත් එලෙසම පැවතුණි. |
| 03. | පොදු තැන්පත් (පැරණි) ගිණුමේ 2020 දෙසැම්බර් 31 දිනට රු.10,000,000 ක් වූ හර ශේෂය සඳහා වර්ෂ 13 කට අධික කාලයක් ඉකුත් වී තිබුණද, 2019 ඔක්තෝබර් 15 දිනැති හා අංක 269/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.7 ඡේදයේ විධිවිධාන ප්‍රකාර පියවා නිරවුල් කිරීමට නොහැකි වී තිබුණි. | මෙම හර ශේෂය නිරවුල් කර ගැනීමට චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාර කටයුතු කළ යුතුය. | පොදු තැන්පත් ගිණුමේ පවතින රු.මිලියන 10 හර ශේෂය, පොතෙන් කපා හැරීමට ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යංශය වෙත යොමුකර ඇත. අමාත්‍යංශය මගින් අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත යවා ඇත. 2021 මැයි 04 දින සිහිකැඳවීම් ලිපියක්ද යොමු කර ඇත. මේ සම්බන්ධයෙන් ගතහැකි ක්‍රියාමාර්ග | 2022 පෙබරවාරි වනවිටත් රු.10,000,000 ක් වූ හර ශේෂය නිරවුල් කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | සියල්ල සිදු කර ඇති බව. | |
| 04. | ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 570(අ) අනුව ඉඩම් වන්දි තැන්පත් කළ දින සිට වර්ෂ 10 ක් ගතවූ පසු ඉකුත් තැන්පත් ලෙස රජයේ ආදායමට බැර කළ යුතු වුවද තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාළව තැන්පතු 11 ක රු.3,962,668 ක් පැවති අතර 2021 මාර්තු 31 දින වන විටත් එම ශේෂය නිරවුල් කිරීමට අදාල පියවර ගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව නිරවුල් නොවූ තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. | ඉඩම් තැන්පතු 11 සම්බන්ධයෙන් මේවන විට අදාල ආයතනවලින්, ව්‍යාපෘති ප්‍රගතිය විමසා ඇත. ඒ අනුව එම තැන්පතුද ඉක්මනින් නිරවුල් කිරීමට කටයුතු කිරීමට ප්‍රා.ලේ. තිඹිරිගස්යාය වෙත උපදෙස් ලබාදී ඇත. | තවදුරටත් නිරවුල් නොවූ තැන්පතු 03 ක් පවතී. |
| 05. | ගණනය කිරීමේ හා පරිවර්තනය කිරීමේ දෝෂ, විශ්‍රාම වැටුප් දෙවරක් ගෙවීම, විශ්‍රාමිකයන් මියගිය පසු ඒ බව තහවුරු කර ගැනීමෙන් තොරව තවදුරටත් විශ්‍රාම වැටුප් ගෙවීම, හමුදා විශ්‍රාම වැටුප් සඳහා දෙවරක් ජීවන වියදම් දීමනා ගෙවීම යනාදී විවිධ හේතූන් මත කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 13 ට අදාළ බල ප්‍රදේශයන්හි විශ්‍රාමිකයන්ට අවිධිමත් හා අක්‍රමිකතා සහිතව විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවා තිබුණි. 2020 දෙසැම්බර් 31 දින වන විට විශ්‍රාමිකයන් 198 | විශ්‍රාම වැටුප් නිවැරදිව ගණනය කර පරීක්ෂා කිරීමෙන් අනතුරුව ගෙවීමටත්, මියගිය විශ්‍රාමිකයන් සම්බන්ධයෙන් යාවත්කාලීන තොරතුරු ලබාගෙන විශ්‍රාම වැටුප් නතර කිරීමටත්, වැඩිපුර ගෙවන ලද මුදල් අයකර ගැනීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. | එම ශේෂයට වැඩිපුර ගෙවීම්, වර්ෂය තුලදී එකතුවෙමින් ඉදිරියට ගමන් කරනු ලබයි. මෙම තත්ත්වයට විශ්‍රාම වැටුප් සංශෝධන, වෛද්‍ය හේතු මත පෙර දාතම් කරමින් විශ්‍රාම ගැන්වීම හා වයස අවු.55 දක්වා වැටුප් ගෙවීම වැනි ත්‍රිවිධ හමුදා ක්‍රියාවලීන් තුල විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් සිදුවීම, විශ්‍රාමිකයින් මියගිය දිනය හා එය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට වාර්තාවන දිනය අතර | 2021 දෙසැම්බර් 31 දිනට වැඩිපුර ගෙවීම් ප්‍රමාණය රු.24,207,556 ක් වේ. |

දෙනෙකුගෙන් එලෙස වැඩියෙන් ගෙවන ලද නමුත් තවදුරටත් අය විය යුතුව පවතින විශ්‍රාම වැටුප් වටිනාකම රු.23,958,120 ක් වූ අතර එම මුදලින් රු.22,347,228 ක් වර්ෂ 05 කට අඩු කාලයක් හා රු.1,610,892 ක් වර්ෂ 5-10 ත් අතර කාලයක සිට අයවිය යුතුව පැවතුණි.

සිදුවන වැඩිපුර ගෙවීම් (බොහෝ විට ATM යන්ත්‍ර මගින් ඥාතීන් මුදල් ලබා ගැනීම්), ජීවන වියදම් වැඩිපුර ගෙවීම් වාර්තා වීම. (විශේෂයෙන් හමුදා දුබලතා හා යැපීම් දීමනා වලදී), වැටුප් පරිවර්තන හා වැටුප් විෂමතා ගණනයේදී සිදුවන දෝෂ, විශ්‍රාමිකයින් වෙත, ඒකාබද්ධ නොකර වැටුප් ගෙවීම් සිදුවීම මෙයට හේතු වී ඇති බව.

මෙම වැඩිපුර ගෙවීම් අවම කර ගැනීම සම්බන්ධයෙන් ගතහැකි පිළියම් පිලිබඳව මෙන්ම බොහෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ගණකාධිකාරී යටතේම, විශ්‍රාම වැටුප් අංශයද පවතින අතර ඔවුන්ගේ රාජකාරී වපසරිය තුල විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම අපහසු හෙයින් විශ්‍රාම වැටුප් සඳහා වෙනම ගණකාධිකාරීවරයෙකු

| | | | | |
|---|---|---|---|---|
| | | | පත් කිරීම වැනි කරුණු සඳහන් කරමින් අවස්ථා කිහිපයකදීම විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බවද, දැනට සිටින අවම පුහුණු නිලධාරීන් යොදවා ගෙන මෙම තත්වයන් අවම කර ගැනීම අප විසින් නිරන්තරයෙන් කටයුතු කරන බව. | |
| 06. | 2020 දෙසැම්බර් 31 දින වන විට කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ගිනි ගැනීමෙන් සිදු වූ හානියට වර්ෂ 08 ක් සහ මහරගම ප්‍රාදේශිය ලේකම් කාර්යාලය ගිනි ගැනීමෙන් සිදු වූ හානියට වර්ෂ 05 කට අධික කාලයක් ඉකුත් වි තිබුණි. නමුත් එම හානිවලින් අයකර ගැනීමට හෝ කපා හැරීමට කටයුතු කර නොතිබුණු පාඩු හා හානි වටිනාකම පිළිවෙලින් රු.92,606,688 ක් සහ රු.629,492 ක් වශයෙන් එකතුව රු.93,231,180 ක් විය. වර්ෂ 08 ක් ගත වන තුරුත් මේ සම්බන්ධයෙන් පොලිස් විමර්ශණ අවසන් වී නොතිබුණු බැවින් එම හානි අයකර ගැනිම හෝ කපාහැරීම | පාඩු හා හානි පිළිබඳව පරීක්ෂණ පවත්වා ඊට වගකිව යුතු නිලධාරීන්ට හා සේවකයන්ට එරෙහිව කටයුතු කිරීමට හා රජයට සිදුවූ පාඩුව සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව පූර්ණය කර ගැනීමට හා අනතුරුව හානි නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ගිනි ගැනීමට අදාල පොලිස් විමර්ශන තවමත් අවසන්ව නොමැත. ඒ නිසා ගොනුවේ කටයුතු අවසන් කිරීමට උපදෙස් විමසා 2021 ජනවාරි 15 දාතමින් ලිපියක් ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බව. | එගිනි ගැනීමෙන් සිදු වූ පාඩුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

සිදුකළ නොහැකිව පැවතුණි.

| | | | | |
|---|---|---|---|---|
| 07. | කොළඹ, දෙහිවල, කොලොන්නාව, කැස්බෑව සහ හෝමාගම යන ප්‍රාදේශිය ලේකම් කාර්යාල පවත්වාගෙන යනු ලබන ඉඩම්වල අයිතිය එම ප්‍රාදේශිය ලේකම් කාර්යාල සතු නොවූ අතර ඒවායේ අයිතිය පවරා ගැනීම සඳහා මේ වන තෙක් විධිමත් පියවර ගෙන නොතිබුණි. අයිතිය ප්‍රාදේශිය ලේකම් කාර්යාල සතු නොවූ මෙම ඉඩම්වල ඉදිකිරීම් කටයුතු සඳහා එම ප්‍රාදේශිය ලේකම් කාර්යාල විසින් රජයේ මුදල් විශාල වශයෙන් වැය කර තිබුණි. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල පිහිටි ඉඩම්වල නෛතික අයිතිය පවරා ගැනිමට කඩිනම් පියවර ගත යුතුය. | කොළඹ ප්‍රා.ලේ. කාර්යාල ඉඩම - මැනුම් නියෝගයක් ලබාගෙන ඉදිරි කටයුතු සිදු කිරීමටද, දෙහිවල ප්‍රා.ලේ.කාර්යාල ඉඩම සම්බන්ධයෙන් දිස්ත්‍රික් ඉංජිනේරු අංශය විසින් ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බවද, කොලොන්නාව ප්‍රා.ලේ. කාර්යාල ඉඩම පවරා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී.<br>මේ සම්බන්ධයෙන් කටයුතු කරන ලෙස අදාල ප්‍රා.ලේකම්වරුන් වෙත උපදෙස් දුන් බව. | පවරාගැනීම් කටයුතු අවසන් කර නොමැත.. |
| 08. | මහරගම නගර සංවර්ධනය සඳහා ඉඩම් අත්කර ගැනීම යටතේ ගමනාගමන මණ්ඩලයට අයත් ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය පවරාගෙන තිබුණද, 2016 පෙබරවාරි 02 දිනැති තක්සේරු දෙපාර්තමේන්තුවේ වන්දි මුදල් තක්සේරු වටිනාකම වන රු. මිලියන 112 ක් ගමනාගමන මණ්ඩලයට ගෙවා නොතිබුණි. | අදාළ ප්‍රතිපාදන ලබාගෙන වන්දි මුදල ගෙවීමට කටයුතු කළ යුතුය. | මේ සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට ගෙවිය යුතු රු.මිලි.112ක මුදල් ප්‍රතිපාදනය මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලා ඇති අතර, එය ලද පසු ගෙවීම් කිරීමට කටයුතු කරන බව | මේ දක්වා ගෙවීම් කර නොමැත. |

**ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**-----------------------------------------**

2018 - තත්ත්වාගණනය කළ මතය

2019 - තත්ත්වාගණනය කළ මතය

2020 - තත්ත්වාගණනය නොකළ මතය

| | විගණකාධිපති වාර්තාවේ ඇතුළත් ප්‍රධාන අඩුපාඩු | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 01 | මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු භූමිය සඳහා ඔප්පුවක් නොමැති වීම හේතුවෙන් එහි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. එසේම කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල අයත් භූමිය රු.15,000,000 කට තක්සේරු කර ගිණුම් ගත කර තිබුණ ද එම ඉඩමෙහි අයිතිය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් වී තිබුණු අතර බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල අයත් භූමියෙහි වටිනාකම රු.28,000,000ක් ලෙස ගිණුම්ගත කර තිබුණ ද, එම ඉඩමෙහි වටිනාකම තක්සේරු කර නොතිබුණි. | වත්කම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | මේ පිළිබඳව භාණ්ඩාගාර ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් සමඟ පැවති රැස්වීම්වලදී නිරන්තරයෙන් සාකච්ඡා කර ඇති අතර මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් විසින් තක්සේරු දෙපාර්තමේන්තුවට ලිඛිතව ද දන්වා ඇත. මේ පිළිබඳව නැවත වරක් අදාළ තක්සේරුකරුවන් සමඟ සාකච්ඡා කර 2020 දෙසැම්බර් 31ට ප්‍රථම අදාළ කටයුත්ත අවසන් කිරීමට බලාපොරොත්තු වේ. | 2022 පෙබරවාරි වන විටත් වත්කම් තක්සේරු කර නොතිබුණි. |
| 02. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් හෝ ප්‍රාදේශීය ලේකම් | අයිතිය පවරාගෙන ගිණුම් ගත කිරීමට | මෙම ඉඩම් වලින් බොහොමයක් ඉඩම් | 2022 පෙබරවාරි වන විටත් වියදම් කළ |

| | | | | |
|---|---|---|---|---|
| | බලධාරීත්වය යටතේ ඉදිකරන ලද දිවුලපිටිය, වත්තල, කටාන, ගම්පහ, අත්තනගල්ල, ජා-ඇල සහ දොම්පේ යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් සේවා පියස/නිල සෙවන කාර්යාල 97 ක ගොඩනැගිලි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | කටයුතු කළ යුතුය. | ප්‍රාදේශීය සභාව සතු වීම නිසා තක්සේරු කිරීමට නොහැකි වී ඇති බව දන්වමි. නිශ්චිතව දිස්ත්‍රික් ලේකම් සතුව නොමැති ජංගම නොවන වත්කම් ගිණුම්ගත කිරීම ගැටළු සහගත වන බැවින් මේ පිළිබඳව භාණ්ඩාගාර ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් සමඟ සාකච්ඡා කර නිසි වැඩ පිළිවෙළක් යෙදීමට කටයුතු කරමි. | මුදල් ගිණුම්ගත කර නොතිබුණු අතර ඉඩම් පවරා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ගද ගෙන නොතිබුණි. |
| 03. | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන යටතේ ගම්පහ දිස්ත්‍රික්කය තුළ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ක් මගින් විශ්‍රාම වැටුප් ලබමින් සිටි 72 දෙනෙකු මිය ගිය බව දැනුම් දීමට ප්‍රමාද වීම හේතුවෙන් විශ්‍රාමිකයින් මිය යාමෙන් පසුව 2020 දෙසැම්බර් 31 දිනට රු.9,539,450 ක් වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවීම් ආපසු අය කර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. | මෙම වැඩිපුර ගෙවීම් ක්‍රියාවලිය සම්බන්ධයෙන් කටයුතු කිරීම හා අදාළ ක්‍රියාමාර්ග ගැනීම විශ්‍රාම වැටුප් ජනරාල්ගේ වගකීමක් වේ. කෙසේ වෙතත් පසුගිය වසර 10 තුළ මාගේ අධීක්ෂණය යටතේ ප්‍රධාන ගණකාධිකාරීගේ මෙහෙයවීමෙන් ප්‍රාදේශීය ලේකම්වරුන්ට හා ගණකාධිකාරීවරුන් අවශ්‍ය උපදෙස් ලබාදි | වැඩිපුර ගෙවීම් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ඇත. මෙම වැඩිපුර ගෙවන ලද මුදල් සැහෙන ප්‍රමාණයක් අයකරගෙන ඇති බව දන්වනු කැමැත්තෙමි. | |
| 04. | කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරීවරුන් දෙදෙනෙකු සහන පදනම මත යතුරුපැදි ලබා ගෙන තිබියදී වයස 60 සම්පූර්ණ වීමට පෙර විශ්‍රාම යාම නිසා චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව රු.283,420 ක් ආපසු අයකර ගත යුතු වුවත් වසර 3 කට වඩා වැඩි කාලයක් ගත වී ඇතත් එම මුදල අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව විශ්‍රාම යාමට පෙර අයකරගත යුතු අතර විශ්‍රාම පාරිතෝෂිතයෙන් අයකර ගැනීමට කටයුතු නොකිරීම සම්බන්ධයෙන් වගකිව යුතු නිළධාරින්ට එරෙහිව කටයුතු කළ යුතුය. | අයවිය යුතු යතුරුපැදි මුදල් ඉදිරියේ අය කර ගැනීමට කටයුතු කරමි. | 2022 පෙබරවාරි වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| 05. | මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2014 ජූලි 15 දින සිදු වූ සේප්පුවේ මුදල් අතුරුදහන් වීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(1)(අ) ප්‍රකාරව සිදු කරන ලද අවසන් පරීක්ෂණ වාර්තාව අනුව මෙම මුදල් අස්ථානගත වීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් , ගණකාධිකාරී, මුදල් සහකාර, සහ සරප් යන නිලධාරීන්ගේ රාජකාරී කටයුතු වල පැවති අඩුපාඩු, නොසැලකිලිමත් බව සහ | අලාභය අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. | 2021 මැයි දෙවන දින ලබාදී ඇති පරීක්ෂණ වාර්තාව ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් දැනුවත් කර ඇත. ඒ අනුව ඔහු විසින් ලබාදෙන උපදෙස් මත ඉදිරි කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වේ. | 2022 පෙබරවාරි වන විටත් අනුමැතිය ලබා දී වර්ෂයකට අධික කාලයක් ගතවී තිබුණද, අයකරගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | අනවධානය හේතු වී ඇති බැවින් මෙමගින් රජයට සිදු වූ අලාභය එම නිලධාරීන් හතර දෙනාගෙන් අයකර ගත යුතු බවට යෝජනා ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව 2020 සැප්තැම්බර් 22 දිනැති ලිපියෙන් එම අය කිරීම සඳහා නිර්දේශ හා අනුමැතිය ලබා දී තිබුණද අදාළ මුදල් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | | | |
| 06. | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව, මිය ගිය, විශ්‍රාම ගිය, වැඩ තහනම් කළ හා සේවය හැර ගිය නිලධාරීන්ගෙන් 2020 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.4,236,665 ක් විය. | අයකර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. | එම ණය ශේෂ අයකර ගැනීම සම්බන්ධව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට නිරන්තර උපදෙස් ලබා දෙනු ලැබේ. | 2022 පෙබරවාරි වන විටත් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. |
| 07. | පොදු තැන්පත් ගිණුම් 03 ක අවස්ථා 1150 කදී තැන්පත් කරන ලද , වර්ෂ දෙකකට වඩා කල් ඉකුත්වූ වටිනාකම රු.298,476,498 ක් වූ ශේෂයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළයුතුය. | වන්දි ගෙවීම් නිරවුල් කිරීම සඳහා විශේෂ වැඩපිළිවෙළක් යොදා ඇති අතර අධිවේගී මාර්ග සඳහා අත්පත් කර ගැනීම් යටතේ වන්දි මුදල් ප්‍රමාණවත් නොවීම නිසා ලබා නොගත් වන්දි මුදල් වැඩි ප්‍රමාණයක් වේ. එකඟතාවයන් ලැබෙන | රැඳවුම් මුදල් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | තෙක් අදාළ වන්දි මුදල් තැන්පත් ගිණුමේ රඳවා ගැනීමට සිදුවේ. තවද ඉඩම් ආරවුල් , වන්දි ලාභීන් විදේශගත වීම් ආදී හේතු මත මෙම වන්දි මුදල් නිරවුල් කිරීම ප්‍රමාද වීම සිදුවේ. කෙසේ වෙතත් මෙම තැන්පතු ශේෂ 2021 වර්ෂය තුළ හැකිතාක් නිරවුල් කිරීමට කටයුතු කරමි. | |
| 08. | 2020 වර්ෂයේදී මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මිනුවන්ගොඩ නාලන්දා පිරිමි පාසලෙහි නල ළිඳක් ඉදිකර ජල පොම්පාගාරයක් සවිකර පානීය ජලය ලබා දීම සඳහා රු.1,000,000 ක ඇස්තමේන්තුගත මුදලකට ව්‍යාපෘතියක් ආරම්භ කර රු.800,714 ක වියදමක් දැරීමෙන් පසු අපේක්ෂිත ප්‍රතිලාභ ඉටු නොවීම මත ව්‍යාපෘතිය අතහැර දමා ඇත. | ලැබෙන ප්‍රතිපාදන මගින් මහජනයාට උපරිම සේවයක් ලැබෙන පරිදි ව්‍යාපෘති නිම කිරීමට කටයුතු කළ යුතු අතර ව්‍යාපෘති අතරමඟ නතර කිරීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුය. | 2020 වර්ෂය තුළ දී ක්‍රියාත්මක වූ ඇතැම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ඇති වූ ගැටළු හා යම් ක්‍රියාත්මක කිරීමේ අපහසුතා නිසා නවතාලීමට සිදු වී ඇත. | ඇස්තමේන්තු මුදල වූ රු. 1,000,000 ක මුදලින් රු. 800,714 ක් වැයකර තිබුණද, ඉතිරි වැඩ 2022 පෙබරවාරි වන විටත් සිදුනොකර අතහැර දමා තිබුණි. |
| 09. | මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ නිල සෙවන ව්‍යාපෘති කාර්යාල 15ක් ඉදිකිරිමට සැලසුම් කර තිබූ නමුත් කාර්යාල 8 ක් පමණක් | ලැබෙන ප්‍රතිපාදන මගින් මහජනයාට උපරිම සේවයක් ලැබෙන පරිදි ව්‍යාපෘති නිම කළ | 2020 වර්ෂය තුළ දී ක්‍රියාත්මක වූ ඇතැම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ඇති වූ ගැටළු හා යම් ක්‍රියාත්මක | 2018 වර්ෂයේ රු.1,433,909 ක් වැය කර තිබුණද ඉතිරි වැඩ 2022 දක්වාම සිදුකර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | නිමකර තිබූ අතර ඉතිරි ව්‍යාපෘති 7 සඳහා 2018 වර්ෂයේදී රු.1,433,909 ක් වියදම් දරා අතහැර දමා තිබුණි. 2020 වර්ෂයේදී ඒවායේ ඉදිකිරීම් නිම කිරීම් සඳහා රු.12,566,092 ක ප්‍රතිපාදන ලබා ගැනීමට සැලසුම් කර තිබුණු නමුත් ප්‍රතිපාදන ලැබී නොතිබුණි. | යුතු අතර අතරමග නවතා දැමීම තුළින් සිදු වූ වියදම් නිෂ්ක්‍රීය වීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුය. | කිරීමේ අපහසුතා නිසා නවතාලීමට සිදු වී ඇත. | |
| 10. | 2018 වර්ෂයේදී ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන වැඩ සටහන යටතේ විමධ්‍යගත අයවැයෙන් වෙන් කරන ලද රු. ලක්ෂ 50ක මුදලකට කැළණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් දිප්පිටිගොඩ සේවා පියස ඉදිකර තිබුණි.එම ගොඩනැගිල්ලෙහි ග්‍රාම නිලධාරී, සංවර්ධන නිලධාරී, සමෘද්ධි නිලධාරී හා කෘෂි නිලධාරී යනාදී සියලු නිලධාරීන් රාජකාරි කටයුතු කළ යුතු වුවත් ගොඩනැගිල්ල ඉදිකර වසර 02කට වඩා වැඩි කාලයක් වුවද ප්‍රදේශීය සභාවට අයිති භූමියක ඉදි කිරීම නිසා ඉහත කී නිලධාරීන්ට එම සේවා පියසෙහි රාජකාරී කටයුතු කිරීමට ප්‍රාදේශීය සභාව විසින් ඉඩ ලබාදී නොතිබුණි. | ගොඩනැගිලි ඉදිකිරීමට ප්‍රථම අයිතිය පිළිබඳ අවධානය යොමු කළ යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. | රාජකාරි කටයුතු සඳහා යොදාගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 11. | 2019 වර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා වැඩ සටහන් 8ක් යටතේ ව්‍යාපෘති 6404 ක් අනුමත කර තිබුණද එයින් රු.1,426,707,694 ක් වටිනාකම වූ ව්‍යාපෘති 4975 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | අනුමත ප්‍රතිපාදන වලින් උපරිම ප්‍රයෝජන ගත යුතුය. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | 2019 වර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා වැඩ සටහන් 8ක් යටතේ ව්‍යාපෘති 6404 ක් අනුමත කර තිබුණි. ඉන් රු.1,426,707,694 ක් වටිනාකම වූ ව්‍යාපෘති 4975 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. |
| 12. | මිනුවන්ගොඩ, දිවුලපිටිය හා දොම්ප යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශවල 2012 වර්ෂයට පෙර සිට වසා දමා ඇති පාසල් සංඛ්‍යාව 11ක් වූ අතර ඒවා ඵලදායී කටයුත්තක් සඳහායොදවාගෙන නොතිබුණි. | වසා දැමූ පාසල් ප්‍රාදේශීය ලේකම් වෙත පවරාගෙන ඵලදායී කටයුතුවලට යොදවා ගැනීමට කටයුතු කළ යුතුය. | ඵලදායී කටයුතු සඳහා යොදාගැනීමට කටයුතු කරමි. | මිනුවන්ගොඩ, දිවුලපිටිය හා දොම්ප යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශවල 2012 වර්ෂයට පෙර සිට වසා දමා ඇති පාසල් සංඛ්‍යාව 11ක් වූ අතර ඒවා ඵලදායී කටයුත්තක් සඳහායොදවාගෙන නොතිබුණි. |
| 13. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් විශ්‍රාම වැටුප් ගෙවීම් කරනු ලබන සෑම පුද්ගලයෙකු වෙනුවෙන්ම විශ්‍රාම වැටුප් ගොනුවක් පවත්වා ගත යුතු වුවත් ප්‍රාදේශීය ලේකම් | ලිපිගොනු යාවත්කාලීන කිරිමට පියවර ගත යුතුය. | ගොනු නොමැති විශ්‍රාමිකයින්ගෙන් තොරතුරු කැඳවීමක් කල අතර ඔවුන් ඉතා වයෝවෘද්ධ පුද්ගලයන් බැවින් ද, බොහෝ | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් විශ්‍රාම වැටුප් ගෙවීම් කරනු ලබන සෑම පුද්ගලයෙකු වෙනුවෙන්ම විශ්‍රාම |

| | | | | |
|---|---|---|---|---|
| | කාර්යාල 9 ක විශ්‍රාම වැටුප් ලබන පුද්ගලයන් 426 දෙනෙකු වෙනුවෙන් ලිපිගොනු පවත්වාගෙන ගොස් නොතිබුණි. | | වැන්දඹු විශ්‍රාම වැටුප් ලබන්නන් තම කාලාත්‍රයාගේ රැකියා විස්තර හෝ ආයතන පිළිබඳ දැනුවත් නොවීම, තොරතුරු ලබා ගැනීම අසීරු වී ඇත. අදාළ පුද්ගලයින් සේවය කල ආයතන වලින්ද තොරතුරු කැදවා සමහර ලිපි ගොනු සකස් කර ඇති අතර සමහර ආයතන වසා දමා ඇති බැවින් තොරතුරු ලබාගත නොහැකි වී ඇත. තාවකාලික ගොනු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් ඉදිරියේදී අනුමත කර ගැනීමට කටයුතු කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් දී ඇත. | වැටුප් ගොනුවක් පවත්වා ගත යුතු වුවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 9 ක විශ්‍රාම වැටුප් ලබන පුද්ගලයන් 426 දෙනෙකු වෙනුවෙන් ලිපිගොනු පවත්වාගෙන ගොස් නොතිබුණි . |
| 14. | අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ඉඩම් දීමනා පත්‍රලාභීන්ට නීත්‍යානුකූලව හිමිකම පැවරිය හැකි අය සඳහා තම භුක්තිය පැවරිය හැකි වුවද මුදලට විකිණීමක් කළ නොහැකි වුවත් බොහෝ ජනපදවල දීමනා පත්‍රලාභීන් තම ඉඩම් | නියමිත දීමනාපත්‍ර ලාභී ඉඩම් කට්ටි සම්බන්ධයෙන් පවතින ගැටළු නිරාකරණය කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. | ජනපද හි ඉඩම් 04 කට්ටි පිළිබඳව පළාත් ඉඩම් කොමසාරිස්ගේ අනුමැතිය යටතේ ඉදිරි .කටයුතු කරනු ලැබේ | අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ඉඩම් දීමනා පත්‍රලාභීන්ට නීත්‍යානුකූලව හිමිකම පැවරිය හැකි අය සඳහා තම භුක්තිය පැවරිය හැකි වුවද මුදලට විකිණීමක් කළ |

| | | | |
|---|---|---|---|
| මුදලට විකුණා ඇති බව නිරීක්ෂණය විය. තවද වර්තමානය වන විට දීමනපත්‍ර හිමි අය ඉඩමේ පදිංචි වී නැති අවස්ථා ද නිරීක්ෂණය විය. ජනපද 4 ක පැවති ඉඩම් කට්ටිවලින් 10 දෙනෙකු තම ඉඩම් විකුණා තිබුණු අතර ඉඩම්17 ක දීමනා පත්‍රලාභීන් නොවන අය පදිංචිව පැවතුණි. ඉඩම් 07 ක කිසිවෙකු පදිංචි වී නොතිබුණු අතර ඉඩම් 34 ක අනවසර පදිංචි වීම්ද පැවතුණි. | | | නොහැකි වුවත් බොහෝ ජනපදවල දීමනා පත්‍රලාභීන් තම ඉඩම් මුදලට විකුණා ඇති බව නිරීක්ෂණය වියතවද වර්තමානය . ට දීමනවන විපත්‍ර හිමි අය ඉඩමේ පදිංචි වී නැති අවස්ථා ද නිරීක්ෂණය විය . ජනපද 4 ක පැවති ඉඩම් කට්ටිවලින් 10 දෙනෙකු තම ඉඩම් විකුණා තිබුණු අතර ඉඩම්17 ක දීමනා පත්‍රලාභීන් නොවන අය පදිංචිව පැවතුණි. ඉඩම් 07 ක කිසිවෙකු පදිංචි වී නොතිබුණු අතර ඉඩම් 34 ක අනවසර පදිංචි වීම්ද පැවතුණි. |

**කළුතර දිස්ත්‍රික් කාර්යාලය**
------------------------------

2018 තත්ත්වාගණනය කළ මතය

2019 තත්ත්වාගණනය කළ මතය

2020 තත්ත්වාගණනය කළ මතය

| **විගණකාධිපති වාර්තාවේ ඇතුළත් ප්‍රධාන අඩුපාඩු** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග** | **ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය** |
|---|---|---|---|
| 01 පාලින්දනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 836ඊ පැළෑඳ බටහිර ග්‍රාම නිලධාරී | අවශ්‍ය යටිතල පහසුකම් ලබාදී රණවිරුවන් පදිංචි | රණවිරු සේවා අධිකාරිය හා පළාත් ඉඩම් කොමසාරිස් | ඉඩම් අහිමි වෙනත් රණවිරුවන් සඳහා එම ඉඩම් ලබා දීමට |

| | | | | |
|---|---|---|---|---|
| | වසමේ පැලන්වත්ත ඉඩමෙන් වර්ෂ 2003 – 2012 අතර කාලය තුල ඉඩම් කැබලි 181 ක් රණවිරුවන් සඳහා ලබාදී තිබූ නමුත් ඉන් ඉඩම් කැබලි 20 ක පමණක් රණවිරුවන් පදිංචි වී සිටී. | කිරීමට කටයුතු කළ යුතුය. | විමසා රණවිරු හෝ වෙනත් සුදුසු පවුල් පදිංචි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම | රණවිරු සේවා අධිකාරිය යෝජනා කර ඇති අතර එය මෙතෙක් ක්‍රියාත්මක වී නොතිබුණි. |
| 02. | ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 620 ජී මහ ඉංගිරිය ග්‍රාම නිලධාරී වසමට අයත් ඉමගිර ඉඩමෙන් කැබලි 22 ක්ද, 620 නිමලගම ග්‍රාම නිලධාරී වසමේ ඇඳුරුගල වත්තෙන් ඉඩම් කැබලි 26 ක්ද වශයෙන් ඉඩම් කැබලි 48 ක් 2010 වර්ෂය තුල රණවිරුවන් සඳහා ලබාදී තිබුණි. මෙම ඉඩම් කැබලි අතරින් මේ වන විට ඉඩම් කැබලි 13ක පමණක් රණවිරුවන් පදිංචි වී ඇති අතර ඒ සඳහා හිමිකම් ඔප්පු මේ දක්වා ලබා දී නොතිබුණි. | කඩිනමින් හිමිකම් ඔප්පු ලබාදී සියළුම ඉඩම් කැබලිවල රණවිරුවන් පදිංචි කරවීමට කටයුතු කළ යුතුය. | - එම - | පවතින ගැටළු නිරාකරණය කර රණවිරුවන් පදිංචි කිරීමට පියවර ගෙන තිබුණ ද එම කටයුතු මේ දක්වා නිම වී නොතිබුණි. |
| 03. | අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 829 බී කැකුළන්දල ග්‍රාම නිලධාරී වසමට අයත් පිඹුරවත්ත කපුහේන ඉඩමෙන් ඉඩම් කැබලි 81 ක් 2009 දෙසැම්බර් 08 දින රණවිරුවන්ට ලබාදී තිබූ නමුත් මේ වන විට එහි පදිංචිව සිටින්නේ පවුල් 3 ක් | රණවිරුවන් පදිංචි කිරීමට කටයුතු කළ යුතු අතර විකිණීමට නොහැකි පරිදි පාලන ක්‍රමයක් ඇති කළ යුතුය. | - එම - | පදිංචි වී සිටින තිදෙනාගෙන් දෙදෙනෙකු රණ විරුවන් නොවන අතර ඉතිරි ඉඩම් කැබලි 78 හි කිසිවකු පදිංචි වී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | පමණි. මෙම ඉඩම් අතරින් ඉඩම් කිහිපයක් මේ වන විටත් විකුණා තිබූ බව නිරීක්ෂණය විය. | | | |
| 04. | කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා නව සිව්මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය රු. මිලියන 108.48 කට 2017 පෙබරවාරි 13 දින ආරම්භ කර තිබුණු අතර එය 2018 මැයි 20 දින වන විට වැඩ අවසන් කළ යුතුව තිබුණි. නමුත් මෙහි වැඩ අතරමග නවතා දමා තිබුණු අතර නිමකර තිබුණේ මුළු වැඩ ප්‍රමාණයෙන් සියයට 22.5 ක් පමණක් වූ අතර ඒ සඳහා රු. මිලියන 42.9 ක් වියදම් කර තිබුණි. | වැඩ නිම නොකිරීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතු අතර ඉතිරි වැඩ නිම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | 2020 වර්ෂයේ දී නව කොන්ත්‍රාත්කරුවකු වෙත ඉදිකිරීම් කටයුතු පවරා තිබීම | ඉදිකිරීම් කටයුතු 2022 පෙබරවාරි 11 දින දක්වාත් නිම කර නොතිබුණි. |
| 05. | කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 14 තුළ අනවසරයෙන් අල්ලාගෙන ඇති බවට හඳුනාගෙන තිබූ ඉඩම් කට්ටි 11,225 අතරින් සමාලෝචිත වර්ෂය තුළ ඉඩම් කච්චේරි 73 ක් පවත්වා ඉඩම් කැබලි 759 ක් පමණක් නියමානුකූල කර තිබුණි. | අනවසර ඉඩම් නියමානුකූල කිරීමේ කටයුතු කඩිනමින් අවසන් කිරීමට කටයුතු කළ යුතුය. | කඩිනමින් ඉඩම් නියමානුකූල කිරීමට ප්‍රාදේශීය ලේකම් වරුන්ට උපදෙස් ලබා දී තිබුණි. | 2021 දෙසැම්බර් 31 දින වනවිට බලපත්‍ර 4,849 ක් හා දීමනා පත්‍ර 341 ක් පමණක් ලබා දී තිබුණි. |
| 06. | බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මුංහේන සංඝමිත්තා ජල ව්‍යාපෘතිය | පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියට ගෙවිය | ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී නොමැති බැවින් ජල සම්පාදන හා | අදාළ මුදල් 2022 ජනවාරි දක්වාත් අය කරගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ක්‍රියාත්මක කිරීම සඳහා රු.2,341,259 ක් ජාතික ජලසම්පාදන හා ජලපවහන මණ්ඩලය වෙත 2018 වර්ෂයේදී ගෙවා තිබුණි. නමුත් මාර්ග පළුදු කිරීම වෙනුවෙන් වන භෞතික හානි සඳහා බස්නාහිර පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු රු.1,941,970 ක් නොගෙවීම නිසා 2020 ජුනි 10 වන දින වනවිටත් අදාල ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නොහැකිවී තිබුණි. | යුතු මුදල ගෙවා ව්‍යාපෘතිය ආරම්භ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | ජලපවහන මණ්ඩලයට ගෙවූ මුදල් ආපසු අය කර ගැනීම බේරුවල ප්‍රාදේශීය ලෙකම් වෙත උපදෙස් ලබා දී තිබුණි | |
| 07. | බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 661/A කොතලාවල ග්‍රාම නිලධාරී වසමේ ප්‍රාදේශීය සභා ඉඩමක සේවා පියස ඉදිකිරීම වෙනුවෙන් 2012 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා විවිධ ව්‍යාපෘති යටතේ රු.3,729,024 ක් වැයකර තිබුණද ඉදිකරන ලද ගොඩනැගිල්ලට අයත් භූමිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම විධිමත් ආකාරයට පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | අදාළ ඉඩම පවරා ගැනීමට කටයුතු කිරීමට ප්‍රාදේශීය ලේකම් වෙත උපදෙස් ලබා දී තිබුණි. | 2021 දෙසැම්බර් 31 දින දක්වාත් අදාළ පවරා ගැනීම සිදු කර නොතිබුණි. |
| 08. | කළුතර දිස්ත්‍රික්කයට අයත් ප්‍රාදේශිය ලේකම් කාර්යාල බලප්‍රදේශ 13 ක් තුළ ස්වභාවික ආපදාවලින් පූර්ණ හානියට පත් වන සහ ජාතික ගොඩනැගිලි පර්යේෂණ | අවදානම් සහිත ප්‍රදේශවල ජීවත්වන පුද්ගලයන් සුරක්ෂිත ස්ථානවල පදිංචි කිරීමේ කටයුතු කඩිනමින් සිදු කළ | අදාළ නිවාස ඉදි කිරීමේ කටයුතු කඩිනම් කරන ලෙස ප්‍රාදේශීය ලේකම් වරුන් වෙත උපදෙස් ලබා දී තිබුණි. | නැවත පදිංචි කිරීමේ කටයුතු 2021 දෙසැම්බර් 31 දින වන විටත් නිම වී නොතිබුණි. ඇතැම් ප්‍රතිලාභීන් පදිංචිය |

| | | | | |
|---|---|---|---|---|
| | සංවිධානය විසින් අධි අවදානම් නිසා ඉවත් කළ යුතු ලෙස හඳුනාගත් පවුල් සඳහා “නිවසට නිවසක්” සංකල්පය මත නිවාස 879 ක් තැනීමට 2017 වර්ෂයේ සිට 2020 දෙසැම්බර් 31 දක්වා ලැබී ඇති රු.1,363,413,225 ක ප්‍රතිපාදන අතරින් 2020 දෙසැම්බර් 31 දිනට ප්‍රතිලාභීන්හට රු.929,986,597 ක් ලබා දී තිබුණි. එහෙත් ඉලක්කගත නිවාස සංඛ්‍යාවෙන් 606 ක් පමණක් සම්පූර්ණයෙන්ම නිම කර තිබුණ අතර ප්‍රතිලාභීන් ලවා නිවාස 273 ක් නිම කරවා ගැනීමට නිලධාරීන් අපොහොසත් වී තිබුණ බව නිරීක්ෂණය විය. | යුතුය. | | සඳහා රජයෙන් ලබා දී ඇති ඉඩම්වල පදිංචිම ප්‍රතික්ෂේප කර තිබුණි. |
| 09. | 2020 වර්ෂයේ ක්‍රියාත්මක කළ සපිරිගම ව්‍යාපෘතියේ මාර්ග ඉදිකිරීමේ කර්මාන්ත සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් මුදල් ගෙවීමේ දී මාර්ගයේ ප්‍රමිතිය පිළිබඳ තහවුරුවක් ලබා ගැනීම සඳහා සම්පීඩන ශක්තිය පරීක්ෂණ (Cube test) හා මාර්ග ඝනකම පිළිබඳ පරීක්ෂණ වාර්තා (Core test) මූලික පදනමක් ලෙස යොදා ගෙන තිබුණි. එහෙත් මුදල් ගෙවීම සඳහා | විධිමත් පරීක්ෂණයක් සිදු කර වගකිව යුතු පාර්ශව හඳුනා ගැනීමට හා සාවද්‍ය වාර්තා මත ගෙවීම් කිරීම නිසා රජයට සිදු වී ඇති අලාභය ගණනය කර පියවා ගැනීමට කටයුතු කළ යුතුය. | ගැටළු සහිත පරීක්ෂණ වාර්තා සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා මාර්ගෝපදේශයක් නිකුත් කර තිබුණි. | 2022 පෙබරවාරි දක්වාම සාවද්‍ය වාර්තා මත ගෙවන ලද මුදල් අයකරගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | පදනම් කර ගත් පර්යේෂණ වාර්තා අසමත් වී තිබීම, ව්‍යාජ වාර්තා ඉදිරිපත් කර තිබීම, පර්යේෂණාගාරය ඉදිරිපත් කළ අසමත් වාර්තා සමත් ලෙස වෙනස් කර තිබීම ආදි වංචනික කටයුතු සහ වාර්තාවල වෙනත් අඩුපාඩු සහිත ඉදිකිරීම් ව්‍යාපෘති 141 ක් සඳහා එකතුව රු.82,087,610 ක් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබුණි. | | | |
| 10. | බස්නාහිර පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) විසින් අනුමත මිල ලැයිස්තු අනුව, මාර්ග ඉදිකිරීමේ හැඩයම් වැඩ (Form Work) සඳහා යොදාගත යුතු වර්ග මීටරයක් සඳහා රු.1,335 ක හෝ රු.943 ක මිල වෙනුවට රු.3,351 ක රේටය ඇතුළත් කර සපිරිගමක් ව්‍යාපෘති 162 ක හැඩයම් වැඩ වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක් විසින් රු.22,351,434 ක් වැඩිපුර යොදා සැකසූ ඇස්තමේන්තු පදනම් කර ගෙන ගෙවීම් කර තිබුණ බව නිරීක්ෂණය විය. | විධිමත් පරීක්ෂාවක් සිදු කර වැඩිපුර ගෙවා ඇති මුදල් අය කර ගැනීමටත් වගකිවයුතු පාර්ශව සම්බන්ධයෙන් නිසි පියවර ගැනීමත් කළ යුතුය. | ගැටළු සහගත ගෙවීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා උපදෙස් මාලාවක් නිකුත් කර තිබුණි. | පානදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අය විය යුතු මුදලින් රු.2,319,870 ක් පමණක් අය කර ඇත. අනෙකුත් වැඩිපුර ගෙවා ඇති මුදල් අය කරගෙන නොතිබුණි. |
| 11. | මාර්ග කොන්ක්‍රීට් ඇතිරීමේ දී කොන්ක්‍රීට් ප්‍රවාහනය සඳහා | - එම - | - එම - | 2022 පෙබරවාරි වන විටත් වැඩිපුර ගෙවා |

| | | | | |
|---|---|---|---|---|
| | අනුමත ගාස්තුවට අමතරව සාවද්‍ය ලෙස ප්‍රවාහනය ගාස්තු ඇතුළත් කර සැකසූ ඇස්තමේන්තු මත වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කොන්ත්‍රාත්කරුවන් වෙත රු.5,124,709 ක් වැඩිපුර ගෙවා තිබුණි. | | | ඇති මුදල් අය කර ගෙන නොතිබුණි. |
| 12. | දොඩංගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින්, ඉදිකිරීම් කර්මාන්තවලට යොදා ගන්නා මි.මී.37.5 කළුගල් ඝන මීටරයක අනුමත මිල රු.2,400 වෙනුවට ඝන මීටරයක් සඳහා රු.3,134 ක් ලෙස ඇතුළත් කර සපිරිගමක් ව්‍යාපෘති 115 ක් සඳහා ඉදිකිරීම් කරන ලද දොඩංගොඩ ප්‍රාදේශීය සභාවට එකතුව රු.1,180,823 ක් වැඩිපුර ගෙවා තිබුණි. | - එම - | - එම - | වැඩිපුර ගෙවා ඇති මුදල අත රැඳවුම් මුදලින් අඩු කිරීමට දොඩංගොඩ ප්‍රාදේශීය සභාව එකඟ වී තිබුණ ද අදාළ මුදල් අය කර කර නොතිබුණි. |
| 13. | මාර්ග 76 ක් තාර යොදා නිම කිරීමේ දී චිප් ගල් භාවිතා කර තිබුණ අතර චිප් ගල් වෙනුවට වැලි යෙදූ බව දක්වමින් අධිතක්සේරුගත ඇස්තමේන්තු සකසා ඒ මත හොරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කොන්ත්‍රාත්කරුවන් වෙත රු.844,196 ක් වැඩිපුර ගෙවා තිබුණි. | - එම - | - එම - | 2022 පෙබරවාරි වන විටත් වැඩිපුර ගෙවා ඇති මුදල් අය කරගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 14. | මාර්ග සඳහා යොදාගන්නා ABC ප්‍රමාණය මාර්ග තලයේ ස්වභාවය අනුව තීරණය විය යුතු වුවත් හොරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය බල ප්‍රදේශය තුල කොන්ක්‍රීට් කළ මාර්ග 78 ක් සඳහා මි.මි. 76 ක එකම උසින් මාර්ග තලයේ ABC ඇතිරීමේ පදනම ලෙස ගෙන ABC ඇතිරීම සඳහා එකතුව රු.3,456,347 ක අසාමාන්‍ය ඇස්තමේන්තු සකසා කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවීම් කර තිබුණි. | අසාමාන්‍ය ඇස්තමේන්තු මත වැඩිපුර ගෙවා ඇති මුදල හඳුනා ගෙන රජයට අයකර ගත යුතු අතර වගකිවයුතු පාර්ශව සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. | - එම - | - එම - |
| 15. | මාර්ගය සඳහා යොදාගන්නා ABC ප්‍රමාණය මාර්ග තලයේ ස්වභාවය අනුව තීරණය විය යුතු වුවත් පාලින්දනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය බල ප්‍රදේශයේ තුල කොන්ක්‍රීට් කළ මාර්ග 147 ක් අතරින් 94 ක් සඳහා ABC හා කොන්ක්‍රීට් එකම ප්‍රමාණයක් ඇතුළත් කරමින් අසාමාන්‍ය ඇස්තමේන්තු සකසා ඒ මත කොන්ත්‍රාත් කරුවන් වෙත වැඩියෙන් ගෙවීම් කර තිබුණි. | - එම - | - එම - | - එම - |
| 16. | මාර්ග ඉදිකිරීම් කර්මාන්තවල හැඩයම් වැඩ සඳහා ඇස්තමේන්තු සැකසීමේ දී නිවැරදි නොවූ රේටයක් යොදා | විධිමත් පරික්ෂාවක් සිදු කර වැඩිපුර ගෙවා ඇති මුදල් අය කර ගැනීමටත් | - එම - | වැඩිපුර ගෙවා ඇති මුදල් අය කර ගැනීමේ විස්තර විගණකාධිපතිට |

| | | | | |
|---|---|---|---|---|
| | ගැනීම නිසා ව්‍යාපෘති 13 කට අදාළව අධිතක්සේරුගත ඇස්තමේන්තු මත බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.1,770,939 ක් කොන්ත්‍රාත්කරුවන් වෙත වැඩිපුර ගෙවා තිබුණි. | වගකිවයුතු පාර්ශව සම්බන්ධයෙන් නිසි පියවර ගැනීමත් කළ යුතුය. | | වාර්තා කර නොතිබුණි. |
| 17. | සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් අමතමින් දේශිය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් එවා ඇති 2019 මැයි 14 දිනැති අංක SEC/2029/02 මුද්දර ගාස්තු චක්‍රලේඛය ප්‍රකාරව, විදේශීය මත්පැන් බලපත්‍ර සමඟ නිකුත් කරන AFL1 ,AFL2 ,AFL3 හා AFL4 යන අරක්කු බල පත්‍ර හා බෝතල් රා බල පත්‍ර සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක් විසින් 2006 වර්ෂයේ සිට 2020 දෙසැම්බර් 31 දක්වා අය කළ යුතු එකතුව රු.21,534,500 ක හිඟ මුද්දර ගාස්තුවක් බලපත්‍රලාභින් ගෙන් අය කර ගැනීමට 2020 දෙසැම්බර් 31 දින දක්වාත් පියවර ගෙන නොතිබුණි. | හිඟ මුද්දර ගාස්තු කඩිනමින් අය කර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කළ යුතුය. | හිඟ මුද්දර ගාස්තු අය කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත උපදෙස් ලබා දී තිබුණි. | හිඟ මුද්දර ගාස්තු අය කර දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |
| 18. | කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 4 ක විශ්‍රාමිකයින් 70 දෙනෙකු සඳහා ස්ථිර හෝ තාවකාලික | ගොනු නොමැති විශ්‍රාමිකයන් සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂාවක් | විශ්‍රාම වැටුප් ලිපි ගොනු පරීක්ෂා කර අඩු පාඩු නිවැරදි කිරීමට උපදෙස් ලබා දී තිබුණි. | 2022 පෙබරවාරි වනවිටත් තාවකාලික ලිපි ගොනු හෝ සකස් කර නිම කර |

| | | | |
|---|---|---|---|
| විශ්‍රාම වැටුප් ලිපි ගොනුවක් නොමැතිව විශ්‍රාම වැටුප් ගෙවමින් පවතින බව නිරීක්ෂණය වූ අතර සමාලෝචිත වර්ෂයේ දී පමණක් එකතුව රු.12,252,253 ක් එසේ ගෙවා තිබුණි. | සිදු කර වැරදි ගෙවීම් වලක්වා ගැනීමේ පාලන ක්‍රම හඳුන්වා දීමත් කළ යුතුය. | | නොතිබුණි. |

ගාල්ල - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**2018 -** තත්ත්වාගණනය කළ මතය

**2019 -** තත්ත්වාගණනය කළ මතය

**2020 -** තත්ත්වාගණනය කළ මතය

| විගණකාධිපති වාර්තාවේ ඇතුළත් ප්‍රධාන අඩුපාඩු | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| 01. ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 කින් එම කාර්යාලවලට අනුබද්ධව සමෘද්ධි බැංකු සංගම් 08 ක් මගින් විවිධ ණය වැඩසටහන් සඳහා ණයලාභීන් 70,181 දෙනෙකු වෙත රු.මිලියන 381 ක සමස්ත ණය මුදලක් ලබා දී තිබුණි. ණයලාභීන් 856 ක් වෙත ලබා දී තිබුණු ණය මුදලින් රු.මිලියන 46.58 ක් කල් පසුවූ ණය වී තිබුණි. ණයලාභීන් 335 දෙනෙකු වෙත ලබා දී තිබුණු රු.මිලියන 11.28 ක ණය බොල් ණය | කල් පසු වු ණය කඩිනමින් අය කර ගැනීමට ක්‍රමවත් වැඩ පිළිවෙලක් සකස් කළ යුතු අතර ණය ඉල්ලුම් කර ඇති සියළුම පුද්ගලයන්ගේ සුදුසුකම් පරීක්ෂාකර ණය ලබා දීමට කටයුතු කළ යුතුය. | කල් පසු වූ ණය සම්බන්ධයෙන් ප්‍රගති සමාලෝචන රැස්වීමේදී සාකච්ඡා කරන ලද අතර ලිපි මගින් අදාළ ණයකරුවන් දැනුවත් කර ඇත. එසේම ණය අයකර ගැනීම සඳහා පොලිස් ස්ථානාධිපතිවරුන්ගේ සහාය ලබා ගැනීමටත්, සමථ මණ්ඩලය වෙත යොමු කිරීමටත් කටයුතු කර ඇත. | 2022 ජනවාරි 01 දිනට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 19 කට අදාළව සමෘද්ධි බැංකු සංගම්වල කල් පසු වූ ණය මුදල්වල වටිනාකම රු.මිලියන 623 ක් වූ අතර බොල් ණය මුදල රු.මිලියන 166 ක් විය. |

| | | | | |
|---|---|---|---|---|
| | වශයෙන්ද හඳුනාගෙන තිබුණි. | | මෙම ණය ලාභීන් බැංකුවේ කොටස්කරුවන් වන බැවින් කල් පසු වුවද මෙම ණය ගෙවමින් පවතී. | |
| 02. | ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ එක් ව්‍යාපෘතියක් සඳහා රු.මිලියන 2 ක් බැගින්, නිල සෙවන ව්‍යාපෘති 17 ක් වෙනුවෙන් 2017 වර්ෂයේදී රු.4,776,000 ක ප්‍රතිපාදන සළසා තිබුණි. 2018 සැප්තැම්බර් 05 දින වන විට ව්‍යාපෘති 12 ක වැඩ ආරම්භ කර තිබුණද, මාඉටිපේ, වැලිවත්ත, සංඝමිත්තපුර, කලුවැල්ල සහ දංගෙදර නිල සෙවන ව්‍යාපෘතිවල ඉදි කිරීමේ කටයුතු ආරම්භ කර නොතිබුණි. | ව්‍යාපෘති ආරම්භකර ජනතාවට මහජන සේවා ලබාදීමට කටයුතු කළ යුතුය. | ගාල්ල මහ නගර සභාවේ අනුමැතිය නොලැබීම, මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස්මත ව්‍යාපෘති ආරම්භ නොකිරීම, තෝරාගත් බිම් කොටස් ප්‍රමාණවත් නොවීම වැනි කරුණු නිසා නිල සෙවන ව්‍යාපෘති 05 ක වැඩ ආරම්භ කිරීමට නොහැකි විය. | මාඉටිපේ, වැලිවත්ත, සංඝමිත්තපුර, කලුවැල්ල නිල සෙවන ව්‍යාපෘති 2022 පෙබරවාරි දක්වාම ඉදි කර නොතිබුණි. |
| 03. | ගම් පුළුල් කිරීමේ වැඩසටහන යටතේ නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පුද්ගලයන් පදිංචි කිරීම සඳහා අක්කර 467 ක් වූ ඇප්තොප්වත්ත නැමති ඉඩම රජයට පවරා ගැනීමේ කටයුතු | මතුවී ඇති ගැටළු කඩිනමින් නිරවුල් කර මෙම ඉඩම ගම් පුළුල් කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගත | අනවසරකරුවන් 40 දෙනෙකුගේ සන්තකය ආපසු ලබා ගැනීමේ පනත යටතේ නඩු පවරා ඇත. ගස් කැපීමේ කටයුතු සම්බන්ධයෙන් | ඉඩම රජයට පවරාගෙන පුද්ගලයන් පදිංචි කිරීමේ කටයුතු 2022 පෙබරවාරි වන විටත් සිදුකර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | 1999 වර්ෂයේදී ආරම්භ කර තිබුණද, 2018 ජුලි 13 දින වන විටත් එම ඉඩම් පවරා ගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි. තවද මහජනතාව පදිංචි කරවීම සඳහා මෙම ඉඩම් අත්පත් කර ගැනීමට සැලසුම් කර තිබුණද, ඒ තුළ පදිංචියට නුසුදුසු තත්ත්වයේ ඉඩම් පැවතීම, අත්කර ගන්නා ඉඩම් අදාළ අරමුණ සඳහා යොදා ගන්නා තෙක් එම ඉඩම් අනවසර පදිංචිකරුවන්ගෙන් ආරක්ෂා කර ගැනීමට නොහැකි වීම, බෙදාදුන් ඉඩම් හිමිකම් නොකී වෙනත් බාහිර පාර්ශවයන්ට පවරා තිබීම, අදාළ ඉඩමෙහි පැවති විශාල කැලෑ අනවසරකරුවන් විසින් හෙලි පෙහෙළි කිරීම හා එමගින් විශාල පරිසර හානියක් සිදුකර තිබීම යන කරුණු නිරීක්ෂණය විය. | යුතුය. | පොලීසියට පැමිණිලිකර නඩු පැවරීමට කටයුතු කර ඇති අතර ඉඩමේ හිමිකාරීත්වය සම්බන්ධ නඩු විභාගයට අදාළ තීන්දුව මෙතෙක් ලබා දී නොමැත. | |
| 04. | බලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ පවතින විශ්‍රාම වැටුප් ලිපිගොනු 34 ක 16/2015 විෂමතා තොරතුරු, විශ්‍රාම වැටුප් දීමනා හා වැටුප් වර්ධක අගය, සක්‍රීය සේවා කාලය යන තොරතුරු නොමැති වීම හේතුවෙන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2019 පරිදි විශ්‍රාම | තොරතුරු ගෙන්වාගෙන විශ්‍රාම වැටුප් විෂමතා නිවැරදි කර ගෙවීම් කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. | තව දුරටත් සංශෝධනය කළ යුතු ලිපිගොනු සංඛ්‍යාව 34 ක් බවත් අදාළ ආයතන විසින් තොරතුරු ලද විගස මෙම විශ්‍රාම වැටුප් ලිපිගොනුවල සංශෝධන කටයුතු අවසන් කරන බවද, | විශ්‍රාම වැටුප් ලිපිගොනු 07 ක විශ්‍රාම වැටුප් සංශෝධනයන් සිදුකර ඇත. තවදුරටත් ලිපිගොනු 27 කට අදාළ විශ්‍රාම වැටුප් සංශෝධනයට අවශ්‍ය උපදෙස් ඉල්ලා 2020 අගෝස්තු 14 දින |

| | | | | |
|---|---|---|---|---|
| | වැටුප් සංශෝධනය කිරීමට නොහැකිවී තිබුණි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් අදාළ ආයතන වෙත මෙම අඩුපාඩු පිළිබඳව වාර්තා කර තිබුණද 2020 මැයි 28 දින වන විටද එම කාර්යයන් අවසන් කිරීමට නොහැකි වී තිබුණි. | | මෙය අපගේ පාලනයෙන් තොර කාරණයක් බවද දන්වා තිබුණි. | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ට ලිපියක් යොමු කර තිබුණද උපදෙස් ලබාදී නොමැත. |
| 05. | හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් දොඩන්දූව පොදු වෙළඳ පොල ඉදි කිරීම සඳහා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාශය මගින් පටුවත ග්‍රාම නිලධාරී වසමේ පිහිටි හෙක්ටයාර් 0.1709 ක් වන මාදරමුල්ල, කුඹුරුඕවිට ඉඩම අත්පත් කර ගැනීමේ කටයුතු 1999 වර්ෂයේදී ආරම්භ කර තිබූ අතර ඉඩම අත්පත් කර ගැනීමට රුපියල් ලක්ෂ 20 ක් ඇස්තමේන්තු කර තිබූ අතර, ඉන් රුපියල් ලක්ෂ 5 ක් පමණක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කර තිබුණි. ඉතිරි මුදල් නොගෙවීම මත වන්දි ගෙවීම ඇතුළුව ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු අතරමග නවතා දමා තිබුණි. | අදාළ පාර්ශවයන් දැනුවත් කර තක්සේරු කර ඇති මුදල් ගෙන්වාගෙන ඉඩම් අත්පත් කර ගෙන අදාළ ඉදිකිරීම් සිදුකිරීමට කටයුතු කළ යුතුය. | ඉඩම අත්පත් කර ගැනීමට අදාළ තක්සේරුගත මුළු මුදල ඉල්ලුම්කාර අමාත්‍යාංශය විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කර නොමැති බැවින් ගොනුවේ ඉදිරි කටයුතු ආරම්භ කිරීමට නොහැකි වී ඇත. | තක්සේරුගත මුදල 2022 පෙබරවාරි දක්වා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කර නොතිබුණු බැවින් ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු අවසන් කිරීමට නොහැකිව තිබුණි. |
| 06. | හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මෝදර පටුවත ග්‍රාම නිලධාරී වසමට අයත් | ඉඩම් අත්පත් කර ගැනීමේ අරමුණු වූ නිවාස යෝජනා | උක්ත ඉඩම අත්පත් කර ගැනීමේ අරමුණ සඳහා භාවිතා නොවන | ඉඩම් අත්පත් කර ගැනීමේ යෝජනාව සංශෝධනය කරන |

| | | | | |
|---|---|---|---|---|
| | හෙක්ටයාර් 0.243 ක් වන පිඹුරුදෙණිය ඉඩම, ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යාංශය මගින් ධීවර නිවාස යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමේ අරමුණ ඇතිව ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 38(ආ) අතුරු විධානය ප්‍රකාරව 1995 වර්ෂයේදී රජය සතු කර ගෙන මේ වන විට වසර 20කට ආසන්න කාලයක් වී තිබුණද, ඉහත අරමුණු ඉටු වී නොතිබුණි. | ක්‍රමය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. | බැවින් ගම් පුළුල් කිරීම යටතේ ඉඩම් නොමැති ජනතාව වෙත බෙදාදීම සඳහා ඉඩම් අමාත්‍යාංශයෙන් ඉල්ලා ඇත. ඉහත අත්පත්කර ගැනීමේ අරමුණ සංශෝධනය කිරීම සම්බන්ධයෙන් නිර්දේශ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය වෙත යොමු කර තිබුණද මෙතෙක් අමාත්‍යාංශය විසින් අරමුණ සංශෝධනය කර එවා නොමැත. | ලෙස ඉඩම් අමාත්‍ය වෙත දන්වා යවා තිබුණද, එය මේ දක්වාම සංශෝධනය කර එවා නොතිබුණි. |
| 07. | හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, කුමාර විදුහල පිහිටා තිබූ ඉඩම සංචාරක ප්‍රවර්ධන කාර්යයන් සඳහා රුහුණු සංචාරක කාර්යාංශය වෙත වසර 30 ක් සඳහා දීර්ඝකාලීන බදු පදනම මත ලබා දීමට 2016 ජූලි 07 ලිපිය මගින් ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් අනුමැතිය ලබා දී තිබුණි. රුහුණු සංචාරක කාර්යාංශය විසින් මෙම ඉඩම 2016 අප්‍රේල් 05 දින සිට වසර 30 ක කාලයක් සඳහා පෞද්ගලික ආයතනයකට | ඉඩම බදු දීමේ අරමුණු ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | විධිමත් අනුමැතියක් නොමැතිව රුහුණු සංචාරක කාර්යංශය බාහිර ආයතනයක් සමඟ අතිකරගත් ගිවිසුමක් මත සිදුකරන ලද ගණුදෙණුවක් බැවින් ඔවුන් ඉවත් කිරීම ගැටළු සහගත තත්වයක් බැවින් ඉදිරි කටයුතු සඳහා උපදෙස් ලබාදෙන ලෙස දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත නැවත ඉල්ලා ඇත. | ඉඩම් ලබාදීමේ අරමුණු ඉටුවන ආකාරයට 2022 පෙබරවාරි දක්වාම කටයුතු කර නොතිබුණි. ප්‍රාදේශීය ලේකම් වෙත මසකට රු.320,000 ක් ගෙවා තිබුණු අතර අනුමැතියකින් තොරව අතුරු බදු දී මසකට රු.350,000 ක් උපයාගෙන තිබුණි. මේ අනුව අතුරු බදුදීම හේතුවෙන් සංචාරක |

| | | | | |
|---|---|---|---|---|
| | අනුමැතියකින් තොරව උප බදු දී තිබුණි. බදු ගිවිසුම 2017 නොවැම්බර් 21 දිනැතිව ලියාපදිංචි කර තිබුණි. පෞද්ගලික ආයතනයකට ඉඩම උප බදු දීමෙන් ඉහත සංචාරක ප්‍රවර්ධන අරමුණු ඉටු නොවන බව අනාවරණය විය. | | | ප්‍රවර්ධන කාර්යයන් සඳහා දීර්ඝකාලීන බදු පදනම මත ලබාදීමේ අරමුණු ඉටුවී නොතිබුණි. තවද නීතියට පටහැනි අතර බදුදීම පිළිබඳ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| 08. (i) | බටගන්විල දිසාපති නිල නිවස ඉදිකර තිබුණු භූමියේ සංරක්ෂණය උදෙසා ගේබියන් බැම්ම ඉදි කිරීමේ කර්මාන්තය කොටස් දෙකකට වෙන්කොට ප්‍රසම්පාදන කාර්යයන් දෙකක් ලෙස කොන්ත්‍රාත්කරුවන්ට ප්‍රදානය කර තිබුණි. 2019 මාර්තු 15 දින ඉහත කර්මාන්තයේ වැඩ අවසන් කර දිස්ත්‍රික් ලේකම් වෙත භාරදී තිබුණි. මෙම ප්‍රසම්පාදන කාර්යයන් ඉහළ සුදුසුකම් සහිත වඩා පලපුරුදු කොන්ත්‍රාත්කරුවන්ට නොපැවරීම, නිසි ප්‍රමිතියෙන් යුතු අමුද්‍රව්‍ය භාවිතා කොකිරීම, හා නුපුහුණු ශ්‍රමය භාවිතා කර තිබීම හේතුවෙන් | ගේබියන් බැම්ම ඉදි කිරීමට ප්‍රථම ස්ථානීය පරීක්ෂාවක් සිදුකර අවශ්‍ය තාක්ෂණය භාවිතා කර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතුය. තවද නිසි ප්‍රමිතියෙන් යුතු අමුද්‍රව්‍ය භාවිතා නොකිරීම සම්බන්ධයෙන්ද අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.<br><br>ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ වාර්තාවේ උපදෙස් පරිදි කටයුතු නොකිරීම සම්බන්ධයෙන් වගකිවයුතු | මෙය වැඩි අවදානමක් සහිත කඩිනමින් ඉටුකළ යුතු ව්‍යාපෘතියක් බැවින්ද තනි ව්‍යාපෘතියක් ලෙස ඉටු කිරීමට වැඩි කාලයක් ගන්නා බැවින්ද ව්‍යාපෘති දෙකක් ලෙස මිල සැඳහුම් ක්‍රමයට ඉටු කරන ලද බව දන්වා තිබුණි. තවද කොන්ත්‍රාත්තුව පවරා ඇති කොන්ත්‍රාත්කරුවන් දෙදෙනාහටම ඉහළ පලපුරුද්දක් ඇති බවත් එවැනි කොන්ත්‍රාත්කරුවන්හට පුහුණු ශ්‍රමිකයන් එකතුවක් පවතින බව දන්වා තිබුණි. තවද භාවිතා කළ අමුද්‍රව්‍ය | 2022 පෙබරවාරි දක්වාම ගේබියන් බැම්මට සිදුවූ හානිය යථා තත්ත්වයට පත් කර නොතිබුණි. රක්ෂණ වන්දි ඉල්ලුම් කර තිබුණද, ඉදි කිරීම් කාලය තුළ සිදුවූ හානියක් නොවන බැවින් රක්ෂණ වන්දි ගෙවීම ප්‍රතික්ෂේප කර තිබුණි. මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වීමට 2020 නොවැම්බර් 16 දින ත්‍රිපුද්ගල කමිටුවක් පත්කර තිබුණද, එම කමිටු වාර්තාවේ නිර්දේශ සම්බන්ධයෙන් විගණනයේදී සැහීමකට පත්විය |

| | | | |
|---|---|---|---|
| 2019 ඔක්තෝබර් 24, 25 දිනවල ගේබියන් බැම්ම හානියට පත්වීම හේතුවෙන් රජයට රු.7,690,295 ක පාඩුවක් සිදුවී තිබුණි. | පාර්ශවයන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතුය. | වල ප්‍රමිතිය සම්බන්ධව විගණනය පෙන්වා දෙන ලද්දේ අතුරණ ලද කළු ගලේ ප්‍රමාණය සුළු වශයෙන් වැඩි වීමක් බවත් ප්‍රායෝගිකව ඉදිකිරීමේදී යොදා ගන්නා ලද ගලේ ප්‍රමාණය සුළු වශයෙන් වෙනස් විය හැකි බවත් මෙම ඉදිකිරීම Gravity Retaining Wall එකක් බැවින් ගලේ ප්‍රමාණය සුළු වශයෙන් වැඩි වීම එහි ස්ථායීතාවයට බලපෑමක් නැති බවත් තවදුරටත් දන්වා තිබුණි. එම හානියට පත් වූ කොටස නැවත යථා තත්ත්වයට පත් කර දෙන බව කොන්ත්‍රාත්කරු ලිඛිතව දන්වා ඇති බවත් තවදුරටත් දන්වා තිබුණි. | නොහැකි විය. කවද මේ සඳහා වගකිවයුතු නිලධාරින් සම්බන්ධයෙන් පරික්ෂණයක් පවත්වා හානි ප්‍රතිපූරණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) පස් වැර ගැන්නුම් සඳහා ටෙරා මෙෂ් භාවිතා කර තිබුණු අතර එය ව්‍යුහාත්මක නිර්මාණය සඳහා තාක්ෂණික | ඇස්තමේන්තුවල දක්වා ඇති පරිදි ප්‍රමාණාත්මක Terra – mesh යොදා ඇති බවට භෞතික සාක්ෂි | 2019 දෙසැම්බර් 03 වන දින විගණන නිළධාරීන් ගේබියන් බැම්ම පරික්ෂා කළ බවත් Terra – mesh | ගෙවීම්වලට අදාළව සියළු ස්ථාන ආවරණය වන පරිදි ටෙරාමෙෂ් යොදා තිබුණේද යන්න |

| | | | | |
|---|---|---|---|---|
| | ක්‍රමවේදයක් බව සඳහන් කර තිබුණි. නමුත් එවැනි ටෙරා මෙෂ් යොදා තිබුණු බවට තහවුරු කෙරෙන සාක්ෂි ඉදිරිපත් නොකෙරුණු බැවින් මේ සඳහා ගෙවා තිබුණු රු.1,018,604 ක මුදල වැඩියෙන් ගෙවීම් ලෙස නිරීක්ෂණය විය. | ඉදිරිපත් කළ යුතුය. | ඉහළ සිට පළමු මට්ටමට යොදා ඉදිකර ඇති බව කාර්මික නිලධාරීන් පෙන්වා දී ඇති බවත් අවශ්‍ය නම් ඉතිරි මට්ටම් වල Terra – mesh යොදා ඇති බව පෙන්වා දිය හැකි බවත් දන්වා තිබුණි. | පිළිගතහැකි සාක්ෂි 2022 දක්වාම ඉදිරිපත් නොකෙරුණි. |
| 09. | 1971 වර්ෂයේ සිට 1991 වර්ෂය දක්වා ඇප තැන්පත් කළ නිලධාරීන් 35 කට අදාළ බැංකු පාස් පොත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තබාගෙන තිබුණි. මෙම ඇප තැන්පත් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට 2020 මැයි දක්වා ම අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | අදාළ පාස්පොත් 35 සම්බන්ධයෙන්ද සුදුසු ක්‍රියාමාර්ග ගැනීමටත් එහි වර්තමාන ප්‍රගතිය විගණනයට දැන්වීමටත් කටයුතු කළ යුතුය. | තොරතුරු සපයා ගත හැකි වූ සියළුම පාස් පොත් අදාළ කාර්යාල වලට යැවීමට කටයුතු කළ අතර, තොරතුරු සොයා ගැනීමට නොහැකි වූ පාස්පොත් 35 ක් මේ දක්වා පවතින බව සඳහන් කර තිබුණි. | ඇප තැන්පත්වලට අදාළ පාස්පොත් 35 ක් මේ දක්වාම තොරතුරු සොයා ගත නොහැකිව කාර්යාලයේ රඳවාගෙන ඇත. |
| 10. | කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2006 වර්ෂයේ සිදු වී තිබුණු චෙක්පත් වංචාව හේතුවෙන් එදින සිට අග්‍රිම ගිණුමේ උද්ගත වී පවතින රු.194,086 ක නොපියවූ ශේෂය, වර්ෂ 14 ක කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද එය නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද පියවර ගෙන | නොපියවූ අග්‍රිම ශේෂය කඩිනමින් පියවීමට කටයුතු කළ යුතුය. | මේ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. | 2021 සැප්තැම්බර් දක්වාම අග්‍රිම ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. නීතිමය ක්‍රියාමාර්ග 2022 පෙබරවාරි දක්වාම අවසන් වී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | නොතිබුණි. | | | |
| 11. | වැඩ තහනම් කර තිබූ නිලධාරියෙකුගෙන් තවදුරටත් අයකරගත යුතු රු.108,248 ක් වර්ෂ 02 සිට 04 ක කාලයක සිට අය නොවී පැවතුණි. | වැඩ තහනම්කර ඇති නිලධාරියාගෙන් අය විය යුතු ණය ශේෂ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඡේදගත නිරීක්ෂණය එලෙසම පවතී. |
| 12. | 2017 වර්ෂයේ ගංවතුරින් ආපදාවට ලක්වූ දේපල සඳහා වන්දිගෙවීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | | |
| | **(i)** 2017 වර්ෂයේ සිදුවූ ගංවතුරින් ආපදාවට ලක්වූ දේපල සඳහා වන්දි ගෙවීමට අදාළ කර ගතහැකි පරිදි වාරිමාර්ග, ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් චක්‍රලේඛ දෙකක් නිකුත් කර තිබුණි. එක් චක්‍රලේඛයක් 2018 මැයි දින රහිතව නිකුත් කර තිබුණු අතර එම චක්‍රලේඛයට අදාළව ආපදාවට ලක් වූ දේපල වෙනුවෙන් රු.100,000 ක උපරිම වන්දි මුදලක් ගෙවිය හැකිව තිබුණි. | එකම කරුණක් සම්බන්ධයෙන් චක්‍රලේඛ දෙකක් නිකුත් කිරීම සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කළ යුතුය. | ආපදා කළමණාකරණ අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති අංක NDRSC/01/04/ 01/2017 හා 2017.06.05 දිනැති ලිපියෙන් ලබා දී ඇති උපදෙස් අනුව 261 වැය ශීර්ෂයේ ගණන් දීමේ නිලධාරී විසින් නිකුත් කර ඇති අංක DSG/SVC/12 /39-2018 හා 2018.06.08 දිනැති උපදෙස් ලිපිය මගින් 2017 මැයි මස ආපදා තත්ත්වයෙන් හානි වූ දේපළ සඳහා වන්දි ගෙවීමට කටයුතු | ඡේදගත නිරීක්ෂණය එලෙසම පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් වන්දි ගෙවීම සඳහා අදාළ කරගෙන තිබුණු චක්‍රලේඛය 2017 ජුනි 05 දින නිකුත් කර තිබුණු අතර එම චක්‍රලේඛයට අදාළව රුපියල් මිලියන 2.5 ක උපරිම වන්දි මුදලක් ගෙවිය හැකිව තිබුණි. ඒ අනුව එම චක්‍රලේඛය උපයෝගී කර ගෙන නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ සිදු කර තිබුණු වන්දි ගෙවීම හේතුවෙන් රු.100,000 කට වඩා වැඩියෙන් වන්දි ගෙවා තිබුණු ව්‍යාපාරිකයින් සංඛ්‍යාව 122 ක් වූ අතර ගෙවා තිබුණු මුදල රුපියල් මිලියන 56.98 ක් විය. මෙසේ එකම කරුණක් සම්බන්ධයෙන් චක්‍රලේඛ දෙකක් නිකුත් කර තිබීම සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කළ යුතුව තිබුණි. | | කර ඇත. | |
| (ii) | වෙන්වෙන්ව ව්‍යාපාරික ස්ථාන දෙකක් පවත්වාගෙන ගිය බවට පිළිගතහැකි ලිඛිත සාක්ෂි නොතිබියදී | වන්දි ගෙවීමට ප්‍රථම ව්‍යාපාරික ස්ථාන දෙකක් ද යන්න තහවුරු කර ගැනීමේ එකම සාක්ෂි සියල්ල | කාර්යාලයීය ව්‍යාපාර නාම ලියාපදිංචි ලේඛනය අනුව ව්‍යාපාර නාම ලියාපදිංචිය ලබාගෙන | ව්‍යාපාරික ස්ථාන දෙකක් පවතින බවට මේ දක්වාම සාක්ෂි ඉදිරිපත් නොවීය. |

| | | | | |
|---|---|---|---|---|
| | ව්‍යාපාරික ස්ථානයක් පවත්වාගෙන ගොස් තිබූ ස්වාමිපුරුෂයා හා බිරිඳ යන දෙදෙනාටම පිළිවෙලින් රු.2,000,000 ක් හා රු.1,521,000 ක් වශයෙන් එකතුව රු.3,521,000 ක වන්දි ගෙවා තිබුණි. | ලබාගෙන ඒ අනුව ක්‍රියා කළ යුතුය. | නොමැති නමුත් බොහෝ කාලයක් තිස්සේ ප්‍රදේශයේ පැවති වෙළඳ ආයතන දෙකක් බව නිරීක්ෂණය වූ බැවින් අලාභය ගෙවීම් කර ඇත. | |
| | (iii) ගංවතුරින් හානි වූ දේපලවලට වන්දි ගෙවීම් යටතේ නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතියට අදාළව ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙතින් රු.243,000 ක් වන්දි ලෙස ඉල්ලීම් කළ පුද්ගලයෙකුට රු.1,266,587 ක් වැඩිපුර වන්දි ගෙවා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව ලබාදී ඇති මාර්ගෝපදේශ වලට අනුකූලව කටයුතු කළ යුතුය. | සාමාන්‍ය පුරවැසියන්ට තක්සේරු කිරීම පිළිබඳ අවබෝධයක් නොමැති බව දන්වා තිබුණු අතර හානි ප්‍රතිපූර්ණය කිරිමට පදනම් කරගනු ලබන්නේ ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථාන 9(V) ආකෘතිය එබැවින් කිසිදු වැඩිපුර ගෙවීමක් සිදු කර නොමැත. | නිවාස කමිටුව මගින් තක්සේරු කිරීමට පදනම් කරගත් තොරතුරු කුමක්ද යන්න නිරීක්ෂණය නොවුණි. |
| 13. | 2020 වර්ෂය සඳහා ගොවීන්ගේ භාරකාර අරමුදලේ ප්‍රදාන යටතේ වූ කෘෂි ව්‍යාපෘති 08 ක් සඳහා රු.3,899,885 ක් ඇස්තමේන්තු කර තිබුණද, කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ප්‍රතිපාදන වෙන් නොකිරීම නිසා එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. | අදාළ ආයතනය මගින් ප්‍රතිපාදන ලබාගෙන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. | එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශයෙන් ප්‍රතිපාදන ලැබී නොමැති බැවින් ක්‍රියාත්මක කිරීම සිදු නොවුණි. | ප්‍රතිපාදන ලබාගැනීමට අවශ්‍ය වාර්තා පිළිබඳව අවධානය යොමු කිරීමක් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් සිදු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 14 | හරිත කෘෂි උද්‍යානයක් ස්ථාපිත කර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.1,500,000 ක යෝජනාවක් කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණද 2020 වර්ෂයේදී ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන වෙන්කර නොතිබුණි. | - එම - | හරිත කෘෂි උද්‍යානයක් ස්ථාපිත කර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලද අතර ප්‍රතිපාදන වෙන් නොවූ බැවින් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | - එම - |
| 15 | 2020 වර්ෂයේ ක්‍රියාකාරී සැලසුම් යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 කින් කෘෂි ව්‍යාපෘති 13 ක් සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් රු.3,153,015 ක ප්‍රතිපාදන ඉල්ලීම් කර තිබුණද අදාළ ප්‍රතිපාදන නොලැබීම නිසා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකිව තිබුණි. | -එම- | එම ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන නොලැබුණු බැවින් ක්‍රියාත්මක කර නැත. | ඡේදගත නිරීක්ෂණය එලෙසම පවතී. |
| 16. | ප්‍රදේශයේ කාබනික ගොවිතැන ප්‍රවර්ධනය සඳහා කාබනික පොහොර නිෂ්පාදනය කිරීමට ඇති විභව හා ගැටළු ඇතුළත් වාර්තාවක් ලබාදෙන ලෙස කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් දන්වා තිබුණු අතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් දිස්ත්‍රික්කයට අදාළ ව්‍යාපෘති යෝජනාවක් රු.12,192,470 | -එම- | ප්‍රතිපාදන වෙන් නොකළ බැවින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ නොහැකි විය. | ඡේදගත නිරීක්ෂණය එලෙසම පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | ක ඇස්තමේන්තුගත වටිනාකමක් යටතේ ඉදිරිපත් කර තිබුණි. ඒ සඳහාද 2020 වර්ෂයේ ප්‍රතිපාදන වෙන්කර නොතිබීම හේතුවෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකිව තිබුණි. | | | |
| 17. | කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් පැවති 2019 මැයි 29 දින රැස්වීම් කමිටුවේ වාර්තාව අනුව වන සතුන්ගෙන් සිදුවන ගැටළු අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග වශයෙන් වායු රයිපල් මඟින් වන සතුන් පලවා හැරීම ඇතුළුව කරුණු 06 ක් සාකච්ඡාකර තිබුණද 2020 දෙසැම්බර් 31 දක්වා එම කාර්යයන් කිසිවක් ක්‍රියාත්මක කර නොතිබුණි. | අමාත්‍යාංශ ලේකම් වරයාගේ තීරණ ක්‍රියාත්මක කිරීමට ගණන්දීමේ නිලධාරීන් කටයුතු කළ යුතුය. | මෙම කාර්යයන් ආරක්ෂක අමාත්‍යාංශය හා කෘෂිකර්ම අමාත්‍යාංශය, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වන ජීවී අමාත්‍යාංශය හා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හා මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් ඉටු කිරීමට ප්‍රමුඛව කටයුතු කළ යුතුය. | 2022 පෙබරවාරි වන විටත් යෝජිත කාර්යයන් සිදු කර නොතිබුණි. |
| 18. | කෘෂිකාර්මික ප්‍රදේශවල වගාවන්ට හානි සිදු කරනු ලබන වන සතුන්ගෙන් වන හානි අවම කිරීම සඳහා තිරසර වැඩපිළිවෙලක් සකස් කිරීමට කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් සියළුම | කෘෂිකාර්මික ජනතාව වෙනුවෙන් තිරසර තීරණ ගත හැකි දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු රැස්වීම් වලට පමණක් සීමා | මෙම ව්‍යාපෘතිය කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක වන බවත්, මෙහි වගකීම් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන වෙත පවරා | 2022 වනවිටත් වන සතුන්ගෙන් වන හානි වැළැක්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | දිස්ත්‍රික් ලේකම්වරුන්ගෙන් තොරතුරු කැඳවා තිබුණු අතර ඒ සඳහා සවිස්තරාත්මක වාර්තාවක් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණි. නමුත් එම ගැටළු සම්බන්ධයෙන් තිරසර වැඩපිළිවෙලක් මේ දක්වා සකස් කර නොතිබුණි. | නොකර එම තීරණ ක්‍රියාත්මක කිරීමට ද කටයුතු කළ යුතුය. | ඇති බවත්, ඊට අදාල ක්ෂේත්‍රගත තොරතුරු කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත යවා ඇති බවත් දන්වා ඇත. | |
| 19. | 2020 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුම් තුනකට අදාළ වර්ෂ 2 ත් 5 ත් අතර හා අවුරුදු 5ට වැඩි නිරවුල් කර නොතිබුණු ගිණුම් ශේෂ වටිනාකම් පිළිවෙලින් රුපියල් මිලියන 93.81 ක් සහ රුපියල් මිලියන 199.37 ක් විය. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571(2) හා (3) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අදාළ ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. | ගණන් දීමේ නිලධාරිගේ අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | 2022 පෙබරවාරි වන විටත් එම තත්ත්වයම පවතී. |
| 20. | ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් සපිරි ගමක් සංවර්ධන වැඩසටහන යටතේ ඇස්තමේන්තුගත වටිනාකම රු.1,000,000 ක් වූ මකුළුව, නො.29 පළමු පටුමගෙහි ඉදිකර තිබුණු පැති කාණුව, ජලය අවසානයට බැසයන ඇල මාර්ගයට සම්බන්ධ වන ආකාරය නිවැරදි මට්ටම් | ශක්‍යතා අධ්‍යනය විධිමත්ව සිදුකර සෞඛ්‍ය ගැටළු ඇති නොවන ආකාරයට ව්‍යාපෘතිය සම්පූර්ණ කළ යුතුය. | මේ ගැටළුව සම්බන්ධයෙන් 2020.12.24 දින ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවති ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී ද සාකච්ඡා වූ අතර නගරාධිපති තුමා විසින් ඉතිරි ව්‍යාපෘති කොටස සම්පූර්ණ කර | 2022 පෙබරවාරි වන විටත් එම තත්ත්වයේම පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | (Level) ගෙන සම්පූර්ණ කර නොතිබුණු බැවින් මෙම ව්‍යාපෘතිය සෞඛ්‍ය ගැටළු රාශියක් ඇති කරන අසම්පූර්ණ ව්‍යාපෘතියක් වී තිබුණි. | | පැන නැගී ඇති ගැටළුව විසඳන බවට පොරොන්දු වී ඇත. | |
| 21. | මහා භාණ්ඩාගාර ඒකාබද්ධ කළමනාකරණ පද්ධති වැඩසටහන (Intergrated Treasury Management System) යටතේ කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මුදල් අමාත්‍යාංශය මගින් 2018 නොවැම්බර් 11 දින පරිගණක 06 ක් ලබා දී තිබුණද 2021 අප්‍රේල් 30 දින දක්වාම වැඩසටහන ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් එම පරිගණක සඳහා දරා තිබුණු වියදම අනාර්ථික වී තිබුණි. | භාණ්ඩාගාර ලේකම් වරයාගේ උපදෙස් පරිදි අදාළ ව්‍යාපෘතිය කාර්යක්ෂමව ක්‍රියාවට නැංවීමට කටයුතු කළ යුතුය. | මහාභාණ්ඩාගාර ඒකාබද්ධ කළමනාකරණ පද්ධති වැඩසටහන කඩිනම්ව ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත. | 2022 පෙබරවාරි දක්වාම අදාළ වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබුණි. |
| 22. | ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉඩම් නොමැති ජනතාවට ඉඩම් ලබාදීමේ ව්‍යාපෘතිය යටතේ බෙදාහැර තිබූ ඉඩම් වෙනුවෙන් අදාල ප්‍රතිලාභීන් වෙත ලබාදීමට පිළියෙල කරන ලද දීමනා පත්‍ර 445 ක්, බෙදා දීමට නොහැකිව වර්ෂ 38 ක කාලයක සිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි රඳවාගෙන | දීමනා පත්‍ර සම්බන්ධයෙන් ඒ ඒ කාලයන් තුළ බෙදා හැරීම සිදු කළ යුතු අතර දීමනා පත්‍ර ලාභීන් හඳුනාගෙන ඔවුන්ට දීමනා පත්‍ර ප්‍රදානයට කටයුතු කළ යුතුය. | දීමනා පත්‍රකරුවන් ඉදිරිපත් නොවීම මෙම දීමනාපත්‍ර සම්බන්ධව කටයුතු කිරීමට ගැටළුවක් වී ඇත. | දීමනා පත්‍රකරුවන් හඳුනාගෙන ඒවා ලබා දීමට 2022 පෙබරවාරි දක්වාම කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | තිබුණි. එම දීමනා පත්‍ර ජනාධිපතිවරයා විසින් 1982 – 2009 අතර කාලච්ඡේදය තුළදී අත්සන් කර තිබුණ අතර දීමනා පත්‍ර 02 ක් අත්සන් කර නොතිබුණි. ඉහත දීමනා පත්‍ර අතුරින් දීමනා පත්‍ර 142 ක් ඉඩම් රෙජිස්ටාර් කාර්යාලයේ ලියාපදිංචි කර තිබූ අතර දීමනා පත්‍ර 303 ක් ලියාපදිංචි කිරීමේ කටයුතුද සිදුකර නොතිබුණි. | | | |
| 23. | නියාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම් අංශයේ 1987 හා 1997 කාලපරිච්ඡේදය තුළ දීමනාපත්‍ර ලාභීන්ට බෙදාදිය නොහැකිව දීමනා පත්‍ර 384 ක් කාර්යාලයේ රඳවාගෙන තිබුණු අතර ඒ අතුරින් දීමනාපත්‍ර 26 ක් නිසි අධීක්ෂණයක් නොමැති වීම හා වෙනත් කළමනාකරණ දුර්වලතාවයන් හේතුවෙන් දෙවරක් සකස් වී තිබුණි. තවද 1987 සිට 1997 කාලපරිච්ඡේදය තුළ නිකුත් කර තිබුණු දීමනාපත්‍ර 14 ක් 2021 පෙබරවාරි 05 දක්වාම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කර නොතිබුණි. | - එම - | කෙටි කලකින් විසඳුම් ලබා දීමට අපහසු දීමනාපත්‍ර සම්බන්ධයෙන් මෙම වසර අවසාන වීමට පෙර කටයුතු කිරීමට අපේක්ෂා කරන බවත් බලපත්‍ර 9 ක් ප්‍රතිලාභීන් වෙත කඩිනමින් ලබාදීමටත් කොවිඩ් තත්ත්වය හේතුවෙන් කාර්යයන් කිරීමේ ප්‍රතිශතය අඩුවී ඇති බවත් තවදුරටත් දන්වමි. | - එම - |

| | | | |
|---|---|---|---|
| 24. **Covid-19 වසංගත හේතුවෙන් සහනාධාර ගෙවීම.**<br>---------------------------------<br>දිස්ත්‍රික් ලේකම් යටතේ පවතින දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා වෙනත් අංශවලින් Covid-19 වසංගතය හේතුවෙන් ජීවනෝපාය අහිමි වීම ඇතුළුව විවිධ වර්ගීකරණයන් යටතේ සහනාධාර ලබා දීම සම්බන්ධයෙන් සිදු කළ සෝදිසි පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය. | | | |
| (i) Covid-19 වසංගතය හේතුවෙන් මුදල් සහනාධාර ලබා දීම සඳහා 2020 මැයි මාසය අවසන් වන විට ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල 19 හා ඒ යටතේ පිහිටුවා ඇති සමෘද්ධි බැංකු 68 ක් වෙත සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් එවා තිබුණු මුළු මුදල රුපියල් මිලියන 2,382.65 ක් විය. ඉන් රුපියල් මිලියන 308.44 ක් ආපසු යවා තිබුණි. ඒ අනුව ශුද්ධ | සමෘද්ධි බැංකු කටයුතු බාධාවකින් තොරව පවත්වා ගෙන යාමට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත අයවිය යුතු රු.483,560,780 ක් වූ මුදල කඩිනමින් ප්‍රතිපූර්ණය කරගත යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නැත. | 2022 පෙබරවාරි වන විටත් සමෘද්ධි බැංකු සංගම්වලින් ගෙවා තිබූ රු.මිලියන 483.56 ක මුදල ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| වශයෙන් ලැබී තිබුණු මුදල රුපියල් මිලියන 2,074 ක් වී තිබුණු අතර මුළු ගෙවීම් රුපියල් මිලියන 2,557.77 ක් වී තිබුණු බැවින් සමෘද්ධි බැංකු සංගම්වල අරමුදල් වලින් රුපියල් මිලියන 483.56 ක් ප්‍රතිලාභීන්ට ගෙවා තිබුණි. ඒ අනුව එම මුදල සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණය කරගත යුතුව තිබුණි. | | | |
| (ii) බලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 86 - ඩී ආඳාදොළ ග්‍රාම නිලධාරී වසමෙහි පුද්ගලයින් 17 දෙනෙක් සඳහා එක් වටයකදී රු.5,000 බැගින් පදනම් 02 ක් යටතේ එකතුව රු.170,000 ක් ගෙවා තිබූ බැවින් එම පුද්ගලයන් 17 දෙනාට පමණක් රු.85,000 ක් වැඩියෙන් ගෙවා තිබුණි. | covid ප්‍රතිලාභ ගෙවීම එක් පදනමක් තෝරාගෙන ඒ සඳහා පමණක් සිදු කළ යුතුය. | ප්‍රතිලාභීන් හඳුනාගැනීමේදී ආබාධිත හා වැඩිහිටි මහලේකම් කාර්යාලවලින් ලබා දෙන ප්‍රතිලාභී හිමිකම සැලකිල්ලට නොගෙන කටයුතු කල යුතු බවට උපදෙස් ලබා දී ඇති බවත් ඒ අනුව ගෙවීම් කර ඇති බවත් දන්වමි. | වැඩියෙන් ගෙවන ලද රු.85,000 ක මුදල 2022 පෙබරවාරි දක්වාම අයකරගෙන නොතිබුණි. |
| (iii) කඩවත්සතර හා අක්මීමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාළව covid 19 යටතේ ප්‍රතිලාභ නොලැබීම සම්බන්ධයෙන් 2020 මැයි 01 දින සිට 2020 මැයි 27 දින දක්වා | සුදුසුකම්ලත් ප්‍රතිලාභීන්ට කාලීනව නියමිත covid ප්‍රතිලාභ ගෙවිය යුතුය. | ගෙවීම් කිරීම සඳහා නිර්දේශය ලැබී තිබුණද ප්‍රතිපාදන හා මුදල් නොලැබීම හේතුවෙන් මේ වනතෙක් ගෙවීම් කර නැත. | 2022 පෙබරවාරි දක්වාද අභියාචනා සඳහා covid ප්‍රතිලාභ ගෙවා නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ලැබී තිබුණු අභියාචනා එකතුව 41 ක් සඳහා ගෙවීම් කිරීමට කමිටු නිර්දේශය ලැබී තිබුණු අතර 2021 අප්‍රේල් 30 දින වන විටත් දීමනා ගෙවා නොතිබුණි. | | | |
| | (iv) ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් තලාපිටිය ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ covid 19 ප්‍රතිලාභ ගෙවීමේදී අප්‍රේල් හා මැයි මාස වලදී ද්විත්ව පදනමක් මත පුද්ගලයන් 25 දෙනෙකුට ප්‍රතිලාභ ගෙවීම හේතුවෙන් එකතුව රු.250,000 ක් වැඩියෙන් ගෙවා තිබුණි. | covid ප්‍රතිලාභ ගෙවීම කිසියම් එක් පදනමක් තෝරාගෙන ඒ සඳහා පමණක් සිදු කළ යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පුද්ගලයන් 25 දෙනෙකුට මසකට රු.10,000 බැගින් පදනම් දෙකක් යටතේ වැඩිපුර ගෙවීම 2022 පෙබරවාරි දක්වාම අයකරගෙන නොතිබුණි. |
| 25. | සමෘද්ධි නිලධාරියකු දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ දිවිනැගුම සංවර්ධන නිලධාරී තනතුරෙහි පත්වීම් ලිපියේ කොන්දේසි නොසලකා හැර නිලධාරියාට නිත්‍ය තනතුරෙහි රාජකාරියට හිමි වැටුපට අතිරේකව දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ මාසික සභාපති දීමනාව, ඉන්ධන දීමනාව සමඟ දුරකථන දීමනාවක්ද වශයෙන් සංවර්ධන අධිකාරියේ සභාපති තනතුරට පත්වූ දින සිට 2020 | පත්වීමේ ලිපිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | විගණන නිරීක්ෂණ හා එකඟවෙන බව දන්වා තිබුණි. | සභාපතිධූරයට පත්වීමට අනුමැතිය ලැබීමට පෙර සභාපතිවරයාට හිමි දීමනා ලෙස ලබා ගන්නා ලද රු.654,729 ක මුදල 2022 පෙබරවාරි දක්වාම අය කරගෙන නොතිබුණි. |

ජූනි මාසය දක්වා අවිධිමත් පරිදි සභාපති තනතුරට හිමි දීමනා වශයෙන් එකතුව රු.654,729 ක් ගෙවා තිබුණි.

**මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

---

2018 - තත්ත්වාගණනය කළ මතය

2019 - තත්ත්වාගණනය කළ මතය

2020 - තත්ත්වාගණනය කළ මතය

| විගණකාධිපති වාර්තාවේ ඇතුළත් ප්‍රධාන අඩුපාඩු | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| 01. 2018 වර්ෂය වෙනුවෙන් විමධ්‍යගත වැඩසටහන් 11 ක් සඳහා රු.8,505,000 ක ප්‍රතිපාදන සලසා තිබුණි. 2018 දෙසැම්බර් 31 දින වන විට රු.7,911,281 ක වැඩසටහන් ක්‍රියාත්මක කර තිබුණි. ප්‍රතිපාදන රු.596,800 ක් සලසා තිබුණු එක් වැඩසටහනක් පමණක් අවිච්ඡේද වී තිබුණි. මේ සම්බන්ධයෙන් සිදු කළ විගණනයේදී පහත සඳහන් අඩුපාඩුව අනාවරණය විය. | | | |
| (i) මාතර මැද්දවත්ත වී ගබඩාව අළුත්වැඩියා කිරීම සඳහා මාතර දිස්ත්‍රික් ලේකම් වෙත 2017 අගෝස්තු 22 දින වී අලෙවි | විශ්වවිද්‍යාල විද්‍යායතනයේ විරෝධතාවය පිළිබඳව ඔවුන් සමඟ එකඟතාවයකට | 2019 අප්‍රේල් මාසයේදී වී අලෙවි මණ්ඩලයෙන් ලද රු.3,000,572 ක මුදලින් | විශ්වවිද්‍යාල විද්‍යායතනයේ විරෝධතාවය හේතුවෙන් අළුත්වැඩියා කටයුතු |

| | | | | |
|---|---|---|---|---|
| | මණ්ඩලය මගින් රු.2,198,354 ක අත්තිකාරම් ලබාදී තිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ප්‍රසම්පාදන කටයුතු සිදුකර පුද්ගලික ආයතනයක් වෙත රු.9,841,705 කට (එකතු කළ අගය මත බදු රහිත) කොන්ත්‍රාත්තුව පිරිනමා 2017 නොවැම්බර් 22 දින රු.1,968,342 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගෙවා තිබුණි. ඊට යාබදව පිහිටි විශ්වවිද්‍යාල විද්‍යායතන සිසුන්ගේ විරෝධතාවයක් නිසා 2018 ජනවාරි මාසයේ සිට අළුත්වැඩියා කටයුතු නතර කර තිබූ අතර ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ගයක් අනුගමනය නොකර අළුත්වැඩියා කටයුතු නතර කර තිබුණි. | පැමිණ සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි. | කොන්ත්‍රාත්කරුට ගෙවියයුතු මුදල පියවීමටත් එහිදී ලබාදුන් අත්තිකාරම් මුදල අයකර ගැනීමටත් හැකිවන බව දක්වා ඇත. | අතරමඟ නතර වී ඇති අතර මෙම ගොඩනැගිල්ල ප්‍රයෝජනයකින් තොරව පවතී. |
| 02. | 1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබාගැනීමේ) පනතට අනුකූල ඉඩම් නියෝග 175 සහ 179 ප්‍රකාරව රජයේ ඉඩම් හඳුනාගෙන ලේඛනගත කිරීම හෝ සිතියම් හඳුනා ගැනීමක් සහිත දත්ත පද්ධතියක් සකස්කර පවත්වාගත යුතුව | 1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබාගැනීමේ) පනත ප්‍රකාරව රජයේ ඉඩම් නිශ්චිතව හඳුනාගෙන ලේඛනගත කිරීමට කටයුතු කළයුතුය. | ලේඛන සකස් කර පවත්වාගෙන යාම හා යාවත්කාලීන කිරීම කෙරෙහි අවධාරණය කරන මෙන් ප්‍රාදේශීය ලේකම් සාකච්ඡාවේ දී ප්‍රාදේශීය ලේකම් වරුන් දැනුවත් කිරීමට කටයුතු කර ඇත. | රජයේ ඉඩම් හා අළුතින් හඳුනාගත හැකි ඉඩම් සම්බන්ධ සියළු දත්ත ඇතුළත් වාර්තාවක් (තොරතුරු, සිතියම් කණ්ඩාංක, යෝග්‍යතාවය, Google map) |

| | | | | |
|---|---|---|---|---|
| | තිබුණි. නමුත් මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ මාතර හා තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල එසේ කටයුතු කර නොතිබුණි. | | | පිළියෙල කරමින් පවතී. |
| 03. | ඉඩම් නියෝග අංක 180 යටතේ ග්‍රාම නිලධාරීන් වෙත පැවරෙන වගකීම් ඉටුකිරීමෙහිලා රජයේ ඉඩම් නිශ්චිතව හඳුනා ගැනීමට අදාළ දත්ත පද්ධතියක් පවත්වා නොතිබුණි. මේ නිසා අනවසර අල්ලා ගැනීම් හා ගොඩකිරීම් සම්බන්ධව වාර්තා කිරීම ආදී කාර්යයන් මන්දගාමීව ඉටු කර තිබුණි. | ඉඩම් නියෝග අනුව කටයුතු කළ යුතුය. | ඉඩම් සම්බන්ධ කටයුතු ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමෙන් සිදු කරන අතර, විගණන විමසුමෙහි දක්වා ඇති අඩුපාඩු සම්බන්ධයෙන් අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත. | 2022 පෙබරවාරි වනවිටත් රජයේ ඉඩම් නිසි පරිදි හඳුනා ගැනීම අවසන් වී නොමැත. |
| 04. | මාතර හා තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා සකසන ලද වාර්තාවල හඳුනාගත් රජයේ ඉඩම් ලෙස නම්කර තිබුණු ප්‍රමාණයෙන් එකතුව අක්කර 38 ක් පමණ වූ ඉඩම් 13 ක් සම්බන්ධයෙන් පසු විපරම් සිදුකර ඉඩම් සංරක්ෂණය, ආරක්ෂණ කටයුතු සඳහා සහ ඵලදායීව යෙදවීමට පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි. ඇතැම් ඉඩම් අනවසර ලෙස පරිහරණයන්ට ලක්වී තිබුණි. | හඳුනාගත් රජයේ ඉඩම් සම්බන්ධයෙන් පසු විපරම් කර සංරක්ෂණය හා ආරක්ෂණය සිදුවන පරිදි කටයුතු කළ යුතුය. | මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මේ සම්බන්ධයෙන් අදාළ නිලධාරීන් දැනුවත් කර ඇති අතර, එම අඩුපාඩු ඉදිරියට ඇති නොවන පරිදි කටයුතු කිරීමට සටහන් කර ඇත. | 2022 පෙබරවාරි වනවිටත් ඉඩම් 10 ක් එම තත්ත්වයේම පවතී. |
| 05. | මාතර ප්‍රාදේශීය ලේකම් | දීර්ඝකාලීන බදුකර | මෙම ඉඩම් සම්බන්ධව | 2022 පෙබරවාරි |

| | | | | |
|---|---|---|---|---|
| | කාර්යාලයේ රජයේ ඉඩම් දීර්ඝකාලීන බදු පදනම මත ලබාදීමේදී, අවස්ථා 10 කට අදාළව 2008 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ඉඩම් පරිහරණයන් සිදුකිරීම් ආරම්භ කර තිබුණද, ඉඩම් සම්බන්ධයෙන් දීර්ඝකාලීන බදුකර සැකසීම් 2018 සැප්තැම්බර් 30 දින වනවිටත් නිමකර නොතිබුණි. මේ නිසා එම ඉඩම්වලින් රජයට උපයාගත හැකිව තිබූ ආදායම් අහිමි වී තිබුණි. | සැකසීමේ කාර්යය නිසි අධීක්ෂණයකින් කාලීනව ඉටු කිරීම තුළින් ඉඩම්වලින් රජයට උපයාගත හැකි ආදායම් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | ඉදිරි කටයුතු සිදුකරමින් පවතී. | දක්වාම මෙම බදුකර ලබාදීම සිදුකර නොමැත. |
| 06. | තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ ඉඩම් රජයට අත්පත් කර ගැනීම් සම්බන්ධයෙන් වූ තෙළඹුගහහේන, බුලේඋඩුකරහේන, පුංචිකන්දහේන සහ තැන්නහේන ඒකාබද්ධ ඉඩම ප්‍රමාණයෙන් හෙක්ටයාර් 2.5184 ක් වී තිබුණි. එම ඉඩම් අත්පත් කර ගැනීම සඳහා 2011 ජූලි 29 දිනැති අත්පත් කර ගැනීමේ පනතේ 2 වගන්තිය යටතේ දැන්වීම් නිකුත් කර 38(අ) අතුරු විධානය යටතේ 2012 මැයි 25 දින ගැසට් පත්‍රයේ නිවේදනයක් නිකුත් කර තිබුණි. 2018 පෙබරවාරි 07 | ඉඩම් සම්බන්ධ කාර්යයන් සිදුකිරීමේදී කාලීනව පසු විපරම් සිදුකර කඩිනම් ක්‍රියා මාර්ග ගත යුතුය. | අත්පත් කර ගැනීමට යෝජිත ඉඩමට මූලික සැලැස්ම හා කට්ටි විස්තර ලබා ගැනීම සඳහා 2019 ජනවාරි 24 දින මැනුම් ඉල්ලීමක් මැනුම් අධිකාරි වෙත යොමුකර ඇති බව දක්වා ඇත. | 2022 පෙබරවාරි වනවිටත් එම තත්ත්වයේම පැවතුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | දින වන විටත් මෙම ඉඩම අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය අවසන් කර නොතිබුණි. | | | |
| 07. | මාතර දිස්ත්‍රික්කයේ වැලිගම, අකුරැස්ස, මාතර, මුලටියන හා කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල යටතේ වසා දැමූ පාසල් 10 ක් ද මාතර, මුලටියන, මාලිම්බඩ හා අතුරලිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල යටතේ භාවිතා නොකරන ලද කාර්යාල හා නිළ නිවාස 06 ක් ද වැලිපිටිය, වැලිගම, කිරින්ද පුහුල්වැල්ල හා මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල යටතේ පේෂකර්මාන්ත අක්‍රියවීම හේතුවෙන් එහි පැවති ගොඩනැගිලි 05 ක් ද වැලිගම, වැලිපිටිය, මාතර හා කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාල යටතේ ඉදිවෙමින් පැවති ප්‍රජාශාලා 10 ක් ද, වැලිපිටිය හා මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල යටතේ පැවති එකතුව අක්කර 05 ක් වූ ඉඩම් 02 ක් ද, මුලටියන, මාතර හා පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල යටතේ පිළිවෙලින් බහුකාර්ය ගොඩනැගිල්ලක්, සතිපොළ | ප්‍රාදේශීය ලේකම් කාර්යාල යටතේ වන රජයේ ඉඩම් හා ගොඩනැගිලි හඳුනාගෙන ඒ සම්බන්ධව කාලීනව කටයුතු කර අදාළ වත්කම් ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. | තොරතුරු ලබාදෙන ලෙස ඉඩම් සම්බන්ධයෙන් ඉඩම් අංශය වෙත ද, ගොඩනැගිලි සම්බන්ධයෙන් පරිපාලන නිලධාරි වෙත ද උපදෙස් ලබාදී ඇති බව දක්වා ඇත. | 2022 පෙබරවාරි වනවිටත් වසා දමන ලද පාසල් 10 ක්, නිවාස 06 ක්, ගොඩනැගිලි 05 ක්, ප්‍රජාශාලා 10 ක්, ඉඩම් 02 ක් සහ ගොඩනැගිලි හා ඉදිකිරීම් ව්‍යාපෘති 06 ක් එම තත්ත්වයේම පැවතුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | 02 ක්, මාතෘ සායනයක් ද, මුලටියන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ පැවති "ළඟම පාසල හොඳම පාසල" යටතේ ඉදිකිරීම් ව්‍යාපෘති 02 ක් ද 2018 දෙසැම්බර් 31 දින වනවිට භාවිතයෙන් තොරව නිෂ්ක්‍රියව පැවතුණි. | | | |
| 08. | හක්මණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් රජයේ ඉඩමක් 1996 වර්ෂයේ සිට සමුපකාර සමිතියක් විසින් බුක්ති විඳින අතර බදු ගිවිසුම කාලීනව සංශෝධනය නොකිරීම හා දීර්ඝකාලීන බදුකරය සකස් නොකිරීම හේතුවෙන් රජයට බදු ආදායම් අහිමි වී තිබුණි. මිනින්දෝරු වාර්තාව අනුව අනවසර පදිංචිකරුවන් 04 දෙනෙකු ඉඩමේ කොටසක් බුක්ති විඳින බව දක්වා ඉන්පසු ගොනුව අක්‍රීයව පැවතුණි. | කාලීනව බදු ගිවිසුම සංශෝධනය කළ යුතු අතර දීර්ඝකාලීන බදුකර නියමිත දිනට සකස් කර බදු ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුය. එසේම අනවසර පදිංචිකරුවන් සම්බන්ධයෙන් ද කඩිනමින් ක්‍රියා කළ යුතුය. | මෙම අනවසර අල්ලා ගැනීම් සිදු වන්නේ ස.ණ.ස. සංගමය වෙත ඉඩමේ භුක්තිය ලබා දීමෙන් අනතුරුව වන බැවින් එම සංගමයේ සමානාධිකාරී සමග සාකච්ඡා කර බදු ඔප්පු කෙටුම්පතෙහි සඳහන් ඉඩම් ප්‍රමාණය සංශෝධනය කිරීමට හා අනවසරකරුවන් පිළිබඳව තීරණයක් ගැනීමට ඉදිරියේ දී කටයුතු කරන බව හක්මණ ප්‍රාදේශීය ලේකම් වාර්තා කර ඇත. | 2022 පෙබරවාරි වනවිටත් එම තත්ත්වයේම පවතී. |
| 09. | දෙවිනුවර පැරණි ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල රජයේ ඉඩම් ආඥා පනතේ නියෝග 191(2) ට අනුකූල නොවන ලෙස, | රජයේ ඉඩම් සම්බන්ධව කටයුතු කිරීමේදී ඉඩම් ආඥා පනතේ නියෝග සෑමවිටම අනුගමනය | මෙම කටයුතුවලට අදාළ ලිපි අමාත්‍යාංශය වෙත යොමුකොට ඇත. | 2022 පෙබරවාරි වනවිටත් බදු අයකර ගැනීමේ කටයුතු හෝ ඉඩම පවරාදීමේ කටයුතු සිදුවී |

| | | | | |
|---|---|---|---|---|
| | 1997 ඔක්තෝබර් 04 දින සමුපකාර සමිතියකට ගිවිසුමක් මගින් බදු දී සංශෝධිත බදු මුදල් ගෙවීමට අපොහොසත් වීම මත 2019 මාර්තු 30 දිනට රු.6,910,183 ක ආදායම් හිඟව පැවතුණ ද දීර්ඝකාලීන බදුකරයක් සකස් කර නොතිබුණි. | කළ යුතුය .ඒ අනුව බදු ගිවිසුම සැකසීමේදී ඉඩම් කොමසාරිස්වරයාගේ අනුමැතිය ලබාගත යුතු අතර පවතින බදු ගිවිසුම කාලීනව සංශෝධනය කර බදු මුදල් නියමිත පරිදි අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | | නොමැත. |
| 10. | මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රිට්රිට් වත්ත ඉඩමේ පර්චස් 10 බැගින් වූ ඉඩම් කට්ටි 22 ක් කර්මාන්තකරුවන් වෙත බෙදා දී තිබූ අතර එක් කර්මාන්තකරුවෙකු ඉතිරි ඉඩම් කොටස් ද ලබාදෙන ලෙස ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් ඉල්ලීමක් කර මැනුම් කටයුතු සඳහා රු.57,500 ක් ගෙවා තිබුණ ද 2017 වර්ෂයේ එම ආයතනය වසා දමන තෙක් දීර්ඝකාලීන බදුකර සකස් කර නොතිබුණි. | රජයේ ඉඩම් සම්බන්ධව කටයුතු කිරීමේදී කාලීනව බදු ගිවිසුම් සකස් කර රජයට අයකර ගත යුතු බදු ආදායම් රැස්කර ගත යුතුය. | දීර්ඝකාලීන බදුකරයක් සැකසීම සඳහා ආයතන 04 ක එකඟතා ලබාගත යුතු වුවත් නාගරික සංවර්ධන අධිකාරියේ නිර්දේශ පමණක් ලැබී ඇති බවත් මෙම ඉඩම ප්‍රාදේශීය සභාව සතු බැවින් බිම් බදු අයකිරීමට කටයුතු කර ඇති බවත් දක්වා ඇත . | දැනට මෙම ආයතනය වසා දමා ඇති බැවින් එම ආයතනය වෙනුවෙන් වූ මැනුම් නියෝගය අවලංගු කර ඇති අතර, ඉඩම අනවසර පරිහරණයෙන් ඉවත් කර ගැනීමට කර්මාන්ත අමාත්‍යාංශයේ අනුමත කර්මාන්ත සඳහා දීර්ඝකාලීන බදුකර යටතේ ඉඩම ලබා දීමට කටයුතු කරමින් පවතී.<br>බදු අනුමැතිය ලබා ගැනීම ප්‍රමාද වීමට ඉඩ ඇති බැවින් දැනට කර්මාන්තකරුවන්ගේ ඉල්ලීම පිට දීර්ඝ කාලීන බදුකරය |

| | | | | |
|---|---|---|---|---|
| | | | | සකස් කරන තෙක් දකුණු පළාත් ඉඩම් කොමසාරිස්ගේ අනුමැතිය යටතේ වාර්ෂික බලපත්‍ර ලබාදී ඇති අතර තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලද තක්සේරුවට අනුව වාර්ෂික බදු මුදල් අයකර ගනී. |
| 11. | වසා දමන ලද මාර/වේරදුව බණ්ඩාරනායක විදුහල් භූමිය 2012 පෙබරවාරි 15 දින වෘත්තිය පුහුණු මධ්‍යස්ථානයක් සඳහා විහාරස්ථානයක් වෙත පවරා දීමේදී රජයේ ඉඩම් ආඥා පනතේ නියෝග අංක 200 ට අනුකූලව කටයුතු කර නොතිබුණු අතර විගණිත දිනය දක්වාම වෘත්තිය පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවා නොතිබුණි .විහාරස්ථානය සහ චීන සමාගම විසින් ඇතිකරගත් බදු ගිවිසුම් 02 හි කොන්දේසි අංක 02 අනුව බදුකුලී ගෙවීමක් සිදු නොකරන බව දක්වා තිබූ අතර මුල් බදු ගිවිසුම මේ දක්වාම විගණනයට ඉදිරිපත් නොකෙරුණි විගණනයෙන් පසුව ප්‍රාදේශීය ලේකම්වරයා | රජයේ ඉඩම් සම්බන්ධව කටයුතු කිරීමේදී රජයේ ඉඩම් නියෝග අනුගමනය කළයුතු අතර නිවැරදි බදු ගිවිසුම් සකස් කර ඒ අනුව බදු ආදායම් රැස්කිරීමට ක්‍රියා කළ යුතුය. එසේම කඩිනමින් හිඟ බදු අයකර ගැනීමට ද කටයුතු කළ යුතුය. | මෙවැනි අවිධිමත් ක්‍රියාවලින් වැලකීමට කටයුතු කරන ලෙස උපදෙස් දී ඇත. | වේරදූව බණ්ඩාරනායක විදුහලට අදාළව තක්සේරු දෙපාර්තමේන්තුවට දන්වන ලද සියළුම හිඟ මුදල් අයකර ඇති අතර දුම්රිය ව්‍යාපෘතිය අවසන් වී ඇති බැවින් චීන සමාගම වෙතින් භුක්තිය තමා වෙත භාරගෙන දැනට සන්රු සමාගමට වාර්ෂික බදුකරයක් යටතේ එම ඉඩම ලබා දීමට කටයුතු සිදු කරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | වෙත විහාරාධිපති හිමි රු.895,000 ක් ගෙවීම් කර තිබුණ ද තවත් රු.1,790,000 ක් අයවීමට පැවතුණි. | | | |
| 12. | 2017, 2018 හා 2019 වර්ෂවල පවුල් 294 ක් නැවත පදිංචි කිරීම් වෙනුවෙන් වැය විෂයය අංක 130-02-08-12-2202 යටතේ 2019 දෙසැම්බර් 31 දිනට එකතුව වූ රු.361,933,604 ක වියදමක් දරා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | | |
| | (i) මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ඉඩමක් මිලදී ගැනීම සඳහා ප්‍රතිලාභියෙකු වෙත රු.400,000 ක් ලබාදී තිබුණි. එසේම තවත් ප්‍රතිලාභියෙකුට ලබාදුන් ආධාරවලින් ඔහුගේ පුතාගේ ඉඩම රු.400,000 කට මිලදී ගෙන නිවස ඉදිකිරීම වෙනුවෙන් තවත් රු.500,000 ක් ද ලබා ගෙන තිබුණි. එසේ වුවද මෙම ප්‍රතිලාභීන් දෙදෙනාම 2019 දෙසැම්බර් මස වනවිටත් නිවාස ඉදිකිරීම් හා අවදානම් ස්ථානයෙන් | මූල්‍යාධාර ලබාදීමේදී ප්‍රතිලාභියාට සහන සැලසීම මෙන්ම මුදල් රෙගුලාසි සම්බන්ධයෙන් ද අවධානය යොමුකළ යුතු අතර ආධාර ලබාදුන් අරමුණ ඉටුවී තිබේද යන්න පරීක්ෂා කළ යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2022 පෙබරවාරි වනවිටත් එම තත්ත්වයේම පැවතුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ඉවත්වීම සිදුකර නොතිබුණි. | | | |
| (ii) | මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ එක් පුද්ගලයකුගේ නිවස, භූ විද්‍යා සමීක්ෂණ වාර්තාව අනුව අළුත්වැඩියාවන් සිදුකර නැවත භාවිතයට නිර්දේශ ලබාදී තිබුනද මධ්‍යම නායයාම් අවදානම් සහිත වෙනත් ඉඩමක් මිලදී ගැනීම සඳහා රු.1,600,000 ක් ලබාදී තිබුණි. | භූ සමීක්ෂණ වාර්තාවල ලබාදී තිබූ නිර්දේශ අනුව කටයුතු කළ යුතුය. | නිවසෙහි පදිංචිකරුවන් පදංචි වී තිබුණද අනුකූලතා සහතිකය මේ වනතුරු ලබාදී නොමැත. | මෙම නිවස ඉදිකිරීම සඳහා සියළුම මුදල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් නිදහස් කර ඇත. |
| (ii) | දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැනැත්තෙකු වෙත නිවසක් සහිත ඉඩමක් මිලදී ගැනීම සඳහා රු.1,558,000 ක් ලබාදී තිබුණ ද මිලදී ගත් ඉඩමේ ඔප්පුව විගණනයට ඉදිරිපත් නොවුණි. | ප්‍රතිලාභියාට ලබාදුන් ආධාර වෙනුවෙන් අවශ්‍ය මූලික ලේඛන නිවැරදිව ලබාගත යුතුය. | ඔප්පුව ඇතුළත් කර ගොනුව සකස් කරන ලෙස උපදෙස් ලබාදී තිබුණි. | 2022 පෙබරවාරි වනවිටත් ඔප්පුව විගණනයට ඉදිරිපත් නොවුණි. |
| 13. | පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව පස්මහල් ගොඩනැගිල්ල ඉදිකිරීම. | | | |
| (i) | ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා කණ්ඩිය කැපීම හේතුවෙන් නායයෑමේ අවදානමක් පවතින බවට ජාතික | භූ සමීක්ෂණ වාර්තාවේ දක්වා ඇති ක්‍රියා මාර්ග අනුගමනය කළ යුතුය. | පස් කණ්ඩි කඩා වැටීමේ අවදානමක් පවතින බැවින් ඒ සඳහා තාවකාලික විසඳුමක් ලෙස ජලය බැසයන | දීර්ඝ කාලීන විසඳුම ලෙස සිදු කළ යුතු ගොඩනැගිලි ඉදිකිරීම ප්‍රමාද වීම පිළිබඳව විවිධ ආකාරයට කිහිප |

| | | | | |
|---|---|---|---|---|
| | ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් 2019 ඔක්තෝබර් 22 දිනැති වාර්තාවේ දක්වා තිබුණ ද ඒ සඳහා අවධානය යොමුකර නොතිබුණි. | | ආකාරය විධිමත්ව පාලනය හා ස්ථානය ආවරණය සිදු කර ඇත. | වතාවකදීම කොන්ත්‍රාත් ආයතනය දැනුවත් කර ඇත. |
| (ii) | අත්තිකාරම් සුරක්ෂණයේ කාලය 2019 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර තිබුණ ද 2019 නොවැම්බර් 30 දින වනවිට ගෙවන ලද අත්තිකාරම් මුදලින් රු.11,333,175 ක (වැට් සහිත) මුදලක් අයකර ගැනීමට ඉතිරිව තිබුණි. | රජයට ඇතිවිය හැකි පාඩු කලින් හඳුනාගෙන ඒවා අවම කර ගැනීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය. | - | මෙම අත්තිකාරම් මුදල පියවා ගැනීමට කටයුතු කරමින් සිටින අතර ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ සඳහා ඇස්තමේන්තුවක් සකස් කර අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇත. |
| (iii) | කොන්ත්‍රාත් ගිවිසුමේ වගන්ති 13.1 සහ 13.2 අනුව විධිමත් රක්ෂණ ගිවිසුමක් ඉදිරිපත් නොවූ අතර ඉදිරිපත් කරන ලද රක්ෂණ ගිවිසුමේ කාලය ඉක්මවා ගොස් තිබුණි. තවද ගිවිසුමේ වගන්ති 27.1 අනුව සෑම මාසයකදීම යාවත්කාලින කරනලද Programme for the works කොන්ත්‍රාත්කරුගෙන් ලබාගෙන නොතිබුණි. | ගිවිසුම ප්‍රකාරව රක්ෂණ ගිවිසුම සහ Programme for the works ලබාගත යුතු අතර එසේ නොවන විට ඒ සඳහා ගිවිසුම අනුව පසු ක්‍රියා මාර්ග ගත යුතුය. | මෙම රක්ෂණ ආවරණ කාලය දීර්ඝ කරන ලෙස අවස්ථා ගණනාවකදීම කොන්ත්‍රාත් ආයතනය දැනුවත් කර ඇත. තවද, කොන්ත්‍රාත්කරු වෙතින් සෑම මාසයකදීම යාවත්කාලීන කරන ලද කොන්ත්‍රාත් කළමනාකරණය සඳහා වැඩසටහන් සැලසුමක් ලබා ගැනීමට කටයුතු කරන මෙන් දිස්ත්‍රික් ඉංජිනේරු දැනුවත් කර ඇති බව ද වාර්තා | 2022 පෙබරවාරි වනවිට ව්‍යාපෘතියේ කටයුතු නවතා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | කරමි. | |
| 14. | ඇස්තමේන්තු වටිනාකම රු.100,940,000 ක් වූ තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල නව තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සීමාව ඉක්මවන බැවින් රු.99,971,000 කට සංශෝධිත ඇස්තමේන්තුවක් සකස් කර තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් ඉටුකර ගැනීමට අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාවය සහ ඵලදායිත්වය උපරිම කිරීම යන අරමුණු මගහැරී තිබුණි. | මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සැකසිය යුතු අතර යොමුගත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අත්‍යවශ්‍ය නොවන වැඩ අයිතමයන් දිස්ත්‍රික් ඉංජිනේරුගේ නිර්දේශය අනුව ඉවත් කොට දිස්ත්‍රික් ලේකම් කාර්යාල ප්‍රසම්පාදන සීමාව දක්වා ඇස්තමේන්තුව සංශෝධනය කිරීමට තීරණය කරන ලද අතර ඒ අනුව ප්‍රසම්පාදන කටයුතු කඩිනමින් සිදු කරන ලදී. |
| 15. | මාතර දිස්ත්‍රික් ක්‍රමසම්පාදන ලේකම් කාර්යාලය විසින් 2019 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් 08 කට අදාල ව්‍යාපෘති 44 කට ජාතික තරඟකාරී ලංසු කැඳවීම වෙනුවෙන් මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2019 වර්ෂයේ සිදුකළ ප්‍රසම්පාදන කටයුතු සඳහා ප්‍රසම්පාදන කමිටු / තාක්ෂණ ඇගයීම් කමිටු දීමනා ලෙස රු.2,529,000 ක් ගෙවීම් කිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ දක්වා ඇති | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.9.1 හි උපදෙස් අනුව කටයුතු කළ යුතුය. | ඉදිරියේදී නිවැරදි කර ගන්නා බව දක්වා ඇත. | මෙම තත්ත්වය 2022 පෙබරවාරි වනවිටත් නිවැරදි කර ගැනීමට කටයුතු කර නොමැත. |

කරුණු සපුරා නොතිබුණි.

| | | | | |
|---|---|---|---|---|
| 16. | රජයේ ඉඩම් දීර්ඝකාලීන බදුදීම් සම්බන්ධව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක ගොනු 194 ක් නඩත්තු කර තිබුණු අතර ගොනු 08 ක පමණක් දීර්ඝකාලීන බදුකර සකස් කර රජයට ආදායම් අයකරමින් පැවතුණි. | දීර්ඝකාලීන බදුකර සැකසීමේ කාර්යය නිසි අධීක්ෂණයකින් කාලීනව ඉටු කිරීම තුලින් ඉඩම්වලින් රජයට උපයාගත හැකි ආදායම් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදී නිවැරදි කර ගන්නා බව දක්වා ඇත. | මාතර, දෙවිනුවර, දික්වැල්ල, තිහගොඩ හා මාලිම්බඩ ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල අදාළ ඉඩම් අතුරින් දිගුකාලීන බදු අයකළ හැකි ඉඩම්වලට අදාළ ඉදිරි කටයතු සිදුකරමින් පවතී. |
| 17. | රජයේ ඉඩම් පිළිබඳ දත්ත e–Slims නැමැති තොරතුරු පද්ධතියට ඇතුළත් කිරීම 2016 ඔක්තෝබර් මස අවසානය වනවිට සිදුකළ යුතු වුවද කිරින්ද පුහුල්වැල්ල, මාතර, මාලිම්බඩ සහ තිහගොඩ යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 විසින් එම ඉලක්කය 2019 නොවැම්බර් 11 දින වනවිට ද සපුරා නොතිබුණි. | යොමුගත ලිපිය ප්‍රකාරව කටයුතු කළයුතු අතර අදාල කාර්යයන් කඩිනමින් නිමකළ යුතුය. | අදාළ දත්ත **e–Slims** තොරතුරු පද්ධතියට කඩිනමින් යාවත්කාලීන කිරීමට උපදෙස් ලබාදී ඇති බව සඳහන් කර ඇත. | කිරින්ද පුහුල්වැල්ල, මාතර, මාලිම්බඩ හා තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල තොරතුරු තවදුරටත් e-Slims තොරතුරු පද්ධතියට යාවත්කාලීන කරමින් පවතී. |
| 18. | දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම් නොමැති තැනැත්තන් සඳහා බෙදාදීමේ අරමුණින් ගම් පුළුල් කිරීමේ වැඩසටහන යටතේ භූමි ප්‍රමාණය අක්කර 14 පර්චස් 28.9 ක් වූ ඉඩම් 04 ක් සඳහා | ඉඩම් සම්බන්ධ කාර්යයන් සිදුකිරීමේදී කාලීනව පසු විපරම් සිදුකර කඩිනම් ක්‍රියා මාර්ග ගත යුතුය. | ඉඩම් කච්චේරි හරහා තෝරාගත් පුද්ගලයින්ගේ තොරතුරු යාවත්කාලීන විය යුතු බැවින් හා නැවත ඔවුන් වෙනුවෙන් ඉඩම් | අත්පත් කරගෙන ඇති නමුත් අරමුණු සඳහා මෙතෙක් නොයොදවා තබන ලද ඉඩම් ලෙස නාඔටුන්න ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ගොරකපදුරගේන |

| | | | | |
|---|---|---|---|---|
| | 2014 හා 2015 වර්ෂවල රුපියල් මිලියන 70.7 ක් වන්දි ලෙස ගෙවා අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය අවසන් කර තිබුණද 2019 ඔක්තෝබර් 30 දින වනවිටත් අත්පත් කරගැනීමේ අරමුණ සඳහා නොයොදවා එම ඉඩම් නිෂ්කාර්යව පැවතුණි. | | කච්චේරියක් පැවැත්වීමට යෝජනා වූ බැවින් ඒ සඳහා දකුණු පළාත් ඉඩම් කොමසාරිස් වෙතින් අනුමැතිය ඉල්ලා ඇති බවත්, ඒ අනුව, LCD 1, 2, 3 වාර්තා හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ වාර්තා ලබා ගැනීමෙන් අනතුරුව සහකාර ඉඩම් කොමසාරිස් වෙත යැවීමට කටයුතු කරන බවත්, ඉන්පසු ඉදිරි ක්‍රියා මාර්ග ගන්නා බවත් වාර්තා කර ඇත. | ඉඩම, තලල්ල දකුණ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මාරගහවත්ත, පුවන්කංකානම්ගෙවත්ත, ගොඩකඳුරවත්ත ඒකාබද්ධ ඉඩම හඳුනාගෙන ඇති බව දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් වාර්තා කර ඇත. ප්‍රමාණවත් වන්දි මුදලක් නොලැබීම හා ඉඩම් අයිතිකරුවන්ගේ විරෝධතාවයන් හේතුවෙන් වන්දි මුදල් ලබා දී අවසන් වන තෙක් ඉඩම් බෙදා දීම ප්‍රමාද කරන ලද අතර, මේවන විට වන්දි මුදල් පිළිබඳ ගැටළුව නිරාකරණය කර ඇති බව වාර්තා කර ඇත. |
| 19. | 2008 අගෝස්තු 20 දිනැති අංක 2008/4 දරන ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛය පරිදි සකසන ලද ඉඩම් නොමැත්තන් ලියාපදිංචි කිරීමේ ලේඛන අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක සුදුසුකම් ලැබූ පුද්ගලයින් 11,033 ක් හඳුනාගෙන සිටි අතර එම ඉල්ලුම්කරුවන් | යොමුගත චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. | ඉඩම් කච්චේරි හරහා හඳුනාගත් පුද්ගලයින් හට බෙදා දීමට සුදුසු ඉඩම් ගම් පුළුල් කිරීම යටතේ දැනට හඳුනාගෙන ඇති අතර අත්පත් කර ගැනීමේ කටයුතු අවසන් වූ පසු එම ඉඩම් සුදුසුකම්ලාභීන් වෙත | 2022 පෙබරවාරි දක්වා මේ සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | වෙත (මාතර, දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාල හැර) බෙදාදීමට ප්‍රමාණවත් ඉඩම් එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නොමැති බැවින් උක්ත චක්‍රලේඛයේ 2.3 හි සඳහන් ක්‍රියාමාර්ග කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. | | බෙදාදීමට කටයුතු කරන බව දන්වා ඇත. | |
| 20. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු කැබ්රථයක් 2018 ජනවාරි 01 දින විධිමත් අවසරයක් ලබා නොගෙන රියදුරු විසින් ධාවනය කර සිදුවූ අනතුරු 02 ක් නිසා රියදුරුගේ වැඩ තහනම් කර තිබුණි. එහෙත් අනතුර සිදුවී වසර 02 කට වැඩි කාලයක් ඉක්ම ගොස් තිබුණද මුදල් රෙගුලාසි ප්‍රකාරව අලාභයේ එකතුව වූ රු.882,394 ක් පොත්වලින් කපාහැරීමට/ අයකර ගැනීමට හා ඊට අදාළ වගකිවයුතු පාර්ශවයන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීම දිගින් දිගටම ප්‍රමාද වී තිබුණි. එසේ වුවද අදාළ රියදුරු 2019 නොවැම්බර් 21 දින විශ්‍රාම ගන්වා ඇත. | මුදල් රෙගුලාසි අනුව කඩිනමින් කටයුතු කළ යුතුය. | මු.රෙ.104(4) අවසන් පරීක්ෂණ වාර්තාව ලැබී ඇති අතර ඉදිරි කටයුතු කඩිනමින් අවසන් කරන බව සඳහන් කරමි. | රියදුරුගේ විශ්‍රාම පාරිතෝෂිකයෙන් උක්ත අලාභයන් අයවී ඇත්දැයි 2021.07.31 දිනැති ලිපියෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් විමසා ඇත. 2022 පෙබරවාරි වනවිටත් එම අලාභය අයකර නොතිබුණි. |
| 21. | 1976 වර්ෂයේ සුදුකොහු කර්මාන්තය වෙනුවෙන් රජයට අත්කරගෙන තිබූ | රජයේ ඉඩම් පවරාදීමේදී අනුගමනය කළයුතු | මාතර ප්‍රාදේශීය ලේකම් විසින් දකුණු පළාත් කර්මාන්ත | 2022 පෙබරවාරි වනවිටත් අදාළ කාර්යයන් නිමවී |

| | | | | |
|---|---|---|---|---|
| | අක්කර 02, පර්චස් 19 ක් වූ මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මඩිහ නැගෙනහිර සහ බටහිර වසම්වලට අයත් ඉඩමෙන් මඩිහ බටහිර වසමට අයත් රූඩ් 01 පර්චස් 36 ක් වූ භූමියේ සමෘද්ධි අධිකාරිය විසින් රු.2,139,000 ක් වැයකර සමෘද්ධි මහා සංගම් කාර්යාලය ඉදිකර වර්ෂ 18 ක පමණ කාලයක් පවත්වාගෙන ගොස් තිබුණි. ප්‍රාදේශීය ලේකම්වරයා ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ විධිමත් අනුමැතියක් නොමැතිව ඉඩම අත්පත් කරගෙන අරමුණින් බැහැරව සමෘද්ධි අධිකාරියට මෙන්ම දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශයට ඉඩමේ බුක්තිය භාරදීමට කටයුතු කර තිබුණි. | විධිමත් ක්‍රමවේදයක් අනුව කටයුතු කළ යුතුය. | අමාත්‍යාංශයේ ලේකම්ට ලිපියක් මඟින් මෙම ඉඩම් කොටස් සමෘද්ධි අධිකාරිය වෙත පවරා දීම සඳහා තමා වෙත නිදහස් කරනමෙන් ඉල්ලීම් කර ඇති බව ප්‍රාදේශීය ලේකම් වාර්තා කර ඇත. අදාළ ඉඩම පිළිබඳ සියලුම විස්තර පැහැදිලි කොට ඉදිරි කටයුතු සඳහා උපදෙස් ලබා දෙන මෙන් ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් වෙත ලිපියකින් ඉල්ලා ඇති බවත්, ඉඩමේ භුක්තිය නැවත තමා වෙත භාර දෙන මෙන් දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම් වෙතින් ද ඉල්ලීමක් කර ඇති බවත්, ප්‍රාදේශීය ලේකම් වාර්තා කර ඇත. | නොතිබුණි. |
| 22. | මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සවිකර තිබූ විදුලි සෝපානය සඳහා සවිකිරීමේ වියදම, නඩත්තු වියදම සහ සේවා කිරීම් වියදම ලෙස එකතුව රු.4,082,211 ක මුදලක් වැයකර තිබුණ ද 2015 | රජයේ මුදල් කාර්යක්ෂම ලෙස යෙදවිය යුතුය. | අදාළ අළුත්වැඩියා කටයුතු සඳහා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත ගෙවිය යුතු උපදේශක සේවා ගාස්තු ලෙස පොදු තැන්පත් ගිණුමෙහි | 2022 පෙබරවාරි වනවිටත් විදුලි සෝපානය යථා තත්ත්වයටට පත්කර ගැනීම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | මාර්තු මස නව කාර්යාලය විවෘත කළ දින සිට මේ දක්වාම විදුලි සෝපානය අක්‍රීයව පවතින බැවින් ඉහත මුදල නිෂ්කාර්ය වියදමක් ලෙස නිරීක්ෂණය විය. | | රඳවා ඇති මුදලින් කර ගැනීමට කටයුතු කරන බව දක්වා ඇත. | |
| 23. | කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත ඉදිරිපත් කරන ලද වාර්තාව අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ක හඳුනා ගන්නා ලද ඉඩම් ප්‍රමාණය වූ හෙක්ටයාර් 42.6527 ක වටිනාකම තක්සේරු කර මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයට ඇතුළත් කර නොතිබුණු අතර, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 කට අයත් ඉඩම් ප්‍රමාණය හඳුනා ගැනීමට ද කටයුතු කර නොතිබුණි. | කඩිනමින් මෙම කටයුතු අවසන් කරවාගෙන එම ඉඩම්වල වටිනාකම් වාර්තාවලට ලබාගත යුතුය. | මූල්‍ය නොවන වත්කම් වාර්තාවේ සහ කොම්ප්ට්‍රෝලර් ජනරාල්වරයාගේ වාර්තාවේ වත්කම් සංකේත එක හා සමාන නොවේ. එසේම කොම්ප්ට්‍රෝලර් ජනරාල්වරයාගේ භාවිතා වන ආකෘතිවල මූල්‍යමය අගයන් සඳහන් කිරීමට එම වකවානුවේ පහසුකම් සලසා නොතිබුණි. | මේ වනවිට නිවැරදි කරමින් පවතී. |
| 24. | 2016 ඔක්තෝබර් 05 දිනැති අංක HAF/ADMIN/ DRIVERS/2016/23 දරන ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ සහකාර ලේකම් (පාලන) ගේ ලිපිය මගින් බස්නාහිර පළාත් ප්‍රවාහන අමාත්‍යාංශයේ පළාත් රාජ්‍ය සේවයේ රියදුරු වැටුප් ප්‍රතිපූර්ණය කිරීමට යටත්ව 2016 ඔක්තෝබර් සිට දිස්ත්‍රික් | මෙම වැටුප් ගෙවීම් හා තනතුර විධිමත් කර ගැනීමට කටයුතු කළ යුතුය. | මේ පිළිබඳව ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ඉල්ලා ඇති අතර ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් ද අමතා තිබුණි. | මේ සම්බන්ධයෙන් 2022 පෙබරවාරි වනවිටත් කටයුතු සම්පූර්ණ කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | ලේකම් කාර්යාලය වෙත අනුයුක්ත කර තිබුණද, 2019 ඔක්තෝබර් සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා ගෙවන ලද රු.542,070 ක් වූ වැටුප් හා දීමනා ප්‍රතිපූර්ණය කර නොතිබුණු අතර මෙම අනුයුක්ත කිරීම සඳහා විධිමත් අනුමැතියක් ද නොතිබුණි. | | | |
| 25. | මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු රජයේ නිවාසය අවිධිමත් ලෙස 2014 අගෝස්තු මාසයේ සිට 2017 ජූලි 12 දක්වා කාලය සඳහා වෙනත් ප්‍රදේශයක ප්‍රාදේශීය ලේකම්වරයෙකු වෙත ලබාදී තිබුණද ආයතන සංග්‍රහයේ xix වැනි පරිච්ඡේදයේ 5.7 ප්‍රකාරව නිවාස කුලී අයකරගෙන නොතිබුණි. | ආයතන සංග්‍රහයේ xix වැනි පරිච්ඡේදයේ 5.7 ප්‍රකාරව කටයුතු කළයුතුය. | මෙම නිල නිවාසයේ ප්‍රාදේශීය ලේකම් වරයෙකු පදිංචිව සිටියේ නම් එම කාල සීමාව සඳහා ඔහුගෙන් නිවාස කුලී අය කර ගැනීමට කටයුතු කරන ලෙස මාතර ප්‍රාදේශීය ලේකම් දැනුවත් කර ඇත. | 2022 පෙබරවාරි වනවිටත් මෙම කටයුතු අවසන් වී නොමැත. |
| 26. | ගම්පෙරලිය වේගවත් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන (RRDP) 2019 යටතේ වැලිගම මැතිවරණ කොට්ඨාශයේ ආගමික ස්ථාන සඳහා සූර්යබල පහසුකම් ලබාදීමේ ව්‍යාපෘතිය යටතේ වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පූජනීය ස්ථාන 41 ක හා වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පූජනීය ස්ථාන 34 ක | මෙම තත්ත්වයන් නිවැරදි කරගත යුතුය. | සියයට 10 රඳවුම් මුදල් රඳවාගෙන මෙම මුදල නිදහස් කර ඇත. | 2022 පෙබරවාරි වනවිටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | සූර්ය කෝෂ සවිකර තිබූ අතර සුනිත්‍ය බලශක්ති අධිකාරියේ තාක්ෂණ නිලධාරී විසින් ඉදිරිපත් කර තිබුණු ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තාව මගින් නිසි පරිදි ඉටු නොකෙරුණ වැඩ කොටස් හා තව දුරටත් වැඩි දියුණු කළයුතු දෑ සඳහන් කර දිස්ත්‍රික් ලේකම් දැනුවත් කර තිබියදී එම අඩුපාඩු හා වැඩිදියුණු කිරීම් කොන්ත්‍රාත්කරුගෙන් ඉටුකරවා ගැනීමකින් තොරව, ආයතන 03 ක් වෙත සූර්ය කෝෂ 75 ක් සවිකිරීම වෙනුවෙන් බදු රහිතව රු.මිලියන 32 ක් ගෙවා තිබුණි. | | | |
| 27. | මාතර නිල්වලා සංවර්ධන ව්‍යාපෘතිය 2018 - 2020 සඳහා අභ්‍යන්තර ස්වදේශ කටයුතු සහ පළාත් පාලන අමාත්‍යාංශය වෙතින් මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට 2019 හා 2020 වර්ෂ සඳහා එකතුව රු.මිලියන 715 ක් ලබා දී තිබුණු අතර, 2019 ජනවාරි 10 දිනැති අංක MNPEA/PLN/2019 දරන ජාතික ප්‍රතිපත්ති ආර්ථික කටයුතු හා නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව ව්‍යාපෘති | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අනුමත කර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නැත. | මේ සම්බන්ධව 2022 පෙබරවාරි වනවිටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | යෝජනා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර අනුමත කරගෙන නොතිබුණි. මෙම ව්‍යාපෘතියේ කාර්යයන් වාර්ෂිකව ක්‍රියාකාරී සැලැස්මකට ඇතුළත් කර විෂයභාර අමාත්‍යාංශය වෙතින් අනුමත කර ගැනීමෙන් තොරව ක්‍රියාත්මක කර තිබුණි. | | | |
| 28. | 2019 නොවැම්බර් 20 දිනැති අංක BD/GPS/ISS/09/01/NA/2019 දරන සියලුම දිස්ත්‍රික් ලේකම්වරු ඇමතු භාණ්ඩාගාර ලේකම්ගේ ලිපිය ප්‍රකාරව දැනට වැඩ ආරම්භ කර නොමැති ව්‍යාපෘති නැවත සමාලෝචනය කර දන්වන තෙක් තාවකාලිකව අත්හිටුවන ලෙස දැනුම් දී තිබූ නමුත් ඊට අනුකූල නොවී 2020 දෙසැම්බර් මස 23 දින දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන කමිටුව විසින් එකතුව රු.මිලියන 254.4 ක් වූ ජලනල දීර්ඝ කිරීමේ නව ව්‍යාපෘති 14 ක් ක්‍රියාත්මක කිරීමට අදාළ ප්‍රසම්පාදන තීරණ ගෙන තිබුණි. | අදාළ ලිපිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු තීරණය මත භාණ්ඩාගාර ලේකම් දැනුවත් කර මෙලෙස සිදුකරන ලද බව දන්වා තිබුණි. | 2022 පෙබරවාරි වනවිටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. |
| 29. | නිල්වලා එළිය ව්‍යාපෘතියට අදාළ ඇස්තමේන්තු වටිනාකමේ එකතුව | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව | මෙම සුරක්ෂණයේ වලංගු කාල සීමාව දීර්ඝ කරදෙන ලෙස | විධිමත් පරිදි ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් |

| | | | | |
|---|---|---|---|---|
| | රු මිලියන.78.6 ක් වූ ඉදිකිරීම් කර්මාන්ත 09 ට අදාළ එකතු වටිනාකම රු.3,844,624 ක් වූ කාර්යසාධන බැඳුම්කර 09 ක වලංගු කාල සීමාව ඉකුත් වී මාස 02 ත් මාස 11 ත් දක්වා පරාසයක පැවතියද අදාළ ඉදිකිරීම් කර්මාන්තවල වැඩ අවසන් වී නොමැති අතර, කොන්ත්‍රාත් කාලසීමාව ද දීර්ඝ කර නොතිබුණි . | කටයුතු කළ යුතුය. | කොන්ත්‍රාත්කරුට උපදෙස් දී ඇති බව දක්වා ඇත. | කාර්යසාධන බැඳුම්කර වලංගු කාලය දීර්ඝ කිරීමට කටයුතු නොකළ බව විගණනය වෙත දන්වා තිබුණි. |
| 30. | 2020 මැයි 15 දිනැති අංක DSM/DPS/Nilwala/24/2019 දරන දිස්ත්‍රික් ලේකම් මාතර මගින් ලේකම් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය අමතා යොමු කර තිබූ ලිපිය මගින් මෙම ව්‍යාපෘතියට අදාළව 2019 දෙසැම්බර් 31 දිනට භෞතික හා මූල්‍ය ප්‍රගතිය ඉදිරිපත් කර තිබුණි. එහිදී භෞතික ප්‍රගතිය සියයට 100 ක් ලෙස පෙන්නුම් කරමින් අතැති බිල් ලෙස කර්මාන්ත 48 ට අදාළව එකතුව රු.මිලියන 400.55 ක වටිනාකමින් යුතු බිල්පත් පවතින බව සඳහන් කරමින් ඊට අදාළ අක්මුදල් ලබාදෙන ලෙසට ඉල්ලීම් කර තිබුණි. එහෙත් එම අතැති බිල් ලෙස ඉදිරිපත් කර තිබූ රු.මිලියන | ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීමේදී නිවැරදි තත්ත්වය පෙන්නුම් කිරීමටත් මෙම ව්‍යාපෘති කඩිනමින් නිම කරවා ගැනීමටත් කටයුතු කළ යුතුය. | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හරහා ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන් සඳහා වැඩ ආරම්භ කිරීමට ප්‍රථම මුදල් ගෙවීමට සිදුවීම මෙයට හේතුවී ඇති බව දක්වා ඇත. | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘතීන් 06 ක් වැඩ අවසන් කර ඇති බව විගණනය වෙත දන්වා තිබුණි. අනෙකුත් ව්‍යාපෘති 04, 2022 පෙබරවාරි වනවිටත් නිමකර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | 329 කට අදාළ කර්මාන්තවල කිසිදු භෞතික ප්‍රගතියක් නොතිබුණි. | | | |
| 31 | ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කළයුතු කර්මාන්ත 05 ක් සඳහා ජාතික තරඟකාරී මිල කැඳවීම් ක්‍රමය මගින් පුවත්පත් දැන්වීම් පළකර මිළගණන් කැඳවා තිබුණද පසුව එම ව්‍යාපෘතිවල ප්‍රසම්පාදන කටයුතු ආරම්භ නොකර අවලංගු කර තිබුණි. ඒ අනුව පුවත්පත් දැන්වීම් සඳහා දරූ එකතුව රු.166,174 ක් නිෂ්කාර්ය වියදම් වී තිබුණි. | මෙම නිෂ්කාර්ය වියදම පිළිබඳව නිසි ක්‍රියාමාර්ග ගත යුතුය. | ඇස්තමේන්තු සංශෝධනය කිරීමට සිදුවීම නිසා මෙම තත්ත්වය ඇතිවී ඇති බව දක්වා ඇත. | මේ සම්බන්ධව 2022 පෙබරවාරි වනවිටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. |
| 32. | ප්‍රසම්පාදන ක්‍රියාවළියෙන් බැහැරව හා ගිවිසුම්ගතවීමකින් තොරව මාකඳුර ඩැනී හිත්තැටිය ක්‍රීඩාපිටිය, අකුරැස්ස ඇල්ලේවෙල කනිටු විද්‍යාලය ක්‍රීඩාපිටිය, දික්වැල්ල වලස්ගල වොලිබෝල් ක්‍රීඩාපිටිය හා යටියන වයර්ලස් වත්ත ඉඩම තුළ ක්‍රීඩාපිටිය යන ව්‍යාපෘති ඉදිකිරීම් නිමකර තිබුණි . | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කළ යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නැත. | ප්‍රසම්පාදනයෙන් බැහැරව කටයුතු කිරීම සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශවයන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| 33. | මාර/කිරින්ද පුහුලවැල්ල මහා විද්‍යාලයේ ක්‍රීඩා පිටිය සංවර්ධනය සඳහා 2019 වර්ෂයේ රුපියල් මිලියනයක ප්‍රතිපාදන වෙන්කර එයින් | ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය නිවැරදිව පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. | ආර්ථික සංවර්ධන නිලධාරී විසින් පරීක්ෂා කරන ලද අවස්ථාවේදී කරන ලද වැඩ කොටස් දක්වමින් අදාළ පූර්ව | 2022 පෙබරවාරි වනවිටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | රු.898,582 ක් වැයකර දුර පැනීම් වලක් ඉදිකර තිබුණද එය අවහිර වන පරිදි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සැලසුම් අංශය විසින් රුපියල් මිලියන 2.16 ක් වැයකර දිවා/රාත්‍රී වොලිබෝල් පිටියක් සකස් කර තිබීම නිසා එම වියදම් නිෂ්කාර්ය වී තිබුණි. ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසු ප්‍රසම්පාදන ක්‍රියාවලිය මෙන්ම පූර්ව විමර්ශන වාර්තා හා ශක්‍යතා වාර්තා ලබා ගැනීම සිදුකර තිබුණි. | | විමර්ශන වාර්තා ලබාදී ඇති බව දක්වා ඇත. | |
| 34. | වරාය සහ නාවික කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක සිංහරාජ විශේෂ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ කොන්ක්‍රීට් මාර්ගයක් ඉදිකිරීම සඳහා රු.මිලියන 5.9 ක් වූ ගිවිසුම් වටිනාකමට පෞද්ගලික ආයතනයක් සමඟ 2019 ජූලි 05 දින ගිවිසුම්ගතවී තිබූ අතර 2019 සැප්තැම්බර් 03 දින වනවිට කොන්ත්‍රාත්තුවේ වැඩ ගිවිසුම් ප්‍රකාරව අවසන් කළයුතු විය. එහෙත් කොන්ත්‍රාත්කරු විසින් එදිනට වැඩ අවසන් කර නොතිබුණු බැවින් 2019 දෙසැම්බර් 31 දින වනවිට කොන්ත්‍රාත්තුවට අදාළ | කඩිනමින් මෙම මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර ඉටු නොකර අත්හැර දමන ලද ව්‍යාපෘතීන්හි කටයුතු අවසන් කිරිම සඳහා නිසි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. | මෙම මුදල අයකර ගැනීමට කටයුතු කරන බව දක්වා ඇත. | මෙම මුදල අයකර ගැනීමට මේ වනතෙක් නොහැකි වී ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | කාර්යසාධන සුරකෂණයේ වලංගු කාලය ඉකුත්වී තිබුණු රු.296,417 ක වටිනාකමින් රු.130,998 ක් අයකර ගැනීමට නිලධාරීන්ට නොහැකි වී තිබුණි. එබැවින් කොන්ත්‍රාත්කරු වෙත ගෙවූ රු.475,146 ක් වූ වියදම් නිෂ්කාර්ය වී තිබුණි. | | | |
| 35. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 සම්බන්ධයෙන් 2020 වර්ෂය තුළදී ද නිසි අවධානය යොමු කර නොතිබුණි. වර්ෂය තුළ ලද ප්‍රතිපාදන මත පදනම්ව තිරසර සංවර්ධන අරමුණු 03 ක් හඳුනාගෙන තිබුණු අතර තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 ට අනුව අරමුණු 14 ක් කෙරෙහි කිසිදු අවධානයක් යොමු කර නොතිබුණි. | තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම කෙරෙහි අවධානය යොමුවිය යුතුය. | ඉදිරියේදී අරමුණු 14 අනුව තිරසාර සංවර්ධන සැලැස්ම සකස් කිරීමට කටයුතු කරන බව දක්වා ඇත. | 2021 වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි. |
| 36. | 2018 ජනවාරි 24 දිනැති අංක 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛයෙන් සංශෝධිත 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන චක්‍රලේඛයෙන් හඳුන්වාදී ඇති පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කර ක්‍රියාත්මක කළයුතු වුවද | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. | පිළියෙල කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව දක්වා ඇත. | 2022 පෙබරවාරි වනවිටත් එලෙස කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඒ අනුව කටයුතු කර නොතිබුණි. | | | |
| 37. | 2020 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 1733 ක්ද, තථ්‍ය සේවක සංඛ්‍යාව 1623 ක්ද වූයෙන් කාර්ය මණ්ඩලයෙහි පවතින 141 ක පුරප්පාඩු පියවා ගැනීමට හා 31 දෙනෙකුගෙන් යුතු අතිරික්ත කාර්ය මණ්ඩලය විධිමත් පරිදි අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අත්‍යවශ්‍ය තනතුරු පුරප්පාඩු පුරවා ගැනීමටත් අතිරික්තතා විධිමත් කර ගැනීමටත් කටයුතු කළ යුතුය. | අමාත්‍යාංශ ලේකම් දැනුවත් කර ඇත. | 2022 පෙබරවාරි වනවිටත් එම තත්ත්වයම පැවතුණි. |
| 38. | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන ලේකම්ගේ චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. තවද සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම ඉහත චක්‍රලේඛයෙහි ඇමුණුම 1 ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉදිරියේදී මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර එය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව දක්වා ඇත. | 2022 පෙබරවාරි වනවිටත් එම තත්ත්වයම පැවතුණි. |

**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - හම්බන්තොට**

**-----------------------------------------------**

| | |
|---|---|
| 2018 | තත්ත්වාගණනය කළ මතය |
| 2019 | තත්ත්වාගණනය කළ මතය |
| 2020 | තත්ත්වාගණනය කළ මතය |

| **විගණකාධිපති වාර්තාවේ ඇතුළත්** | **විගණකාධිපතිගේ** | **ආයතනය විසින් ගනු** | **ඒ සම්බන්ධයෙන් වූ** |
|---|---|---|---|

| | ප්‍රධාන අඩුපාඩු | නිර්දේශය | ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 01. | ක්‍රීඩා අමාත්‍යාංශය මගින් 2017 වර්ෂයේ දී රුහුණු මාගම්පුර පරිපාලන සංකීර්ණ පරිශ්‍රය තුළ ක්‍රියාත්මක කරන ලද ඇවිදීමේ මංතීරුව ඉදිකිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් වැඩ විෂයන් 10 ක් සඳහා රු.2,113,447ක් ඇස්තමේන්තු කර තිබුණි. බිල් පත්‍ර පරීක්ෂාවේ දී ඇස්තමේන්තුගත වැඩ වෙනුවෙන් රු.751,601 ක් ද, අමතර වැඩ සඳහා රු.273,258 ක් ද, අතිරේක වැඩ සඳහා රු.1,015,468 ක් ද වශයෙන් ගෙවීම් කර තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත වැඩ වටිනාකමින් සියයට 61ක ප්‍රමාණයක් අමතර හා අතිරේක වැඩ ලෙස ගෙවා තිබුණි. තවද මෙම ව්‍යාපෘතිය නිමකළ දින සිට 2019 මැයි මාසය දක්වා ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටුවන පරිදි භාවිතයට ගෙන නොතිබුණි. | ව්‍යාපෘතිය සැලැසුම් කිරීමේදී පූර්ව අධ්‍යනයකින් පසුව සියළු වැඩ ඇතුළත් කර ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. | ව්‍යාපෘතිය සැලැසුම් කිරීමේ ගැටළු ඇති බව ව්‍යාපෘතිය කරගෙන යාමේදී අවබෝධ විය. මෙවැනි ඉදිකිරීමක ප්‍රථම අත්දැකීම මෙය වීම මීට ප්‍රධානම හේතුව වේ. අමතර වැඩ හා අතිරේක වැඩ සඳහා අනුමැතිය ලබාගෙන ඇත. අපේක්ෂිත ප්‍රතිඵල මෙතෙක් පූර්ණ වශයෙන් ළහාකර ගැනීමට නොහැකි වුවද, ඉදිරියේදී තවදුරටත් එය ප්‍රචලිත කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | අපේක්ෂිත ප්‍රතිඵල මෙතෙක් පූර්ණ වශයෙන් ලගාකර ගැනීමට නොහැකි වුවද තවදුරටත් එය ප්‍රචලිත කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. මෙහිදී දෙවනි අදියර ක්‍රියාත්මක නොකිරීමට තීරණය කර ඇත. |
| 02. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ව්‍යාපෘති 10 ක් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් | සලසා දෙන ප්‍රතිපාදන ඵලදායි ලෙස සංවර්ධන කටයුතු සඳහා | අමාත්‍යාංශ විසින් ගිණුම් වර්ෂය අවසානයේ දී ප්‍රතිපාදන ලබාදීමත්, | 2022 පෙබරවාරි වන විටත් ව්‍යාපාති ඉටුකර නොමැත. |

| | | | |
|---|---|---|---|
| | කාර්යාලය වෙත 2018 නොවැම්බර් මාසයේදී ලබා දී තිබුණු රු.7,100,000 ක ප්‍රතිපාදනයෙන් 2018 දෙසැම්බර් 31 දින වන විට කිසිදු ප්‍රගතියක් ලබාගෙන නොතිබුණි. | යෙදවිය යුතුය. | ඒ අනුව ප්‍රසම්පාදන කටයුතු සිදුකර කාර්යයන් නිම කිරීමට ප්‍රමාණවත් කාලයක් නොලැබීමත්, වැව් හා අමුණු ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අවස්ථාවේදී අධික වැසි නිසා බාධාවන් සිදුවීමත් වැනි හේතූන් මත අදාළ ව්‍යාපෘති ඉටු කිරීමට නොහැකි වී ඇත. |
| 03. | කිරින්ද උෟරණිය ප්‍රදේශයේ මුහුදේ ගිලී තිබූ “රුව්හෙර” නම් නෞකාවේ සුන්බුන් ඉවත් කිරීමේ කාර්යය 2010 වර්ෂයේ දී ධීවර සමූපකාර සමිතියක් වෙත පවරා තිබුණි. ඒ වෙනුවෙන් එම සමිතිය විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තැන්පත් කරන ලද රු.3,500,000 ක තැන්පතු මුදල 2018 දෙසැම්බර් 31 දින ආපසු ගෙවා තිබුණ ද එම ගෙවීමේ දී පහත අඩුපාඩු අනාවරණය විය. | | |

| | | | |
|---|---|---|---|
| (i) තැන්පත් මුදල් ආපසු | මුදල් රෙගුලාසි | තැන්පත්කරුවන් | මුදල් රෙගුලාසි |

| | | | |
|---|---|---|---|
| ගෙවීමේදී මුදල් තැන්පත් කළ ලදුපත්‍ර දෙකෙහි මුල් පිටපත්, වවුචරය සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | විසින් ණයා පිටපත් ඉදිරිපත් කර තිබුණු අතර අපගේ පොත්පත්වල පවතින කුවිතාන්සියේ අනුපිටපත් සමඟ පරීක්ෂා කර නිවැරදිතාවය තහවුරු කර ගන්නා ලදී. | ප්‍රකාරව කටයුතු කර නැත. |
| (ii) කොන්ත්‍රාත්කරු තෝරා ගත් පදනම පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතුය. | නාවික හමුදාව, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, වරාය හා ගුවන් සේවා අමාත්‍යාංශයේ වෙළඳ නැව් අංශය, සමුද්‍ර දූෂණ වැලැක්වීමේ අධිකාරිය යන ආයතන වල උපදේශකත්වය හා එකඟතාවය මත අදාල සමිතිය වෙත ලබා දී ඇත. | තෝරාගත් පදනම ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii) කොන්ත්‍රාත්තුව පැවරීමේදී දෙපාර්ශවය අතර විධිමත් කොන්දේසි සහිත ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මෙවැනි කටයුත්තක් සම්බන්ධයෙන් අත්දැකීම් නොමැතිවීම මත කොන්දේසි සහිත ලිපියක් මගින් අදාල සමිතිය වෙත පවරා | ගිවිසුමක් අත්සන් කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | දී ඇත. එයට වරාය හා මහාමාර්ග අමාත්‍යාංශයෙන් සහ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් අනුමැතීන් ලබා ගෙන ඇත. | |
| | (iv) කොන්ත්‍රාත්කරු කාර්ය නිම නොකර ඉන් ඉවත් වී තිබියදී තැන්පත් මුදල ආපසු ගෙවා තිබුණි. | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අද වන විට ද ඉතිරි කොටස් ඉවත් කළ නොහැකිව පවතී. | කාර්යය ඉටුකර නොතිබියදී තැන්පත් මුදල ගෙවා ඇත. |
| | (v) නැවෙන් ඉවත් කරන ලද සුන්බුන් ප්‍රමාණය කොපමණ ද යන්න වාර්තාගත කර නොතිබුණු බැවින් රාජ්‍ය ආදායමට අයවිය යුතු සියළු මුදල් අය වූ බවට සාක්ෂි නොතිබුණි. | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉවත් කරන ලද සුන්බුන් ප්‍රමාණය ග්‍රාම නිලධාරී හා සමුද්‍රිය පරිසර අධිකාරියේ අධීක්ෂණය මත වාර්තා ලබා ගෙන ඇත. ඒවා කිරා ඊට රේගු ගාස්තු ගෙවීමෙන් අනතුරුව පමණක් ඉවත් කර ගැනීමට අනුමැතිය ලබාදී ඇත. | විධිමත් වාර්තාවක් සකස් කර නොතිබුණි. |
| 04. | 2019 පෙබරවාරි 11 දිනැති අංක PS/NC/4/ CP/41/2019 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය - සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන්ට ණය සහන | ආපසු අයකර ගැනීමේ අරමුණින් ජාතික අවශ්‍යතාවයන් වෙනුවෙන් යොදන ලද රජය සතු මුදල් නියමිත කාර්යය | 2020.06.18 දිස්ත්‍රික් ලේකම් හා වී මෝල්හිමියන් අතර පැවති රැස්වීමේදී මෝල් හිමියන් විසින් මාස 03 ක සහන | වරින් වර කරන ලද දැනුම් දීම් වලට අනුව සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් විසින් මේ වන විට රු.15,361,483 ගෙවා |

| | | | | |
|---|---|---|---|---|
| | ලබාදීමේ වැඩසටහන යටතේ සහල් නිෂ්පාදකයින්ගේ සී/ස සමුපකාර සමිතියක් වෙත 2019 අප්‍රේල් 05 වන දින ලබාදුන් රු.38,000,000 ක පොලී රහිත ණය මුදල් 2019 ඔක්තෝබර් 05 දින වන විට මෝල්හිමියන්ගෙන් සම්පූර්ණ වශයෙන් අයකර ගතයුතු වුවත් විගණිත දිනය වූ 2020 ජුනි 30 දින වන විටත් රු.26,445,848 ක මුදලක් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. | අවසානයේ අදාල පාර්ශවයන්ගෙන් අයකරගෙන ඒකාබද්ධ අරමුදලට බැරකළ යුතුය. | කාලයකට හා ණය ගෙවීමේ ක්‍රමවේදයකට යටත්ව එම ණය ගෙවා අවසන් කිරීමට එකඟ වී ඇති බව. | 2022 පෙබරවාරි මස වන විටත් රු.22,638,517 ක්ද අයකර ගෙන නොතිබුණි. |
| 05. | 2009 මැයි 06 දිනැති අංක 1600/18 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ 10(1) ඡේදය හා 2003 අගෝස්තු 28 දිනැති අංක 1303/17 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ 15 ඡේදය - ඕකෙවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පුද්ගලික ඉඩමක පවත්වාගෙන ගොස් තිබූ කළුගල් වැඩබිම, තම පුද්ගලික ඉඩමේ සීමාව ඉක්මවා රජයේ ඉඩමේ හෙක්ටයාර් 0.6227ක භූමියේ අනවසරයෙන් කළුගල් කියුබ් 10,911ක් කැණිම් කර තිබූ අතර, ඒ සඳහා චක්‍රලේඛ ප්‍රකාරව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රජයේ | රජයේ ඉඩම් සහ දේපල අනවසර පරිහරණය වලක්වා ගැනීමටත්, අනවසර පරිහරණය කළ දේපල සඳහා නියමිත රජයේ ගාස්තු අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය. | 2019.12.12 දින දිස්ත්‍රික් ලේකම් සමඟ පැවති සාකච්ඡාවේදී නිරීක්ෂණය පිළිගෙන ඇත. | 2022 පෙබරවාරි වන විටත් අයකිරීම් කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | ගාස්තු අයකරගෙන නොතිබුණි. | | | |
| 06. | 2017 වර්ෂයේ මැයි මස ඇතිවූ ගංවතුර හා නායයාම් හේතුවෙන් ජන ජීවිතය පවත්වාගෙනයාම අවධානම් සහිත ප්‍රදේශවල ජනතාව වෙනත් ප්‍රදේශවල පදිංචි කිරීමේ අරමුණින් 2017, 2018 සහ 2019 යන වර්ෂවලදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 06 ක සුරක්ෂිත ප්‍රදේශවල නිවාස ඉදිකිරීම සඳහා රු.127,450,000 ක මුදල් ප්‍රතිලාභීන් 91 දෙනෙකුට ලබාදී තිබූ අතර විගණිත දිනය වූ 2020 ජනවාරි 03 දින වන විටත් ව්‍යාපෘතියේ අරමුණ වූ අවධානම් සහිත ප්‍රදේශවල ජනතාව නව නිවාස වල නැවත පදිංචිවීම සිදුවී නොතිබුණි. නියැදි පරීක්ෂාවට අනුව කටුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ එකතුව රු.11,025,000 ක් ලබාදී තිබූ ප්‍රතිලාභීන් 07 දෙනෙකුද, වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රු.1,575,000 ක මුදලක් ලබාදී තිබූ බුද්ධියාගම එක් ප්‍රතිලාභියෙකුද, ඕකෙවෙල කැන්දකැටිය රු.900,000 ක් ලබාදී තිබූ එක් ප්‍රතිලාභියෙකුද | වැඩසටහනෙහි අරමුණු ඉටුවන අයුරින් ප්‍රතිලාභීන් තෝරා ගැනීමටත්, කාර්යසාධනය ඇගයීමෙන් පසුව මුදල් නිදහස් කිරීමටත්, පසු විපරම් අඛණ්ඩව සිදුකිරීමටත් පියවර ගත යුතුය. | පදිංචිය සඳහා නොපැමිණි පුද්ගලයන් වෙත වහා නව නිවසේ පදිංචිය තහවුරු කරන මෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ලිපි යවා ඇති බව. | 2022 පෙබරවාරි දක්වාම ආරක්ෂිත ස්ථානවල පදිංචි වී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | හා බෙලිඅත්ත නෙළුව රු.200,000 ක මුදලක් ලබාදී තිබූ එක් ප්‍රතිලාභියෙකුද විවිධ වූ කාරණා හේතු කොට ගෙන නව නිවාසවල පදිංචියට නොගොස් අවධානම් සහිත ප්‍රදේශවලම පදිංචිව සිටීම. | | | |
| 07. | ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාර වැඩසටහන 1 අදියර යටතේ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12 හි ග්‍රාම ශක්ති ජනතා සමිති 36 ක ජීවනෝපාය සංවර්ධන කාර්යය සඳහා ලබාදුන් රු.27,757,257 ක් විගණිත දිනය වූ 2020 මැයි 15 දින දක්වා ප්‍රයෝජනයට නොගෙන වර්ෂයක පමණ කාලයක් සමිතිවලම ඉතුරුම් ලෙස පැවතුණි. | රජය සතු මුදල් මහජනතාවගේ සුභ සාධනය උදෙසා වැය කිරීමකින් තොරව රඳවා තබාගැනීමට ඉඩ නොහැර ප්‍රතිපාදන වෙන්වී ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුය. | ග්‍රාම ශක්ති ව්‍යාපාරය පසුගිය රජය යටතේ ආරම්භ කරන ලද වැඩසටහනක් වීම නිසා රාජ්‍ය තන්ත්‍රයේ ඇතිවූ වෙනස්කම් අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් උපදෙස් ලැබී නොමැති බව. | 2022 පෙබරවාරි වන විටත් මෙම මුදල් ඉතුරුම් ගිණුම්වල තැන්පතු වශයෙන් ප්‍රයෝජනයට නොගෙන ඇත. |
| 08. | **නව තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම සහ මායිම් තාප්පය ඉදිකිරීම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ඕකෙවෙල** <br> **------------------------** | | | |
| | i. ගොඩනැගිලි සැලසුම් කිරීම හා ඉංජිනේරු ඇස්තමේන්තුව සැකසීමේදී භූමිය සහ | ඉදිකිරීම පිළිබඳව ඇස්තමේන්තු පිළියෙල කිරීමට පෙර ඉදිකිරීම් භූමිය | එවකට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පැවැති භූමියේ ඉදිරිපිට සැලසුම් | පිළිතුරු ලබාදුන් අවස්ථාවේ පැවති තත්ත්වය වෙනස්වී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | සේවාදායකගේ අවශ්‍යතා පිළිබඳව සැලකිලිමත් වී නොතිබුණි. ඉදිකිරීම් සිදුකිරීමේදී ගොඩනැගිලි සැලැස්මේ වෙනස්කම් සිදුකර තිබූ අතර, අමතර වැඩ ලෙස අයිතම 72 ක් සඳහා රු.5,405,626 ක් ගෙවා තිබුණි. ඒ අනුව ගොඩනැගිලි සැලැස්ම සහ ඉංජිනේරු ඇස්තමේන්තුව සැකසීම ඉතා දුර්වල මට්ටමක පැවතුණු බව නිරීක්ෂණය කෙරේ. | පිළිබඳව හා සේවා දායකයන්ගේ අවශ්‍යතාවය පිළිබඳව සලකා බැලිය යුතුය. | කරන ලද ගොඩනැගිල්ල වෙනත් භූමියක ඉදිකිරීමට සිදුවීම නිසා ගලපා ගැනීමේදී ඇති වූ ගැටළු බව. | |
| ii. | ඉංජිනේරු ඇස්තමේන්තුවේ ප්‍රධාන වැඩ විෂයයන් 3 ක රු.5,484,292 ක වැඩ අත්හැර තිබුණි. එසේ වුවද අත්හල වැඩ සඳහා රු.948,973 ක වැඩ පූර්ව අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණි. | ඉටුකළ හැකි වැඩ විෂයයන් සහිතව ඇස්තමේන්තු පිළියෙල කර එම වැඩ විෂයයන් ඉටුකරවා ගැනීමට වගබලා ගතයුතුය. | ගොඩනැගිල්ල ඉදිකරන අතර මෙම අයිතම සඳහා භූමි අලංකරණය යටතේ ප්‍රතිපාදන සැලසුන බැවින් මෙම අයිතම ඉටුකිරීම මෙම ඇස්තමේන්තුව යටතේ ඉටු නොකළ බව. | 2022 පෙබරවාරි වන විටත් නිවැරදි කර නොමැත. |
| iii. | ඉංජිනේරු ඇස්තමේන්තුව අනුව විදුලි තතැදීම සඳහා රු.2,245,030 ක් ඇස්තමේන්තු කර තිබූණද අමතර වැඩ | පිළියෙල කරනු ලබන ඉංජිනේරු ඇස්තමේන්තු තුළ අසාමාන්‍ය විචලනයන් නොපැවතිය යුතුය. | රු.මිලියන 100 මූල්‍ය සීමාව ඉක්මවා යන බැවින් මෙම වියදම් ඇස්තමේන්තුවට | වියදම් සීමාව ඉක්මවන්නේ නම් ඊට අදාල අනුමැතිය ලබාගත යුතුය. එසේ සිදුකර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | සහ බාහිර වැඩ ලෙස සමස්ත විදුලි පද්ධතිය වෙනුවෙන් රු.4,996,348 ක් ගෙවා තිබුණි. තවද ගොඩනැගිල්ලේ තෙකලා විදුලි සැපයුමක් සඳහා රු.12,175 ක්වූ ප්‍රමාණවත් නොවූ ඉංජිනේරු ඇස්තමේන්තු සකසා තිබුණි. | | ඇතුළත් නොකළ බව. | ඇස්තමේන්තු මුදල අඩුකර දක්වා තිබුණි. |
| iv. | ගොඩනැගිල්ලේ බාහිර අලංකරණයට හා රැහැන්වල ආරක්ෂාවට බලපෑම් වන පරිදි විදුලි රැහැන් ඇදීම සඳහා භාවිතා කළ කේසින් (CASING) පිටතට පෙනෙන පරිදි නිමකර තිබුණි. තවද බිල්පතේ Ex.54 යටතේ විදුලි පංකා සවිකිරීමට ආධාරකයක් සැකසීමට රු.282,225 ක් ගෙවීම වැඩිපුර ගෙවීමක් ලෙස නිරීක්ෂණය කරනු ලැබේ. | ඉදිකිරීම් මනා නිමාවකින් යුතුව ඉටුකළ යුතුය. වැඩ විෂය පිළිබඳව පූර්ව අවබෝධයක් සහිතව මිලගණන් ඉදිරිපත් කලයුතුව තිබියදී අමතරවැඩ වශයෙන් නැවත ගෙවීම් කිරීම නොකළ යුතුය. | මූලික සැලසුමට අනුව යෙදූ වයරින් බට භාවිතා කළ නොහැකි වූ බැවින් මෙසේ සිදුකළ බව සහ වහලය උස බැවින් හා විදුලි පංකා එල්ලිය යුතු ස්ථානවල පරාල නොමැති බැවින් වෙනම ව්‍යුහයක් සකස් කිරීමට සිදුවූ බව. | වැඩිපුර ගෙවීම් සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර, අයකරගෙනද නොතිබුණි. |
| v. | ඇස්තමේන්තු විෂයය අංක **C-1** යටතේ පස් කැපීම හා තුනී කිරීමට | ඇස්තමේන්තු විෂය ප්‍රමාණයන් සහ විෂයයට අදාල | කඩිනමින් ඇස්තමේන්තු පිළියෙල කිරීම | අනුමත ඝණ මීටර් 900 ඉක්මවා ඝණ මීටර් 8652ක් කපා |

| | | | | |
|---|---|---|---|---|
| | සණ මීටර් 900 ක් ඇස්තමේන්තු කර තිබුණද, බිල්පත් මගින් මැනුම් වාර්තා තනි මිනුමක් ලෙස ශ්‍රී ලංකා ප්‍රමිත (**SLS** 573) ට පටහැනි අන්දමින් සිදුකර සණ මීටර් 9552 ක් සඳහා රු.1,930,432 ක් ගෙවා තිබුණි. තවද කපා ඉවත් කරන ලද පස් සන මීටර් 9552 ක ප්‍රමාණය, කුමන කාර්යයකට යෙදුවේද යන්න තහවුරුවක්ද ගොනුවේ නොවීය. | කළවැඩ අසාමාන්‍ය විචලනයන් නොපැවතිය යුතුය. වෘත්තිකයන්/ කාර්මිකයන් තම වෘත්තිය ඉටුකිරීමේදී වෘත්තීය ප්‍රමිතීන් පිළිබඳව සැලකිලිමත් විය යුතු අතර ඉටුකළ කාර්යයන් විධිමත්ව ලේඛනගත කර විනිවිදභාවයකින් යුතුව කටයුතු කළයුතුය. | නිසා මිනින්දෝරු මැනුම් අනුව ගණනය කර පස් කැපීම සිදුකල නොහැකි විය. කපා ඉවත් කල පස් අවට පිහිටි පාසැල් හා විහාරස්ථාන ආදී ස්ථානවලට බැහැර කළ බව. | තුනී කිරීමට මුදල් ගෙවා තිබූ අතර, එලෙස සිදුකළ බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොවුනි. |
| vi. | කර්මාන්තය ආරම්භ කිරීමට පෙර ලබාදිය යුතු වැඩ සැලැස්ම (work Schedule) හා කලවැඩවල ප්‍රගතිය,ඉදිරි කාලය සඳහා නව වැඩ සැලැස්මක්ද ලබා නොගෙන ගොඩනැගිල්ල සඳහා මාස 6½ ක් හා තාප්පය සඳහා දින 90 ක කාලයක්ද, කොන්ත්‍රාත් දින දීර්ඝ ලබාදී තිබුණි. ඉහත කරුණු අනුව ඉංජිනේරුවරුන් වැඩ බිම නිසි අධීක්ෂණයක් සිදුකළේ කෙසේද යන්න | සාධාරණ හේතු පදනම් කරගෙන කොන්ත්‍රාත් කාලය දීර්ඝ කළ යුතුය. වැඩබිම් මනා කළමනාකරණයකින් යුතුව පවත්වා ගෙනයාම සඳහා සැලසුම් කළ යුතුය. | අධීක්ෂණය සඳහා ප්‍රමාණවත් කාර්මික නිලධාරීන් නොමැති බැවින් වැඩ සැලැස්මක් ලබා ගෙන නැත. භූමියේ පස් ඉවත් කිරීම ප්‍රමාදවීම සහ ගල් ඉවත් කිරීම සඳහා පුපුරණ ද්‍රව්‍ය සපයාගත නොහැකි වීම මත කාලය දීර්ඝ කර ඇත. තාප්පය ඉදිකිරීමේ පළමුවර දින දීර්ඝය ලබා නොදී ඉදිරිපත් කළ කරුණු සාධාරණ | අවශ්‍යතා සම්පූර්ණ නොකර දින දීර්ඝ ලබාදී ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | විගණනයේදී ප්‍රශ්න සහගතය. | | බැවින් දෙවන දින දීර්ඝය ලබාදී ඇත. | |
| vii. | කර්මාන්තයේ ඉතුරුම් ලෙස දක්වා තිබූ රු.14,518,048 ක මුදලින් රු.5,405,626 ක අමතර වැඩ සිදුකර තිබුණි. එසේ වුවද මෙම අමතර වැඩ සඳහා කොන්ත්‍රාත් ගිවිසුමේ පරිදි සියයට 2 වට්ටම රු.108,113 ක මුදල අඩුකර නොතිබුණි. | ඇස්තමේන්තු වැඩ විෂයයන් වෙනුවට අමතර වැඩ සිදුකර තිබුණි. එබැවින් වට්ටම් මුදල් අඩුකර ගත යුතුය. | කොන්ත්‍රාත්කරුගේ වට්ටම් වලංගු වන්නේ ගිවිසුමේ සඳහන් වැඩ සහ එකී ප්‍රමාණයෙන් සියයට 25 දක්වා පමණි. | පිළිතුරු ලබාදුන් අවස්ථාවේ පැවති තත්ත්වය වෙනස්වී නොමැත. |
| viii. | මිල වැඩිවීම් ගෙවීමට ගිවිසුමේ එකගතාවයක් නොතිබුණද අවසාන බිල්පත මගින් මිල වැඩිවීම් සඳහා රු.3,324,543 ක් ගෙවීම් කර තිබුණි. | සියළු ගෙවීම් නීත්‍යානුකූල වන පරිදි ඉටුකළ යුතුය. | ගිවිසුම සකස් කිරීමේදී ප්‍රමාද දෝෂයක් සිදුව ඇත. මේ හේතුවෙන් එහි වාසිය කොන්ත්‍රාත්කරුට හිමිවන අතර එය නොගෙවා සිටියත් කොන්ත්‍රාත්කරු Arbitration ක්‍රියාවලියට වේ. එවිට මිල වැඩිවීමද ගෙවීම් කර Arbitration ක්‍රියාවලිය සඳහා කොන්ත්‍රාත්කරුට වැයවන මුදලද රජයට ගෙවීමට සිදුවනු ඇත. එසේ හෙයින් මිල | ගිවිසුම් සකස් කිරීමේදී ප්‍රමාද දෝෂයක් සිදුවී ඇති බැවින් එහි වාසිය කොන්ත්‍රාත්කරු ලබාගෙන තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | විචලන ගෙවා ඇති අතර එය වැඩිපුර ගෙවීමක් නොවේ. | |
| ix. | ගිවිසුම් ප්‍රකාරව ආපසු අයකළ යුතු අත්තිකාරම් මුදල් බිල්පත් 01 සිට 03 දක්වා මාස 06ක් තුළ නිසි පරිදි අය නොකිරීම හේතුවෙන් රු.5,558,482 ක රජයේ මුදල් අවභාවිතා කිරීමක් සිදුව තිබුණි. | රජයේ මුදල් නියමිත දිනයන්හි අයකිරීමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදී සම්මත ලංසු තැබීමේ ලේඛන (SBD) උපදෙස් හා කොන්ත්‍රාත් ගිවිසුමේ සඳහන් පරිදි කටයුතු කිරීමට සටහන් කරගත් බව. | රජයේ මුදල් අවභාවිතා කිරීම සම්බන්ධව ක්‍රියාකිරීම පිළිබඳ ක්‍රියාමාර්ග ගෙන නැත. |
| x. | කර්මාන්ත අවසාන බිල්පත ගෙවීමේදී ඉතුරුම්, (saving) අත්හළ වැඩ, වැඩිපුර කළවැඩ ඇතුලත්ව සංසන්දනාත්මක ප්‍රකාශය සකස් කර නොතිබුණි. තවද, කර්මාන්තය නිම කිරීමෙන් පසු ඉදිරිපත් කළයුතු සැලසුම් (AS build Drawing), හිමිකම් නොපෑම් සහතිකය නිම කිරීමේ සහතිකය ලබාගෙන නොතිබුණි. මේ තත්ත්වය මත අනාගතයේ මෙහි ඇතිවන අළුත්වැඩියා, නිවැරදි කිරීම් සිදුකිරීමට | නිලධාරීන් තම වගකීම මනා විනිවිදභාවයකින් යුතුව ඉටුකළ යුතුය. | සන්සන්දනාත්මක ප්‍රකාශ සකස් කිරීම අත්‍යවශ්‍ය නොවේ. අතිරේක වැඩ කොටස් බිල්පත් මගින් සොයාගත හැක. **AS build drawings** සඳහා ඇස්තමේන්තුවෙන් මුදල් වෙන්කර නොමැති නිසා එය සිදුකර නොමැත. හිමිකම් නොපෑමේ සහතිකය ලබාගැනීම විශාල ව්‍යාපෘති සඳහා සිදුකරන බැවින්, එය සිදු කර නොමැත. | නිසි පරිදි ලබාගත යුතු ලිපි ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | නොහැකි තත්ත්වයක් පැන නගින බවත්, ගිවිසුම ප්‍රකාරව බැඳීම් නිදහස් කළ බවට වූ සනාථ කිරීම් ලබා නොගැනීම තුළින් අනාගතයේදී කොන්ත්‍රාත්කරු තවදුරටත් බැඳීම් ඇතිකර ගැනීම සඳහා අවස්ථාව සැලසී තිබුණු බවත් නිරීක්ෂණය විය. | | | |
| 09. | 1987 වර්ෂයෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ සිදුවූ සමාලෝචිත වර්ෂය අවසාන වන විට මාස 12 ත් වර්ෂය 32 ත් අතර කාලසීමාවක් ගතව තිබුණු රු.25,000 ට අඩු වටිනාකමින් යුතු සිදුවීම් 09 කට අදාළව එකතුව රු.73,253 ක හානි හා පාඩු ද, රු.25,000 ට වැඩි වටිනාකමින් යුතු සිදුවීම් 20 කට අදාළව එකතුව රු.8,233,211 ක වටිනාකමින් යුතු හානි හා පාඩු ද සම්බන්ධ ලිපිගොනුවල කටයුතු නිමකර නොතිබුණි. | අයකර ගැනීමට හෝ කපාහැරීමට සම්බන්ධ ලිපිගොනු කටයුතු නොපමාව ඉටුකළ යුතුය. | ලිපිගොනුවල අදාල කටයුතු සිදුකර ගෙන යනු ලබන බව. | 2022 පෙබරවාරි වන විටත් එම තත්ත්වය සම්පූර්ණයෙන් නිවැරදි කර නැත. |
| 10. | 2003 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයටත් පසුව | රජයේ ඉඩම් සම්බන්ධයෙන් රජයේ ඉඩම් ආඥා පනතේ ප්‍රතිපාදන | හිඟ මුදල් ඉදිරියේදී අයකරන බවත්, ක්‍රමවේදය නිවැරදි කර ඉදිරියේදී | මෙම ඉඩම සඳහා කැණීම් බලපත්‍ර ලබාදීමේදී එම ඉඩම සින්නක්කර ඉඩමක් |

| | | | | |
|---|---|---|---|---|
| | තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයටත් අයත් වූ දකුණු බටඅත එරඹුගලයාය පිහිටි අංක 16 දරන ගල්වල පිහිටි අක්කර 04 ක් වූ රජයේ ඉඩම එක් පුද්ගලයකු විසින් තමා දීර්ඝකාලයක් ඉඩම භුක්තිවිඳීම හේතුකොටගෙන තමාගේ නමින් ප්‍රකාශන ඔප්පුවක් පිළියෙල කර 2018 මාර්තු 14 වන දින තංගල්ල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කර තිබුණි. රජයේ ඉඩම අනවසර පරිහරණයට යොදා ගැනීම හා තමා නමට ලියාපදිංචි කර ගැනීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙක විසින්ම කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අනුව කටයුතු කළ යුතුය. | බලපත්‍ර ලබාදීමට කටයුතු කරන බව. | ලෙස සලකා ප්‍රකාශන ඔප්පුවක් ඉදිරිපත් කර ඇත. පෞද්ගලික මිනින්දෝරු කෙනෙකු ලවා ඉඩම මැනුම් කර අයිතිය තහවුරු කරන ලෙස ප්‍රාදේශීය ලේකම් විසින් ඉඩමට හිමිකම් කියනු ලබන අය වෙත දන්වා ඇත. 2022 පෙබරවාරි වන විටත් එම තත්ත්වය පැවතුණි. |
| 11. | අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ලියන්ගස්තොට ප්‍රදේශයේ පවත්වා ගෙන යන කළුගල් වැඩබිමේ ආරම්භය වූ 2017 ඔක්තෝබර් 23 සිට 2019 ඔක්තෝබර් 16 දක්වා පුපුරණ ද්‍රව්‍ය කි.ග්‍රෑ. 26244 ක් නිකුත් කර තිබූ අතර, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ නිලධාරීන්ගේ 2019 ඔක්තෝබර් 16 දින ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තාව | සහකාර පුපුරණ ද්‍රව්‍ය පාලක විසින් නිකුත් කරනු ලබන පුපුරණ ද්‍රව්‍ය අදාල කාර්යයන් සඳහා යොදා ගනු ලබන්නේද යන්න පිළිබඳව විධිමත් පසු විපරම් ක්‍රියාවලියක් මගින් තහවුරු කරගත යුතු අතර මෙසේ අතිරික්ත පුපුරණ ද්‍රව්‍ය බාහිර පාර්ශවයන්ට මුදා හැරීම ජාතික | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙන් තොරතුරු ලබාගෙන පිළිතුරු ඉදිරිපත් කරන බව. | 2022 පෙබරවරි දක්වා පිළිතුරු සපයා නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | අනුව කැණීම් කරන ලද මුළු කළුගල් පරිමාව කියුබ් 12656 කි. ඒ සඳහා වැයවන අවම පුපුරණ ද්‍රව්‍ය ප්‍රමාණය කි.ග්‍රෑම් 6328 කි. ඒ අනුව ඉතිරි පුපුරණ ද්‍රව්‍ය කි.ග්‍රෑම් 19916 ක් හෙවත් නිකුත් කළ ප්‍රමාණයෙන් සියයට 76 ක අතිරික්ත පුපුරණ ද්‍රව්‍ය කුමන කාර්යයක් සඳහා යොදා ගත්තේද යන්න අනාවරණය නොවුණි. | ආරක්ෂාව පිළිබඳවද තර්ජනයන් වියහැකි බැවින්, ඒ පිළිබඳව අවධානය යොමු කළ යුතුය. | | |
| 12. | 2011 යල කන්නයේ වී මිලදී ගැනීම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් ලද මුදලින් හම්බන්තොට දිස්ත්‍රික්කයේ එක් සමුපකාර සමිතියක් වෙත 2011 අගෝස්තු 11 වන දින දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ලබාදුන් පොළී රහිත අත්තිකාරම් මුදලින් රු.මිලියන 5 ක් විගණිත දිනය වූ 2020 පෙබරවාරි 06 දිනට අයවී නොතිබුණි. | ජාතික අවශ්‍යතාවයන් වෙනුවෙන් බාහිර පාර්ශවයන්ට ලබාදුන් රජයේ මුදල් අප්‍රමාදව අයකර ඒකාබද්ධ අරමුදලට බැරකළ යුතුය. | මෙම මුදල අයකර ගැනීමට නිරන්තරයෙන් කටයුතු කළද මේ දක්වා අයවී නොමැති බවත් ඉදිරියේදී නීත්‍යානුකූලව කටයුතු කරන බව. | නඩු පවරා මුදල් අයකර ගැනීමට පෙර ගිවිසුම් ප්‍රකාරව 5 වගන්තිය යටතේ කටයුතු කරමින් බේරුම්කරණය සඳහා යොමු වීමට උපදෙස් ලැබී ඇත. තීරක තීන්දුවක් ලබාගැනීම පිණිස වූ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් වෙත වාර්තා කර ඇත. |
| 13. | සමෘද්ධි ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී සමෘද්ධි සංවර්ධන නිලධාරී, ග්‍රාම නිලධාරී, ආර්ථික සංවර්ධන නිලධාරී | චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව ප්‍රතිලාභීන් තෝරාගැනීම හා | වැළැක්වීමට ක්‍රියාමාර්ග ගෙන නොමැත. | දිස්ත්‍රික්කයේ ප්‍රමුඛතා ලේඛනගත කරන ලද පුද්ගලයින් 15,817 |

| | | | | |
|---|---|---|---|---|
| | හා ප්‍රජා මූල සංවිධානයේ සභාපති යන නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ලේඛනගත කරන ලද ප්‍රතිලාභීන් 21 දෙනෙකුගෙන් යුත් ප්‍රමුඛතා ලේඛනයේ අනුපිළිවෙල නොසලකා හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අරවනමුල්ල ග්‍රාම නිලධාරී වසමේ ප්‍රමුඛතා ලේඛනයේ පළමු 07 දෙනා සමඟ අවසන් 04 දෙනාට සමෘද්ධි සහනාධාර හිමිකම්පත් ලබාදී තිබුණි. | ප්‍රතිලාභ ලබාදීමට කටයුතු කළ යුතුය. | | නාමලේඛනයක් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කරන ලදි. අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කර තිබූ ප්‍රමාණය 13,227 ක් බවත් ප්‍රමුඛතා ලේඛනයේ සඳහන් ප්‍රමුඛතාවය නොසලකා සහනාධාර ලබා දී ඇත. |
| 14. | විගණන පරීක්ෂාවට අනුව හම්බන්තොට හා බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකෙහි ග්‍රාම නිලධාරී කොට්ඨාශ 03 ක වඩාත් සුදුසුකම් සහිත ප්‍රමුඛතා ලේඛනයේ නම සඳහන් වූ පවුල් 30 ක් සඳහා ද ප්‍රමුඛතා ලේඛනයේ නම් සඳහන් නොවූ එහෙත් සුදුසුකම් සහිත පවුල් 05 ක් සඳහාද සමෘද්ධි ප්‍රතිලාභ ලැබී නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව නියමිත නිර්නායක අනුව ප්‍රතිලාභීන් තෝරාගැනීම හා ප්‍රතිලාභ ලබාදීමට කටයුතු කළ යුතුය. | ප්‍රමුඛතා ලේඛනයේ සඳහන් ප්‍රමුඛතාවය නොසලකා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කර එවා තිබූ ලේඛනයට අනුව සහනාධාර ලබාදීමට කටයුතු කර ඇත. | - එම - |
| 15. | සහනාධාර ලබාදීමේ නිර්නායකවල ප්‍රමුඛතාවය නොසලකා බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී | චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව ප්‍රතිලාභීන් තෝරාගැනීම හා ප්‍රතිලාභ ලබාදීමට | - එම - | අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කර එවා තිබූ ලේඛනයට අනුව සහනාධාර ලබාදීමට කටයුතු |

| | | | | |
|---|---|---|---|---|
| | කොට්ඨාශ දෙකක ආදායම් මාර්ග හිමි ප්‍රතිලාභීන් 04 දෙනෙකු වෙත සමෘද්ධි ප්‍රතිලාභ ලබාදී තිබුණි. | කටයුතු කළ යුතුය. | | කර ඇත. |
| 16. | බෙලිඅත්ත, තංගල්ල, ඕකෙවෙල සහ වීරකැටිය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හතරෙහි ප්‍රතිලාභීන් 1,209 ක් වෙනුවෙන් ගම්පෙරළිය නිවාස සංවර්ධන වැඩසටහන යටතේ දිළිඳු පවුල්වල තාවකාලික වහල ස්ථිර වහල බවට පරිවර්තනය කිරීම සඳහා 2019 වර්ෂයේදී රු.120,806,068 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | | |
| **i.** | දිස්ත්‍රික්කයේ ඉහල දරිද්‍රතා මට්ටමක් ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තෝරා නොගෙන පහල දරිද්‍රතා මට්ටමක් සහිත ඉහත සඳහන් ප්‍රදේශීය ලේකම් කොට්ඨාශ තෝරා ගෙන තිබුණද ප්‍රතිලාභීන් තෝරා ගැනීම විධිමත් ක්‍රමවේදයකට අනුව සිදුවී නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් වල සඳහන් නිර්නායක අනුව සුදුසුම ප්‍රතිලාභියා තෝරා ගැනීම සඳහා කටයුතු කළයුතුය. | ප්‍රතිලාභීන් තේරීමේ බලය දිස්ත්‍රික් ලේකම්ට හෝ එම නිලධාරීන්ට හිමිනොවූ බවත්, එසේ වුවද ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අදාල නිලධාරීන් යොදවා ප්‍රතිලාභීන් පිළිබඳව පරීක්ෂා කොට ආධාර ලබාදීම සිදුකළ බව. | 2022 පෙබරවාරි වනවිටත් එම තත්ත්වයම පවතී. |
| **ii.** | ප්‍රතිලාභීන් තෝරා ගැනීමට නිවැරදි හා අදාල | -එම- | ප්‍රතිලාභීන් තේරීමේ බලය දිස්ත්‍රික් | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| | නිර්නායක යොදා නොගැනීම නිසා ප්‍රතිලාභීන් 567 දෙනෙකු සඳහා වෙන්කළ ප්‍රතිපාදනයෙන් සියයට 20 සිට සියයට 80 දක්වා ප්‍රමාණයක් පමණක් ගෙවා තිබූ අතර තවත් ප්‍රතිලාභීන් 86 දෙනෙකුට ආධාර මුදල් ගෙවා නොතිබුණි. | | ලේකම්ට හෝ එම නිලධාරීන්ට හිමිනොවූ බවත්, එසේ වුවද ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අදාල නිලධාරීන් යොදවා ප්‍රතිලාභීන් පිළිබඳව පරීක්ෂා කොට ආධාර ලබාදීම සිදුකළ බව. | |
| 17. | වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 07 ක් විසින් ලබාදී තිබුණු ප්‍රතිපාදන සීමාව ඉක්මවා රු.3,176,850 ක් වැය කර තිබුණි. | ලබාදුන් ප්‍රතිපාදන සීමාව මත වියදම් කළ යුතුය. | ප්‍රතිපාදන ඌණතා පිළිබඳ අදාල අමාත්‍යාංශ දැනුවත් කර ඇත. | ප්‍රතිපාදන ඌණතා පිළිබඳ අදාල අමාත්‍යාංශ දැනුවත් කර තිබුණද ඒ පිළිබඳව කරුණු දක්වා නැත. |
| 18. | වැඩ තහනම් කර තිබූ නිලධාරීන් දෙදෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු වර්ෂ 04 කට වැඩි කාලසීමාවක් ඉක්මවා ඇති රු.443,538 ක අක්‍රීය ණය ශේෂ අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | රජයට අයවිය යුතු ණය ශේෂ නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | එකතුව රු.135,472 ක ණය ශේෂය සඳහා අදාල ලිපිගොනු රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමුකර ඇති බවත් රු.308,066 ක ණය ශේෂ අයකර ගැනීමට නීත්‍යානුකූලව කටයුතු කරන බවත් ඉතිරි ණය ශේෂය රු.8,000 ක වාරික මගින් අය කරනු | 2022 පෙබරවාරි වනවිටත් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ලබන බවත් දන්වා ඇත. | |
| 19. | සේවය අතහැර ගොස් තිබූ නිලධාරීන් 03 දෙනෙකුගෙන් එකතුව රු.314,515 ක ණය ශේෂ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබුණි. මෙම ණය ශේෂ ණයකරුවන්ගෙන් අයකර ගැනීමට හෝ එසේ නොහැකි නම් ඒවා සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.5 වගන්තිය අනුව ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. | රජයට අයවිය යුතු ණය ශේෂ නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | ණය ශේෂ අයකර ගැනීමට නීත්‍යානුකූලව කටයුතු කර ඇති බව. | ණය ශේෂ අයකර ගැනීමට නීත්‍යානුකූලව කටයුතු කරමින් පවතී.. |
| 20. | තැන්පතු ගිණුම් අංක 6000-0-0-16-0-43 යටතේ ලබාගත් එකතුව රු.794,692 ක රැඳවුම් මුදල් තැන්පතු 09 ක් 2020 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 02 ක් ඉක්මවා ගොස් තිබුණද අදාල තැන්පතුකරුවන්ට ගෙවීමට හෝ මුදල් රෙගුලාසි 571 පරිදි කටයුතු කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතුය. | එකතුව රු.170,644 ක් නිරවුල් කර ඇත. | 2022 පෙබරවාරි වන විට රු.624,048 ක් ශේෂයක් අයකර ගතයුතුව පැවතුණි. |
| 21. | තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ පහේ ගෙදර අසල සිට සිංහල ගෙදර දක්වා මාර්ගයේ පැතිබැම්ම | අපේක්ෂිත සම්පිණ්ඩතා ශක්තිය තිබිය යුතු පරිදි කාර්යයන් ඉටුකළ යුතුය. | පාධාංකයන්හි සාමාන්‍ය අගය ගණනය කර $30NMM^{-2}$ ට වැඩි නිසා ඒ අනුව ගෙවීම් | අපේක්ෂිත සම්පිණ්ඩතා මට්ටම නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ඉදිකිරීම හා කැටගල් ඇතිරීම ව්‍යාපෘතියෙහි පරීක්ෂාවට භාජනය කල කැටගල් වලින් සියයට 50 ක්ම අපේක්ෂිත සම්පිණ්ඩතා ශක්ති මට්ටමට වඩා අඩු මට්ටමක පැවතුණි. | | කටයුතු සිදු කර ඇති බව. | |
| 22. | පෙරපුත්තාභයගම ශ්‍රී රාගල්ගම, සියල්සෙත්ගම යන ගම්මාන සම්බන්ධ වන අභ්‍යන්තර මාර්ග බොරළු දමා සංවර්ධනය කිරීමේ දී බොරළු ඝන මීටර 96.2 ක් අඩුවෙන් යොදා තිබූ බැවින් රු.117,874 ක් වැඩියෙන් ගෙවීමට නිර්දේශ කර තිබුණි. | නිවැරදි මිනුම් ලබාගෙන ගෙවීම් කටයුතු සිදුකළ යුතුය. | දිස්ත්‍රික් ඉංජිනේරු මගින් උපදෙස් ලබාගෙන ඒ අනුව ඉදිරි කටයුතු සිදුකරන බව. | වැඩියෙන් කරන ලද ගෙවීම 2022 පෙබරවාරි වන විටත් අයකරගෙන නොතිබුණි. |
| 23. | 1987 සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ සිදුව තිබුණු සමාලෝචිත වර්ෂය අවසාන වන විට වර්ෂ 02 ත් වර්ෂ 33 ත් අතර කාලසීමාවක් ගතව තිබුණු රු.25,000 ට අඩු වටිනාකමින් යුතු සිදුවීම් 09 කට අදාලව එකතුව රු.73,253 ක හානි හා පාඩු සම්බන්ධ ලිපිගොනුවල කටයුතු අවසන් කර නොතිබුණි.තවද, 1987 සිට 2020 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ සිදුව තිබුණු රු.25,000 ට වැඩි වටිනාකමින් යුතු සිදුවීම් 23 | අයකර ගැනීමට හෝ කපාහැරීමට කටයුතු කළ යුතුය. | විශේෂ කමිටුවක් පත්කර අවශ්‍ය කටයුතු සිදුකරන බව. | තත්ත්වය සම්පූර්ණයෙන් නිවැරදි කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | කට අදාලව එකතුව රු.8,538,572 ක වටිනාකමින් යුතු හානි හා පාඩු සම්බන්ධව ලිපිගොනුවල කටයුතු අවසන් කර නොතිබුණි. | | | |
| 24. | සිරිබෝපුර නව පරිපාලන සංකීර්ණයට යාබද නිලධාරීන්ගේ නිවාස සංකීර්ණයේ ජල බිල්පත් ගෙවීම වෙනුවෙන් 2013 වර්ෂයේ සිට ප්‍රතිපූර්ණය කරගත යුතු රු.2,578,309 ක් අයකරගෙන නොතිබුණි. | නියමිත පරිදි ප්‍රතිපූර්ණය කරගත යුතුය. | අදාල නිල නිවාසවල පදිංචි නිලධාරීන් වෙත ජල ගාස්තු ගෙවන ලෙස ලිඛිතව දැනුම් දී ඇති බවත් ඒ අනුව ඉදිරියේදී ජල ගාස්තු අය කර විගණනයට වාර්තා කරන බව. | අදාල නිල නිවාසවල පදිංචි නිලධාරීන් වෙත ජල ගාස්තු ගෙවන ලෙස ලිඛිතව දැනුම් දී ඇති බවත් ඒ අනුව ඉදිරියේදී ජල ගාස්තු අය කර විගණනයට වාර්තා කරන බවත් දන්වා ඇත. |
| 25. | 2012 ඔක්තෝබර් 25 දින රජයේ ගිණුම් පිළිබඳව කාරක සභාවේ 16 වන තීරණය මඟින් “නාගරික සංවර්ධන අධිකාරිය මගින් 2012 ඔක්තෝබර් 12 දක්වා දිස්ත්‍රික් ලේකම් වෙත භාර නොදී දිස්ත්‍රික් ලේකම්ට අයත් ඉඩමෙහි ඉදිකර තිබුණු රජයේ නිලධාරීන් සඳහා වන නිල නිවාස 22 අත්පත් කර ගත යුතුවේ. එසේ අත්පත් කර ගැනීමෙන් අනතුරුව ඉහත නියෝග දිනයේ සිට මාස දෙකක් තුළ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට | 2012 ඔක්තෝබර් 25 දින රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ 16 වන තීරණය අනුව කටයුතු කළ යුතුය. | අවස්ථා කිහිපයකදීම නාගරික සංවර්ධන අධිකාරිය වෙත දැනුම් දීම් සිදු කරන ලද අතර මේ සම්බන්ධයෙන් යහපත් ප්‍රතිචාර ලැබී නොමැති බව. | අවස්ථා කිහිපයකදීම නාගරික සංවර්ධන අධිකාරිය වෙත දැනුම් දීම් සිදු කරන ලද අතර මේ සම්බන්ධයෙන් යහපත් ප්‍රතිචාර ලැබී නොමැති බව. |

| | | | | |
|---|---|---|---|---|
| | වාර්තා කිරීම සඳහා" නියෝග කර තිබුණද එම නියෝගය ක්‍රියාත්මක වූ බවට සාක්ෂි ඉදිරිපත් නොවීය. ඉහත නිවාස සහිත භූමිය මහවැලි සංවර්ධන අධිකාරියෙන් නාගරික සංවර්ධන අධිකාරියට පවරා ගැනීම සඳහා කටයුතු කරන බව නිරීක්ෂණය වී ඇත. | | | |
| 26. | අඟුණුකොළපැලැස්ස ප්‍රාදේශීය මිනින්දෝරු අධිකාරීගේ 2010 නොවැම්බර් 29 දිනැති ලිපිය මගින් සියාරපිටිය ග්‍රාම නිලධාරී වසමේ ගම්මන්වෙල මාර්ගයේ පිහිටා ඇති රජය සතු ඉඩමෙන් රූඩ් 02 ක් සුසාන භූමියක් සඳහාද රූඩ් 01 ක් බෝධිය සඳහාද වෙන්කර තිබුණි. මෙම සුසාන භූමිය සඳහා වෙන්කර තිබුණු ඉඩමේ ඊට යාබදව ඇති පන්සලේ දායක සභාව විසින් අනවසර ඉදිකිරීම් සිදුකරන බව ග්‍රාම නිලධාරී සහ ප්‍රදේශවාසීන් විසින් අවස්ථා කිහිපයකදී ප්‍රාදේශීය ලේකම් වෙත වාර්තා කර තිබුණද විගණිත දින වූ 2021 පෙබරවාරි 19 දින වන විටත් මෙම සුසාන භූමියේ අනවසර | ඉඩම් පනත යටතේ අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | විහාරාධිපති හිමියන් විසින් මෙහි ඉදිකිරීම් තවදුරටත් සිදු කරන බැවින් ඒ පිළිබඳව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | විහාරාධිපති හිමියන් විසින් මෙහි ඉදිකිරීම් තවදුරටත් සිදු කරන බැවින් ඒ පිළිබඳව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. |

| | | | | |
|---|---|---|---|---|
| | ඉදිකිරීම් සම්බන්ධයෙන් ඉඩම් පනත යටතේ අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | | |
| 27. | ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශය විසින් ලබාදී තිබුණු රු.200,000ක මූලික ප්‍රතිපාදන මත කටුවන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කාන්තා සමිතිවල සාමාජිකාවන් වෙත රු.5,000, රු.10,000 හා රු.15,000 ක් බැගින් ස්වයං රැකියා සඳහා ණය ලබාදීම සිදුකර තිබුණු අතර, ණය වාරික මාස 10 කදී සියයට 6 ක පොලියක් සමඟ අයකර ගැනීමටත් ගිවිසුම් ගතව තිබුණි. මේ යටතේ ණයලාභීන් 39 දෙනෙකු විසින් ලබාගෙන තිබුණු රු.195,000 ක ණය මුදල් ගිවිසුමේ පරිදි මාස 10 කදී ගෙවා නොතිබුණු බැවින් විගණිත දිනය වූ 2021 පෙබරවාරි 19 දින වන විට රු.109,190 ක හිඟ ණය ශේෂයක් පැවතුණි. තවද, ගිවිසුමේ පරිදි සියයට 6 ක පොළියක් අයකරගත යුතු වුවද එවැනි නිශ්චිත පදනමක් නොමැතිව පොළී අයකර තිබුණු අතර, පොළී අයකිරීමේදී වාරික නොගෙවූ මාස සඳහා සමුච්චිත පොළී අයකිරීමත් සිදුකර නොතිබුණි. | අදාල ණය මුදල් හා පොළී නියමිත පරිදි අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | හිඟ හිටි ණය ආපසු ගෙවන ලෙසට ණයලාභීන් දැනුවත් කර ඇත. පසුගිය පොලිය අය කර ගැනීම සම්බන්ධයෙන් උපදෙස් ලැබී නැති අතර එය බල මණ්ඩලය මගින් ගනු ලබන එකඟතාවයකි. ප්‍රාදේශීය බල මණ්ඩලය හරහා එම එකඟතාවය ලබා ගන්නා ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් දී ඇත. | හිඟ හිටි ණය ආපසු ගෙවන ලෙසට ණයලාභීන් දැනුවත් කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| 28. | වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ මැදමුලන සමෘද්ධි බැංකු සංගමය මගින් කොවිඩ් 19 වසංගත තත්ත්ව සමයේ සහන අරුණළු ණය වැඩසටහන යටතේ සමෘද්ධි නොවන ප්‍රතිලාභීන් 23 කට ලබාදුන් එකතුව රු.115,000 ක් නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නියමිත පරිදි ණය වාරික අයකල යුතුය. | සමෘද්ධි සහනාධාරය නොලබන ප්‍රජා මූල සාමාජිකයන් සඳහා සමෘද්ධි අරුණළු ණය වැඩසටහන යටතේ ණය ලබා දිය හැකි බැවින්, එසේ ප්‍රතිලාභීන් 23 දෙනෙකුට ණය ලබා දී ඇති බව සහ ඒවා අය කර ගැනීමට අවශ්‍ය කටයුතු යොදා ඇති බව. | සමෘද්ධි සහනාධාරය නොලබන ප්‍රජා මූල සාමාජිකයන් සඳහා සමෘද්ධි අරුණළු ණය වැඩසටහන යටතේ ණය ලබා දිය හැකි බැවින්, එසේ ප්‍රතිලාභීන් 23 දෙනෙකුට ණය ලබා දී ඇති බව සහ ඒවා අය කර ගැනීමට අවශ්‍ය කටයුතු යොදා ඇත. |

**මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

--------------------------------------

2018 **තත්ත්වාගණනය කළ මතය**

2019 **තත්ත්වාගණනය කළ මතය**

2020 **තත්ත්වාගණනය කළ මතය**

| | විගණකාධිපති වාර්තාවේ ඇතුළත් ප්‍රධාන අඩුපාඩු | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| | ------------------------ | --------------------- | ------------------------ | --------------------- |
| 01. | 2018 ජූලි 18 දිනැති අංක 03/2018 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛය පරිදි අතිරික්ත කාර්ය මණ්ඩලයට වැටුප් | අතිරික්ත කාර්ය මණ්ඩලය ස්ථාන මාරුකිරීමට හෝ අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුය. | නාඋල හා දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා භාෂා පරිවර්තක තනතුරු ඇති කිරීමට කළමනාකරණ සේවා | කළමනාකරණ සේවා නිලධාරියකු හා සංවර්ධන සම්බන්ධීකරණ හැර අනෙකුත් අතිරික්ත එලෙසම පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | ගෙවිය නොහැකි බව දක්වා තිබුණ ද දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක තනතුරු 07 ක අතිරික්ත කාර්යමණ්ඩලය 19 දෙනෙකු සඳහා 2020 ජනවාරි සිට මාස 10 ක කාලයක් වෙනුවෙන් රු.1,870,300 ක් වැටුප් ලෙස ගෙවා තිබුණි. | | දෙපාර්තමේන්තුව වෙත අනුමැතියට යවා ඇත. සංවර්ධන නිලධාරීන් අනුමැතිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යොමු කිරීමට ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. රියදුරු අමාත්‍යාංශයට මාරු කිරීමට ඉල්ලා ඇත. | |
| 02. | මාතලේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ සපිරිගමක් ව්‍යාපෘතියේ බටගල්ල මාර්ගය අසල කානුවේ හා ඔය පහළ ප්‍රජා ශාලාව වෙත ප්‍රවේශ වන මාර්ගයේ බෝක්කුවේ දිග නියමිත ප්‍රමාණයට වඩා අඩු වීම නිසා රු. 31,266 ක් වැඩිපුර ගෙවා තිබුණි. | ඉටුකරන ලද වැඩ සඳහා පමණක් ගෙවීම් කළ යුතුය. | රඳවුම් මුදලින් වැඩිපුර ගෙවීම අයකර ගැනීමට කටයුතු කිරීම. | 2022 පෙබරවාරි 21 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නැත. |
| 03. | මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සපිරි ගමක් සංවර්ධන වැඩසටහන යටතේ රු. 500,000 ක ප්‍රතිපාදන යොදවා දොරකුඹුර උහන ගොඩැල්ල පවුල් 15 ක් සඳහා ජල පහසුකම් සැපයීම ව්‍යාපෘතියේ ජලනල එලීම හා පස් කැපීම වෙනුවෙන් රු.29,538 ක මුදලක් වැඩිපුර | ඉටුකරන ලද කර්මාන්තවල මිමි ලබා ගැනීමේදී ඉටුකරන ලද අයිතම වල මිමි නිවැරදිව ගණනය කළ යුතුය. | අදාළ දුර ප්‍රමාණයට කාණු කැපීමේ කටයුතු හා ජල නල එලීම් කටයුතු සිදු කර ගැනීමට ජල අවශ්‍යතා පිළිබඳව තොරතුරු ලබා ගැනීම. | 2022 පෙබරවාරි 21 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | ගෙවා තිබුණි. | | | |
| 04. | සමිතියක් ස්ථාපිත කර සාමාජිකයින් වෙත ලබාදිය යුතු රු. 840,000 ක් වටිනා සෝජි මහන මැෂින් 20 ක් යටවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් තනි පුද්ගලයකු වෙත ලබා දී තිබුණි. | ව්‍යාපෘතියේ උපදෙස් පරිදි සමිතියක් හරහා කටයුතු කළ යුතුය. | නැවත මෙවැනි අඩුපාඩු සිදු නොවන අයුරින් නිලධාරීන් දැනුවත් කිරීම. | 2022 පෙබරවාරි වන විටත් සිදුවී ඇති වැරැද්ද නිවැරදි කිරීමට කටයුතු කර නැත. |
| 05. | ලග්ගල - පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමෘද්ධි සංවර්ධන නිලධාරින් ලෙස සේවය කරන හා මහජන නියෝජිතයන් ලෙස කටයුතු කරන නිලධාරින් දෙදෙනෙකු එම අවස්ථා දෙක යටතේ ම යතුරු පැදි ලබාගෙන තිබූ බැවින් අයකර ගත යුතු රු.377,000 ක මුදල ඔවුන්ගෙන් අයකර ගෙන නොතිබුණි. | වැඩිපුර ලබාගත් යතුරුපැදි සඳහා වෙළඳපල වටිනාකම අයකර ගැනිමට හා ඔවුන් එසේ කිරීම සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. | වැටුපෙන් අයකර ගැනීමට අවස්ථා 7 කදී සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල් දැනුවත් කර ඇත. | 2022 පෙබරවාරි වන විටත් අදාල මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| 06. | නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අක්කර 50 මාර්ගය සහ අතුරු මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ ඉටු නොකළ වැඩ සඳහා රු. 68,590 ක ගෙවීම් කර තිබුණි. | වැඩිපුර ගෙවීම් ආපසු අයකර ගැනීම හා වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. | ඉංජිනේරු උපදෙස් මත තාක්ෂණික නිලධාරියකු මඟින් වාර්තාවක් ලබා ගැනීමට ලිපියක් යොමුකර ඇත. | 2022 පෙබරවාරි වන විටත් අදාල වැඩිපුර ගෙවීම අයකර ගෙන නොතිබුණි. |
| 07. | මාතලේ ප්‍රාදේශීය ලේකම් | යෝජිත ව්‍යාපෘති ඉටු | ඉදිරියේදී දී යෝජිත | ක්‍රියාත්මක නොකළ |

| | | | | |
|---|---|---|---|---|
| | කාර්යාලයේ 2020 වර්ෂය තුළ ඉටු කිරීමට යෝජිත ව්‍යාපෘති 177 අතුරින් රු.26,500,000 වටිනා ව්‍යාපෘති 27 ක් ක්‍රියාත්මක නොකර ඒ වෙනුවට වෙනත් ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබුණි. එම හේතුවෙන් මහජන අවශ්‍යතාවය අනුව ග්‍රාමීය නියෝජිතයන් හදුනාගත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. | කිරීම පිළිබඳ අවධානය යොමු කළ යුතු අතර වෙනත් ව්‍යාපෘති කරන්නේ නම් ඊට අනුමැතිය ලබාගත යුතුය. | ව්‍යාපෘති පමණක් ඉටුකිරීමට කටයුතු කිරීම. | ව්‍යාපෘති පසුව හෝ ක්‍රියාත්මක කළ බවට තොරතුරු නොවීය. |
| 08. | නාඋල ලිහිණිපිටිය ජල යෝජනා ක්‍රමය වෙනුවෙන් 2008 සිට 2017 වර්ෂය දක්වා අවස්ථා 06 කදී එකතුව රු.5,769,793 ක් වැය කර ඉදිකිරීම් කර තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසානය වන විට ද එම ව්‍යාපෘතියෙන් කිසිදු ජල පාරිභෝගියකු වෙත ජලය ලබා දී නොතිබුණි. | මුදල් නිදහස් කරන ලද ව්‍යාපෘති මඟින් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කළයුතුය. | ව්‍යාපෘතිය ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවට පැවරීමට අනුමැතිය දී ඇත. | 2022 පෙබරවාරි වන විටත් ව්‍යාපෘතිය භාවිතයට ගෙන නොතිබුණි. |
| 09. | 2014 වර්ෂයේ සිට 2018 දක්වා වර්ෂයන් තුළ අවස්ථා 06 කදී වැඩසටහන් 05 ක් යටතේ ලබාදී තිබූ එකතුව රු.3,748,000 ක ප්‍රතිපාදන මඟින් රු.3,685,398 ක් වැයකර යටවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් | මුදල් නිදහස් කරන ලද ව්‍යාපෘති මඟින් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කළ යුතු අතර සැලැසුමකින් තොරව රජයේ මුදල් වැය කිරීම | වැලැක්වීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2022 පෙබරවාරි වන විටත් ව්‍යාපෘතිය ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | කහවත්ත පානීය ජල ව්‍යාපෘතියේ ඉදිකිරීම් කර තිබුණි. එසේ වුවද එහි අඩුපාඩු හේතුවෙන් 2019 වර්ෂය අවසානය වන විට ද කිසිදු ජල පාරිභෝගියකු වෙත ජල සැපයුම් ලබා දී නොතිබුණි. | සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගතයුතුය. | | |
| 10. | යටවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපෘතිය ශක්තිමත් කිරීම සඳහා 2018 හා 2019 වර්ෂවලදී ලබාදී තිබූ මුදලින් 2020 දෙසැම්බර් 31 දින වන විට රු.666,935 ක මුදලක් නිෂ්කාර්යව පැවතුණි. | ලැබී ඇති ප්‍රතිපාදන ඵලදායිව ව්‍යාපෘති වෙනුවෙන් යෙදවිය යුතුය. | - එම | 2022 පෙබරවාරි වන විටත් එම තත්ත්වයේම පැවතුණි. |
| 11. | උකුවෙල හා රත්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල 2019 වර්ෂයේ “ගම්පෙරළිය වැඩසටහන” යටතේ මිලදී ගන්නා ලද රු. 26,642,202 ක් වූ සෙවිලි තහඩු හා උපකරණ නිෂ්කාර්යව පැවතුණි. | මිලදී ගන්නා ලද තහඩු බෙදා දීමට කටයුතු කළ යුතුය. | උකුවෙල - පරාල හා ශ්‍රමය වතු සමාගම් මඟින් ලබාගෙන ඉදිරි කටයුතු කිරීමට දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතිය ලබාගෙන ඇත. සෙවිලි තහඩු හා උපකරණ ගබඩාකර ඇත. | - එම - |
| 12. | රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ යටිතල පහසුකම් විශේෂ වැඩසටහන යටතේ යෞවන සමාජ 2 ක් වෙත ලබාදුන් රු.141,750 ක් වටිනා කායවර්ධන උපකරණ 11 ක ඌනතාවයක් විය. | යෞවන සමාජ වෙත ලබා දෙනු ලබන භාණ්ඩ සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු සිදු කළ යුතුය. | පසු විපරම් නොකිරීම සම්බන්ධ ග්‍රාම නිලධාරීන්ට හා ක්‍රීඩා නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. අස්ථානගත වූ භාණ්ඩ දෙසැම්බර් 15 දිනට පෙර ස්ථාපිත | 2022 පෙබරවාරි වන විටත් එම තත්ත්වයේම පැවතුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | කරගන්නා ලෙස සමිතියට දැනුම් දී ඇත. | |
| 13. | ගුරු වෘත්තිය සඳහා මුදා හැර විගණිත දිනට වර්ෂ 03 ත් වර්ෂ 06 ත් අතර කාලයක් ඉක්ම ගොස් තිබූ ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිළධාරින් 08 දෙනෙකුගෙන් අයකර ගත යුතු රු.995,180 ක මුදල අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අධ්‍යාපන කාර්යාලය දැනුවත් කර අදාළ මුදල් අයකරගැනීමට කටයුතු කළ යුතුය. | පළාත් අධ්‍යාපන ලේකම් වෙත දැනුම් දී ඇත. | 2022 පෙබරවාරි වන විටත් නිලධාරීන් 06 දෙනෙකුගෙන් අදාළ මුදල් අයකරගෙන නොමැත. |
| 14. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක් මඟින් රජයේ සංවර්ධන ව්‍යාපෘති 37 ක් වෙනුවෙන් ඉඩම් පවරාගැනීමේදී වර්ෂ 1 සිට වර්ෂ 43 දක්වා කාලයක් ගතවී තිබුණ ද එම පවරාගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි. | ඉඩම් පවරාගැනීමේ කටයුතු කඩිනම් කළ යුතුය. | ඉදිරිපත් කර නැත. | විසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතිය, උඩුපිහිල්ල ශ්‍රී සරණංකර විදුහල හුන්නස්ගිරිය විකාශනාගාරය, කොහොඹිලිවෙල ස්මාරකය, කන්දේමඩ අවතැන්වූවන් සඳහා ඉඩම් අත්පත් කර ගැනීම යන කටයුතු අවසන් කර ඇති අතර අනෙකුත් නිරීක්ෂණ වල වෙනසක් නැත. |
| 15. | මාතලේ දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අංශයේ සහකාර අධ්‍යක්ෂ සැලැසුම් (අධිසේවක) තනතුරක් සඳහා එක් නිලධාරියකු සඳහා පුද්ගලික වන සේ අනුමත කර ඇතත්, ඊට අමතරව සහකාර අධ්‍යක්ෂ | අතිරික්ත නිලධාරීන් පුරප්පාඩු ඇති ස්ථානවලට ස්ථාන මාරු කළ යුතුය. | ඉදිරිපත් කර නැත. | 2022 පෙබරවාරි වන විටත් නිරීක්ෂණයේ වෙනසක් නැත. |

සැලැසුම් (අධිසේවක) තනතුරක් අතිරික්තව පවත්වාගෙන යමින් ඒ සඳහා 2019 ජනවාරි සිට 2020 දෙසැම්බර් දක්වා රු.1,872,083 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

**මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

-----------------------------------------

2018 - තත්ත්වාගණනය කළ මතය

2019 - තත්ත්වාගණනය කළ මතය

2020 - තත්ත්වාගණනය කළ මතය

| විගණකාධිපති වාර්තාවේ ඇතුළත් ප්‍රධාන අඩුපාඩු | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| 01. ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයෙකු අවුරුදු 16 මාස 2 ක කාලයක් එකතුව රු.2,064,377 ක මුදලක් කාර්යාල 02 කින් විශ්‍රාම වැටුප් ලබාගෙන තිබුණි. මෙම මුදල් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | විශ්‍රාම ගොනුව මාරු කිරීමෙන් පසු අනිවාර්යයෙන්ම විශ්‍රාම වැටුප් ලැබූ කාර්යාලයෙන් ඔහුගේ නම ඉවත් කල යුතුය. වැඩියෙන් ගෙවීම් අයකර ගැනිමට කටයුතු කල යුතුය. | පරීක්ෂණ මේ වනවිට අවසන් කර ඇති බවත් පරීක්ෂණ වාර්තාව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට හා මහනුවර පොලිස් ස්ථානයට 2019 පෙබරවාරි 8 දින යොමුකර ඇති බවත් ඉදිරි කටයුතු විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂගේ උපදෙස් මත සිදුකරන බවත් දන්වන ලදි. | වැඩිපුර ගෙවා ඇති රු.1,847,709 ක මුදල විශේෂ අනුමැතියක් ලබාගෙන වැන්දඹු විශ්‍රාම වැටුපෙන් අයකිරීමට විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත ප්‍රාදේශීය ලේකම්ගේ අංක DS/KGK/2/12 දරන 2021-12-31 දිනැති ලිපියෙන් දන්වා ඇත. තවද 2020 ජනවාරි මස සිට උක්ත විශ්‍රාමිකයාගේ (විශ්‍රාම වැටුප් අංක |

| | | | | |
|---|---|---|---|---|
| | | | | 1603037) විශ්‍රාම වැටුප නතර කර ඇති අතර 2021-03-02 දින මිය ගිය හෙයින් ඒ දක්වා හිලව් කරගන්නා මුදල රු.321,842 ක් බව ද වාර්තා කර ඇත. |
| 02. | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අධි අවධානම් කලාප ලෙස හඳුනාගත් බෙරවිල ප්‍රදේශයේ පවුල් 162 ක් පදිංචි කරවීම සඳහා කුරුඳුවත්ත නගරයට ආසන්න අක්කර 25 ක පෞද්ගලික ඉඩමක් වෙන්කර ගෙන, එම ඉඩමේ නැවත පදිංචි කරවීම සඳහා පවුල් 153 කට ඉඩම් ලබාදී නිවාස ඉදිකර ගැනීමට පළමු වාරිකය ලෙස රු.200,000 ක් බැගින් 2018 වර්ෂයේදී ලබා දී තිබුණි. 2021 වර්ෂය වන විටත් ඉන් පවුල් 125 ක් කිසිදු ඉදිකිරීමක් නොකර අධි අවධානම් කලාපවලම ජීවත් වෙමින් පැවතුණි. | අධි අවධානම් කලාපවල ජීවත්වන පිරිස්වලට ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය කර අදාල නිවාස ඉදි කිරීම් සම්බන්ධයෙන් පසු විපරම් කර ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කල යුතුය. | ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මුලින් ලබා දුන් එකඟතාවය මත ගෙවීම් සිදු කළ ද පසුව එකඟතාවය ලබා නොදීම හේතුවෙන් විකල්ප යෝජනාවලට අනුව නැවත පදිංචි කිරීම සඳහා කටයුතු කරමින් පවතින බව ප්‍රකාශ කරන ලදි. | නැවත පදිංචි කිරීමේ වැඩසටහනෙහි පළමු අදියර යටතේ ඉඩම් හා පළමු වාරිකය සඳහා මුදල් ලබාදුන් ප්‍රතිලාභීන් 153 අතරින් 33 දෙනෙක් අදාල මුදල නැවත පවරා ඇත. මේ වන විට නැවත පදිංචි කිරීමේ වැඩ සටහනෙහි ප්‍රගතිය පහත පරිදි වාර්තා කර ඇත.<br>නිවාස ඉදිකර අවසන්, සිව්වන වාරිකය නිදහස් කරන ලද 09, තෙවන වාරිකය නිදහස් කරන ලද 25, දෙවන වාරිකය නිදහස් කරන ලද 10, අත්තිවාරම් දමා වැඩ ආරම්භ කර ඇති 06 ක් විය.ප්‍රතිලාභීන් දෙනෙකු මුදල් |

| | | | | |
|---|---|---|---|---|
| | | | | නැවත ලබා දීම හෝ නිවාස තැනීම සිදු කර නොතිබුණි. |
| 03. | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නායයාමේ අධි අවධානම් හේතුවෙන් නැවත පදිංචි කළ යුතු බවට නිවාස 243 ක් හා වතු නිවාස 36 ක් හඳුනාගෙන තිබුණ ද පවුල් 126 ක් අධි අවධානම් ප්‍රදේශයේම පදිංචි වී තිබුණි. මොවුන් ආරක්ෂිත ප්‍රදේශයක පදිංචි කරවීමට විධිමත් ක්‍රමවේදයක් සකස් කර නොතිබූ අතර, මෙම ඉඩමේ මාර්ග සංවර්ධනය කිරීම වෙනුවෙන් 2018 වර්ෂයේදී රු.1,929,960 ක වියදමක් ද දරා තිබුණි. | අධිඅවධානම් කලාපවල ජීවත්වන පිරිස් සඳහා ලබා දුන් ප්‍රතිපාදන ඉතා කඩිනමින් උපයෝජනය කර නැවත පදිංචි කිරිම කළ යුතුය. | ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මුලින් ලබා දුන් එකඟතාවය මත ගෙවීම් සිදු කළ ද පසුව එකඟතාවය ලබා නොදීම හේතුවෙන් විකල්ප යෝජනාවලට අනුව නැවත පදිංචි කිරීම සඳහා කටයුතු කරමින් පවතින බව ප්‍රකාශ කරන ලදි. | මෙම කොට්ඨාශයට අදාලව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මඟින් නැවත පදිංචි කළ යුතු බවට නිර්දේශිත පවුල් සංඛ්‍යාව 243 වුවත්, අදාළ සියළු ප්‍රතිලාභින් සඳහා ලබාදීමට ප්‍රමාණවත් ඉඩම් කට්ටි ප්‍රමාණයක් රජයට පවරා ගන්නා ලද ඉඩමෙහි නොමැති වීම හේතුවෙන් අදාළ ඉතිරි ප්‍රතිලාභින් සඳහා ඉදිරියේදි රජයේ ඉඩම් ලබාදීමට හෝ විකල්ප අවස්ථා වෙත යොමු කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව ප්‍රාදේශීය ලේකම් වාර්තා කර ඇත. |
| 04. | මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අධි අවදානම් ලෙස හඳුනාගෙන තිබූ ප්‍රදේශවල ජීවත්වන පවුල් 120 | අධි අවධානම් ප්‍රදේශවල ජීවත්වන පවුල් හැකිතරම් කඩිනමින් සුදුසු | නැවත පදිංචි කරවීම සඳහා 120 ක් හඳුනාගෙන ඇතත් මූලික වටයේ 07 ක් | මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පවුල් 17 ක් නැවත පදිංචි |

| | | | | |
|---|---|---|---|---|
| | කගෙන් පවුල් 07 ක් පමණක් නැවත පදිංචි කිරීම සඳහා කටයුතු කරගෙන යමින් පැවති අතර, ඉතිරි පවුල් 113 දෙනාගේ නැවත පදිංචි කිරීමේ කටයුතු ආරම්භ කර නොතිබුණි. | ස්ථානයන්හි පදිංචි කරවීමට පියවර ගත යුතුය. | වෙනුවෙන් වන්දි ගෙවීම් අනුමත වී ඇත. ඉතිරි පවුල් නැවත පදිංචි කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. . | කර අවසන් බවත්, පවුල් 16 ක් සඳහා නිවාස ඉදි කරමින් පවතින බවත්, ප්‍රතිලාභීන් 87 දෙනෙකු නැවත පදිංචි වීම සඳහා ඉඩම් සොයමින් සිටින බවත්, ප්‍රතිලාභීන් 4 ක් නැවත පදිංචි වීමට අකැමැත්ත ලිඛිතව ප්‍රකාශ කර ඇති බවත්, ප්‍රතිලාභීන් 49 දෙනෙකු නැවත පදිංචි වීමට අකැමැත්ත වාචික ව ප්‍රකාශ කරන බවත් දන්වා ඇත. බඹරගහදෙණිය ග්‍රාම නිලධාරි වසමේ “අගුරුගමවත්ත” නැමැති රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් ඉඩම අත්පත් කොට ගෙන එය කොටස්කර ප්‍රතිලාභීන්ට බෙදා දීම සඳහා කටයුතු සූදානම් කර ඇත. |
| 05. | කුසලතා සංවර්ධනය, කාන්තාවන් බලගැන්වීම, ග්‍රාමීය සංවර්ධන හා ජීවනතත්ත්වය උසස් කිරීම හා රැකියා දසලක්ෂයක් බිහි කිරීමේ රජයේ වැඩපිළිවල | රාජ්‍ය මුදල් වැයකර මිළදීගත් භාණ්ඩ අදාල අරමුණු ඉටුකර ගැනීම සඳහා යොමු කිරීමට කටයුතු කළ යුතුය. | උපකරණ භාරදීමට නිසි උපදෙස් දී ඇතත් අමාත්‍යාංශය විසින් එය ක්‍රියාත්මක කර නොතිබුණි. | කර්මාන්ත අමාත්‍යාංශය විසින් 2016 වසරේ මහනුවර දිස්ත්‍රික්කයේ තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 07 |

| | |
|---|---|
| යටතේ පුහුණුවක් හා කර්මාන්තශාලා 08 ක් සඳහා රු.9,781,156 ක් වටිනා යන්ත්‍ර හා උපකරණ ලබාදී තිබුණි. මෙම කර්මාන්ත 08න් කර්මාන්තශාලා 05 ක් වසා දමා තිබුණු අතර, මෙම උපකරණවලින් රු.2,998,344 ක් වටිනා උපකරණ අමාත්‍යාංශ සම්බන්ධීකරණ ලේකම්ගේ නිවසේ ගබඩා කර තිබුණි. | ක් තුළ කුඩා පරිමාණ කර්මාන්තශාලා 08 ක් පිහිටුවීම සිදුවූ අතර, මේ වන විට එම සියළුම මධ්‍යස්ථාන අක්‍රීය මට්ටමේ පවතී. එසේම මෙම යන්ත්‍ර හා උපකරණ ආරක්ෂිතව ගබඩා කර තැබීමට සුදුසු ස්ථානයක් රජයේ ආයතන සතුව නොමැති බැවින් තවදුරටත් එම මධ්‍යස්ථාන පවත්වාගෙන ගිය ආයතනවල රඳවා තබා ඇත. එසේ රඳවා තබා ඇති යන්ත්‍ර හා උපකරණ භාණ්ඩ ලේඛනය අනුව භෞතිකව පරික්ෂා කරන ලද අතර, එම වාර්තාව හා එම යන්ත්‍ර හා උපකරණ සම්බන්ධ නිර්දේශ බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් වෙත මාගේ අංක KDS/4/11/3/7 හා 2021.07.22 දිනැති ලිපියෙන් යොමු කර |

| | | | | |
|---|---|---|---|---|
| | | | | ඇති අතර, මේ දක්වා ගතයුතු ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳ දැනුවත් කිරීමක් කර නොමැති බව දන්වා ඇත. |
| 06. | නුගවෙල මධ්‍යමහා විද්‍යාලයේ ගෘහස්ථ ක්‍රිඩාගාරය ඉදිකිරීම වෙනුවෙන් 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා රු.30,950,137 ක වියදමක් දරා තිබුණ ද එහි වැඩ අවසන් කර නොතිබුණි. | ප්‍රතිපාදන ලබා දුන් කාර්යයන් පිළිබඳව පසු විපරම් කර අදාල කාර්යය නිමකරවා ගැනීමට කටයුතු කල යුතුය. | වරින් වර ලබා දුන් ප්‍රතිපාදන මත ඇස්තමේන්තුවලට අදාළ වැඩ කොටස් නිම කර විදුහල්පතිවරයා වෙත භාර දෙන ලදි. | 2017 වර්ෂය දක්වා ලද ප්‍රතිපාදන මත සිදු කළ හැකි වූ ඉදිකිරීම් නිම කර 2017.02.17 වන දින නුගවෙල මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පතිවරයා වෙත භාර දී ඇති අතර ගෘහස්ථ ක්‍රීඩාගාරය සම්පූර්ණ වශයෙන් නිම කිරීම සඳහා තවදුරටත් රු. මිලියන 10 ක් පමණ මුදලක් වැය වන බව ඇස්තමේන්තුගත කර ඇති බව ප්‍රාදේශීය ලේකම් වාර්තා කර ඇත. |
| 07. | කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2008 අප්‍රේල් මාසයේ මියගිය විශ්‍රාමිකයෙකුගේ විශ්‍රාම වැටුප් වශයෙන් 2008 මැයි මස සිට 2012 ජනවාරි මස දක්වා කාල පරිච්ඡේදයට අදාළව එකතුව රු.428,911 ක් ගෙවා තිබුණි. | වංචාවලට අදාළ පරීක්ෂණ කඩිනමින් පවත්වා වගකිවයුතු පාර්ශවයන් සම්බන්ධව අදාළ නිර්දේශයන් ක්‍රියාත්මක කළ යුතුය. | මුදල් රෙගුලාසි 104(4) පරීක්ෂණය ප්‍රකාරව ග්‍රාම නිලධාරීන් දෙදෙනෙකුගෙන් මුදල් අය කර ගැනීමට කටයුතු කර ඇති අතර, තවත් ග්‍රාම නිලධාරියෙකු, විශ්‍රාම | ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක HA/3/1/15/4-6 හා 2021.11.25 දිනැති ලිපියට අනුව රජයට සිදුවූ අලාභය වගකිව යුතු නිලධාරින් එක්ව |

| | | | | |
|---|---|---|---|---|
| | ඒ සම්බන්ධ මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව පරික්ෂණයක් සිදුකර තිබුණු අතර එම පරීක්ෂණ වාර්තාව අනුව ඊට වගකිවයුතු පාර්ශවයන්ගෙන් එම මුදල අයකර ගත යුතු බව දන්වා තිබුණි. එහෙත් තවදුරටත් රු.214,302 ක මුදලක් අයකර ගත යුතුව පැවතුණි. | | වැටුප් නිලධාරියෙකු හා ලේඛන සහකාර නිලධාරියෙකු 2016 මැයි 02 දිනැතිව, අභියාචනා ඉදිරිපත් කර ඇති බැවින් ඊට අදාළ අමාත්‍යාංශ තීරණ ලැබෙන තෙක් අලාභය අයකර ගැනීමට කටයුතු කර නොමැති බව. | හා/හෝ තනි තනිව ගෙවීමට බැඳී සිටින බැවින් එම මුදල් අදාල නිලධාරීන්ගෙන් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කරන ලෙස අංක KDS/1/6/2/2/14 හා 2021.12.07 දිනැති ලිපිය මඟින් ප්‍රා.ලේ. කුණ්ඩසාලේ වෙත දන්වා ඇති අතර 2022.01.12 දිනැති ලිපිය මඟින් සිහි කැඳවීමක් ද කර ඇත. |
| 08. | පාතහේවාහැට හා තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශවල රජයට අයත් එකතුව පර්චස් 417 ක ඉඩම් කට්ටි 23 ක් අනවසරයෙන් භුක්ති විදිමින් පැවති අතර, එම ඉඩම් සන්තකය ආපසු ගැනීමට කටයුතු කර නොතිබුණි. | අනවසරයෙන් භුක්ති විදින ඉඩම් නැවත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු නොපමාව කලයුතුය. | අනවසර පදිංචිකරුවන් පිළිබඳ ලේඛනයක් සකස් කර ඇත. ඒ අය සඳහා ඉඩම් නියමානුකූල කිරීමට පළාත් ඉඩම් කොමසාරිස් වෙත යැවීමට, ඉඩම් කච්චේරි පැවැත්වීමට සංවර්ධන වාර්තා සකස් කිරීමට ඉඩම් මැනීමට හා මැනුම් නියෝග යැවීමට කටයුතු කරමින් පවතී. 2019 දෙසැම්බර් 19 දින ඉඩම් කච්චේරියක් පවත්වා එම ඉඩම් නියමානුකූල කිරීමට | උඩගම බටහිර ග්‍රාම නිලධාරී වසමේ 2021/04/08 දින ඉඩම් කච්චේරිය පවත්වා ඉඩම් ප්‍රමාණ නිශ්චය කර ගැනීම සඳහා මැනුම් ඉල්ලීමක් කච්චේරි මිනින්දෝරු වෙත යොමු කර ඇත. කහබිලියාව ග්‍රාම නිලධාරි වසමේ 2020/10/06 දින පැවති ඉඩම් කච්චේරියට සහභාගි වී ඇති අවසන් තේරීමේ ලැයිස්තුව පළාත් ඉඩම් කොමසාරිස් අනුමත |

| | | | | |
|---|---|---|---|---|
| | | | කටයුතු කර ඇති බවත් රජයේ ඉඩම් නීති විරෝධි ලෙස අල්ලා ගැනීම පාලනය කිරීමට ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් මාසික වාර්තා කැඳවා ඇති බව තුම්පනේ ප්‍රාදේශීය ලේකම් වාර්තා කර ඇත. | කර ඇත. ඒ අනුව එහි බලපත්‍ර සැකසෙමින් පවතී. තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2019 දෙසැම්බර් 19 දින ඉඩම් කච්චේරියක් පවත්වා අදාල අනවසරකරුවන් වෙත බලපත්‍ර ලබාදීමට කටයුතු කර ඇත. |
| 09. | වැඩතහනම් කළ නිලධාරියෙකුගෙන් රු.136,620 ක ණය ශේෂයක් හා සේවය අතහැරගිය නිලධාරියෙකුගෙන් රු.106,391 ක ණය ශේෂයක් 2021 දෙසැම්බර් 31 දිනට වර්ෂ 08 ක කාලයක් ඉක්මවා තිබුණද අයකර ගෙන නොතිබුණි. | ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ණය ශේෂය අයකර ගැනීමට අදාළ ආරම්භ කළ විනය පරීක්ෂණ කටයුතු කඩිනම් කිරීමට පියවර ගන්නා බවත් සේවය හැරගිය නිලධාරියාගෙන් අයවිය යුතු රු.106,391 ක ණය මුදල ගෙවා නිරවුල් කරන ලෙස නීතිපතිවරයා දන්වා ඇත. | විධිමත් විනය පරීක්ෂණ කටයුතු කොවිඩ් - 19 වසංගත තත්වය හේතුවෙන් නතර වී තිබූ අතර එම පරීක්ෂණ කටයුතු නැවත ආරම්භ කර ඇත.<br>සේවය අතහැර ගිය නිලධාරියාගේ ණය ශේෂය අයකර ගැනීම සඳහා නීතිපති වෙත දන්වා ඇත. |
| 10. | පස්බාගේ කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අධි අවදානම් ප්‍රදේශවල ජීවත් වන පවුල් නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය යටතේ හඳුනාගන්නා ලද පවුල් 53 අතුරින් පවුල් 10 ක් සඳහා | අපේක්ෂිත අරමුණු ඉටුකිරීමට කටයුතු කළ යුතුය. | තවදුරටත් පවුල් 10 ක් සඳහා පමණක් නැවත පදිංචි සඳහා ඉඩම් හඳුනා ගත යුතුව පවතින බව. | පවුල් අතරින් එක් අයෙකු සඳහා ඉඩම් ලබා දී ඇති බවත්, අනෙකුත් පවුල් අතරින් පවුල් 06 ක් ඥාති නිවෙස් සහ වෙනත් ස්ථාන වල |

| | | | | |
|---|---|---|---|---|
| | රජය විසින් ලබාදෙන රු.400,000 ක මුදලින් නැවත පදිංචිය සඳහා සුදුසු ඉඩම් කැබලි හඳුනාගැනීමට පවතින අපහසුතාවය සහ එම මුදලට අමතරව යම් වියදමක් දරා ඉඩමක් මිලදී ගැනීමේ හැකියාව මෙම පවුල්වලට නොමැතිකම මත එම අවධානම් ප්‍රදේශයේම පදිංචිව සිටින බව නිරීක්ෂණය විය. | | | පදිංචියට ගොස් ඇති බවත් වාර්තා කර ඇත. ඒ අනුව පවුල් 03 ක් පමණක් එම අවදානම් ස්ථානවලම පදිංචිව සිටින නමුත් වර්ෂාව අධික කාල වලදී එම පවුල්වල ජීවිත සුරක්ෂිතතාවය සඳහා පියවර ගෙන ඇති බවත් ප්‍රාදේශීය ලේකම් වාර්තා කර ඇත. |
| 12. | උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයක් 2017 මැයි මස 25 වන දින අනතුරට පත්ව තිබුණු අතර එහි ඇස්තමේන්තු කළ මුළු අලාභය වූ රු.2,223,927 කින් රු.210,093 ක මුදලක් කැබ් රථය අනතුරට පත්කළ බස් රථයේ රියදුරුගෙන් අයකර ගත යුතු බවට පරීක්ෂණ මණ්ඩලය තීරණය කර තිබුණි. එහෙත් 2021 දෙසැම්බර් වන විටද එම මුදල අය කරගෙන නොතිබුණි. | අලාභහානි වගකිවයුතු පාර්ශවයන් වෙතින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | අනතුරට වගකිව යුතු රියදුරු මියගොස් ඇති බව හා ඔහුගේ නීත්‍යානුකූල උරුමකාරිය සම්බන්ධ තොරතුරු උඩ පළාත ප්‍රාදේශීය ලේකම් විසින් අංක KDS/UDP/1/1/VEH/9 හා 2021.03.13 දිනැති ලිපියෙන් නීතිපති වෙත දන්වා යවා තිබූ බව. | අංක CPPD 6103 දරන නිල කැබ් රථයේ අනතුර සම්බන්ධයෙන් 2021.02.08 වන දින නීතිපති දෙපාර්තමේන්තුව විසින් ඉල්ලන ලද තොරතුරු සඳහා 2021.03.13 වන දින ප්‍රාදේශීය ලේකම් විසින් තොරතුරු ඉදිරිපත් කර ඇති බවත්, 2021.12.27 , 2021.10.27 සහ 2021.05.05 යන දිනවල නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද සිහි කැඳවීම් ලිපි |

| | | | | |
|---|---|---|---|---|
| | | | | වලටද මෙතෙක් පිළිතුරු ලැබී නොමැති බව. |
| 13. | 2019 නොවැම්බර් 22 දිනැති අංක BD/GPS/130/9/4/MC-8 දරන ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂගේ ලිපියේ 2 ඡේදය අනුව එක් නිලධාරියෙකුට එක් යතුරු පැදියක් පමණක් හිමිවන බව දක්වා තිබුණද 2014 අයවැය යෝජනා අනුව සහනදායී පදනමට යතුරුපැදි ලබාගත් ක්ෂේත්‍ර නිලධාරීන් 07 දෙනෙකු පළාත් පාලන මහජන නියෝජිතයන් ලෙස තේරීපත්වී ඒ යටතේ ද යතුරුපැදි ලබාගෙන තිබුණි. ඔවුන්ගෙන් අයකළ යුතු එක් යතුරුපැදියක වෙළඳපල වටිනාකම ගණනය කර ගෙන හෝ අයකර හෝ නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළයුතුය. | අදාළ නිලධාරින් 07 දෙනා සඳහා තමන් විසින් ලබාගත් යතුරුපැදියේ වෙළඳපළ වටිනාකම 2021.05.20 දිනට පෙර දිස්ත්‍රික් සමෘද්ධි අංශය වෙත ගෙවා බිල්පත් ඉදිරිපත් කරන ලෙසත්, එලෙස ගෙවීමට අසමත් වන්නේ නම් එම මුදල වාරික ලෙස වැටුපෙන් අයකර ගැනීමට කටයුතු කරන බවක් බවත්, ලිඛිතව දන්වා යවන ලද බව . | අය කිරීම් සම්බන්ධව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගෙන් අංක KDS/07/2/17 හා 2022.01.13 දින ලිඛිතව උපදෙස් පතා ඇති බව කාරුණිකව දන්වමි. |
| 14. | සමාලෝචිත වර්ෂයේ පවිත්‍රතා සේවාව සැපයීම සඳහා තෝරාගත් ආයතනයට, මිනිස් දින 224 ක් සේවය සපයා නොතිබියදී ඒ වෙනුවෙන් රු.244,640 ක් ගෙවා තිබුණි. | ගෙවීම් කිරීමේ දී පසුවිපරම් කර අදාල කාර්ය ඉටුකර ඇත්නම් පමණක් ගෙවීම් යුතුය. | පවිත්‍රතා සේවාවට යොදවා ඇති සේවකයින්ට සේවක අර්ථසාධක අරමුදල් සහ සේවක භාරකාර අරමුදල් දායකත්වයන් ලැබෙන්නේ ද යන්න සොයා බැලීමට පියවර ගන්නා බව. | මෙම මුදල සේවා සැපයුම්කරුගෙන් අයකර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |

**නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

---------------------------------------------

2018 තත්ත්වාගණනය කළ මතය

2019 තත්ත්වාගණනය කළ මතය

2020 තත්ත්වාගණනය කළ මතය

| | **විගණකාධිපති වාර්තාවේ ඇතුළත් ප්‍රධාන අඩුපාඩු** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග** | **ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය** |
|---|---|---|---|---|
| 01. | නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය අතහැර ගිය නිලධාරියෙකුගෙන් වර්ෂ 5 ක සිට පැවත එන රු.49,985 ක ණය ශේෂයක්ද, වැඩ තහනමට ලක් වූ නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු වර්ෂ 01 ක සිට වර්ෂ 05 දක්වා කාලයක සිට හිඟ හිටව පැවත එන රු.459,818 ක ණය ශේෂය ද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනීමට අපොහොසත් වි තිබුණි. | ලබා දුන් ණය අත්තිකාරම් නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | වැඩ තහනම් වූ හා සේවය හැරගිය නිලධාරීන්ගේ ණය ගෙවා අවසන් කරන ලෙස දන්වා යවා මුදලින් කොටසක් පියවා ඇති අතර, ඉන්පසු ගෙවීම් කර නොමැති බැවින්, නීත්‍යානුකූලව අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | 2022 පෙබරවාරි වන විටත් අයකර ගෙන නැත. |
| 02. | වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දැලිවල දකුණ | කෙසෙල් පැළ මිලදීගෙන | පැළ මිල දී ගැනීම ප්‍රමාද වුවද, ඉහත | 2022 පෙබරවාරි දක්වා ව්‍යාපෘති |

| | | | | |
|---|---|---|---|---|
| | ග්‍රාම නිලධාරී වසමේ කෙසෙල් කොළ යොදා ගනිමින් පරිසර හිතකාමී සෞඛ්‍ය ආරක්ෂිත "ලන්ච්ෂීට්" නිෂ්පාදනය රු.මිලියන 1.74 ක වියදමක් දරා 2018 නොවැම්බර් මස ආරම්භ කර තිබුණි. ව්‍යාපෘති කටයුතු කරගෙන යාමට අවශ්‍ය ප්‍රධාන අමුද්‍රව්‍ය වන කෙසෙල් පැළ මිලදී ගැනීම සඳහා ප්‍රමුඛතාවයක් ලබාදී නොතිබීම සහ යන්ත්‍රයේ ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය වන විදුලි ධාරිතාවය පිළිබඳ අවධානයක් යොමු නොකර ඊට අදාළ ගොඩනැගිල්ල සඳහා මුදල් වියදම් කර තිබීම නිසා ව්‍යාපෘතිය අසාර්ථක වී පසුව ව්‍යාපෘතිය අක්‍රිය වී තිබුණි. | ව්‍යාපතිය සාර්ථක කර ගැනීමට කටයුතු කළ යුතුය. | සඳහන් පරිදි කටයුතු සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ ද නිලධාරීන්ගේ උත්සාහය පමණක් ඇතත්, කෙටිකාලීනව වැඩි ආදායමක් නොලැබෙන බැවින්, වසමේ ජනතාවගේ උනන්දුව ක්‍රමයෙන් අඩුවන බව නිරීක්ෂණය වූ බවත්, ඒ අනුව ව්‍යාපෘතිය මෙම වසමේ ක්‍රියාත්මක නොකර වෙනත් උනන්දුවක් ඇති ග්‍රාමශක්ති වසමකට ලබාදීම මඟින්, රජයේ මුදල් අවභාවිතාවීම වළක්වා ගැනීමට හැකියාව ලැබෙන බවත් දන්වා ඇත. | ආරම්භ කර නැත. |
| 03. | 2013 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පවතින වටිනාකම රු.900,878 ක අග්‍රිම ශේෂයක් 2020 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | නොපියවූ අත්තිකාරම් ශේෂය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. | 2012 වර්ෂයේදී කොන්ත්‍රාත්කරුවකු වෙත ගෙවන ලද අත්තිකාරමක් අය නොවීම නිසා මෙම තත්වය ඇති වී ඇති බවත් 2018 වර්ෂයේ ලබාගත් කැබිනට් තීරණයක් අනුව ඉදිරි | 2013 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පවතින වටිනාකම රු.900,878 ක අග්‍රිම ශේෂයක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | කටයුතු සඳහා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත යොමුකර ඇති බව. | |
| 04. | අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙතින් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් දැරීම වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලැබී තිබූ ප්‍රතිපාදන වලින් සියයට 3 සිට සියයට 68 දක්වා පරාසයක ඉතිරිවීම් පැවතුණි. | ලැබෙන ප්‍රතිපාදන උපරිම මට්ටමෙන් උපයෝජනය කළ යුතුය. | කොවිඩ් තත්ත්වය හේතුවෙන් ව්‍යාපෘති ඉටුකළ නොහැකි විය. | අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙතින් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් දැරීම වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලැබී තිබූ ප්‍රතිපාදන වලින් සියයට 3 සිට සියයට 68 දක්වා පරාසයක ඉතිරිවීම් පැවතුණි. |
| 05. | හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බීජ බෝංචි වගා කරන ගොවින්ගේ ආදායම ඉහළ නැංවීමේ අරමුණින් ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබූ අතර, 2019 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය වෙනුවෙන් රජයෙන් රු.5,311,908 ක මුදලක් දරා තිබුණි. බීජ බෝංචි ශීත ගබඩා පහසුකම් ලබාදීම සඳහා මන්දාරම්නුවර ගොවිජන සේවා මධ්‍යස්ථාන භූමියේ ඉකුත් වර්ෂයේ ඉදිකිරීම් නිම කරන ලද ශීත ගබඩාව 2021 ජනවාරි 11 දින | ව්‍යාපෘති ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. | ඉදිරියේදී ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කරන බව. | බීජ බෝංචි ශීත ගබඩා පහසුකම් ලබාදීම සඳහා මන්දාරම්නුවර ගොවිජන සේවා මධ්‍යස්ථාන භූමියේ ඉකුත් වර්ෂයේ ඉදිකිරීම් නිම කරන ලද ශීත ගබඩාව 2021 ජනවාරි 11 දින වන විටත් භාවිතයට ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | වන විටත් භාවිතයට ගෙන නොතිබුණි. | | | |
| 06. | ගම්පෙරලිය වැඩසටහන යටතේ දිස්ත්‍රික්කයේ ආගමික ස්ථාන 85 ක් වෙත සූර්ය බලශක්ති පද්ධති මඟින් විදුලි උත්පාදනය සඳහා 2020 වර්ෂයේ රු.42,500,000 ක් වැය කර තිබුණද 2021 මාර්තු 30 දින වන විටත් එම ව්‍යාපෘතීන් ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබුණි. | සැලසුම් කළ ව්‍යාපෘති ලබාදෙන ප්‍රතිපාදන මත උපරිම මහජන සේවයක් සැලසෙන පරිදි අනුමත ව්‍යාපෘති යෝජනාවේ සඳහන් පරිදි ඉටුකිරීමට කටයුතු කළ යුතුය. | ජාතික විදුලි පද්ධතිය හා සම්බන්ධ කිරීමට කටයුතු කරන ලෙසට විදුලි බල මණ්ඩලයට දන්වා ඇති බව. | ගම්පෙරලිය වැඩසටහන යටතේ දිස්ත්‍රික්කයේ ආගමික ස්ථාන 85 ක් වෙත සූර්ය බලශක්ති පද්ධති මඟින් විදුලි උත්පාදනය සඳහා 2020 වර්ෂයේ රු.42,500,000 ක් වැය කර තිබුණද 2021 මාර්තු 30 දින වන විටත් එම ව්‍යාපෘතීන් ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබුණි. |
| 07. | 2020 දෙසැම්බර් 31 දින වන විට වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නැවත පදිංචි කිරීම සඳහා හඳුනාගත් පවුල් 189 ක් විය. එයින් විකල්ප ස්ථාන ලබාදී යළි පදිංචි කිරීමට කටයුතු ආරම්භ කර තිබුණේ පවුල් 42 ක් සම්බන්ධයෙන් පමණි. පවුල් 147 ක් තවදුරටත් එම අවදානම් සහිත ස්ථානවලට පදිංචි වි සිටි ඒ අතර, 2014 වර්ෂයේ පළල් පතන වසමේ නායයෑමෙන් ආපදාවට ලක්වූ පවුල් 17 ක්ද විය. | ලබා දෙන ප්‍රතිපාදන මඟින් ආපදාවන්ට ලක් වූ මහජනතාවට කඩිනමින් සහන සැලසීමට කටයුතු කළ යුතුය. | වතු ආශ්‍රිත ඉඩම් අක්කර 20 ක් ඉල්ලුම් කර ඇති අතර වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය සහ වතු සමාගම් එකඟතාවය පළ නොකිරීම හේතුවෙන් යළි පදිංචි කිරීමේ කටයුතු ප්‍රමාද වී ඇත. ගම් පුළුල් කිරීමේ ක්‍රමවේදය යටතේ ඉඩම් අත්පත් කර ගැනීමට අදාළ යෝජනාවක් සකස් කරමින් පවතින බව. | පවුල් 147 ක් තවදුරටත් එම අවදානම් සහිත ස්ථානවලම පදිංචි වි සිටි ඒ අතර, 2014 වර්ෂයේ පළල් පතන වසමේ නායයෑමෙන් ආපදාවට ලක්වූ පවුල් 17 ක්ද විය. |

| | | | | |
|---|---|---|---|---|
| 08. | 2017 අංක 19 දරන තිරසර සංවර්ධන අරමුණු පනතේ විධිවිධානයන්ට අනුව 2030 වර්ෂය වන විට ළඟාකර ගතයුතු අරමුණු පැහැදිළිව හඳුනාගෙන ඒ අනුව සැලැසුම් සකස් කර නොතිබුණි. | පැහැදිළිව තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන ඒවා ළඟා කර ගැනීමට අදාළව සැලැසුම් සකස් කළ යුතුය. | ඒ සම්බන්ධයෙන් සියලුම නිලධාරීන් දැනුවත් කර නියමිත පරිදි කටයුතු කරන බව | අරමුණු සැලසුම්කර විගණනයට වාර්තාකර නැත. |
| 09. | නුවරඑළිය දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව සේවාලාභි ප්‍රඥප්ති හඳුන්වා දී ක්‍රියාත්මක කළත්, විදුලිය විසන්ධි වන අවස්ථාවලදී ඒ සඳහා බාධාවක් බව නිරීක්ෂණය වේ. විශේෂයෙන් අධික සුළං සහ වැසි සහිත කාලගුණික තත්ත්වයන් පවතින අවස්ථාවල විදුලිය විසන්ධි වීම යථා තත්ත්වයට පත්කිරීම සඳහා අධික කාලයක් වැයවන අවස්ථාවල අත්‍යවශ්‍ය සේවා ඉටුකරවා ගැනීමට පැමිණෙන ජනතාවට මහත් අපහසුතාවයන්ට පත්වීමට සිදුවී තිබුණි. | ප්‍රමාණවත් ධාරිතාවයෙන් යුතු විදුලි ජනක යන්ත්‍ර සපයාදීම සඳහා අතිරේක ප්‍රතිපාදන ඉල්ලා අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. | ලැබෙන ප්‍රතිපාදන ප්‍රමාණය මත ප්‍රමුඛතාවය අනුව විදුලි ජනක යන්ත්‍ර ලබාදීමට කටයුතු කරන බව. | 2022 පෙබරවාරි දක්වා කටයුත්ත ඉටුකර නැත |

**රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**-----------------------------------------**

2018 තත්ත්වාගණනය කළ මතය

2019 තත්ත්වාගණනය කළ මතය

2020 තත්ත්වාගණනය කළ මතය

| විගණකාධිපති වාර්තාවේ ඇතුළත් ප්‍රධාන අඩුපාඩු | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| 01. රත්නපුර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ගංවතුර ආපදාවෙන් හානියටපත් ගෘහ භාණ්ඩ හා උපකරණ වෙනුවෙන් වන්දි ගෙවීමේදී ඒ සම්බන්ධයෙන් පත්කළ කමිටුවේ සහ ප්‍රාදේශීය ලේකම්වරයාගේ නිර්දේශ මත අදාළ ප්‍රතිලාභීන් ඉල්ලුම් කළ උපරිම වටිනාකම ද ඉක්මවා අවස්ථා 49 ක දී රු2,088,965 ක් වන්දි වශයෙන් වැඩිපුර ගෙවා තිබුණි. | මුදල් රෙගුලාසි 104, 109 හා 156 ප්‍රකාරව කටයුතු කළ යුතුය. | වැලැක්වීමේ ක්‍රියාමාර්ග දක්වා නැත. | 2021 ඔක්තෝබර් 25 දින පරීක්ෂණ මණ්ඩලය පත්කර ඇතත්, 2022 පෙබරවාරි 03 දින වන විටත් මේ සම්බන්ධයෙන් පරීක්ෂණ වාර්තාවක් නිකුත් වී නොමැති අතර වැඩිපුර ගෙවීම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| 02. 2017 වර්ෂයේ රත්නපුර | මුදල් රෙගුලාසි 104, | පරීක්ෂණයක් සිදු | 2021 ඔක්තෝබර් 25 |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ගං වතුරෙන් හානියටපත් නිවාස සඳහා වන්දි ගෙවීමේදී 2017 ජූනි 25 දිනැති අංක NDRSC/01/04/01/2017 දරන චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව වසම් 09 ක නිවාස 31 කට අදාළව රු.1,187,711 ක් වැඩිපුර ගෙවා තිබුණි. | 109 හා 156 ප්‍රකාරව කටයුතු කළ යුතුය. | කිරීමට කටයුතු කර ඇත. | දින පරීක්ෂණ මණ්ඩලය පත්කර ඇතත්, 2022 පෙබරවාරි 03 දින වන විටත් මේ සම්බන්ධයෙන් පරීක්ෂණ වාර්තාවක් නිකුත් වී නොමැති අතර වැඩිපුර ගෙවීම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| 03. | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය විසින් ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ දෙහිඅත්තවෙල ඇල පැති බැම්ම ඉදිකිරීමේ කර්මාන්තය සඳහා රු.784,000 ක ප්‍රතිපාදන සළසා තිබුණි. එම ව්‍යාපෘතිය ඉටුකිරීම සඳහා ප්‍රදේශයේ මරණාධාර හා සහනාධාර සමිතියක් සමග රු.784,000 ක ගිවිසුමකට එළඹ තිබුණි. 2018 ජූලි 23 දින මෙම ව්‍යාපෘතියේ වැඩ අවසන් කර ඇති බව ප්‍රකාශ කර අදාළ සමිතිය වෙත රු.702,575 ක් (රැඳවුම් සියයට 10ක් අඩුකිරීමෙන් පසු) ගෙවා තිබුණද 2018 දෙසැම්බර් 11 දින භෞතිකව පරීක්ෂා කරන අවස්ථාවේදී එකී ව්‍යාපෘතිය | ව්‍යාපෘති සඳහා ගෙවීම් කිරීමේ දී මුදල් රෙගුලාසිවලට අනුකූල විය යුතු අතර එයට පටහැනි වීම් සඳහා විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. | විමර්ශනයක් සිදු කිරීම | 2020 දෙසැම්බර් 20 හා 31 යන දිනයන්හි නිලධාරීන් තිදෙනෙකු සම්බන්ධයෙන් මූලික පරීක්ෂණ වාර්තා චෝදනා පත්‍ර සමග ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ලබා දී ඇති අතර 2021 නොවැම්බර් 29 දින ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් කාර්මික නිලධාරී වෙත චෝදනා පත්‍ර නිකුත් කර ඇත. ඒ අනුව 2022 පෙබරවාරි 03 දින වන විටත් අදාළ නිලධාරීන් සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු |

| | | | | |
|---|---|---|---|---|
| | ඉදිකර නොතිබුණි. | | | අවසන් කර අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| 04. | ගලගම ළඳුයාය මාර්ගය සංවර්ධන කිරීම සඳහා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් රු.50,653,814 ක ප්‍රතිපාදන සළසා තිබුණි. එම කොන්ත්‍රාත්තුව දින 37 කින් ඉදිකර නිම කිරීමේ පදනම මත 2016 දෙසැම්බර් 14 දින බස්නාහිර පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය සමග අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණි. 2017 දෙසැම්බර් මාසය වන විට කර්මාන්තයේ ඉදිකිරීම වැඩ අතරමග නවතා දමා තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5,4,8 (අ) මාර්ගෝපදේශ ප්රකාරව ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් මුදලින් සියයට 5 නොඅඩු එනම් රු,2,532,691 ක් වූ කාර්ය සාධන සුරක්ෂණයක් ලබාගෙන නොතිබීමත්, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.11.4 මාර්ගෝපදේශය ප්‍රකාරව පැහැර හැර ඇති කොන්ත්‍රාත්කරුවන්ගේ | අදාළ කොන්ත්‍රාත්කරු අසාධු ලේඛනගත කර එම පාර්ශවය සමග වූ අවබෝධාත්මක ගිවිසුම අවලංගු කිරීමට කටයුතු කලයුතු අතර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 (අ) මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. | කාර්ය සාධන සුරක්ෂණයක් ලබාගෙන නොමැති වුවත්, කාර්ය සාධන සුරක්ෂණයේ වටිනාකමට වඩා වැඩිපුර වත්කම් ප්‍රමාණයක් කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගෙන ඇත. මෙම ආයතනය අසාධු ලේඛනගත කිරීමට කටයුතු නොකළද මෙම සිදුවීමෙන් පසු වෙනත් ගිවිසුමකට මෙම ආයතනය සමග එළඹ නොමැත. 2017 මැයි 23 දිනැති ප්‍රසම්පාදන මණ්ඩල තීරණය අනුව කොන්ත්‍රාත් කාලය දීර්ඝ කළ ද, ප්‍රගති සමාලෝචන රැස්වීමේදී ප්‍රගතිය ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය. එහෙත් වර්ෂයේ තවදුරටත් ඉතිරිව පැවති සීමිත කාල | “කිලෝ මීටර් 100,000 ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම් වැඩසටහනට” තෝරාගෙන තිබූ මෙම මාර්ගය 2022 පෙබරවාරි 03 දින වන විටත් නිම කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ලැයිස්තුවට කොන්ත්‍රාත්කරුගේ නම ඇතුළත් කිරීමට කටයුතු නොකිරීමත්, අවබෝධතා ගිවිසුම අවලංගු කර වෙනත් ආයතනයක්/ කොන්ත්‍රාත්කරුවෙකු මගින් අදාළ කොන්ත්‍රාත්තුව ඉටුකර ගැනීමත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සිදුකර නොතිබුණි. | | සීමාව තුළ අවලංගු කර ගිවිසුම්ගත වීම ප්‍රායෝගික නොවන බැවින් එසේ සිදු කර නොමැත. | |
| 05. | ඕපනායක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාළව ජනාධිපති ලේකම් කාර්යාලය මගින් ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය පිටු දැකීමේ අරමුණින් ආරම්භ කරන ලද ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය ක්‍රියාත්මක කිරීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලය මගින් ඕපනායක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට වැය ශීර්ෂ අංක 001-2-6-6-2509 යටතේ රු.3,178,000 ක ප්‍රතිපාදන නිදහස් කර තිබුණි. එක් එක් වසම්වල පිහිටුවා ඇති ජනතා සමිති සඳහා වසම්වල ජීවනෝපාය සංවර්ධනයට, ධාරිතා සංවර්ධනයට හා යටිතල පහසුකම් සංවර්ධනයට වශයෙන් එක් වසමකට රු.986,550 බැගින් රු.2,959,650 ක මුදල් 2018 දෙසැම්බර් 29 දින ලබා දී | ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදිත මුදල් නිසි පරිදි උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. | ජීවනෝපාය සංවර්ධනය හා ධාරිතා සංවර්ධනයට අදාළව ඉතිරිව තිබූ මුදල් ලද උපදෙස් පරිදි උපයෝජනය කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග අනුගමනය කිරීම. | ලේකම්,සමෘද්ධි ගෘහ ආර්ථික ක්ෂුද්‍ර මූල්‍ය ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක SMS/SDB/GS/Dist01 YD 2021.02.03 දිනැති ලිපියට අනුව ග්‍රාම ශක්ති ජනතා සමිති සමාගම් මැදුරේ ලියාපදිංචියෙන් ඉවත් කර ගැනීමට දැනුම් දී තිබුණු අතර, ඒ සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටීන් වත්මන් වසංගත තත්ත්වය හමුවේ ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව ප්‍රාදේශීය ලේකම් විසින් වාර්තා කර |

| | | | | |
|---|---|---|---|---|
| | තිබුණු අතර 2019 දෙසැම්බර් 31 දින වන විටත් තෝරා ගත් වසම් 03හිම යටිතල පහසුකම් සංවර්ධනයට වැය කළ යුතු සියයට 20 ක ප්‍රමාණය පමණක් භාවිතයට ගෙන තිබුණු අතර ඉතිරි මුදල් නිෂ්කාර්යව ගිණුම්වල රඳවාගෙන තිබුණි. | | | ඇත. 2022 පෙබරවාරි 03 දින වන විටත් ඉතිරි මුදල් වැය නොකර නිෂ්කාර්යව ගිණුම්වල පැවතුණි. |
| 06. | 2014 අගෝස්තු 18 දිනැති අභ්‍යන්තර විගණන උපදෙස් අංක 22/2014 දරන දිස්ත්‍රික් ලේකම්ගේ ලිපියේ ගොඩනැගිලි ඉදිකිරීම් යටතේ වූ 04 වන උපදේශය ප්‍රකාරව නව ඉදිරිකිරීමක් වෙනුවට ප්‍රදේශයේ භාවිතා කළ හැකි රජයේ වෙනත් ගොඩනැගිලි තිබේ දැයි යන්න පරීක්ෂා කළ යුතුව තිබුණි. එසේ වුවද රත්නපුර බේරකැටිය පාසල් භූමියේ ප්‍රයෝජනයට ගත හැකිව තිබූ වර්ග අඩි 1180 ක වසා දමා තිබූ පාසල් ගොඩනැගිල්ල තිබියදීම, එම ගොඩනැගිල්ලට ඉදිරිපසින් ප්‍රජාදායකත්වය රු.961,261 ක් හා රජයේ දායකත්වය රු.2,000,000 ක් සහිතව වර්ග අඩි 729 ක් වූ ගල්ලින්න නිල සෙවන කාර්යාලය ඉදිකර තිබුණි. මේ හේතුවෙන් පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් | 2014 අගෝස්තු 18 දිනැති අභ්‍යන්තර විගණන උපදෙස් අංක 22/2014 දරන දිස්ත්‍රික් ලේකම්ගේ ලිපියේ ගොඩනැගිලි ඉදිකිරීම් යටතේ වූ 04 වන උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය. | පරීක්ෂණ මණ්ඩලයක් වෙත යොමු කිරීම. | 2021 පෙබරවාරි වනවිටත් අවසාන පරීක්ෂණ වාර්තාව නිකුත් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | කොට්ඨාස බල ප්‍රදේශයේ රජයේ ගොඩනැගිලි නොමැති ග්‍රාම නිලධාරි වසමක මෙම නිල සෙවන කාර්යාලය ඉදිකිරීමට තිබූ අවස්ථාව මගහැරී යාමෙන් රජයේ මුදල් ප්‍රමාණවත් සැළකිල්ලක් නොදක්වමින් වැය කර තිබූ බව දක්නට ලැබුණි. | | | |
| 07. | ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව ඉටුකරන ලද හැමර් පරීක්ෂාවන් 131 ක් අතුරින් ගිවිසුම්ගත වටිනාකම රු. 3,394,059 ක් වූ මාර්ග 06 ක පරීක්ෂණ අසමත් වී තිබුණු අතර, එම මාර්ග සඳහා core cutter පරීක්ෂාවක් සිදුකර ප්‍රතිඵල තහවුරු කර ඉදිරි කටයුතු කිරීමට 2021 පෙබරවාරි 01 විගණිත දින දක්වාම කටයුතු කර නොතිබුණි. තවද හැමර් පරීක්ෂණය අසමත් වූ ව්‍යාපෘති 06 අතුරින් 05 කම ඉදිකිරීම් එකම උප කොන්ත්‍රාත්කරුවෙකු විසින් සිදුකර ඇති බව විගණනයේ දී තහවුරු විය. | එම මාර්ග සඳහා core cutter පරීක්ෂාවක් සිදුකර ප්‍රතිඵල තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හැමර් පරීක්ෂණය අසමත් ව්‍යාපෘති 6 සඳහාම core cutter පරීක්ෂණය සිදු කිරීම සඳහා සබරගමුව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) කාර්යාලය වෙත, මුදල් ගෙවා තිබීම. | දිස්ත්‍රික් ලේකම් විසින් මෙම පරීක්ෂණ අසමත් වූ ව්‍යාපෘති සම්බන්ධව නිර්දේශ ලබා ගැනීම සඳහා කමිටුවක් පත් කිරීමට ලිපියකින් අනුමැතිය ඉල්ලා තිබුණි. |
| 08. | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 08 ක 1999 වර්ෂයේ සිට භාවිතයට නොගන්නා රජයේ ගොඩනැගිලි 31 ක් හා දිස්ත්‍රික් | අදාල දේපල විධිමත් ලෙස උපයෝජනය කර ගැනීමට පියවර ගත යුතු අතර රජයේ | අලුත්වැඩියා කටයුතු නොපමාව සිදුකරන ලෙස දක්වා ඇත. | **දිස්ත්‍රික් ලේකම් කාර්යාලය:**<br>බී 8 - අළුත්වැඩියා කටයුතු සිදු වෙමින් |

| | | | |
|---|---|---|---|
| ලේකම් කාර්යාලයට අයත් වසර 02 ක කාලයක සිට භාවිතයට නොගන්නා රජයේ ගොඩනැගිලි 04 ක් ඵලදායි කාර්යයකට යොදවා ගැනීම සම්බන්ධයෙන් අවධානය යොමු වී නොතිබුණු අතර විගණිත දිනය වූ 2021 පෙබරවාරි 04 වන විටත් ගොඩනැගිලි අබලන්ව පැවතීම, වල්බිහි වී විනාශ වී පැවතීම ආදී කරුණු නිරීක්ෂණය විය. | දේපලවල ආරක්ෂාව සම්බන්ධයෙන් විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු වේ. | | පවතී.<br>බී14 - අළුත්වැඩියා කටයුතු අවසන් කර ඇත.<br>සී 31 - අළුත්වැඩියා සඳහා ඇස්තමේන්තු සකස් කරමින් පවතී.<br>සී 27 - කඩා ඉවත් කිරීම සඳහා දිස්ත්‍රික් ඉංජිනේරුගේ නිර්දේශය ලබා ගැනීම සඳහා යොමු කර ඇත.<br>ප්‍රා.ලේ. කොට්ඨාශවලට අදාළව තවදුරටත් භාවිතයට නොගත් රජයේ ගොඩනැගිලි 31ක් පවතින බව දන්වා ඇත. |

**කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

2018 තත්ත්වාගණනය කළ මතය

2019 තත්ත්වාගණනය කළ මතය

2020 තත්ත්වාගණනය කළ මතය

| විගණකාධිපති වාර්තාවේ ඇතුළත් ප්‍රධාන අඩුපාඩු | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| 01. 2011 අංක 46 දරන පනතින් සංශෝධිත 2010 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 34 වැනි වගන්තිය | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. | ඉදිරියේදී කුඹුරු ඉඩම් කෘෂිකාර්මික වගා හැර වෙනත් සංවර්ධන කාර්යයන් සඳහා | මෙම ඉඩම ගොඩ ඉඩමක් සේ සලකා කටයුතු කිරීමට අවශ්‍ය අවසරය |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රකාරව කුඹුරු ඉඩම් කෘෂිකාර්මික වගා හැර වෙනත් කාර්යයන් සඳහා භාවිතා නොකළ යුතුව තිබුණත්, කුඹුරු ඉඩමක් ගොඩ කර මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මඩුල්බෝව ක්‍රීඩා පිටිය ඉදි කරමින් පැවතුණි. | | භාවිත කිරීමේදී පළමුව ගොවිජන සේවා කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන ලෙස ප්‍රාදේශීය ලේකම්ට උපදෙස් දී ඇත. | ලබා ගැනිම සඳහා අදාළ ඉල්ලුම්පත් විදුහල්පති විසින් ගොවි ජන සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇතත් මේවන තෙක් අවසරය ලැබී නැති බව ප්‍රාදේශීය ලේකම් දන්වා ඇත. |
| 02. | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය විසින් කෑගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමෙන් ආරම්භ කරන ලද කුඩා පරිමාණ ඇගලුම් මධ්‍යස්ථාන 15 ක් අතරින් මධ්‍යස්ථාන 04 ක් අපේක්ෂිත මට්ටමෙන් ක්‍රියාත්මක නොවන අතර මධ්‍යස්ථාන 11 ක් වසා දමා තිබුණි. | චක්‍රලේඛ උපදෙස්වලට අනුගත වීම, කර්මාන්ත ශාලා සඳහා ලබාදී ඇති මූල්‍ය හා භෞතික සම්පත් පිළිබඳ සොයා බැලීම හා පසු විපරම් කටයුතු කල යුතුය. | මෙම ඇඟළුම් මධ්‍යස්ථානවල කටයුතු පිළිබඳව අවධානය යොමු කරන ලෙස ප්‍රාදේශීය ලේකම්වරුන්ට උපදෙස් දුනිමි. | 2018 වසරේ ක්‍රියාත්මක නොවූ මධ්‍යස්ථාන මේවන විට ක්‍රියාත්මක අතර, රඹුක්කන හා වරකාපොල ක්‍රියාත්මක වෙමින් තිබුණු (2018දී) මධ්‍යස්ථාන දෙකක් මේ වනවිට ක්‍රියාත්මක නොවේ. |
| 03. | ගලිගමුව අරන්දර ප්‍රදේශයේ වෙළඳ කුටි සහිත වෙළඳ උද්‍යානයක් ගොඩනැගීම සඳහා (ග්‍රාම ශක්ති අවධි නගරය - 2018) ජනාධිපති ලේකම් කාර්යාලයෙන් රු. මිලියන 25 ක මුදලක් ලබා දී තිබුණි. පලමු අධියර යටතේ තොරණගහපිටිය ප්‍රවේශ මාර්ගයේ කොන්ක්‍රීට් කිරීම හා පැති බැම් ඉදිකිරීම | ව්‍යාපෘතියක් තෝරා ගැනීමේදී හා ක්‍රියාත්මක කිරීමේදී ඒ පිළිබඳ නිසි අධ්‍යයනයක් කිරීම හා කාර්යක්ෂමව ඉටුකිරීමට කටයුතු කල යුතුය. | ඉදිරියේදී ව්‍යාපෘති යෝජනා සකස් කිරීමේදී අවධානය යොමු කරන ලෙස අධ්‍යක්ෂ සැලසුම් වෙත උපදෙස් දුනිමි. | අධික වර්ෂාව නිසා ඇති වූ නාය යෑම් තත්ත්වය නිසා හානියට පත්ව ඇති කොටස් ගලිගමුව ප්‍රාදේශීය සභාව විසින් ඉවත් කර ඇත. හානියට පත් බැම්ම නැවත සකස් කිරීම සඳහා සබරගමුව පළාත් මාර්ග |

| | | | | |
|---|---|---|---|---|
| | වෙනුවෙන් රු.1,911,146 ක මුදලක් ගෙවා තිබුණත් ඉදිකරන ලද පැති බැම්ම කඩා වැටීමකට ලක්ව තිබුණි. තවද යෝජිත ඉඩම පවරා ගැනීමට ද කටයුතු කර නොතිබුණු අතර, මෙම ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සිදු කිරීම නවතා දැමීම හේතුවෙන් මෙතෙක් දරන ලද රු.2,068,689 ක මුදල නිෂ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි. | | | සංවර්ධන අධිකාරිය විසින් ඇස්තමේන්තු සකස් කර ටෙන්ඩර් කැඳවා ඇත. |
| 04. | කෑගල්ල, වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2009 සිට 2013 කාල පරිච්ඡේදය තුල සිදුව තිබූ විශ්‍රාම වැටුප් වංචාවෙන් රු.16,765,760 ක මුදලක් අයකරගෙන නොතිබීම. | ආයතන සංග්‍රහයේ සඳහන් පරිදි කටයුතු කර වංචාවට අදාළ මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතුය. | ඉදිරියේදී මෙවැනි වංචා ඇති නොවන ලෙස කටයුතු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කර ඇත. | අදාල පාර්ශවයන්ට එරෙහිව විධිමත් විනය පරික්ෂණ කටයුතු ආරම්භ කර ඇත. මෙම වංචාවට සම්බන්ධ නිළධාරීන් දෙදෙනෙකුගේ විශ්‍රාම වැටුප අත්හිටුවා ඇති අතර 2021 නොවැම්බර් වනවිට එලෙස අත්හිටුවා ඇති මුදල රු.2,286,490 ක් විය.<br>මුදල් රෙගුලාසි 104 (3) සහ 104 (4) පරික්ෂණ අවසන් කර වාර්තා ස්වදේශ කටයුතු ලේකම් ,රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත හා විශ්‍රාම වැටුප් |

| | | | | |
|---|---|---|---|---|
| | | | | අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර ඇත. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අංක 14414/4/14 යටතේ කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇත. |
| 05. | ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය, ප්‍රජා පාලිත ක්‍රමවේදයක් භාවිතයෙන් පිටු දැකීම අරමුණු කරගත් ජනාධිපති ලේකම් කාර්යාලයේ තිරසර සංවර්ධන අංශය මඟින් හඳුන්වා දී තිබුණු ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය යටතේ ජනතා සමිති ස්ථාපිත කිරීම සඳහා 2018 සහ 2019 වර්ෂවලදී ලද ප්‍රතිපාදන මත පළමු අදියර යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11 තුල ජනතා සමිති 43 ක් වෙත රු. 69,575,200 ක් ද 2019 වර්ෂයේදී දෙවන අදියර යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11 තුල ජනතා සමිති 96 ක් වෙත රු.4,560,000ක් ද ලබාදී තිබුණි. එහෙත් සමාලෝචිත | ප්‍රතිපාදන අදාල අරමුණු ගත කාර්යයන්ට යොදාගත යුතුය. | අදාළ අරමුණු ළඟාකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස දක්වා ඇත. | මේ සම්බන්ධව සෞභාග්‍යා කාර්යාංශය වෙතින් දුරකථනය මඟින් විමසුම් කරන ලද අතර, තවමත් අවසන් තීරණයක් ගෙන නොමැති බව දක්වා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | වර්ෂය අවසානය වනවිට පළමු අදියරේදී ලබාදුන් මුදලින් සියයට 71 ක් ලෙස සමිති 34 ක රු.49,812,357 ක් ද, දෙවන අදියරේදී ලබාදුන් මුදලින් සියයට 96 ක් ලෙස සමිති 96 ක රු.4,358,021 ක් ද අදාල කාර්යය සඳහා යෙදවීමෙන් තොරව එකී සමිතිවල බැංකු ගිණුම්වල නිෂ්කාර්යව රඳවාගෙන තිබුණි. | | | |
| 06. | ස්මාර්ට් ශ්‍රී ලංකා වැඩසටහන යටතේ කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට 2019 ලද ප්‍රතිපාදන මත ගලිගමුව, රුවන්වැල්ල, දෙහිඕවිට හා රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ස්මාර්ට් ශ්‍රී ලංකා මධ්‍යස්ථාන පිහිටුවීමට රු.1,744,015 ක්ද, හඳුන්වාදීමේ හා පුහුණු වැඩසටහන් සඳහා රු.241,278 ක් ද, ලෙස රු.1,985,293 ක් 2020 වර්ෂය අවසානය වනවිට වැයකර තිබුණි. මීට අමතරව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අදාල වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා මෘදුකාංග සහිත පරිගණක 22 ක් ද ලබාදී තිබුණි. එහෙත් විගණන අවස්ථාව වූ 2021 මාර්තු | අදාල ව්‍යාපෘතිය අපේක්ෂිත අරමුණු ගත කාර්යයන් සඳහා යොදාගත යුතුය. | මිනිස් බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් පරිදි කටයුතු කර ඇත. | ගලිගමුව NAITA ආයතනයේ ස්ථාපිත කරන ලද මධ්‍යස්ථානය ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීමේ ආයතනයට භාරදීමට මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කටයුතු කර ඇත.<br>ස්මාර්ට් ශ්‍රී ලංකා වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ලබා දුන් පරිගණක වලින් එක් පරිගණකයක් බැගින් මානව සම්පත් |

| | | | | |
|---|---|---|---|---|
| | මාසය වනවිටත් ස්මාර්ට් ශ්‍රී ලංකා වැඩසටහනේ අපේක්ෂිත අරමුණ ඉටුකර ගැනීම සඳහා ක්‍රියාකාරී තත්වයක නොපැවතුණි. | | | නිලධාරීවරුන් වෙත භාර දෙන ලෙස 2021 ජූලි 02 දිනැති ලිපියෙන් මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වා ඇති අතර, ඒ අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මානව සම්පත් නිලධාරීන් වෙත පරිගණක භාර දී ඇත. |
| 07. | නායයෑමෙන් හා නායයෑම් අවදානම් තත්වයන් හේතුවෙන් විපතටපත් පවුල් නැවත පදිංචිකිරීමේ ව්‍යාපෘතිය යටතේ 2016 වර්ෂයේදී රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුල පවුල් 78 ක් හදුනාගෙන තිබුණි. එයින් පවුල් 28 ක් විවිධ හේතු මත ප්‍රතිලාභ ලබාදීම් සඳහා ඇතුලත්ව නොතිබුණු අතර ඉතිරි පවුල් 50 අතරින් පවුල් 15 ක්, තම නිවාස ඉදිකිරීම් කටයුතු සමාලෝචිත වර්ෂය අවසානය වනවිටද සම්පූර්ණ නොකිරීම හේතුවෙන් නොගෙවා පවතින නිවාස ආධාර ප්‍රමාණය රු.4,850,000 | පවතින ගැටළු නිරාකරණය කර නිවාස ආධාර ගෙවීමට කටයුතු කල යුතුය. | නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය යටතේ ජනතාව දිගින් දිගටම දැනුවත් කිරීම් සිදු කළ අතර, වරින් වර කාර්යාලයට කැඳවා උපදෙස් ලබාදීමද සිදුකරන ලදී. ක්ෂේත්‍ර පරීක්ෂණ මගින් දැනුවත් කිරීම, ලිඛිතව උපදෙස් ලබාදීම, කොටස් වශයෙන් මුදල් නිදහස් කිරීම වැනි ක්‍රියාමාර්ග ගත් බව රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම්, විසින් දන්වා ඇත. | පදිංචිව සිටින පවුල් සංඛ්‍යාව 05 කි. නිවාස ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතින පවුල් සංඛ්‍යාව 06 කි. නිවාස ඉදිකිරීම්වල කිසිදු ප්‍රගතියක් වාර්තා කර නැති පවුල් සංඛ්‍යාව 04 කි. |

| | | | | |
|---|---|---|---|---|
| | ක් විය. | | | |
| 08. | මහල් දෙකකින් සමන්විත තුත්තිරිපිටිය බස්නැවතුම්පල රු.23,570,905 ක ඇස්තමේන්තුවකට ඉදිකිරීමට 2014 පෙබරවාරි 19 දින රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට භාරදී තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා රු.3,988,900 ක වියදමක් කර පසුව ඉදිකිරීම් කටයුතු නතර කර තිබුණි. තවද මෙම ඉඩම රජයට අයත් ඉඩමක් බැවින් අරණායක ප්‍රාදේශීය සභාවට පවරාදීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම සඳහා 2018 හා 2019 වර්ෂයන්හි පළාත් ඉඩම් කොමසාරිස් වෙත දන්වා යවා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් එම කාර්යය ඉටුවී නොතිබුණි. | ව්‍යාපෘතිය සැලසුම් කිරීමේදී වැයකරන මුදලට ප්‍රතිලාභයක් ලැබෙන පරිදි සැලසුම් කල යුතුය. | ඉදිරියේදී මෙවැනි ගැටළු ඇති නොවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස අධ්‍යක්ෂ සැලසුම් දැනුවත් කරන ලදී, | සබරගමුව පළාත් සභාවේ ඉඩම් කොමසාරිස් විසින් වෙන්කර තිබූ ඉඩම තුළ උක්ත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණද, එහි ඉතිරි වැඩ සම්පූර්ණ කිරීම සඳහා ප්‍රතිපාදන ලැබී නොතිබුණි. එම තත්ත්වය යටතේ අරණායක ප්‍රාදේශීය සභාව වෙත සංවර්ධනය සඳහා ඉඩම ලබාදීමේ නෛතික ගැටළුවක් මත බස් නැවතුම ඉදි කිරීම් නතර වී ඇත. කෙසේ වෙතත් මෙම රාජ්‍ය දේපළ ඵලදායී ලෙස උපයෝගී කර ගැනීම සඳහා අරණායක ප්‍රාදේශීය සභාව වෙත තාවකාලිකව භාර දී ඇති අතර ඉදිරියේදී එම ගොඩනැගිල්ල ඵලදායි ලෙස උපයෝගී කරගනු ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| 09. | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු නැවත පදිංචි කිරීම පුනරුත්ථාපන උතුරු පළාත් සංවර්ධන යෞවන කටයුතු අමාත්‍යාංශයේ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත කිතුල්ගල නගර සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට 2019 වර්ෂයේදී රු.35,615,876 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. ඒ යටතේ කි.මී 0.8 ක දිගකින් යුත් කිතුල්ගල නගර මධ්‍යයේ මාර්ගය දෙපස පුළුල් කර පැතිකාණු ඉදිකිරීමට රු.25,698,900 ක මුදලකට ගිවිසුම්ගතව තිබුණි. මෙම කර්මාන්තය ඉටුකරගෙනයාමේදී බාහිර පාර්ශවයකින් එල්ල වූ බලපෑමක් මත 2019 නොවැම්බර් 29 දින සිට ඉදිකිරීම් කටයුතු නතර කර තිබුණි. | නව ව්‍යාපෘති සැලසුම් කිරීමේදී වැය කල මුදලට ප්‍රතිලාභයක් ලැබෙන පරිදි සැලසුම් කල යුතුය. | වර්තමානයේ ව්‍යාපෘති සම්බන්ධව තීරණ ගනු ලබන්නේ ග්‍රාමීය කමිටුවල යෝජනාමත බැවින් මෙවැනි ගැටළු පැන නොනගිනු ඇත. | මේ සම්බන්ධයෙන් අදාළ අමාත්‍යාංශය වෙත දන්වා ඇති අතර, ඉදිරියේදී කිතුල්ගල නගර සංවර්ධන වැඩ සටහන යටතේ ප්‍රතිපාදන ලදහොත් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ හැකි බව අධ්‍යක්ෂ (සැලසුම්) දන්වා ඇත. |

**බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**--------------------------------------------**

2018 තත්ත්වාගණනය කළ මතය

2019 තත්ත්වාගණනය කළ මතය

2020 තත්ත්වාගණනය කළ මතය

| විගණකාධිපති වාර්තාවේ ඇතුළත් ප්‍රධාන අඩුපාඩු | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|

| | | | ක්‍රියාමාර්ග | |
|---|---|---|---|---|
| | ------------------------ | --------------------- | ------------------------ | --------------------- |
| 01. | හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.494,890 ක් වැය කර උස්සැල්ල සතිපොල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය නිම කර තිබුණත්, 2018 ඔක්තෝබර් 19 දින වන විටද එම ව්‍යාපෘතියෙන් කිසිදු ප්‍රයෝජනයක් නොගෙන නිශ්කාර්යව පැවතුණි. | ප්‍රතිලාභීන්ගේ අවශ්‍යතාවයන් හා අරමුණු නිසි පරිදි හඳුනාගෙන එම අරමුණු ඉටුවන අයුරින් ව්‍යාපෘති සැලසුම් කර ක්‍රියාත්මක කල යුතුය. | ප්‍රදේශයේ නිෂ්පාදිත භාණ්ඩ තොග මිලදී ගන්නා මධ්‍යස්ථානයක් ලෙස පවත්වාගෙන යාම සඳහා ග්‍රාම සංවර්ධන සමිතිය මගින් ඉදිරි කටයුතු සංවිධානය කිරීම. | 2022 පෙබරවාරි වන විටත් ගොඩනැගිල්ල නිෂ්කාර්යව පැවතුණි. |
| 02. | ඌව පරණගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයක් අනතුරට ලක් වී වර්ෂ 08 කට පසු ඊට අදාල අලාභ හානිය රු.500,000 ක් ලෙස 2019 මැයි 15 දින බදුල්ල දිස්ත්‍රික් තක්සේරුකරු විසින් තක්සේරු කර තිබුණද එම අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගෙන නොතිබුණි. | මූලික පරීක්ෂණ පවත්වා මුදල් රෙගුලාසි අනුව අදාල කටයුතු කල යුතුය. | පරීක්ෂණ කටයුතු සිදු කරමින් පවතී. | 2022 පෙබරවාරි වන විටත් මූලික පරීක්ෂණ පවත්වා නොතිබුණි. |
| 03. | විශ්‍රාමිකයින්ට විශ්‍රාම වැටුප් ගෙවීමේදී වැටුප් ගණනය කිරීමට අදාලව කලින් කලට වෙනස් වීමට භාජනය වන නීති, රීති චක්‍රලේඛ උපදෙස් ලිපි පිළිබඳව අවධානයෙන් කටයුතු නොකිරීම හා ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 6 | නිවැරදිව විශ්‍රාම වැටුප් ගණනය කල යුතු අතර වැඩිපුර ගෙවීම් අයකර ගත යුතුය. | එවැනි තත්ත්වයන් වලක්වා ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | වැඩිපුර ගෙවීම් අයකරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | කට අදාලව විශ්‍රාමිකයන් 114 දෙනෙකුට රු.12,150,749 ක මුදලක් විශ්‍රාම වැටුප් වශයෙන් වැඩිපුර ගෙවා තිබුණි. | | | |
| 04. | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ ලුණුගල හොප්ටන් බී කොටසට ජලය ලබා දීමේ ව්‍යාපෘතිය සඳහා ලුණුගල ප්‍රාදේශීය ලේකම් විසින් 2017 ඔක්තෝබර් 12 දින පෞද්ගලික කොන්ත්‍රාත්තු ආයතනයක් සමඟ රු.2,661,859 ක ගිවිසුමකට එළඹ තිබුණි. 2017 දෙසැම්බර් 12 දින ව්‍යාපෘතියේ වැඩ අවසන් කල යුතු වුවද කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම මත 2019 දෙසැම්බර් 12 දින දක්වා අවස්ථා 05 කදී ඉදිකිරීම් ගිවිසුමේ කාලය දීර්ඝ කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු.906,558 ක මුදලක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණද කොන්ත්‍රාත්කරු ව්‍යාපෘතියේ වැඩ අත්හැර දමා තිබුණි. කොන්ත්‍රාත්තුවට අදාල කාර්යය සාධන සුරක්ෂණ ඇපකරයේ වලංගු කාලය දීර්ඝ කර නොගැනීම නිසා කොන්ත්‍රාත්කරු විසින් | ඉදිකිරීම් ව්‍යාපෘති නිරන්තරයෙන් අධීක්ෂණය කල යුතු අතර ඇපකර වල වලංගු කාලය දීර්ඝ කර ගත යුතුය. | අයතනය විසින් ගනු ලැබූ වැලැක්වීමේ ක්‍රියාමාර්ග වාර්තා කර නොමැත. | 2022 පෙබරවාරි වන විටත් ව්‍යාපෘතිය අවසන් කර නොමැත. රජයට අය විය යුතු රු.133,093 ක් අයකර ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ඇපකරය නිදහස් කරගෙන තිබුණු අතර රජයට අයකර ගත හැකිව තිබුණු රු.133,093 ක් අයකර ගැනීමට නොහැකිවී තිබුණි. | | | |
| 05. | බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 15 ආවරණය වන පරිදි තෝරා ගන්නා ලද ග්‍රාමශක්ති ජනතා සමිති 48 ක් සඳහා විවිධ ව්‍යාපෘති වෙනුවෙන් එක් සමිතියකට රු.1,000,000 බැගින් 2018 හා 2019 වර්ෂ වලදී රු.48,000,000 ක් ලබා දී තිබුණි. එහෙත් 2021 පෙබරවාරි 25 දින වන විටත් ඉන් රු.38,151,040 ක මුදලක් ව්‍යාපෘති සඳහා යොදා නොගෙන බැංකු ගිණුම්වල නිෂ්කාර්යව රඳවා තිබුණි. | ව්‍යාපෘති පිලිබඳ දැඩි අධීක්ෂණයක් හා පසු විපරම් කරමින් මුදල් ලබාදුන් කාර්යය සඳහාම උපයෝජනය කරන බව තහවුරු කල යුතුය. | අයතනය විසින් ගනු ලැබූ වැලැක්වීමේ ක්‍රියාමාර්ග වාර්තා කර නොමැත. | 2022 පෙබරවාරි වන විටත් රු.38,151,040 ක මුදලක් නිෂ්කාර්යව බැංකු ගිණුම් වල පවතී. |
| 06. | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ 2014 වර්ෂයේ පළාත් නැගුම සංවර්ධන වැඩසටහන යටතේ උස්සැල්ල සායන මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් විසින් 2014 අගෝස්තු 20 දින රු. 1,999,998 ක ගිවිසුමකට එළඹ තිබූ අතර එම වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ඉදිකිරීම සඳහා රු.1,773,300 ක් වැය කර | වැඩ නිමකර භාවිතයට ගැනීමට කටයුතු කල යුතුය. | අයතනය විසින් ගනු ලැබූ වැලැක්වීමේ ක්‍රියාමාර්ග වාර්තා කර නොමැත. | 2022 පෙබරවාරි වන විටත් නිෂ්කාර්යව පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | තිබුණ ද, ගොඩනැගිල්ල සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත භාරදී නොතිබුණි. 2021 පෙබරවාරි 23 විගණන දිනය වන විට වසර 7 ක් ගත වී තිබුණ ද ගොඩනැගිල්ල සායන කටයුතු සඳහා භාවිතයට ගෙන නොතිබුණු අතර, ගොඩනැගිල්ලේ සිවිලිම සකස් කර නොතිබුණි. එමෙන්ම ජලය, විදුලිය හා සනීපාරක්ෂක පහසුකම් ද සපයා නොතිබුණි. | | | |
| 07. | රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් වාහනයක් 2017 ජූලි 29 දින අනතුරකට ලක්වීමෙන් රු.6,349,333 ක අලාභ හානියක් සිදු වී තිබුණු අතර ඒ වෙනුවෙන් රක්ෂණ සමාගම විසින් 2020 ජූනි 25 දින ගෙවන ලද රු.2,500,000 ක මුදල පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. 2020 පෙබරවාරි 10 දින වන විට ද වාහනය අළුත්වැඩියා කර නොතිබුණු අතර අනතුර සිදුවීමෙන් වර්ෂ 3 ½ ක පමණ කාලයක් අනතුරට පත් වූ රථය දිස්ත්‍රික් ලේකම් කාර්යාල රථගාලේ නිෂ්කාර්යව ගාල් කර තිබුණි. මු.රෙ.104 (4) ප්‍රකාරව අනතුර සම්බන්ධයෙන් වූ පරීක්ෂණ | අලාභ හානිය පිළිබඳ පරීක්ෂණ මණ්ඩලයේ වාර්තාව අනුව කටයුතු කල යුතුය. | පරීක්ෂණ කටයුතු සිදු කරමින් පවතී. | වර්ෂ 3 ½ ගතව තිබුණද 2022 පෙබරවාරි වන විටත් පරීක්ෂණ කටයුතු අවසන් කර නොතිබුණු අතර අලාභය අයකර ගෙන නොතිබුණි. |

මණ්ඩලයේ වාර්තාව අනුව රක්ෂණ සමාගම විසින් නොගෙවන ප්‍රමාණය, අදාල පාර්ශවයන්ගෙන් අයකරගෙන නොතිබුණි.

මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

-------------------------------------------

2018 තත්ත්වාගණනය කළ මතය

2019 තත්ත්වාගණනය කළ මතය

2020 තත්ත්වාගණනය කළ මතය

| විගණකාධිපති වාර්තාවේ ඇතුළත් ප්‍රධාන අඩුපාඩු | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
| --- | --- | --- | --- |
| 01. මොනරාගල දිස්ත්‍රික්කයේ පැවති එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා ප්‍රදර්ශනය සඳහා ප්‍රදර්ශන භූමියට දින 03 කට විදුලිය සැපයීම වෙනුවෙන් රු.33,582,527 ක ඇස්තමේන්තුවක් සඳහා විදුලි බල මණ්ඩලයට ගෙවීම් කර තිබුණි. එකී ඇස්තමේන්තුවෙහි කම්කරු ගාස්තු ලෙස රු.13,066,537 ක්ද, ප්‍රවාහන ගාස්තු ලෙස රු.1,929,102 ක්ද, අවිනිශ්චිත වියදම් ලෙස | මුදල් රෙගුලාසි 137 හා 139 ප්‍රකාරව වියදම් අනුමත කිරීමේදී හා සහතික කිරීමේදී රජයට අවම වියදමක් දැරෙන ආකාරයට විධිමත් ලෙස විමසීම් කර ගෙවීම් කළයුතුය. | ලංකා විදුලිබල මණ්ඩලය විසින් ඉදිරිපත් කර ඇති ඇස්තමේන්තු අනුව ගෙවීම් කර ඇත. ලංකා විදුලිබල මණ්ඩලයෙන් විස්තරාත්මක වාර්තාවක් ලබා නොදෙන බව දන්වා ඇත. | විදුලි බිල්පත සැකසූ ආකාරය පිළිබඳ පූර්ණ විස්තර ඉදිරිපත් කර නොතිබුණි. අසාමාන්‍ය වියදම් පිළිබඳ විමසීම් කර ගෙවන ලද ඇස්තමේන්තු මුදලින් කොටසක් හෝ විදුලි බල මණ්ඩලයෙන් අයකර ගැනීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | රු.3,115,152 ක් හා විදුලි ජනක යන්ත්‍ර කුලියට ගැනීම හා ඉන්ධන ගාස්තු ලෙස රු.2,770,396 ක් වශයෙන් එකතුව රු.22,724,451 ක අසාමාන්‍ය වියදම් ඇස්තමේන්තු පිළිබඳ විමසීම් කර ඇස්තමේන්තුව අඩු කර ගැනීමට කටයුතු කිරීමෙන් තොරව ගෙවීම් කිරීමෙන් රාජ්‍ය මුදල් අවිධිමත් පරිදි වැයකර තිබුණි. | | | |
| 02. | 2018 වර්ෂයේ රුහුණු කතරගම සහ කොටබෝව කුඩා කතරගම දේවාලවල වාර්ෂික ඇසළ උත්සවයේ අතිරේක විදුලි පහසුකම් සැපයීම සඳහා ආරක්ෂක විදුලි ලාම්පු යෙදීම සඳහා රු.14,664,834 ක් ගෙවා තිබුණු නමුත්, යොදන ලද විදුලි ලාම්පු ගණන, සවිකිරීම් ගාස්තු, ඒ සඳහා යොදවා තිබුණු සේවකයන් පිළිබඳව විධිමත් තොරතුරු නොමැතිව බිල්පත සඳහා මුදල් ගෙවීම් කර තිබුණි. | මුදල් රෙගුලාසි 137 හා 139 ප්‍රකාරව වියදම් අනුමත කිරීමේදී හා සහතික කිරීමේදී රජයට අවම වියදමක් දැරෙන ආකාරයට විධිමත් ලෙස විමසීම් කර ගෙවීම් කළයුතුය. | ලංකා විදුලිබල මණ්ඩලය විසින් ඉදිරිපත් කර ඇති ඇස්තමේන්තු අනුව ගෙවීම් කර ඇත. ලංකා විදුලිබල මණ්ඩලයෙන් විස්තරාත්මක වාර්තාවක් ලබා නොදෙන බව දන්වා ඇත. | විදුලි බිල්පත සැකසූ ආකාරය පිළිබඳ පූර්ණ විස්තර ඉදිරිපත් කර නොතිබුණි. අසාමාන්‍ය වියදම් පිළිබඳ විමසීම් කර ගෙවන ලද ඇස්තමේන්තු මුදලින් කොටසක් හෝ විදුලි බල මණ්ඩලයෙන් අයකර ගැනීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි. |
| 03. | "ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාර" වැඩසටහනේ කාර්යයන් වෙනුවෙන් ආර්ථික සංවර්ධන නිලධාරීන් සඳහා මාසිකව රු.3,000 ක උපරිමයකට | චක්‍රලේඛ උපදෙස් වලට අනුකූල නොවන පරිදි රාජ්‍ය නිලධාරීන්ට ගෙවීමේදී ආයතන | දිස්ත්‍රික් ක්‍රම සම්පාදන අධ්‍යක්ෂකගේ අංක MO/DS/DPS/D/02/04 හා 2018.09.04 ලිපිය අනුව ගෙවා | 2022 පෙබරවාරි වනවිටත් නැවත අයකරගෙන නොමැති අතර, එම ගෙවීම් සඳහා විධිමත් |

| | | | | |
|---|---|---|---|---|
| | යටත්ව ගමන් වියදම් දීමනා ගෙවිය හැකි වුවද, ඊට අනුකූල නොවී කතරගම, වැල්ලවාය සහ තණමල්විල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් නිලධාරීන් 10 දෙනෙකුට එකතුව රු.189,000 ක මාසික දීමනාවක් විධිමත් අනුමැතියකින් තොරව ගෙවා තිබුණි. | අධ්‍යක්ෂකගේ අනුමැතිය ලබා ගත යුතුය. | ඇත. | අනුමැතියක් ලබාගෙන නැත. |
| 04. | “එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා” ප්‍රදර්ශනය සඳහා රු.මිලියන 68.25 ක් වැයකර තිබුණු අතර ඒ සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය. | | | |
| | (i) ප්‍රදර්ශනය පැවති භූමිය සකස් කිරීම සඳහා කොන්ත්‍රාත්කරු විසින් යොදාගෙන තිබුණු වාහන හා යන්ත්‍රෝපකරණ වෙනුවෙන් රු.මිලියන 14.34 ක් වැයකර තිබුණද, යන්ත්‍ර සූත්‍ර ධාවනය කළ පැය ගණන, වාහන ධාවනය කළ දින ගණන තහවුරු කර ගැනීම සඳහා අධීක්ෂණ නිලධාරීන්ගේ තහවුරුව සහිතව ප්‍රවාහන වැඩ පිළිබඳ විස්තර | ගෙවීම් කිරීමට ප්‍රථම ගෙවීම් තහවුරු කිරීමට අධීක්ෂණ නිලධාරීන්ගේ නිර්දේශ හා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදී කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් කිරීමේදී වැඩපත්‍රිකා පිළිබඳ අවධානය යොමු කළ යුතු බවට උපදෙස් ලබා දුනිමි. | ගෙවීමට අදාළව විධිමත් වැඩපත්‍රිකා ඉදිරිපත් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | නොතිබීම මත ඒ සඳහා තත්‍ය වියදම තහවුරු නොවීම. | | | |
| (ii) | ප්‍රදර්ශන භූමියේ අභ්‍යන්තර මාර්ග පද්ධතිය රු. මිලියන 2.06 ක් වැයකර නිමකර තිබුණද, ඉදිකිරීම් කටයුතු නිමකර මාස 05 ක් ගතවීමටත් ප්‍රථම, මාර්ගය කැඩී ආලේප කර තිබුණු තාර ගැලවී වලවල් සෑදී තිබුණි. | ඉදිකිරීම් නියමිත ප්‍රමිතියට කළ යුතුය. | ඉදිරියේදී ඉදිකිරීම් කටයුතුවලදී ගුණාත්මක බව හා කල්පැවැත්ම පිළිබඳ අවධානය යොමු කර කටයුතු කරමි. | මොනරාගල දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතියට මෙම ඉදිකිරීම් සහිත භූමිය යොදාගෙන ඇත. |
| (iii) | ප්‍රදර්ශන භූමිය සකස් කිරීමට යෙදීම සඳහා හියුම් පයිප්ප 143 ක් හා ඊට අදාළ කොලර් 60 ක් සඳහා රු.මිලියන 1.6 ක් වැයකර තිබුණි. 2019 ජනවාරි 10 දින වන විට ප්‍රදර්ශනය අවසන් වී මාස පහකට අධික කාලයක් ගත වී තිබුණද, එම පයිප්ප හා කොලර් නිෂ්කාර්යයව පැවතුණි. | ඉතිරිව පවතින කොලර් හා හියුම් පයිප්ප සුදුසු සංවර්ධන කාර්යයකට යෙදවීමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදී ඉදිකිරීමට යෝජිත හරිත උයන සඳහා ප්‍රයෝජනවත් වන බැවින් මේවා ඉවත් කර නොමැත. | 2022 පෙබරවාරි වන විටත් එම තත්ත්වයේම පවති. |
| (iv) | ප්‍රදර්ශන භූමියේ පොකුණක් ඉදිකිරීම සඳහා රු.මිලියන 2.84 ක් වැයකර තිබුණද එය ඉදිකර මාස පහක් ගත වීමට පෙර පොකුණ | ප්‍රදර්ශනය සඳහා කරනු ලබන ඉදිකිරීම් ප්‍රදර්ශනය අවසන් වීමෙන් පසුව වෙනත් කාර්යයකට යොදා ගැනීමට හැකිවන | මෙම පොකුණ හරිත උයනේ කොටසක් ලෙස භාවිතා කිරීමට අපේක්ෂිතව තිබුණද, දිස්ත්‍රික් ක්‍රීඩාංගනය සකස් කිරීමේදී එම | ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතියට මෙම ඉදිකිරීම් සහිත භූමිය යොදාගෙන ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | ස්ථාන කිහිපයකින් කැඩී ජලකාන්දු වීම සිදුවීම මත ප්‍රමිතියෙන් තොරව ඉදිකිරීම් කර තිබීම. | පරිදි සැලසුම් කළ යුතුය. | කොටසද ක්‍රීඩාංගනයට ඇතුලත් වී තිබුණි. | |
| 05. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක් විසින් ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘතිවල වැඩ කොටස් අඩුවෙන් ඉටුකර තිබීම, වැරදි මිල ගණන් භාවිතා කර තිබීම, මාර්ග මිල ගණන් උපලේඛනයේ සඳහන් උපදෙස් අනුව කටයුතු නොකිරීම, ප්‍රමාද ගාස්තු අය නොකිරීම සහ රජයට වාසිදායක ලෙස ඇස්තමේන්තු පිළියෙල නොකිරීම යනාදි නිරීක්ෂණ නිසා කොන්ත්‍රාත්කරුවන් වෙත එකතුව රු.3,616,001ක් වැඩිපුර ගෙවා තිබුණි. | ව්‍යාපෘතියේ ඇස්තමේන්තු පිළියෙල කිරීම, ක්‍රියාත්මක කිරීම හා ව්‍යාපෘති නිමකර භාර ගැනීමේදී විධිමත් පරිදි අදාළ රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතුය. | වැඩිපුර ගෙවීම් සඳහා හේතු වූ කරුණු පැහැදිලි කර ඇත. | 2022 පෙබරවාරි වනවිටත් වැඩිපුර ගෙවා ඇති මුදලින් රු.1,939,152 ක් තව දුරටත් අය කර ගැනීමට ඇත. |
| 06. | වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2008 සහ 2009 වර්ෂවලදී “ජාතික සවිය ගමනැගුම” විශේෂ ව්‍යාපෘතිය යටතේ රු.3,922,914 ක් වියදම් කර ඉදිකරන ලද ජනසභා කාර්යාල ගොඩනැගිල්ල අරමුණුගත කාර්යය සඳහා යොදා නොගෙන, ස්වාභාවික ආපදාවන්ට ලක් වෙමින් පැවතුණි.2018 මාර්තු 22 වන | නිෂ්කාර්යව පවතින රජයේ ගොඩනැගිලි අරමුණු ගත කාර්යයන් සඳහා යෙදවීමට කටයුතු කළ යුතුය. | සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) ගේ නිල නිවස ලෙස භාවිතයට ගනු ලබයි. | 2022 පෙබරවාරි වනවිටත් අපේක්ෂිත අරමුණ සඳහා යොදවා නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | දින රැස්වූ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ 148 වන රැස්වීමේදීද මෙම ගොඩනැගිල්ල ඵලදායී ලෙස යොදාගැනීම පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළ යුතු බව පෙන්වා දී තිබුණද, එම තීරණය ගෙන වසර 03 ක් ගතවී තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | | | |
| 07. | බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ග්‍රාමීය ආර්ථික ප්‍රවර්ධන වැඩසටහන 2018 යටතේ වැගම දකුණ මාවතේ ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2018 දෙසැම්බර් 31 දින රු. 902,450 ක් වැය කර තිබුණි. මෙම ජල ව්‍යාපෘතිය 2019 ඔක්තෝබර් 16 දින වන විටද, ක්‍රියාකාරී තත්ත්වයේ නොවූ අතර, එය ක්‍රියාකාරී තත්ත්වයට පත් කිරීම සඳහා ජල මෝටරයක් සවි කිරීම හා බෙදා හැරීමේ නල පද්ධතිය සැකසීම යන කාර්යයන් සිදුකළ යුතුව තිබුණි. | ව්‍යාපෘතිය ඵලදායි හා ක්‍රියාකාරී තත්ත්වයට පත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | ව්‍යාපෘතියට වෙන්වූ ප්‍රතිපාදන ප්‍රමාණය අනුව ව්‍යාපෘතිය නිම කර ඇත. ව්‍යාපෘතියේ දෙවන අදියර ලෙස මෝටරයක් සවි කිරීමට ප්‍රතිපාදන ලබාදෙන ලෙස ඉල්ලීමක් කර ඇති බවත්, ඉදිරියේදී ඒ අනුව කටයුතු කිරීමට අපේක්ෂා කරන බවත් දන්වා ඇත. | 2022 පෙබරවාරි වනවිටත් ව්‍යාපෘතිය ක්‍රියාකාරී තත්ත්වයට පත්කර නොතිබුණි. |
| 08. | මිය ගිය, වැඩ තහනම් කළ හා සේවය අතහැර ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු මුළු ණය ශේෂය රු. 2,688,119 ක් වූ අතර ඉන් රු. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | වැලැක්වීමට ගන්නා ලද ක්‍රියාමාර්ග දක්වා නොමැත. | වර්ෂ 05 කට වැඩි කාලයක් අය නොවී පැවති ණය මුදලින් රු.299,912 ක් අය කර ඇත.ඉතිරි මුදල් |

| | | | | |
|---|---|---|---|---|
| | 1,957,679 ක් වර්ෂ පහකට වඩා වැඩි කාලයක් අය නොවී පවතින ණය ශේෂ විය. | | | 2022 පෙබරවාරි වන විටත් අයකර නොතිබුණි. |
| 09. | මොනරාගල දිස්ත්‍රික්කය තුළ 2018 හා 2019 වර්ෂවල ක්‍රියාත්මක කර තිබුණු ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 කට ලබාදී තිබුණු මුදලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.77,691,659 ක් ග්‍රාම ශක්ති සමිති නමින් පවත්වාගෙන යනු ලබන බැංකු ගිණුම් 125 ක වර්ෂයකට අධික කාලයක් නිෂ්කාර්යව රඳවා ඇති බව නිරීක්ෂණය විය. | වෙන් කර ඇති මුදල් ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. | මේ පිළිබඳ ඉදිරියේදී කටයුතු කළයුතු ආකාරය පිළිබඳව සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය 2021 පෙබරවාරි 03 දිනැති ලිපිය මගින් සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත දන්වා ඇති අතර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරන බව දන්වමි. | ග්‍රාම ශක්ති සමිති සමාගම් මැදුරේ ලියාපදිංචියෙන් ඉවත් කර ප්‍රාදේශිය ලේකම් කාර්යාලය තුළ ලියාපදිංචිය කර ඉදිරි කටයුතු කිරීමට දැනුම් දී ඇති බැවින්, සමාගම් මැදුරෙන් ලියාපදිංචිය ඉවත් කරගැනීමට කටයුතු කරමින් පවතී.2022 පෙබරවාරි වන විටත් පැවති තත්ත්වයෙහි වෙනසක් සිදුවී නැත. |
| 10. | ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරයේ පළමු අදියර යටතේ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක් විසින් 2019 වර්ෂයේදී චක්‍රීය ක්‍රමය යටතේ ලබාදී තිබුණු ණය මුදල් වලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද රු. 8,361,836 ක් අයවීම් හිඟ හිටව පැවතුණි. | හිඟ ණය මුදල් අප්‍රමාදව අය කර ගත යුතුය. | අදාළ සමිති නැවත ගිණුම් කටයුතු ආරම්භ කළ පසු හිඟ ණය මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. | 2022 පෙබරවාරි වනවිටත් හිඟ ණය මුදල් අය කරගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 11. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 5.2.3 වගන්තිය අනුව, සාද නිවාසවල (චමරි) ආර්ථික කුලිය එහි පදිංචි සෑම නිලධාරීයෙකුගෙන්ම එක හා සමාන කොටස්වලින් අයකර ගත යුතු ලෙස දක්වා තිබුණද, මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාන්තා හා පිරිමි සාද නිවාස සඳහා, 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් දක්වා කාලයට අදාළව අයවිය යුතු නියමිත ආර්ථික කුලිය එකතුව රු.312,325 ක් අඩුවෙන් අයකර තිබුණි. | තක්සේරු වාර්තාව අනුව හිඟ කුලී මුදල් අයකළ යුතුය. | සාද නිවාසවල ආර්ථික කුලිය අය කිරීමේදී ගැටළු පවතින බැවින් කාමර මට්ටමින් හෝ පදිංචි වියහැකි පුද්ගලයින් සංඛ්‍යාව අනුව නව තක්සේරුවක් කර දෙන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇත. | 2022 පෙබරවාරි වනවිටත් හිඟ කුලී මුදල් අය කර නොතිබුණි. |
| 12. | රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ හා ග්‍රාමීය ආර්ථික කටයුතු ආමාත්‍යාංශයේ 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රතිපාදන උපයෝජනය කර ගෙවතු වගා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වියදම් දැරීමට රු.4,750,000 ක ප්‍රතිපාදන වෙන් කර දී තිබුණද, ඒ සඳහා රු.5,763,882 ක් වැයකර තිබුණු බැවින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 449 (2) (ආ) හි දැක්වෙන | පූර්ව අධිකාරි බලය ලබා ගැනීමකින් තොරව ප්‍රතිපාදන ඉක්මවා වැය කිරීම් නොකළ යුතුය. | පිළිගනිමි. ප්‍රතිලාභීන්ගේ ඉල්ලීම මත උපකරණ හා රෝපණ ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා අමතරව ප්‍රතිපාදන මුදලක් අවශ්‍ය විය. එම මුදල ලබාදෙන ලෙස 2019 නොවැම්බර් 16 දිනැති ලිපියෙන් අමාත්‍යාංශය දැනුවත් කළ අතර වැය ශීර්ෂය යටතේ ප්‍රතිපාදන ඉතිරිව පැවති බැවින් වියදම් පියවා ගැනීමට කටයුතු | අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | විධිවිධාන වලට අනුකූල නොවී, පූර්ව අනුමැතිය නොමැතිව රු.1,013,882 ක් වැයකර ඇති බව නිරීක්ෂණය විය. | | කරන ලදී. | |
| 13. | මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තැන්පතු ගිණුම් 06 ක වසර 2 සිට වසර 5 දක්වා කාල පරාසයක් ගත වී ඇති තෙවන පාර්ශවයන් වෙත නැවත ගෙවීම් කිරීම වෙනුවෙන් තාවකාලිකව රඳවාගන්නා තැන්පතු සහ කොන්ත්‍රාත් සඳහා වූ රැඳවුම් මුදල් රු.9,230,126 ක් මුදල් රෙගුලාසි 571(3) ප්‍රකාරව රාජ්‍ය ආදායමට බැර කර හෝ ආපසු ගෙවා හෝ නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. | ඒ අනුව ඉදිරියේදී කටයුතු කරමි. කොන්ත්‍රාත් රැඳවුම් ශේෂයෙන් කොටසක් නියාදනය කර ඇත. භාණ්ඩාගාරයෙන් ලැබෙන අග්‍රිම අනුව ඉතිරි ශේෂයන් නිරවුල් කිරීම සඳහා අදාළ නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇත. | 2022 පෙබරවාරි වනවිටත් රු.2,414,503 ක් වූ රැඳවුම් තැන්පත් නිරවුල් කිරීමට ඇත. |
| 14. | මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රතිපාදන උපයෝජනය කර පොතුකොළ පිටිය අමුණ ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ සූර්ය පැනල පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා රු.8,700,000 ක් සහ වගා ළිඳ, ජලපොම්පාගාරය සහ ඇළ | ඇස්තමේන්තුගත වැඩ කොටස් ගිවිසුම්ගත කාලය තුලදී නිමකළ යුතුය. | ව්‍යාපෘතිය සඳහා මුදල් ලැබීමේ ප්‍රමාදය සහ කොටස් මුදල් ගෙවීම සඳහා ප්‍රමාණවත් මුදල් නොලැබීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වී ඇත. | සූර්ය පැනල පද්ධතිය සඳහා ආරක්ෂිත වැට ඉදිකිරීම සඳහා 2021 සැලැස්මට ඇතුළත් කර ඇති බව දන්වා ඇත.2022 පෙබරවාරි වනවිටත් ව්‍යාපෘතිය නිමකර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | මාර්ගය ඉදිකිරීම සඳහා රු.1,080,309 ක වටිනාකම් සහිත ගිවිසුම්වලට එළඹ සූර්ය පැනල ස්ථාපනය කිරීම වෙනුවෙන් රු.8,700,000 ක් ගෙවා තිබුණි. ඇළ මාර්ගය ඉදිකිරීම 2019 සැප්තැම්බර් 10 දින වන විට අවසන් කළ යුතු වුවද, 2020 සැප්තැම්බර් 14 දින වනවිටද, එම ඉදිකිරීම් කටයුතු සිදුකර නොතිබීම හේතුවෙන් ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි වී තිබුණි. තවද, සූර්ය පැනල පද්ධතියේ ආරක්ෂාව සඳහා ක්‍රියාමාර්ග නොයෙදීම නිසා සවිකර තිබුණු සූර්ය පැනල අනුවෙන්, දෙකක් හානියට පත්ව තිබුණි. | | | |
| 15. | මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ 2019 වර්ෂයේ කුඩා වැව් අමුණු ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ සියඹලාණ්ඩුව, කරම්මඩ වැව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු.4,916,581 ක වියදමක් දරා ඉදිකිරීම් කටයුතු නිම වීමෙන් පසුව වැව ප්‍රයෝජනයට නොගැනීම නිසා දරන ලද වියදම නිෂ්කාර්ය වියදමක් | නිසි ඇගයීමක් කර ප්‍රමුඛතාවය ලැබිය යුතු කාර්යයන්ට අරමුදල් ඵලදායීව යෙදිය යුතු අතර අපේක්ෂිත අරමුණු ඉටු කරගැනීම සඳහා කටයුතු කළ යුතු වේ. | එම ව්‍යාපෘති යෝජනාව ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුවේ දී සාකච්ඡා කර අරමුණු ළඟා කර ගැනීමට කටයුතු කරන ලෙස ප්‍රාදේශීය ලේකම් දැනුවත් කර ඇත. | 2022 පෙබරවාරි වනවිටත් ව්‍යාපෘතියෙන් එකදු ගොවි පවුලකටවත් ප්‍රතිලාභ ලැබී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | බවට පත්ව ඇති බවත්, මෙම වැව ප්‍රතිසංස්කරණය කිරීම තුලින් අපේක්ෂිත ප්‍රතිලාභී ගොවි පවුල් 20 ක් මගින් කුඹුරු අක්කර 50 ක් පමණ වගා කිරීමේ අරමුණ ඉටු වී නොතිබුණි. | | | |
| 16. | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රතිපාදන උපයෝජනය කර මොනරාගල දිස්ත්‍රික් ක්‍රමසම්පාදන ලේකම් කාර්යාලය මගින් 2019 වර්ෂයේදී මොනරාගල දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.2,019,484,413 ක වියදම් ඇස්තමේන්තුවක් පිළියෙල කර ඒ සඳහා 2020 ඔක්තෝබර් 14 දින වන විට රු. 13,389,919 ක වියදමක් දරා තිබුණු අතර 2019 ඔක්තෝබර් මාසයෙන් පසුව ව්‍යාපෘතියේ ඉදි කිරීම් කටයුතු අත්හැරදමා තිබුණි. | නිසි ඇගයීමක් කර ප්‍රමුඛතාවය ලැබිය යුතු කාර්යන්ට අරමුදල් ඵලදායීව යෙදිය යුතු අතර අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම සඳහා කටයුතු කළ යුතු වේ. | මෙම කර්මාන්තයේ කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍යය අරමුදල් ලබා ගැනීමට නොහැකි වීම හේතුවෙන් මේ වන විට වැඩකටයුතු නවතා ඇති අතර එම නිසා ක්‍රීඩා සංකීර්ණය පූර්ණ ලෙස භාවිතා කිරීමේ හැකියාව නොමැත. | 2022 පෙබරවාරි දක්වා ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් අපේක්ෂිත අරමුණු ඉටු කරගත නොහැකි වි ඇත. |
| 17. | මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක් විසින් ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘතිවල ඉටුකළ යුතු වැඩ කොටස් අඩුවෙන් ඉටුකර තිබීම, අදාළ නොවන මිල | ඇස්තමේන්තු සකස් කිරීම හා ගෙවීම් වාර්තා සකස් කිරීම නිවැරදිව, වගකීමෙන් යුතුව කළයුතු අතර වැඩිපුර ගෙවූ ඉතිරි මුදල් අයකර ගත | මෙම ව්‍යාපෘතිවලට අදාළව අයකර ගැනීම් පිළිබඳ විස්තර හා පැහැදිලි කිරීම් සිදුකර ඇත. | වැඩිපුර ගෙවා ඇති මුදලින් රු.2,954,798 ක් මේ වනවිට අයකර ගෙන තිබුණු නමුදු තවදුරටත් රු.4,517,246 ක් අයකර ගත යුතුව |

| | | | | |
|---|---|---|---|---|
| | රේටයන් භාවිතා කර තිබීම, මාර්ග මිල ගණන් ලේඛනයේ සඳහන් උපදෙස් අනුව කටයුතු නොකිරීම, නිමකළ වැඩ ප්‍රමාණය ඉක්මවා ගෙවීම් කිරීම, රජයට වාසිදායක ලෙස ඇස්තමේන්තු සකස් නොකිරීම සහ ප්‍රමාද ගාස්තු අය නොකිරීම යනාදී කරුණුවලට අදාළව කොන්ත්‍රාත්කරුවන්ට එකතුව රු.7,472,044 ක් වැඩිපුර ගෙවා තිබුණු අතර එයින් මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ මොනරාගල, බුත්තල සහ සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාළව රු.4,517,246ක් තවදුරටත් අයවීමට පැවතුණි. | යුතුය. | | ඇත. |
| 18. | ගම්පෙරළිය සංවර්ධන වැඩසටහන 2018 යටතේ මීයකෙටුආර වැව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු.49,310,900 ක මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස්කර තිබුණි. මෙම ඇස්තමේන්තුවෙහි කළුගල් භාවිතයෙන් වැවෙහි රළපනාව ඉදිකිරීම සඳහා රු.4,076,800 ක් ඇතුළත්ව තිබුණු අතර, ගල් මිලදී ගැනීම සඳහා පමණක් රු.4,974,900 ක් වැයකර තිබුණි. ඒ අනුව | ඉදිකිරීම් කටයුතු ඇස්තමේන්තුව ප්‍රකාරව සිදුකළ යුතුය. | ගම්පෙරළිය සංවර්ධන වැඩසටහන යටතේ මීයකෙටුආර වැව ප්‍රතිසංස්කරණය කිරීමේදී වැව් බැම්මේ රළපනාව සඳහා කළුගල් ඇතිරීම සිදු කර ඇති අතර, එහි මූලික යෙදීම කොටසක් සිදු කර ඇත. වර්ෂාව ලැබීමට ආසන්න වී ඇති හෙයින් යන්ත්‍ර මඟින් කළුගල් ඇතිරීම කළ ද | 2022 පෙබරවාරි වනවිටත් වැව් බැම්මේ රළපනාව ඉදිකිරීම් සම්පූර්ණ නොකිරීම නිසා ඉතිරි කළුගල් වැව් පරිශ්‍රයේ ගොඩගසා ඇති බව දන්වා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තු කළ පිරිවැය ඉක්මවා රු.898,100 ක් කළුගල් මිලදී ගැනීම සඳහා පමණක් වැය කර තිබුණි. වැව් බැම්මේ අතුරා තිබුණු කළුගල් ඇස්තමේන්තුවේ සඳහන් ඝනකම සහිතව අතුරා නොතිබුණු අතර, ඉතිරි කළුගල් වැව් පරිශ්‍රයේ ගොඩ ගසා තිබුණි. | | එහි වැඩ අවසන් නොකිරීම නිසා නියමිත ඝනකම හා හිඩැස් අසම්පූර්ණව පවතින බව දන්වමි. | |
| 19. | මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වාහන 14 ක් වර්ෂ 10 කට අධික කාලයක් කාර්යාල භූමියේ නිෂ්කාර්යව රඳවා තිබුණු අතර, ඒවා අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය | මේ අතුරින් වාහන 9 ක් සුන්බුන් තත්ත්වයේ පවතින අතර, 5 ක් අළුත්වැඩියා කිරීම ආර්ථික වශයෙන් ඵලදායි නොවේ. එම වාහන වෙන්දේසි කිරීමට අදාළ කටයුතු සිදු කරමින් පවතී. | සුන්බුන් තත්ත්වයේ පවතින වාහනවල ලියාපදිංචිය අවලංගු කර නොමැති අතර අනෙකුත් වාහන වෙන්දේසි කර නැත. |
| 20. | 2018 මාර්තු 19 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2018 අනුව, 2015 ජූලි 10 දිනැති මුදල් චක්‍රලේඛ අංක 01/2015 මගින් ලබාදී ඇති උපදෙස් අනුගමනය කර ධාවනය කළ නොහැකි තත්ත්වයේ පවතින සියලුම වාහන 2018 ජුනි 30 දිනට පෙර අපහරණය කරන ලෙස දක්වා තිබුණද, ඊට අනුකූල නොවී මඩුල්ල ප්‍රාදේශීය | චක්‍රලේඛ උපදෙස් අනුව අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. | අපහරණයට අදාළ කටයුතු සිදු කරන බව දන්වා සිටිමි. | 2022 පෙබරවාරි වනවිටත් අපහරණයට අදාළ කටයුතු සිදු කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | ලේකම් කාර්යාලයට අයත් ධාවනය කළ නොහැකි තත්ත්වයේ පවතින කැබ් රථයක්, ට්‍රැක්ටර් රථයක්, යතුරු පැදියක් හා නඟුලක් 2021 පෙබරවාරි 12 දින වන විටත් කාර්යාල පරිශ්‍රයේ රඳවා තිබුණි. | | | |
| 21. | සියඹලාණ්ඩුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය සතු විදුලි ජනක යන්ත්‍රයක්, ජීප් රථයක්, ට්‍රැක්ටර් බවුසරයක්, ලොරි බවුසර් රථයක් හා යතුරු පැදියක් දීර්ඝ කාලයක සිට භාවිතයට නොගෙන පවතින බව නිරීක්ෂණය විය. | අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. | විදුලි ජනක යන්ත්‍රය පිළිබඳව ඉදිරි භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල තීරණයක් අනුව කටයුතු කරන අතර, අනෙකුත් වාහන අපහරණයට කටයුතු කරමි. | වාහන අපහරණ කටයුතු සිදුකර නොමැත. |
| 22. | වැල්ලවාය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයක් 2002 සැප්තැම්බර් 19 දින අනතුරකට පත්වී තිබුණු අතර, මුදල් රෙගුලාසි 104 (4) වාර්තාව අනුව රු. 375,000 ක අලාභය රියදුරුගෙන් අයකර ගැනීමට තීරණය කර තිබුණි. මෙම අලාභය රියදුරුගෙන් අයකර ගන්නා ලෙස 2013 අප්‍රේල් 23 දින පැවති රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේදී නියෝග කර තිබුණි. එම නියෝගය ලබා දී වසර 08 කට ආසන්න කාලයක් ගතවී තිබුණද, එම අලාභයෙන් රු. 92,500 ක් පමණක් අයකර | අලාභය අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | මෙම අනතුර සම්බන්ධයෙන් වගකිවයුතු රියදුරුගෙන් අනතුරට අදාළ අලාභය වන රු.375,000 ක මුදලින්රු. 107,500 ක් මේ වන විට අයකර ගෙන ඇති අතර මසකට රු.2,500 බැගින් අඛණ්ඩව අයකිරීම් සිදු වන බව දන්වා සිටිමි. | 2022 පෙබරවාරි වනවිටත් රු.267,500 ක් අය කර ගැනීමට ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | ගෙන තිබුණි. | | | |
| 23. | වැල්ලවාය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයක් 2016 දෙසැම්බර් 17 දින අනතුරකට ලක් වීමෙන් රු.2,630,726 ක අලාභයක් සිදුවී තිබුණු අතර, එම අනතුරෙන් පසු සිදුකළ අලුත්වැඩියාවන් සඳහා රක්ෂණයෙන් ආවරණය නොවූ රු.188,524 ක් මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් දරා තිබුණි.අනතුර සිදුවී වසර 04 කට අධික කාලයක් ගතවී තිබුණද, 2021 මාර්තු 23 වන දින විටද අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 (4) පරිදි පරීක්ෂණ පවත්වා අවසාන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. එමෙන්ම රජයේ වියදමෙන් දරන ලද රු.188,524 ක අලුත්වැඩියා වියදම පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනයේ තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු යටතේ දක්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි විධිවිධාන අනුව පරීක්ෂණ කටයුතු අප්‍රමාදව සිදුකළ යුතුය. | අවසන් පරීක්ෂණ කටයුතු සිදු කිරීම සඳහා පරීක්ෂණ මණ්ඩලයක් පත්කර ඇති අතර, එම කමිටු නිලධාරීන්ට සිහි කැඳවීම් ලිපි මගින් දැනුවත් කළද, මේවන තෙක් අදාළ වාර්තා ලබාදී නොමැත. | 2022 පෙබරවාරි වනවිටත් අවසන් පරීක්ෂණ වාර්තාව ලැබී නැත. |
| 24. | මොනරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් | අරමුදල් එලදායීව උපයෝජනය කිරීම | කර්මාන්තයේ කාර්යයන් 2020 | මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ |

| | | | | |
|---|---|---|---|---|
| | සපිරිගමක් වැඩසටහන 2020 යටතේ හුලංදාව දකුණ පළමු පියවර 12 කඩය අසලින් ඇති මාර්ගයේ බෝක්කුව අලුත්වැඩියා කිරීම සඳහා රු.495,000 ක වියදමක් දරා තිබුණද, මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ ස්ථානයේ නව පාලමක් ඉදිකරමින් පවතින බැවින් එය ඉදිකිරීම සඳහා, ඉදිකර තිබුණු බෝක්කුව කඩා ඉවත්කර තිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා දරන ලද වියදම නිෂ්කාර්ය වියදමක් බව නිරීක්ෂණය විය. | සඳහා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පෙර ඒවායේ අවශ්‍යතාවය පිළිබඳ නිවැරදි ඇගයීමක් සිදුකළ යුතුය. | නොවැම්බර් 12 වන දින නිමවා තිබුණි. නමුත් 2020 දෙසැම්බර් 28 දින ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය මඟින් එම ස්ථානය සඳහා පාලමක් යෙදීම සිදු කරන බවට දැනුම් දීමක් කර ඇති අතර අදාළ බෝක්කුව ඉදිකිරීම් කාලයේ දී දැනුම්දීමක් සිදු කර නොමැති බව දන්වමි. | ස්ථානයේ නව පාලමක් ඉදිකර ඇත. |
| 25. | 2015 දෙසැම්බර් 11 දිනැති අංක MO/RG/301 දරන තක්සේරු වාර්තාව අනුව 2016, 2017 සහ 2018 වර්ෂවලදී මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් රජයේ නිවාස සඳහා කුලී අය නොකිරීම හේතුවෙන් එම වර්ෂවලට අදාළ හිඟ නිවාස කුලිය රු. 1,506,250 ක් විය. ඉන් 2021 මාර්තු 30 දිනට රු.17,400 ක් පමණක් අය වී තිබුණද, රු.1,488,850 ක් තවදුරටත් හිඟව පැවතුණි. රජයේ නිවාස සඳහා අවසන් වරට තක්සේරුව සිදුකර වසර | තක්සේරු වාර්තා අනුව හිඟ නිවාස කුලී අයකරගත යුතුය. | 2016 ජනවාරි මස සිට 2018 අගෝස්තු මාසය දක්වා හිඟ නිවාස කුලී අය කිරීම සඳහා අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත. එහි දී නිලධාරීන් කිහිපදෙනෙක් විසින් එකවර ගෙවීම් කිරීමට නොහැකි බැවින් වාරික ලෙස ගෙවීම් කිරීමට ඉල්ලා තිබූ අතර එම ඉල්ලීම් රේඛීය අමාත්‍යාංශ වෙත අනුමැතියට යවා ඇත. | 2022 පෙබරවාරි වනවිටත් රු.149,107 ක් අයකර ගෙන ඇති අතර අයවිය යුතු කුලිය රු.1,357,143 ක් විය. |

| | | | | |
|---|---|---|---|---|
| | 05 ක් ඉකුත්ව තිබුණද, තක්සේරු කුලිය සංශෝධනය කර නොතිබුණි. | | අනුමැතිය ලද නිලධාරීන්ගෙන් මේ වන විට වාරික ලෙස අය වන අතර අනෙකුත් නිලධාරීන් හට නැවත සිහිකැඳවීම් ලිපි යොමු කර ඇත. | |
| 26. | 2001 අගෝස්තු 21 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව උපරිම කාල සීමාව වසර 5 ක් එකම තනතුරේ /සේවා ස්ථානයේ සේවය කර ඇති සෑම නිලධාරියෙකුටම වෙනත් සේවා ස්ථානවල සේවය කිරීමට ඉඩදීම සඳහා ස්ථාන මාරුවීම් ලබාදිය යුතු වුවද, මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක සේවයේ නියුතු නිලධාරීන් 584 දෙනෙකු වර්ෂ 6 සිට වර්ෂ 29 ක් දක්වා කාලයක් එකම සේවා ස්ථානයේ සේවයේ යොදවා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතුය. | වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම් කලද බොහෝ නිලධාරීන් හට වාර්ෂික ස්ථාන මාරු ලැබී නැති බව අනාවරණය වී ඇත. | වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම් කලද බොහෝ නිලධාරීන් හට වාර්ෂික ස්ථාන මාරු ලැබී නැති බව දන්වා ඇත. |

අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

-------------------------------------------

2018 තත්ත්වාගණනය කළ මතය

2019 තත්ත්වාගණනය කළ මතය

2020 තත්ත්වාගණනය කළ මතය

| **විගණකාධිපති වාර්තාවේ ඇතුළත් ප්‍රධාන අඩුපාඩු** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ** | **ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය** |
|---|---|---|---|

| | | | ක්‍රියාමාර්ග | |
|---|---|---|---|---|
| 01. | හොරොව්පොතාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දියතිත්තවැව අලුත් ගම්මානයේ පානීය ජල ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.1,039,947 ක වටිනාකමකට ළිඳක් ඉදිකර තිබුණි. එම ඉදිකර තිබූ ළිඳෙහි ජලය පානයට සුදුසු ප්‍රමිතියෙන් නොවූයෙන් ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි. | ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර ව්‍යාපෘතියේ ඵලදායිතාවය ඇගයීමට ලක් කර අරමුණු ඉටු කළහැකි ව්‍යාපෘති පමණක් ක්‍රියාවට නැංවිය යුතුයි. | මෙම ළිඳෙහි ජලය, පානය කිරීම සඳහා නුසුදුසු තත්ත්වයක් ඇති වූවද වර්තමානය වන විට එම ජනතාව ඔවුන්ගේ අනෙකුත් සියළුම ජල අවශ්‍යතා සපුරා ගනුයේ මෙම ළිඳෙනි. | ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි. |
| 02. | අනුරාධපුර මහජන පොල පරිශ්‍රයේ මාළු කඩකාමර සංකීර්ණය ඉදිකිරීම සඳහා 2015 සහ 2016 වර්ෂවල දී රු.මිලියන 6.35 ක වියදමක් දරා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.<br>• මෙම ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.<br>• අපේක්ෂිත සැලසුම්වලට හා ඉංජිනේරු ප්‍රමිතීන්ට අදාළ වී නොතිබුණි.<br>• මහජන පොළ ප්‍රජාවගේ අවශ්‍යතාවයන්ට අනුකූල | ඉදිකිරීම සඳහා අදාල අනුමැතින් ලබාගත යුතු අතර සැලසුම්වලට හා ඉංජිනේරු ප්‍රමිතීන්ට අනුකූලව හා අවශ්‍යතාවයන් අනුව අදාල කටයුතු සිදුකළ යුතුය. | අදාල අනුමැතින් ලබාගැනීමට කටයුතු කර ඇත.<br>එම සැලසුමට අනුව ඉදිකිරීමේදී පැරණි කඩ කාමර නව සැලසුමේ ඇතුළත් නොවන බැවින් එම කඩ කාමර කඩා ඉවත් කර නව ඉදිකිරීම් සිදුකර ඇත. | 2022 පෙබරවාරි වනවිටත් එම තත්ත්වයේම පැවතුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | වී නොතිබුණි. මෙම කඩකාමර සංකීර්ණය කිසිදු ප්‍රයෝජනයකට නොගෙන මුළුමනින්ම කඩා ඉවත් කර තිබුණි. | | | |
| 03. | දිස්ත්‍රික් ලේකම් සතු රජයේ නිවාස 15 ක් වසර 10 කට අධික කාලයක සිට උතුරු මැද පළාත් සභාවේ නිලධාරීන්ගේ පරිහරණය සඳහා ලබාදී තිබුණි. එම නිවාස වලින් ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 05 ඡේදය ප්‍රකාරව කුලී අය කිරීම දිස්ත්‍රික් ලේකම් විසින් සිදු කර නොතිබුණි. එම නිවාස වල පදිංචි කාලය වසර 5 සීමාව ඉක්මවූ පසු සන්තකය ආපසු භාර ගැනීම සඳහා වූ අභ්‍යන්තර පාලනය දිස්ත්‍රික් ලේකම් විසින් ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් එම නිවාසවල පාලනය දිස්ත්‍රික් ලේකම්ගෙන් බැහැර වී තිබුණි. කෙසේ වෙතත්, මෙම නිවාස වෙනුවෙන් වරිපනම් බදු ගෙවීම දිස්ත්‍රික් ලේකම් විසින් අඛණ්ඩව සිදු කර තිබුණි. | ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ විධිවිධාන ප්‍රකාරව කුලී අය කිරීම හා දිස්ත්‍රික් ලේකම් සමඟ නිවාසලාභියා එළඹී ගිවිසුම ප්‍රකාරව සන්තකය ආපසු භාර ගැනීම කළ යුතුය. | උතුරු මැද පළාත් සභාවේ නිලධාරීන් පදිංචි වී සිටින නිවාස 11 සම්බන්ධව එම නිළ නිවාස නැවත මා වෙත භාර දෙන ලෙස ප්‍රධාන ලේකම් වෙත දැනුම් දී ඇති අතර ගැටලු සහගත තවත් නිවාස 04 ක් පවතී. ඒවායේ අයිතිය, ඉදිකිරීම් කළේ කා විසින්ද යන්න තවදුරටත් සොයා බලා ඉදිරි කටයුතු කිරීමට නියමිත වේ. | 2022 පෙබරවාරි වන විටත් පවතින ගැටලු නිරාකරණය වී නොතිබුණි. |
| 04. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පැවැති ගිනි අවි ගබඩාවේ පහත සඳහන් පාලන දුර්වලතාවයන් පැවතුණි. | | | |

| | | | | |
|---|---|---|---|---|
| (i) | දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ ඇති ගිනි අවි ගබඩාවේ භාරගත් දිනය, ලද කාරණය හා ගිනි අවි අංකය ඇතුළු තොරතුරු ලේඛනගත නොකරන ලද පැරණි ගිනි අවි 388 ක් පැවතුණි. | ලැබීම් නිකුත් කිරීම් හා පිටත පවතින ගිනි අවි පිළිබඳ හඳුනාගැනීමට හැකි වන පරිදි ලේඛනයක් නඩත්තු කළයුතුය. | එම අවි 2016.05.14 දින පැවැති ගිනි අවි තක්සේරු මණ්ඩලයෙන් භාවිතයට නුසුදුසු ගිනි අවි ලෙස වෙන්කල අවි බව 2021.08.26 දින නැවත සිදු කල සමීක්ෂණයේදී සොයාගන්නා ලදී. එම ගිනි අවි 2021.12.31 දිනට පෙර ක්ෂේත්‍ර බලකා මූලස්ථානයට භාරදීමට අවශ්‍ය කටයුතු සූදානම් කර ඇත. | 2022 පෙබරවාරි වනවිටත් එම තත්ත්වයේම පැවතුණි. |
| (ii) | ගබඩාවේ තිබූ පිස්තෝල 15 ක් සහ පතරොම් 500 කට ආසන්න සංඛ්‍යාවක් කුමන කාර්යයක් වෙනුවෙන් ගබඩා කර තිබේද යන්න හඳුනාගත නොහැකි විය. | ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් පරිදි කටයුතු කළයුතුය. | මෙම පිස්තෝල 15 සහ පතොරම් 500 2021.12.31 දිනට පෙර ක්ෂේත්‍ර බලකා මූලස්ථානයට භාරදීමට අවශ්‍ය කටයුතු සැලසුම් කර ඇත. | - එම - |
| 06. | තිරප්පනේ, පලුගස්වැව, හොරොව්පොතාන හා මිහින්තලේ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 4 ක රජයේ ඉඩම්වල පදිංචි වී සිටින හා වගා කරන ගොවීන් වෙත ලබාදීම සඳහා ජනාධිපතිවරයා විසින් අත්සන් කර ප්‍රාදේශීය | ජනාධිපතිවරයා අත්සන් කර එවනු ලබන දීමනා පත්‍ර වහාම හිමිකරුවන්ට ලැබීමට සැලැස්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුයි. | තවදුරටත් බෙදා දීමට දීමනා පත්‍ර 166 ක් ඉතිරිව ඇත. මෙම දීමනා පත්‍ර දැනට වසර විසිපහකට පමණ පෙර සැකසූ ඒවා බැවින් තොරතුරු සොයා ගැනීමේ | 2022 පෙබරවාරි වනවිටත් බෙදාදීමට කටයුතු නොකළ දීමනා පත්‍රලාභීන් විය. |

| | | | | |
|---|---|---|---|---|
| | ලේකම් කාර්යාල වෙත එවා තිබූ දීමනා පත්‍ර 536 ක් ලැබී දීර්ඝ කාලයක් තිස්සේ අදාළ ප්‍රතිලාභීන් වෙත නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | | අපහසුව මත දීර්ඝ කාලයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රඳවා ගැනීමට සිදුව ඇත. නිරන්තරයෙන් ග්‍රාම නිලධාරින් දැනුවත් කර තොරතුරු සපයා ගැනීමට කටයුතු කර එසේ ලැබෙන තොරතුරු අනුව වරින් වර දීමනා පත්‍ර නිකුත් කිරීමට හා අවලංගු කිරීම සඳහා යැවීමට කටයුතු කරනු ලැබේ. | |
| 07. | මැදවච්චිය පැරණි උප දිසාපති කාර්යාලය පිහිටි ඉඩම බාහිර පාර්ශවයක් විසින් අනවසරයෙන් දීර්ඝ කාලයක් තිස්සේ පදිංචි වී සිටින අතර, ඒ සම්බන්ධයෙන් සිදු කරන ලද පරීක්ෂණ අනුව එම ඉඩමෙන් පර්චස් 40 ක් දීර්ඝ කාලීන බදු පදනම මත පදිංචිකරුට පවරා දීමට ඉඩම් කොමසාරිස් නිර්දේශ කර තිබුණි. එසේ වුවද, ඒ අනුව කටයුතු නොකිරීම හේතුවෙන් එම ඉඩමේ ඉතිරි කොටස නිදහස් කර ගැනීමට නොහැකි වී තිබුණි. | ඉඩම් කොමසාරිස්ගේ නිර්දේශ පරිදි කටයුතු කර පර්චස් 40 ක් සඳහා දීර්ඝකාලීන බලපත්‍ර ලබා දී ඉතිරි ඉඩම් කොටස නිදහස් කර ගැනීමට කටයුතු කළ යුතුය. | මෙම ඉඩම අදාළ කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි වසම සඳහා පැවති ඉඩම් කච්චේරියකට අදාළ පාර්ශවය ඉදිරිපත් වී ඇත. තේරීම් ලැයිස්තු සකස් කර පළාත් ඉඩම් කොමසාරිස් (උමැප) වෙත යවා අනුමැතිය ලද පසු පදිංචිකරු හට පර්චස් 40 ක කොටස දීර්ඝ කාලීන බදු පදනම මත නිදහස් කළ හැකිය. | 2022 පෙබරවාරි වනවිටත් එම තත්ත්වයේම පැවතුණි. |
| 08. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව | නිලධාරීන් දෙදෙනෙකුගේ මූලික | 2022 පෙබරවාරි වනවිටත් එම |

| | | | | |
|---|---|---|---|---|
| | සංග්‍රහයේ II වැනි කොටසේ XLVIII පරිච්ඡේදයේ 13.2 වගන්තිය ප්‍රකාරව මූලික විමර්ශනය කොතරම් කාලයක් ඇතුළත නිම කළයුතු ද යන්න මූලික විමර්ශනය සඳහා නියෝග කරන නිලධාරියා විසින් පරීක්ෂණ මණ්ඩලය වෙත නියම කළයුතු වුවද, මූලික පරීක්ෂණය අවසන් කළයුතු කාලයක් නිශ්චිතව පරීක්ෂණ මණ්ඩලය වෙත දන්වා නොතිබීම හේතුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පසුගිය වර්ෂ 6 ක් තුළ සිදු කරන ලද එවැනි පරීක්ෂණ 4 ක් 2019 වර්ෂය අවසානය දක්වා නිමකර නොතිබුණි. | කටයුතු කළ යුතුය. | විමර්ශන වාර්තා 2020.06.22 වන දින ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යවා ඇත. මෙතෙක් විධිමත් විනය පරීක්ෂණ අරඹා නැත. වර්තමානයේදී මූලික විමර්ශන නිලධාරීන් පත් කරන විට වාර්තාව ලබා දිය යුතු කාලසීමාව සඳහන් කර ලබා දෙන බවද කාරුණිකව දන්වා සිටිමි. | තත්ත්වයේම පැවතුණි. |
| 09. | ස්මාර්ට් ශ්‍රී ලංකා ගොඩනැගිල්ල ඉදිකිරීමේදී ඇස්තමේන්තු අගය ඉක්මවා රු.2,478,156 ක් ගෙවීම් කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 ප්‍රකාරව විචලනයන් සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුව සංශෝධනය කර අනුමැතිය ලබාගෙන ඒ අනුව කටයුතු කළයුතුය. | වැළැක්වීමට ක්‍රියාමාර්ග ගෙන නැත. | ඇස්තමේන්තුව ඉක්මවා වියදම් කිරීම සම්බන්ධයෙන් අනුමැතිය ලබාගෙන නැත. |
| 10. | ස්මාර්ට් ශ්‍රී ලංකා ගොඩනැගිල්ලට අදාළ උප කොන්ත්‍රාත් පිරිනමන ලද වටිනාකම රු.6,006,157 ක් වූ වැඩ විෂයයන් 06 ක් සඳහා | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළයුතුය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙන් බැහැරව කටයුතු කිරිම සම්බන්ධයෙන් | මෙම තත්ත්වයම වර්තමානයේදීද පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙන් බැහැරව කටයුතු කර තිබුණි. | | ක්‍රියාමාර්ග ගෙන නැත. | |
| 11. | ස්මාර්ට් ශ්‍රී ලංකා ගොඩනැගිල්ල ඉදිකිරීම් සඳහා මිලදී ගත් රු.186,000 ක් වටිනා උපකරණ හා මෙවලම් අයිතම 51 ක් ඉදිකිරීම් කාර්යයෙහි නිරත වූ ආයතන විසින් ආපසු භාර දී නොතිබුණි | ආපසු භාරගෙන ඉන්වෙන්ට්‍රිගත කළ යුතුය. | ස්මාර්ට් ශ්‍රී ලංකා ගොඩනැගිල්ලේ ඉදිකිරීම් සඳහා මිලදී ගත් උපකරණ හා මෙවලම් විධාන සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ (උ.මැ) ඉන්වෙන්ට්‍රියට ඇතුළත් කර ඒ බව මා වෙත වාර්තා කර ඇත. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් මිලදී ගෙන ඇති බැවින් ඒවා ආපසු භාරගතයුතු වුවත්, ආපසු භාර දී නොමැත. |
| 12. | නැවත පදිංචිකිරීම, පුනරුත්ථාපන, උතුරු සංවර්ධන හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය යටතේ උතුරු හා උතුරු මැද පළාත් වල වෙසෙන ණයගැතිභාවයෙන් පෙලෙන ජනතාවට ණය පහසුකම් සැපයීමේ වැඩසටහන යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් සැපයීම සඳහා 2018 වර්ෂය තුළ රු.මිලියන 250 ක් වෙන් කර දී තිබුණි. 2019 වර්ෂයේ ජනවාරි මාසයේදී එම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා උතුරු මැද පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත එම | ව්‍යාපෘති යෝජනාවල සඳහන් මිණුම් දඬු සංශෝධනය කර අපේක්ෂිත අරමුණු සඳහා ණය නිකුත් කිරීමේ වැඩපිළිවෙල කඩිනම් කළයුතුයි. | මෙම වැඩසටහනේ විගණනය මගින් දක්වා ඇති පරිදි 2019.12.31 වන දිනට ප්‍රගතිය ඉතා පහළ මට්ටමක පැවතීමට බලපෑ ප්‍රධාන කාරණය උපරිම ණය මුදල ප්‍රමාණවත් නොවීම හා වාර්ෂික පොළී ප්‍රතිශතය සියයට 14 ක් වූ ඉහල අනුපාතයක පැවතීමයි.<br><br>මෙම සීමාවන් ඉහල දැමීම හා පොළී ප්‍රතිශතය පහළ හෙළීම සම්බන්ධයෙන් සමෘද්ධි, ගෘහ ආර්ථික, | ණය නිකුත් කිරීමේ ප්‍රගතියක් ලබාගෙන නැත. මිලියන 200 ක් ඉක්මවූ මුදලක් නිශ්කාර්යව සමුපකාර ග්‍රාමීය බැංකු ගිණුම්වල පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රතිපාදන මුදාහැර තිබුණු අතර, දෙපාර්තමේන්තුව විසින් අනුරාධපුර දිස්ත්‍රික් සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය සමඟ ගිවිසුමකට එකඟ වී තිබුණි. 2019 දෙසැම්බර් 31 දින වන විට එම වැඩසටහන යටතේ ණය පහසුකම් ණය නිකුත් කර තිබුණේ රු.මිලියන 6.5 ක් පමණක් බැවින්, ලබාදී තිබූ ප්‍රතිපාදනවලින් රු.මිලියන 243.5 ක් හෙවත් සියයට 97.39 ක් ඊට අදාළ ව්‍යාපෘතිය වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි. | | ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌණ උපයෝජන රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කර ඇත. එහෙත් ඊට අදාළ කැබිනට් පත්‍රිකාව අනුමත වූයේ 2021.01.18 වන දිනය. මෙම කැබිනට් පත්‍රිකාවෙන් උපරිම ණය සීමාව රු.40,000 - 100,000 දක්වා වැඩි කිරීමත් වාර්ෂික පොළී අනුපාතය සියයට 14 සිට සියයට 6 දක්වා අඩු කිරීමත් සිදුවිය. ඒ අනුව මේ වන විට සැලකිය යුතු ප්‍රගතියක් අත්කරගෙන ඇත. එනම්, ණයලාභීන් 987කට රුපියල් මිලියන 41.531ක ණය මේ වන විට ලබා දී ඇත. | |
| 14. | තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථානයේ වැට ඉදිකිරීම සඳහා සිදු කරන ලද ප්‍රසම්පාදනයේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.2 ඡේදය ප්‍රකාරව වැඩ | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතු වන අතර, අලාභයට වගකිව යුතු | ක්‍රියාමාර්ග දන්වා නැත. හේතු පැහැදිළි කිරීම් දක්වා ඇත. | ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් සිදු කළ පරීක්ෂණයකදී ද ප්‍රසම්පාදන දුර්වලතා සිදු වී ඇති බැව් |

| | | | | |
|---|---|---|---|---|
| | කොන්ත්‍රාත්වලදී ඉංජිනේරු ඇස්තමේන්තුව සමඟ සැසඳීම් කර විස්තරාත්මක ලංසු ඇගයීම සඳහා ලබාදී තිබූ උපදෙස් අනුව කටයුතු නොකර සුදුසුකම්ලත් අවම මිල ගණන් ඉදිරිපත් කරන ලද ලංසුකරුවන් 5 දෙනෙකු ප්‍රතික්ෂේප කර 6 වන ස්ථානයට මිල ගණන් ඉදිරිපත් කර තිබූ ලංසුකරු වෙත ටෙන්ඩරය පිරිනැමීම හේතුවෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී රු.287,821 ක අලාභයක් සිදු වී තිබුණි. | පාර්ශවයන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුය. | | තහවුරු කර ඇත. අලාභය වගකිව යුත්තන්ගෙන් අයකර නැත. |
| 15. | බොරළු කැණීම් කිරීමේදී භූමිය පුනස්ථාපන තැන්පතු වෙනුවෙන් බොරළු කියුබ් 1 ක් සඳහා රු.200 බැගින් තැන්පත් මුදල් ලබාගත යුතු වුවද, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 13 ක අවස්ථා 25 කදී රඳවා ගතයුතු තැන්පත් මුදල් රු.5,575,600 ක් රඳවා නොගැනීම හේතුවෙන් අදාළ ස්ථානවල පරිසරය යථාවත් කිරීම නිවැරදිව සිදු වී නොතිබුණි. | කාර්මික කැණීම් බලපත්‍ර කොන්දේසි අනුව කටයුතු කළ යුතුය. | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 06 ක ස්ථාන 15 ක භූමිය පුනස්ථාපනය අවසන් කර බැවින් මුදල් නිදහස් කර ඇත. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 2 ක තැන්පත් මුදල් පොදු තැන්පත් ගිණුමෙන් රජයේ ආදායමට බැර කර ඇත. | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 5 ක කැණීම් ස්ථාන පුනස්ථාපනය කර නොමැත. |
| 16. | අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ 2017 සහ 2018 වර්ෂයන්හි නීත්‍යානුකූල බලපත්‍ර ලබාගැනීමකින් තොරව හා | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැණීම් කාර්යාංශය සමඟ එක්ව සුදුසු | නීත්‍යානුකූල බලපත්‍ර ලබා ගැනීමකින් තොරව බොරළු කැණීම් සිදු කරන | 2022 පෙබරවාරි වනවිටත් අහිමි වූ රජයේ ගාස්තු අයකරගෙන නැත |

| | | | | |
|---|---|---|---|---|
| | ලබාගත් බලපත්‍ර අවභාවිතා කර සිදු කරන ලද බොරළු කැණීම් වලින් රජයට අහිමි වූ ආදායම රු.මිලියන 42.9 ක් පමණ විය. | අභ්‍යන්තර පාලන වැඩපිළිවෙලක් සැකසිය යුතුය. | අවස්ථාවන් වාර්තා වූ වහාම ඒ අයට අදාලව නීතිමය පියවර ගන්නා ලෙස අදාල ආයතන දැනුවත් කර ඇත. ලබාගත් බලපත්‍ර අවභාවිතා කර වැඩිපුර කැනීම් කරන අවස්ථාවන්හිදි එසේ කැණීම් කල ප්‍රමාණය ගණනය කිරීම භූ විද්‍යා කැණීම් හා පතල් කාර්යාංශය මගින් සිදුකල යුතුවේ. එබැවින් මෙවැනි අවස්ථාවන්හිදි හිගය අයකර ගැනීමට හැකිවන පරිදි අදාල බලපත්‍රකරුගෙන් යම් තැන්පතු මුදලක් ලබාගැනීම සුදුසු බව යෝජනා වී ඇත. | |
| 17. | රජයේ ඉඩම් ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව නේවාසික හා කෘෂිකාර්මික කටයුතු සඳහා තක්සේරු වටිනාකම අයකරගෙන දීර්ඝ කාලීන බලපත්‍ර ලබාදිය යුතු ඉඩම් කොටස් 2 ක් නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 279 දරන මහකලත්තෑව ග්‍රාම | තක්සේරු වටිනාකම අයකරගෙන දීර්ඝකාලීන බදු බලපත්‍ර ලබාදිය යුතුය. | මේ පිළිබඳව නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් විසින් ඉඩම් කොමසාරිස් ජනරාල්ගෙන් උපදෙස් ඉල්ලා ඇති අතර, ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංක 3/4/1/අනු/නැනුප/202 | 2022 පෙබරවාරි වනවිටත් දීර්ඝකාලීන බලපත්‍ර නිකුත් කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | නිලධාරී වසමේ පුද්ගලයින් දෙදෙනෙකු වෙත ලබා දී තිබුණි. මෙම බලපත්‍ර ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික ආදායම රු.144,000 ට අඩු අය සඳහා ලබාදෙන නිදහස් බලපත්‍ර 2 ක් බව තවදුරටත් නිරීක්ෂණය විය. | | 0/01 හා 2020.12.01 දිනැති ලිපිය මගින් අදාල ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නිකුත් කරන බලපත්‍ර දෙක අවලංගු කර එම ඉඩම් කොටස් සඳහා රජයේ ඉඩම් ආඥා පනත යටතේ දීර්ඝ කාලීන බදු බලපත්‍ර දෙකක් සකස් කිරීමට කටයුතු කරන ලෙස දන්වා ඇත. ඒ අනුව ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නිකුත් කරන බලපත්‍ර නැවත රජයට බාරදෙන ලෙස ප්‍රාදේශීය ලේකම් විසින් අදාල පුද්ගලයන් දැනුවත් කර ඇත. | |
| 18. | ජාතික වැඩිහිටි ලේකම් කාර්යාලය විසින් සියළු ප්‍රාදේශීය ලේකම්වරුන් ඇමතු 2020 ජනවාරි 13 දිනැති අංක NSE/DVE/04/02/03/11 දරන ලිපිය ප්‍රකාරව තම කොට්ඨාසය තුළ සිටින ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා එක් වරක් පමණක් ගෙවන රු.30,000 ක ස්වයංරැකියා ආධාර ලබාදීම සඳහා කටයුතු කරන ලෙස දන්වා තිබූ නමුත්, | ජාතික වැඩිහිටි ලේකම් කාර්යාලය ක්‍රියාත්මක කරන වැඩසටහන් තම කොට්ඨාසය තුළ ක්‍රියාත්මක කරවා ගැනීමට ප්‍රමාණවත් උත්සාහයක් දැරිය යුතුය. | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී සාකච්ඡා කර ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කර ඇත. | 2022 පෙබරවාරි වනවිටත් ක්‍රියාත්මක කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 10 ක් තුළ එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. | | | |
| 19. | දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 21 ක ක්‍රියාත්මක කර තිබූ කාන්තා කාර්යාංශ ණය වැඩසටහන් යටතේ නිකුත් කළ ණයවලින් වසරකට වඩා වැඩි කාලයක් වාරික අය නොවන අක්‍රීය ණය එකතුව රු.5,530,631 ක් විය. ණය වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ලැබී තිබූ ප්‍රතිපාදනවලින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 18 ක බැංකු ගිණුම්වල රු.12,560,764 ක මුදලක් ණය වැඩසටහන සඳහා යොදා නොගෙන නිශ්කාර්යව පැවතුණි. | ණය යෝජනා ක්‍රමයේ අපේක්ෂිත අරමුණු ඉටුවන ආකාරයට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතුය. | මේ සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවයේ නියුතු වනිතා සංවර්ධන නිළධාරීන් සිහි කැඳවීම නිකුත් කර, ඉන් නොනැවතී සමථ මූල මණ්ඩල වෙත යොමු කර ණය අයකර ගැනීමට කටයුතු කර ඇත. දැනටමත් සමථ මූල මණ්ඩල හරහා ණය අයකර ගැනීමේ කටයුතු කරයි. | 2021 සැප්තැම්බර් 30 දිනට අයකර නොගත් ණය ශේෂ එකතුව රු.17,934,807 ක් පැවති අතර එදිනට අක්‍රීය බැංකු ගිණුම් ශේෂ එකතුව රු.9,589,890 ක් විය. |
| 20. | සපිරි ගමක් ජනතා සහභාගීත්ව ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ නාච්චාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහනෙළුඹෑව වාන් ඇල පැති බැම්ම සැකසීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.1,980,000 ක් වැය කර තිබූ නමුත්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ලබාදුන් සැලැස්මට හා ඉංජිනේරු උපදෙස් වලට පටහැනිව මෙම ඉදිකිරීම් සිදු | ඉංජිනේරු උපදෙස් වලට පටහැනිව කටයුතු කළ නිලධාරීන් සම්බන්ධයෙන් විනය පියවර අනුගමනය කළ යුතුය. | මෙම කාරණාව සම්බන්ධව ව්‍යාපෘතිය වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයිති ව්‍යාපෘතියකි. ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුගේ අංක DE1/NA/W/544 හා 2020.02.07 දිනැති ලිපිය හා එවන ලද සැලැස්මට අනුව ගම්වාසීන්ගේ දැඩි ඉල්ලීම නිසා ප්‍රාදේශීය | අධීක්ෂණය කළ නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | කර තිබීම හේතුවෙන් ඉදි කර මාස 06 ක් ගතවීමටත් පෙර එම පැති බැම්ම ඇලට පෙරළී විනාශ වීම හේතුවෙන් දැරූ සම්පූර්ණ මුදල් නිශ්කාර්ය වියදමක් බවට පත් වී තිබුණි. | | ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක කරන ලදී. එබැවින් අදාල ව්‍යාපෘතිය වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් අප නාච්චාදූව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලබා දුන් සැලැස්ම අනුවම සිදු කර ඇති බව වැඩි දුරටත් දන්වනු කැමැත්තෙමි. | |
| 21. | නව සමෘද්ධි හිමිකම්පත් ප්‍රදානය පිළිබඳව නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සිදු කරන ලද නියැදි පරීක්ෂාවට අනුව ප්‍රතිලාභීන් 84 දෙනෙකුගෙන් 46 දෙනෙකුම එනම් සියයට 55 ක්ම හිමිකම් ලැබීමට සුදුසුකම් නොමැති බව නිරීක්ෂණය විය. බොහෝ අවස්ථාවල ප්‍රමුඛතා ලේඛනවල ඉහළ සිටින අය අතහැර අවසන් කිහිප දෙනෙකු වෙත මෙම ප්‍රතිලාභ ලබාදී තිබුණු අවස්ථාවන් පවතින බවද වැඩිදුරටත් නිරීක්ෂණය විය. | සමීක්ෂණයට අනුව සුදුස්සන් සඳහා ප්‍රමුඛතාවය ලබාදිය යුතුය. | ඉහත නම් සඳහන් ප්‍රතිලාභීන් පාදක කර ගනිමින් ඉදිරිපත් කර ඇති නිරීක්ෂණයට අනුව මෙම ප්‍රතිලාභීන් සඳහා අදාල හිමිකම් පත් ලබා දී ඇත. මෙම කාර්යාලය මගින් කරන ලද සමීක්ෂණය පරිදි සහනාධාර ලබා දිමට සුදුසු ප්‍රතිලාභින්ගේ ප්‍රමුඛතාවයට අනුව නාම ලේඛණය සකස් කරන ලදි. ප්‍රාදේශිය ලේකම් විසින් අනුමත කරන ලද ලේඛණය දිස්ත්‍රික් අධ්‍යක්ෂ මගින් ප්‍රධාන කාර්යාලය වෙත යොමු කරන ලදි. | ප්‍රමුඛතා ලේඛනය ප්‍රකාරව ප්‍රතිලාභ හිමිවිය යුතු නියම සුදුස්සන් අත්හැරී තිබුණි. |

| | | | |
|---|---|---|---|
| | | ඒ අතරින් ප්‍රධාන කාර්යාලය විසින් තෝරා ගත් ප්‍රතිලාභීන් සඳහා පමණක් හිමිකම් පත්‍ර මෙම කාර්යාලය වෙත ලබා දිමෙන් අනතුරුව අදාල ප්‍රතිලාභින් වෙත එම හිමිකම් පත් ලබාදෙන ලදි. ඒ.අනුව එය සංශෝධනය කිරීමේ හැකියාවක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත නොවිය. | |

පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

-------------------------------------------------

2018 තත්ත්වාගණනය කළ මතය

2019 තත්ත්වාගණනය කළ මතය

2020 තත්ත්වාගණනය කළ මතය

| **විගණකාධිපති වාර්තාවේ ඇතුළත් ප්‍රධාන අඩුපාඩු** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග** | **ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය** |
|---|---|---|---|
| 01. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සිදුකරන ලද පුදූර් මාර්ගයේ සමූපකාරය අසල පැති බැම්ම ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා පිළියෙල කරන ලද මුල් ඇස්තමේන්තුවේ සඳහන් වැඩ අතුරින් රු. 1,160,676 ක වැඩ සිදු කර නොතිබුණි. මේ | නිවැරදි ඇස්තමේන්තු සකස් කිරීමෙන් පසු ප්‍රතිපාදන ලබාගත යුතුය. | අදාල අංශය මඟින් තොරතුරු ලබා ගැනීමට කටයුතු කර ඇත. | මෙම කාර්ය ඉටුකර ගෙන යාමේදී පෞද්ගලික නිවසක් හා වෙළඳසැලක් ඉදිකර තිබීම හේතුවෙන් ඇස්තමේන්තුවේ මීටර් 86 ක් පමණක් ඉදිකිරිමට සිදුවී ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | හේතුවෙන් එම වැඩ සඳහා වෙන්කර තිබූ ප්‍රතිපාදන පූර්ණ වශයෙන් උපයෝජනය කරගෙන නොතිබුණි. | | | |
| 02. | අංක 57-8974 දරන වාහනයේ 2010 ජූනි 25 දිනැති අනතුර සම්බන්ධයෙන් මු.රෙ.104(4) ප්‍රකාරව අවසන් පරීක්ෂණ වාර්තාව අනුව අනතුරට අදාල අලාභය වන රු.230,000 ක මුදල හිටපු දිඹුලාගල ප්‍රාදේශීය ලේකම්වරයෙකුගෙන් අයකර ගැනීමට තීරණය කර ඇතත් එම මුදල් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | අලාභය අයකරගැනීමට කටයුතු කළ යුතුය. | ඉදිරි කටයුතු සිදු කිරිමට සටහන් කර ගන්නා ලදී. | 2022 පෙබරවාරි වනවිටත් අලාභය අයකර ගැනීම සඳහා විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත 2022.01.12 දිනැති ලිපියක් මඟින් දන්වා ඇත. 2022.02.15 වන විටත් එම මුදල අය වී නොතිබුණි. |
| 03. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2019 වර්ෂයේ ගම්පෙරළිය වැඩසටහන යටතේ ප්‍රතිලාභීන්ට ලබාදීම සඳහා ඇණවුම් කර තිබූ රු.160,902 ක වටිනාකමක් සහිත සෙවිලි තහඩු 84 ක් පළුදුවී තිබුණද,සැපයුම්කරුගෙන් එම අලාභය පියවා ගෙන නොතිබුණි. | අලාභය අයකර ගත යුතුවේ. | පළුදු නොවූ තහඩු ලබාදීමට අදාල ආයතනය එකඟතාවය ලබාදී ඇති බව දන්වා ඇත. | 2022 පෙබරවාරි වනවිටත් සැපයුම්කරුගෙන් අලාභය අයකර ගෙන නොතිබුණි. |
| 04. | මනම්පිටිය වැලි ව්‍යාපෘතිය යටතේ දිඹුලාගල, මැදිරිගිරිය, වැලිකන්ද, හිඟුරක්ගොඩ හා තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් බෙදාදිමට 2018/2019 වර්ෂවල මිලදී | මිලදී ගැනීම සිදු කිරීමේදී නිසි ප්‍රමිතිය පිළිබඳ සැලකිලිමත් විය යුතු අතර අදාළ වෙළෙඳ ආයතන වලින් පළුදු වූ තහඩු | පළුදු වී ඇති තහඩු වෙනුවෙන් නව තහඩු ලද විගස බෙදා දීමට කටයුතු කරමි. | 2022 පෙබරවාරි වනවිටත් පළුදු වූ සෙවිලි තහඩු වෙනුවෙන් නව සෙවිලි තහඩු සැපයුම්කරු වෙතින් |

| | | | | |
|---|---|---|---|---|
| | ගෙන තිබූ රු. 330,595 ක් වටිනා සෙවිලි තහඩු 185 ක් පළුදු වී තිබූ අතර එම සෙවිලි තහඩු වෙනුවෙන් නව සෙවිලි තහඩු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | වෙනුවෙන් නව තහඩු ලබා ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. | | ලබාගෙන නොතිබුණි. එහි වර්තමාන වටිනාකම (වැට් රහිතව) දළ වශයෙන් රු. 547,970 කි. |
| 05. | ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.6 ඡේදය ප්‍රකාරව වැඩ තහනමට ලක් වී ඇති නිලධාරියෙකුගෙන් වර්ෂ 10 කට වැඩි කාලයක සිට අයවිය යුතු රු.408,048 ක ශේෂයක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අදාළ නිලධාරියාට එරෙහිව නඩු පැවරීමට කටයුතු කරමි. | 2022 පෙබරවාරි 10 දින වන විටත් අය වී නොතිබුණි. |
| 06. | පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් විසින් සී/ස පොළොන්නරුව දිස්ත්‍රික් සහල් නිශ්පාදකයන්ගේ සමුපකාර සමිතිය වෙත 2019.03.26 දින සිට 2019.08.06 දින දක්වා 118-02-03-48-1409 වැය ශීර්ෂය මඟින් රු.මි.206 ක ණය මුදලක් ලබා දී තිබුණ ද එම මුදලින් රු.මි.66.4 ක් මෙතෙක් ආපසු ගෙවා නොතිබුණු අතර, රු.මි.139.5 ක් ප්‍රමාදවී ගෙවීම් කර තිබුණි. | රජයට අයත් මුදල් අදාල පාර්ශවයන් වෙතින් අප්‍රමාදව ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | ගිවිසුම් ප්‍රකාරව මාස 06 ගතවීමට ප්‍රථම ගෙවා නිමකරන ලෙස ලිඛිතව වරින් වර අදාල පාර්ශව දැනුවත් කර ඇත. | අදාල මුදල් අයකර ගැනීම සඳහා අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව මඟින් විමර්ශනයක් සිදු කරමින් පවතී. |
| 07. | පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ පළමු අදියර යටතේ පිහිටුවා ඇති ග්‍රාම ශක්ති | අක්‍රිය සමිති, ක්‍රියාකාරී සමිති මට්ටමෙන් | අක්‍රීය ග්‍රාම ශක්ති සමිති විසුරුවා හැර නිශ්කාර්යව පවතින | මෙම අක්‍රිය සමිති සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම |

| | | | | |
|---|---|---|---|---|
| | ජනතා ව්‍යාපාර සමිති 29 න් සමිති 10 ක් අක්‍රිය බව හඳුනාගෙන තිබුණු අතර, එම අක්‍රීය සමිති සඳහා ජීවනෝපාය සංවර්ධන, ධාරිතා සංවර්ධන හා යටිතල පහසුකම් සංවර්ධන අරමුදල් මඟින් ලබාදී තිබූ රු.5,308,349 ක් ගිණුම්වල නිෂ්කාර්යව පැවතුණි. | පවත්වාගත යුතු අතර අරමුදල් කාර්යක්ෂමව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. | මුදල් හා වත්කම් නැවත පවරා ගන්නා ලෙස ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත දන්වා ඇත. | සඳහා සමෘද්ධි, ගෘහ ආර්ථික ක්ෂුද්‍රමූල්‍ය ස්වයං රැකියා රාජ්‍ය අමාත්‍යාංශය වෙතින් උපදෙස් ඉල්ලා ඇතත් 2022 පෙබරවාරි දක්වාම පිළිතුරු ලැබී නොමැත. |
| 08. | ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරයේ සක්‍රීය සමිතිවල පලමු අදියර යටතේ ජීවනෝපාය සංවර්ධනයට, ධාරිතා සංවර්ධනයට හා යටිතල පහසුකම් සංවර්ධනයට ලබාදී තිබූ රු.8,963,712 ක් 2020 වර්ෂය තුල ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | අරමුදල් කාර්යක්ෂමව උපයෝජනය කළ යුතු අතර ඒ සම්බන්ධව පසු විපරම් කළ යුතුය. | මාසික ප්‍රගතිය ලබාගන්නා ලෙසත්, ක්ෂේත්‍ර පරික්ෂණ වලදී මුදල් ප්‍රයෝජනයට ගන්නා ලෙසත් සමිති නිලධාරීන් සඳහා නිරන්තරයෙන් උපදෙස් ලබා දී ඇත. | 2021 වර්ෂය අවසාන වන විට රු. 4,711,927 ක් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. |
| 09. | ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරයේ දෙවන අදියර යටතේ පිහිටුවා ඇති සමිති 26 න්, සමිති 23 ක් අක්‍රිය බව හඳුනාගෙන ඇති අතර, ජීවනෝපාය සංවර්ධන, ධාරිතා සංවර්ධන හා යටිතල පහසුකම් සංවර්ධන අරමුදල් යටතේ ලබාදී තිබූ රු.9,374,289 ක්, ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | සමිති ක්‍රියාකාරී මට්ටමෙන් පවත්වා ගැනීමට කටයුතු කළ යුතු අතර, අරමුදල් කාර්යක්ෂමව උපයෝජනය කළ යුතුය. | අක්‍රීය සමිති විසුරුවා හැර රජය මඟින් ලබාදුන් සියළු මුදල් හා වත්කම් නැවත පවරා ගැනීමට කටයුතු කරමින් පවතී. | අදාල සමිතිවල බැංකු ගිණුම්වල නිෂ්කාර්යව පවතින රජයේ මුදල් සම්බන්ධව ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව සමෘද්ධි ගෘහ ආර්ථික, ක්ෂුද්‍රමූල්‍ය ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයෙන් විමසා ඇත. 2022 පෙබරවාරි දක්වාම පිළිතුරු ලබාදී නැත. |

| | | | | |
|---|---|---|---|---|
| 10. | පිබිදෙමු පොළොන්නරුව ව්‍යාපෘතිය යටතේ රු. 4,425,190 ක වියදමක් දරා ලක්ෂඋයන රණවිරු උද්‍යානය ඉදිකිරීමට අදාලව ඇස්තමේන්තුගත රු. 1,276,161 ක් වටිනා අයිතම 11 ක් ඉටු කර නොතිබුණි. භෞතිකව පැවති ඉදිකිරීම් ප්‍රමාණයන්ට වඩා රු. 348,089 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි. තවද රු. 470,611 ක වියදමක් දරා සිදුකර තිබූ ටයිටේනියම් ගැලවීගොස් තිබුණි. | නිසි ප්‍රමිතියකින් යුතුව ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු අතර අධි ගෙවීම් රඳවුම් මුදල් මඟින් අඩු කර ගැනීමට හා අඩුපාඩු නිවැරදි කර ගැනිමට කටයුතු කළ යුතුය. | හිටපු ජනාධිපතිතුමා සමඟ සිදු කල සාකච්ජා වලදී ගත් තීරණ අනුව සැලසුම් වරින් වර වෙනස් කිරීමට සිදුවී ඇත. වැඩිපුර කළ ගෙවීම් රැදවුම් මුදලින් අය කර ගැනිමට උපදෙස් ලබා දී ඇත. වගකීම් කාලය අවසන් වීමට පෙර අඩු පාඩු සකසා දෙන ලෙස කොන්ත්‍රාත්කරුට දන්වා ඇත. | රැදවුම් මුදලින් වැඩිපුර ගෙවීම් රු. 348,089 පමණක් අයකර ගෙන තිබුණි. |
| 11. | විශ්‍රාම ගොස් ඇති කාර්මික නිලධාරියකු ගිවිසුම්ගත කාලය ඉක්මවා වසර 32 ක් තිස්සේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රජයේ නිවාසයක පදිංචි වීම නිසා අයවිය යුතු දණ්ඩන කුලිය රු.319,849 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිවාස සන්තකය නැවත දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා ගැනීමට හා දණ්ඩන කුලිය අයකර ගැනිමට කටයුතු කළ යුතුය. | නිවාස සන්තක පවරා ගැනීම සඳහා නඩු පැවරීමට හා දණ්ඩන කුලිය අයකර ගැනීමට කටයුතු කරමි. | නිවාස සන්තකය දිස්ත්‍රික් ලේකම් වෙත ලබා ගෙන ඇති අතර විශ්‍රාම වැටුප් පාරිතෝෂිතය සකස් කරමින් පවතින අතර ඒ මඟින් අදාල දණ්ඩන කුලිය අයකර ගැනිමට ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. |
| 12. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් රජයේ නිවාසයක 2014 වර්ෂයේ සිට 2020 මැයි දක්වා මෝටර් රථ පරික්ෂකවරුන් පදිංචි වී සිට ඇති අතර ඔවුන්ගෙන් අය කළ යුතු හිඟ කුලිය හඳුනාගෙන අයකර | පැරණි හිඟ කුලිය හඳුනාගෙන අදාල පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | හිඟ කුලිය අය කර ගැනීමට කටයුතු සිදු කරමින් පවතී. | 2022 පෙබරවාරි වනවිටත් හිඟ කුලිය අයවී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | ගැනීමට කටයුතු කර නොතිබුණි. | | | |
| 13. | ඇළහැර සහ අත්තනකඩවල සමෘද්ධි ප්‍රජාමූල බැංකු මගින් ගිණුම් හිමියන් 163 දෙනෙකුට ලබාදුන් රු.5,800,123 ක ණය මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගෙවීම් පැහැර හැර ඇති ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | ණය මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | 2022 පෙබරවාරි 15 දින වන විට හිඟ මුදල රු.1,824,402 ක් විය. |
| 14. | ඇළහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් නිල සෙවන කාර්යාල පිහිටි ඉඩම් 24 ක අයිතිය මහවැලි අධිකාරියෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | නිලධාරීන්ට උපදෙස් ලබා දුන් බව දන්වා ඇත. | අදාල ඉඩම් මහවැලි අධිකාරියෙන් පවරාගැනීමට ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. |
| 15. | ඉඩම් කච්චේරිකරුවන් 549 ක් වෙනුවෙන් 2015 වර්ෂයේ පවත්වන ලද ඉඩම් කච්චේරිය ඇළහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අවලංගු කර තිබූ අතර කච්චේරිකරුවන් සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අවලංගු කරන ලද ඉඩම් කච්චේරි වෙනුවෙන් නැවත ඉඩම් කච්චේරි පැවැත්විය යුතුය. | ඉඩම් කොමසාරිස් වෙත සිහිකැඳවීම් ලිපි යවා ඇති බවත්, පිළිතුරු ලද පසු ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බවත් දන්වා ඇත. | වනජීවි කලාපයක් ලෙස ගැසට් කරන ලද මෙම ඉඩම් නිදහස් කර දීමේ හැකියාව පිළිබඳ නිර්දේශ වනජීවි අධ්‍යක්ෂ ජනරාල් වෙතින් මේ දක්වා ලැබී නොමැත. ඉඩම් කොමසාරිස් ජනරාල් වෙතින් 2020.02.12 හා 2021.11.20 දිනැති ලිපි මගින් නිර්දේශ ඉල්ලා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| 16. | ඇළහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීමනා පත්‍රයක් මඟින් ලබාදී ඇති ඉඩමක් ප්‍රදාන පත්‍රය ලබාගත් පරමාර්ථවලට පරිබාහිරව සම්ප්‍රේෂණ කුළුණු දෙකක් ඉදිකිරීමට යොදාගෙන තිබුණි. | දීමනා පත්‍ර සහිත ඉඩම් අදාල කොන්දේසි යටතේ උපයෝජනය කළ යුතු අතර එසේ සිදු නොකළ ඉඩම්හිමියන් පිළිබඳව නීතිමය ක්‍රියාමාර්ග ගතයුතුය. | විධිමත් පරිදි බැහැර කිරීමත් සිදුකර නොමැති බවත්, ඉඩම් හිමිකරු දීමනා පත්‍රය රජයට භාරදී නොමැති බවත් දන්වා ඇත. | 2022 පෙබරවාරි වනවිටත් ගැටළුව විසඳී නොතිබුණි. විධිමත්ව බදු බලපත්‍රයක් ලබා ගෙන නැත. |
| 17. | 2019/2020 මහ කන්නයේ රජය මැදිහත්ව වී මිලදී ගැනීමේ වැඩසටහන යටතේ තමන්කඩුව, මැදිරිගිරිය, හිඟුරක්ගොඩ, ඇළහැර හා වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල වී මෝල් හිමියන් විසින් ලබාගත් වී තොගවලින් රජයට ලබාදිය යුතු සහල් කිලෝ ග්‍රෑම් 996,223 ක් වී මිලදීගෙන වර්ෂයකට අධික කාලයක් ගතවී ඇතත් එම සහල් තොග වෙනුවෙන් මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රජයට ලැබිය යුතු සහල් තොග කඩිනමින් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | ගිවිසුම් ප්‍රකාරව සහල් ලබාදීමට බැඳී සිටින බැවින් රජයට කිසිදු අවධානමක් නොමැති බවත් සහල් තොග ලබාගැනීමට කටයුතු කරමින් පවතින බවත් ප්‍රාදේශීය ලේකම්වරු දන්වා ඇත. | මෙම සහල් තොගවල වටිනාකම වාරික වශයෙන් අයකරමින් පවතී. 2022 ජනවාරි වන විට මැදිරිගිරිය, තමන්කඩුව, වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් අයවිය යුතු හිඟ මුදල රු.6,254,043 කි. |
| 18. | ඇළහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පෞද්ගලික හිමිකමක් ඇති ඉඩමක් රජයේ ඉඩමක් ලෙස සලකා ඉඩම් බෙදා වෙන්කර 2000 අප්‍රේල් 26 දින ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර නිකුත් | විධිමත් පරීක්ෂණයකින් තොරව පෞද්ගලික ඉඩමක් රජයේ ඉඩමක් ලෙස බෙදා වෙන්කල බලධාරීන් සම්බන්ධයෙන් | වෙනත් ඉඩමක් යෝජනා කර ගොවි මහතුන්ගේ කැමැත්ත ලැබී ඇති අතර වන ජීවී අධ්‍යක්ෂ ජනරාල්ගේ එකඟතාව ලද පසු ඉඩම් කට්ටි | පෞද්ගලික ඉඩමක් රජයේ ඉඩමක් ලෙස බෙදා වෙන්කළ බලධාරීන් සම්බන්ධයෙන් මේ දක්වා පරීක්ෂා කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | කර තිබුණද, දිසා අධිකරණය විසින් 2017 සැප්තැම්බර් 28 දින පෞද්ගලික හිමිකරුට මෙම ඉඩම හිමි බවට තීන්දු කිරීම නිසා ඉඩම්ලාභීන් 8 දෙනෙකුට ඉඩම් අහිමි වී තිබුණු අතර, ඉඩම් හිමිකම පිළිබඳ නොසලකා ඉඩම් බෙදාදීම හේතුවෙන් එම ඉඩම් සංවර්ධනය කරන ලද බලපත්‍රලාභීන් අසරණ තත්ත්වයකට පත්වී තිබුණි. | කටයුතු කළ යුතුය. | බෙදා දීමට කටයුතු කරමි. | දමනේයාය වසමේ බටුවන්ගල පිහිටි ඉඩම් කොටසක් අදාල අගතියට පත් පාර්ශවය වෙත ලබා දීම සඳහා ඉදිරි කටයුතු සිදුකරමින් පවතී. |
| 19. | ඇළහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සමෘද්ධි නිලධාරීන් විසින් එකතුව රු.2,428,067 ක මූල්‍ය වංචා සිදුකර තිබුණු අතර, ඔවුන් විසින් පළමු උප ලේඛනයට ගැනෙන එම වංචාවන් සිදුකර ඇති බව විනය පරීක්ෂණ වාර්තා අනුව පිළිගෙන තිබුණි. එහෙත් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් එම නිලධාරීන් දෙවන උපලේඛනයට ගැනෙන වරදක් සිදුකර තිබූ බවට නිගමනය කරමින් නැවත සේවයේ පිහිටුවා තිබුණු අතර, සිදුවී ඇති අලාභය අයකර ගැනීමට ද කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය නිලධරයන් විසින් සිදුකළ හැකි වරදවල් සම්බන්ධ පළමුවන උපලේඛනය හා දෙවන උපලේඛනයට ගැනෙන මූල්‍ය වංචා අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | විනය බලධාරියාගේ අවසන් තීරණයට යටත්ව මෙම නිලධාරීන් නැවත සේවයේ පිහිටුවා ඇත. අලාභය අයකිරීම ගැන සඳහන් නොවේ. | විනය නියෝගයේ අලාභය අයකිරීම ගැන සටහන් කර නොමැතිව පසුව, එය අත්වැරදීමකින් බව සඳහන් කර ලිපියක් එවා තිබීමෙන් එම අලාභය ගණනය කර විමර්ශන අංශයට දන්වා ඇතත් මේ වනතෙක් කිසිදු පිළිතුරක් ලැබී නොතිබුණි. |
| 20. | මැදිරිගිරිය, තමන්කඩුව, | හිඟ බදු මුදල් නියමිත | මැදිරිගිරිය ප්‍රාදේශීය | හිඟුරක්ගොඩ හා |

| | | | | |
|---|---|---|---|---|
| | ඇළහැර හා හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ වල මධ්‍යම රජයට අයත් ඉඩම් හිමි පුද්ගලයින් 51 දෙනකුගෙන් ලැබිය යුතු හිඟ බදු ආදායම රු.7,299,210 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | දිනට අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ලේකම් කාර්යාලය විසින් බදුකර අවලංගු කිරීමට ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත උපදෙස් ඉල්ලා ඇත. අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් බදු මුදල් අය කර ගැනීමට නිලධාරීන් දැනුවත් කර ඇති අතර බදු සහන ලබා ගැනීමට හැකියාව විමසා ඇත. | ඇළහැර ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල තව දුරටත් අයවිය යුතු හිඟ බදු ආදායම රු.4,274,012 ක් විය. |
| 21. | වැලිකන්ද සහ තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ග්‍රාමීය ආර්ථික සංවර්ධන ව්‍යාපෘතිවලට අදාල මාර්ග සංවර්ධනය කිරීමේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් අන්තර් බන්ධිත ගල් මිළදී නොගෙන කොන්ත්‍රාත්කරු විසින්ම සපයා ගැනීමට ඉඩ ලබාදී ඒ සඳහා පළාත් මිළගණන් අනුව ගෙවීම් කිරීම හේතුවෙන් රු.3,134,751 ක් වැඩිපුර වැයකර තිබුණි. | මිළදී ගැනීම් සිදුකිරීමේදී රජයට වඩාත් ආර්ථික වාසියක් සහිත ක්‍රමයක් භාවිතා කළ යුතු අතර වැඩියෙන් ගෙවනලද මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | ව්‍යාපෘතිය අනුමත වන ආකාරය මත එය සිදුකර ඇත. | පිබිදෙමු පොළොන්නරුව වැඩසටහන සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයේ උපදෙස් මත අවම මිල මත අන්තර්බන්ධිත ගල් මිලදී ගෙන ඇත. ග්‍රාමීය ආර්ථික සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී අන්තර්බන්ධිත ගල් සඳහා උතුරු මැද පළාත් රේටයන් අනුව ගෙවීම් කිරිම නිසා ඒ සඳහා වැඩිපුර ගෙවිමට සිදුවී තිබුණි. |
| 22. | තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දීමනා පත්‍ර හා | මැනුම් නියෝග හා රේඛා චිත්‍ර | ඉදිරියේදී තිරසර | ජයභූමි දීමනා පත්‍ර169169 ලබාදෙන |

| | | | | |
|---|---|---|---|---|
| | ජය භූමි පත්‍රවල පිටපත් 559 ක ප්‍රමාණයෙන්, මැනුම් කිරීමකින් හා රේඛා චිත්‍ර ලබාගැනීමකින් තොරව ලබාදී ඇති දීමනා පත්‍ර හා ජය භූමි පත්‍ර ප්‍රමාණය කොපමණ ද යන්න හඳුනාගෙන, එය මැනුම් කිරීමට හා රේඛා චිත්‍ර ලබාගැනීමට අවධානය යොමු වී නොතිබුණි. | ලබාගැනීමකින් තොරව ලබාදී ඇති දීමනා පත්‍ර හා ජය භූමි පත්‍ර ප්‍රමාණය හඳුනාගෙන ඉදිරි කටයුතු සිදුකළ යුතුවේ. | විසඳුම් ලබාදෙමි. | ලද ඉඩම් මැනීම සම්බන්ධයෙන් ඉඩම් අමාත්‍යංශය හා මිනින්දොරු දෙපාර්තමේන්තුව මෙතෙක් පැහැදිලි තීරණයක් ගෙන නොමැත. |
| 23. | ජනාධිපතිවරයා විසින් අත්සන් කර තිබූ ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අදාල ඔප්පු 292 ක් හා බලපත්‍ර 113 ක් සහ තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අදාල ඔප්පු හා දීමනා පත්‍ර 25 ක් බෙදාදීමට හෝ හඳුනාගත නොහැකි හා ගැටලු සහිත ඔප්පු හා බලපත්‍ර අවලංගු කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | ප්‍රතිලාභීන් හඳුනාගෙන බෙදාදීමට හෝ හඳුනාගත නොහැකි හා ගැටලු සහිත ඔප්පු හා බලපත්‍ර අවලංගු කිරීමට කටයුතු කළ යුතුය. | ඉදිරි කටයුතු සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කරනු ලැබේ. | 2022 වනවිටත් බෙදා දී ඇති බවට තහවුරු නොවුණි. |
| 24. | 2020 වර්ෂය සඳහා පදනම් කරගත යුතු උතුරුමැද පළාත් ප්‍රසම්පාදන රේටයන් (Building work rate) පිලිබඳව 2020 ජූනි 30 දිනෙන් පසුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල දැනුවත් වී ඇති බැවින් එම දිනෙන් පසුව ගිවිසුම්ගත වන ඉදිකිරීම් කොන්ත්‍රාත් සඳහා එම ප්‍රසම්පාදන රේටයන් පදනම් | නියමිත රේටයන් පදනම් කරගෙන ගෙවීම් කළ යුතු අතර වැඩිපුර කළ ගෙවීම් අදාල පර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | රුඳවුම් මුදල් නිදහස් කර නොමැති බැවින් වැඩිපුර කළ ගෙවීම් අය කර ගැනීමට කටයුතු කරන බව මැදිරිගිරිය, තමන්කඩුව හා ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් දන්වා ඇති අතර | වැලිකන්ද හා මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් 2022 පෙබරවාරි වනවිට අයවිය යුතු මුදල රු.2,333,135 කි. |

| | | | | |
|---|---|---|---|---|
| | කර ගත යුතු වුවත් ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කිරීම හා ගෙවීම් කිරීමට 2019 වර්ෂයේ උතුරු මැද පළාත් ප්‍රසම්පාදන රේටයන් යොදාගෙන තිබූ බැවින් තමන්කඩුව, ලංකාපුර, මැදිරිගිරිය හා වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයන්හි මාර්ග සංවර්ධන ව්‍යාපෘති 48 ක් සඳහා රු.3,437,624 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි. | | එකම ව්‍යාපෘතියේ උප ව්‍යාපෘති සඳහා එකම රේටයක් අනුගමනය කර ඇති බව වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් දන්වා ඇත. | |
| 25. | තමන්කඩුව, වැලිකන්ද හා මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් සමෘද්ධි ප්‍රජාමූල බැංකු සංගමයේ ගිණුම් වලින් (අඩු ආදායම්ලාභී පවුල් සඳහා ගෙවිය යුතු සමාජ ප්‍රතිලාභ දීමනා ගිණුම් මඟින්) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත සහන පියවර හා සහන අරුණළු දීමනා ගෙවීම සඳහා රු.86,384,000 ක් වැය කර තිබූ නමුත් එම මුදල් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි. | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කළ යුතුය. | ප්‍රතිපූර්ණය කරන ලෙස ඉල්ලීම් කර ඇතත් ප්‍රතිපූර්ණය කර නොමැත. | 2022 ජනවාරි වන විට ද මෙම මුදල ප්‍රතිපූර්ණය කර නොතිබුණි. |
| 26. | 2017 හා 2019 වර්ෂ වල පිබිදෙමු පොළොන්නරුව මාර්ග සංවර්ධන වැඩසටහන | කඩිනමින් වන්දි මුදල් ගෙවීමට කටයුතු කිරීම මඟින් | වන්දි ගෙවීම් ක්‍රියාවලිය සඳහා සැලකිය යුතු කාලයක් | වන්දි ගෙවා නොමැති ඉඩම් කැබලි 58 ක් සඳහා හිමිකම් |

| | | | | |
|---|---|---|---|---|
| | යටතේ තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයෙන් අත්පත් කර ගත් ඉඩම් හෙක්ටයාර් 1.6564 ක කැබිලි 67 ක් සඳහා යාවත්කාලීනව අවශ්‍ය ක්‍රියාකාරකම් ඉටු නොවීම නිසා අදාල ඉඩම් හිමියන්ට වන්දි ගෙවා නොතිබුණි. මේ හේතුවෙන් ගෙවිය යුතු මුදල් සඳහා ප්‍රමාදවන කාලයට අනාගතයේදී වාර්ෂිකව සියයට 7 ක පොලියක්ද සමඟ ගෙවීමට සිදුවීමෙන් රජයට අමතර වැය බරක් දැරීමට සිදුවිය හැක. | රජයට සිදුවන අලාභය අවම කර ගැනීමට කටයුතු කළ යුතුය. | ගත වන අතර අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | පරීක්ෂණ සිදු කර තක්සේරු වාර්තා ලබා ගැනීමට යොමුකර ඇත. ආරවුල් පවතින ඉඩම් කොටස් අධිකරණයට යොමුකර ඇත. ඉඩම් කොටස් 9 ක් සඳහා වන්දි ගෙවා ඇත. |
| 27. | හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ සංවර්ධන ව්‍යාපෘති හා රාජ්‍ය ආයතන ඉදිකිරීම් කටයුතු සඳහා 1984 -2011 කාල සීමා තුල අත්පත් කරගත් ඉඩම් හෙක්ටයාර 0.97 ක් සඳහා යාවත්කාලීනව ක්‍රියාකාරකම් ඉටු නොවීම නිසා අදාල ඉඩම් හිමියන්ට වන්දි ගෙවා නොතිබීම හේතුවෙන් ගෙවිය යුතු මුදල් සඳහා ප්‍රමාද වන කාලයට වාර්ෂිකව සියයට 7 ක පොලියක්ද සමඟ ගෙවීමට සිදුවීමෙන් රජයට අමතර වැය බරක් දැරීමට සිදුවන අතරම ඉඩම් හිමියන්ට තම ජීවිත | කඩිනමින් වන්දි මුදල් ගෙවීමට කටයුතු කිරීම මඟින් රජයට සිදුවන අලාභය අවම කර ගැනීමට කටයුතු කළ යුතුය. | ගුවන් හමුදාව විසින් හදිසි අවශ්‍යතාවයන් මත ඉඩම් එළිපෙහෙලි කිරීම හේතුවෙන් මායිම් සොයා ගැනීමට නොහැකිවීම මත මෙම තත්ත්වය සිදුවී ඇත. | ගුවන් හමුදාව විසින් හදිසි අවශ්‍යතාවයන් මත ඉඩම් එළි පෙහෙලි කිරීම හේතුවෙන් මායිම් සොයාගැනීමට නොහැකිවීම මත ඉඩම් කොටස් තක්සේරු කිරිමට නොහැකිවීම නිසා කට්ටිකරුවන්ට වන්දි ගෙවීමට නොහැකි වී ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | කාලය තුල වන්දි ලබාගැනීමට නොහැකි වී තිබුණි. | | | |
| 28. | රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු හා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යංශයේ ලේකම්ගේ 6/2020 හා 20/02/2020 දිනැති චක්‍රලේඛයේ 3 ඡේදය ප්‍රකාරව නිර්ණායක 10 ක් පදනම් කරගෙන ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් සම්මුඛ පරීක්ෂණ පවත්වා, ලකුණු ලබාදී බහුකාර්ය සංවර්ධන සහයකයින් පළමු අදියර යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට බඳවා ගෙන තිබූ නමුත් වසම්වල වැඩි ලකුණුලාභීන් සිටියදී අඩුම මට්ටමේ ලකුණු ලබාගත් අයදුම්කරුවන් තෝරාගෙන තිබීමෙන් බඳවා ගැනීමේ පරිපාටියේ විනිවිදභාවයක් නොතිබුණි. | රජයේ රැකියා ලක්ෂය ලබාදීමේ වැඩසටහනේ මූලික අරමුණු ඉටුවන ආකාරයට විනිවිද භාවයකින් කටයුතු සිදු කළ යුතුය. | පත්වීම් ලබා දීම් හා තෝරා ගැනිමේ කටයුතු බහු කාර්යය සංවර්ධන කාර්ය බලකා දෙපාර්තමේන්තුව මඟින් සිදු කරන ලදි. | පත්වීම් ලබා දීම හා තෝරාගැනීම බහුකාර්ය සංවර්ධන කාර්යය සාධන බලකා දෙපාර්තමේන්තුව මගින් සිදු කරන ලදි. මේ සම්බන්ධයෙන් සම්මුඛ පරික්ෂණ පමණක් ප්‍රාදේශිය ලේකම් කාර්යාල විසින් සිදු කරන ලදී. |
| 29. | ක්‍රීඩා අමාත්‍යංශය මඟින් ක්‍රියාත්මක ඇවිදින මංතීරු ඉදිකිරීමේ වැඩසටහන යටතේ දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජනතාව සඳහා ඇවිදින මං තීරුවක් රු.1,959,698 ක වියදමින් ඉදිකර තිබුණි. එසේ වුවද ඇවිදින මං තීරුවක | විධිමත් ශක්‍යතා අධ්‍යානයකින් පසු ව්‍යාපෘති යෝජනාවන් සකස් කළ යුතුය. | ඇවිදින මංතීරු භාවිතය පෙළඹවීමට ප්‍රදේශයේ ස්වෙච්ඡා සංවිධාන හරහා ජනතාව දැනුවත් කිරීමට කටයුතු කෙරේ. | 2022 පෙබරවාරි 10 දින විගණනය විසින් ස්ථානීය පරික්ෂාවක් සිදුකරන විට ඇවිදින මං තීරුව වල් බිහිවී තිබු අතර භාවිතා කරන බවට හෝ භාවිතා කළ බවට සාක්ෂි නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | අවශ්‍යතාවය තහවුරු කරගෙන නොතිබූ අතර එය කිසිවෙකු විසින් නඩත්තු හා පරිහරණය නොකරන ව්‍යාපෘතියක් වී තිබුණි. | | | |
| 30. | මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වගා ළිං සැකසීම සඳහා රු.20,000 බැගින් ප්‍රතිලාභීන් 22 කට ලබාදෙන ලද රු.440,000 ක් වූ ද්‍රව්‍ය ආධාර භාවිතයට ගෙන නොතිබුණි. | ව්‍යාපෘති ආරම්භ කර එහි ප්‍රතිඵල ලබාගන්නා තුරු පසු විපරම් කටයුතු අඛණ්ඩව සිදුකළ යුතු අතර ලබා දී ඇති ද්‍රව්‍ය ආධාර භාවිතයට නොගැනීමට හේතු පරීක්ෂාකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. | ප්‍රතිලාභීන්ගෙන් අදාල මුදල් ආපසු අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රතිලාභීන් 4 දෙනෙකුගෙන් රු.13,000 ක් පමණක් අයකර ඇත. ඉතිරි පුද්ගලයින් ගෙන් රාජ්‍ය මුදල් අවභාවිතා කිරීම සම්බන්ධයෙන් නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගන්නා ලෙස පොලිස් ස්ථානාධිපති, මැදිරිගිරිය වෙත දන්වා ඇත. |
| 31. | මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් නිල නිවාසයක පදංචිව සිටි නිලධාරියෙකුගෙන් අයවිය යුතු හිඟ නිවාස කුලිය වූ රු.153,600 අයකරගෙන නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව දන්වා ඇත. | හිඟ මුදල නිලධාරියාගේ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුපෙන් අය කර ගැනීමට හෝ ඔහුගේ බිරිද රාජ්‍ය සේවයේ නියලෙන බැවින් ඇයගේ වැටුපෙන් හිඟ මුදල අය කර ගැනීමට ඉදිරි කටයුතු සිදු කරන ලෙස 2021.10.22 දිනැති ලිපිය මඟින් දිස්ත්‍රික් ලේකම් විසින් |

| | | | | |
|---|---|---|---|---|
| | | | | දැනුම් දී ඇත. |
| 32. | වටිනාකම රු.1,479,000 ක වියදමින් ලංකාපුර සෝමපුර වසමේ ඉදිකර තිබූ පොදු ළිඳ හා වොලිබෝල් ක්‍රීඩා පිටිය භාවිතයෙන් තොරව නිශ්කාර්යව පැවතුණි. | ව්‍යාපෘතිය ආරම්භ කර එහි ප්‍රතිඵල ලබාගන්නා තුරු පසුවිපරම් කටයුතු අඛණ්ඩව සිදුකළ යුතු අතර භාවිතයට නොගැනීමට හේතු පරීක්ෂාකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. | පොදු ළිඳ සඳහා ජල පෙරනයක් සවිකර ජලය බෙදාහැරීමට සහ ක්‍රීඩා පිටිය වටා දැල් ආවරණයක් යොදා භාවිතයට ගැනීමට කටයුතු කෙරේ. | පොදු ළිඳ භාවිතය සඳහා ප්‍රතිආශ්‍රිත ජල පද්ධතියක් ඉදිකිරීම සඳහා 2022 වර්ෂයේ ග්‍රාමීය කමිටුවට යෝජනා ඉදිරිපත් කර ඇත. දැනට මෙම ව්‍යාපෘති දෙකම භාවිතයට ගන්නා බව අනාවරණය නොවුණි. |
| 33. | ජනාධිපති කාර්යාලය මඟින් ක්‍රියාත්මක ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය යටතේ ලංකාපුර දේවාලගොඩැල්ල කෘෂි ජල ව්‍යාපෘතියේ විදුලි සම්බන්ධතාවය සඳහා අවශ්‍ය භාණ්ඩ 2017 වර්ෂයේදී ලබාදී තිබුණද, විදුලි සම්බන්ධතාවය ලබා නොගැනීම නිසා එම භාණ්ඩ/ උපකරණ නිෂ්කාර්යව පැවතුණි. | ව්‍යාපෘතියට විදුලිය ලබාගෙන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | විගණනය විසින් පෙන්වා දෙන ලද අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | 2022 ජනවාරි 15 දින විගණනය විසින් පරික්ෂා කරන අවස්ථාව වන විටත් විදුලිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| 34. | ගෙවතු වගාව කරගෙන යාම සඳහා විකල්ප බල ශක්තියක් ලෙස සූර්යය බල ශක්තිය ලබාදීමේ ව්‍යාපෘතිය යටතේ හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් තෝරාගන්නා ලද පාසල් දෙකක් විසින් එම ව්‍යාපෘතිය | මිලදී ගැනීම් සිදු කිරීමට ප්‍රථම අවශ්‍යතාව සහිත ප්‍රතිලාභීන් තෝරා ගැනීමට කටයුතු කළ යුතුය. | වෙනත් පාසලකට හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඉඩමෙහි වගා කටයුතු සඳහා භාවිතා කිරීමට තීරණය කර ඇත. | මෙම පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා 2021 වර්ෂයේ ප්‍රතිපාදන ඉල්ලූ නමුත් එය නොලැබුණු බැවින් නැවත ප්‍රතිපාදන ඉල්ලීමට කටයුතු කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් රු.166,500 බැගින් මිලදීගෙන තිබුණු සෝලා වතුර පොම්ප පද්ධති දෙකක් නිෂ්කාර්යව පැවතුණි. | | | |
| 35. | වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් නවීන ට්‍රැක්ටර් බවුසර් 10 ක් 2018 වර්ෂයේ සිට ස්වාභාවික ආපදාවන්ට ලක්වෙමින් වර්ෂ 3 කට අධික කාලයක සිට කාර්යාල පරිශ්‍රයේ ගාල්කර තිබුණි. | වත්කම්වල ආරක්ෂාව තහවුරු කළ යුතු අතර භාවිතයට ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය. | ප්‍රතිපාදන ලද පසු ඉදිරි කටයුතු සිදුකරනු ලැබේ. | අදාල රථගාල සඳහා ඇස්තමේන්තු මුදල රු.3,729,445 ක් වන අතර 2021 වර්ෂයේදී ඒ සඳහා රු.752,640 ක ප්‍රතිපාදන ලැබුණි. බවුසර් රථ දෙකක් පමණක් ගාල් කිරිමට හැකිවන පරිදි ඉදිකර ඇත. |

ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

--------------------------------------------

| | |
|---|---|
| 2018 | තත්ත්වාගණනය කළ මතය |
| 2019 | තත්ත්වාගණනය කළ මතය |
| 2020 | තත්ත්වාගණනය කළ මතය |

| | විගණකාධිපති වාර්තාවේ ඇතුළත් ප්‍රධාන අඩුපාඩු | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| | ------------------------- | ---------------------- | ------------------------- | ---------------------- |
| 01. | 2017 දෙසැම්බර් 21 දිනැති මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යංශයේ අංක 02/2017 දරන චක්‍රලේඛය ප්‍රකාරව මූතූර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තිබෙන වාහන 7ක ලියාපදිංචි | චක්‍රලේඛ උපදෙස් පරිදි ක්‍රියාකළ යුතුය. | භාවිතා කළ හැකි මට්ටමක නොමැති වෙන්දේසි කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම් තුමාගේ නමට මෙම වාහන අයිතිය | 2022 පෙබරවාරි වන විටත් ලියාපදිංචි අයිතිය ලබාගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | අයිතිය එම ආයතනය සතුව නොතිබූ අතර චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව ලියාපදිංචි අයිතිය ලබා ගැනීමටද කටයුතු කර නොතිබුණි. | | නොමැත. ඒ පිළිබඳ උපදෙස් ඉල්ලා කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට යැවීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | |
| 02. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවා කාලය වර්ෂ 05 ක් ඉක්මවා සිටින නිලධාරීන් සම්බන්ධයෙන් ස්ථාන මාරු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කර නොතිබීම නිසා නගරයෙන් දුර බැහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල දීර්ඝ කාලයක සිට ස්ථාන මාරු අපේක්ෂාවෙන් සිටින නිලධාරීන්ට අසාධාරණයක් සිදු වී තිබුණි. | ස්ථාන මාරු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුය | වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය හා ඉදිරියේදී අභ්‍යන්තර ස්ථාන මාරු ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමි. | 2022 වර්ෂය වන විටත් ස්ථාන මාරු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කර නොතිබුණි. |
| 03. | අග්‍රිම නිදහස් කිරීම සම්බන්ධව භාණ්ඩාගාර උපදෙස්හි 03 වන වගන්තිය අනුව, නිදහස් කර ඇති අග්‍රිම අපේක්ෂිත අරමුණු සඳහා පමණක්ම භාවිතා කළ යුතු අතර වෙනත් වියදම් අරමුණු සඳහා භාවිතා නොකළ යුතු නමුත් ග්‍රාමීය නිවාස ඉදිකිරීම් හා ඉදිකිරීම් අමුද්‍රව්‍ය කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයෙන් හා සමෘද්ධි, ගෘහආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං | ලැබෙන අග්‍රිම අදාළ කාර්යය සඳහා පමණක් යෙදවීමට කටයුතු කළ යුතුය. | අග්‍රිමය නොලැබෙන බැවින් ප්‍රමුඛතාවය හා හදිසි අවශ්‍යතාව සලකා ලද අග්‍රිමය එම මොහොතේ ප්‍රමුඛතාවය ලබාදිය යුතු වියදම් දැරීම සඳහා කළමනාකරණය කර ඇත. | ප්‍රතිපාදන අරමුණු සඳහා භාවිතා කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | රැකියා සහ ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයෙන් ලද රුපියල් මිලියන 63.99 ක අග්‍රිම මුදල් අදාල අරමුණ සඳහා උපයෝජනය නොකර වෙනත් අරමුණු සඳහා භාවිතා කර තිබුණි. | | | |
| 04. | 2020 වර්ෂය සඳහා රුපියල් මිලියන 3.014 ක අග්‍රිම ඉල්ලා තිබුණ ද රුපියල් මිලියන 2.667 ක අග්‍රිම පමණක් ලැබීම හේතුවෙන් ඉල්ලා ඇති අග්‍රිම හා ලැබුණු අග්‍රිම අතර වෙනස රුපියල් මිලියන 347.52 ක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස 2020 වර්ෂය අවසානයේදී රුපියල් මිලියන 196.68 ක් ගෙවිය යුතු බිල්පත් ලෙස දක්වා තිබුණි. | අග්‍රිම ඉල්ලුම්පත් කාලීනව ඉදිරිපත් කර අග්‍රිම ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | ලද අග්‍රිමය එම මොහොතේ ප්‍රමුඛතාවය ලබාදිය යුතු වියදම් දැරීම සඳහා කළමනාකරණය කර ඇත. | අග්‍රිම මුදල් ඉදිරි වර්ෂයේදී ඇස්තමේන්තු කර ලබාගෙන නොමැත. |
| 05. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය | ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳ සමාලෝචනයක් සිදු කර එහි ලිඛිත පිටපත ඉදිරියේ දී විගණනයට ඉදිරිපත් කරමි. | සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | | | |
| 06. | 2016 අප්‍රේල් 11 දිනැති අංක 06/2016 දරන කාන්තා හා ළමා කටයුතු අමාත්‍යංශයේ චක්‍රලේඛය අනුව කන්තලේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් ගර්භනි මවුවරුන්ට රු.20,000 ක පෝෂණ දීමනාව ලබාදීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරිමේ හා අධීක්ෂණය කිරීමේදි ලියාපදිංචි කර ගනු ලබන වෙළඳ ආයතන විසින් නිර්දේශිත ආහාර පමණක් නිකුත් කරන බවට හා ඒවායේ ගුණාත්මක භාවය පිළිබඳ පරික්ෂා කිරිම පිලිබඳව අඛණ්ඩ යාන්ත්‍රණයක් සකස් කර නොතිබුණු අතර 2020 වර්ෂයට අදාලව රුපියල් 13,377,000 ක ආහාර ද්‍රව්‍ය | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. | විධිමත් යාන්ත්‍රණයක් සකස් කිරීමට පියවර ගෙන ඇත. | විධිමත් යාන්ත්‍රණයක් සකස් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | මිලදී ගැනීම සම්බන්ධව නිර්දේශිත ආහාර ලැයිස්තුව සහ ඒවායේ ගුණාත්මක වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | | | |
| 07. | මුතූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සපිරිගමක් ව්‍යාපෘතිය යටතේ 2020 වර්ෂයේදී ග්‍රාම නිලධාරි වසම් 3 ක පානය කිරීම සඳහා සුදුසු ජල නල මාර්ග එළීම සඳහා රු.3,462,632 ක් ජල සම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලයට ගෙවා ඇති නමුත් අදාල ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි. | ගිවිසුම් ගත කාලය තුල ඉදිකිරීම් නිම කිරීම කළ යුතුය. | එම කාලවකවානුව තුල කොරෝනා ව්‍යසන තත්ත්වය ව්‍යාප්ත වීම හා අවශ්‍ය අමුද්‍රව්‍ය මිලදී ගැනීමේ අපහසුතාවක් නිසා ඇතැම් කොටස් ප්‍රමාද වී ඇත. | ව්‍යාපෘතිය ආරම්භ කලද අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| 08. | 2019/20 මහ කන්නයේ වී අස්වනු මිලදී ගැනීමේ කඩිනම් වැඩ පිළිවෙල යටතේ 2020 වර්ෂයේදී වී මිලදී ගැනීමේදී කන්තලේ, තඹලගමුව හා සේරුවිල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ගොවීන්ගෙන් වී මිලදී ගෙන රැස්කර වී ඇඹරුම්හල් වෙත නිකුත් කිරීමේ දී එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පිළිවෙලින් වී කිලෝ ග්‍රෑම් 821, කිලෝ ග්‍රෑම් 8072, කිලෝ ග්‍රෑම් 28457 ක් වශයෙන් රු.1,868,000 ක | ජනාධිපති කාර්යාල චක්‍රලේඛය අනුව ගැටළුව පිළිබඳ විමර්ශණයක් සිදුකර කඩිනම් පියවර ගත යුතුය. | මේ පිළිබඳ විමර්ෂණය කිරීමට පත්කල කමිටුව විසින් ලබාදුන් නිර්දේශ කෘෂිකර්ම අමාත්‍යාංශයේ සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට ඉදිරිපත් කර ඇත. | තොග අඩු වීම සම්බන්ධව විමර්ෂණයක් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | වට්නාකමැති වී තොග අඩු තිබුණි. | | | |
| 09. | නිකුත් කළ වී වලින් සහල් කිරීමේ ප්‍රතිශතය කීරි සම්බා සඳහා සියයට 60 ක්ද අනෙකුත් වර්ග සඳහා සියයට 65 ක් සේ සළකා අදාළ සහල් ප්‍රමාණය ගණනය කර ලංකා සතොස ආයතනයේ ආසන්නතම ගබඩා වෙත භාරදීමට දෙවන පාර්ශවකරු එකඟ විය යුතු වුවද ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් 2020 වර්ෂයේදී ඇඹරුම්හල් වෙත ලබා දී තිබුණු වී තොග ප්‍රමාණයෙන් කන්තලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කිලෝ 75,130 සේරුවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කිලෝ 3,465 හා තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කිලෝ 2,939 ක් වශයෙන් රු.8,319,959 ක් වූ සහල් තොග අඩුවෙන් ඉහත ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලැබී තිබුණි. | ජනාධිපති කාර්යාල චක්‍රලේඛය අනුව ගැටළුව පිළිබඳ විමර්ශණයක් සිදුකර කඩිනම් පියවර ගත යුතුය. | බර අඩුවීමෙන් වූ පාඩුව අයකර ගැනීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමට පත්කළ මණ්ඩලය විසින් ලබා දී ඇති නිර්දේශ කෘෂිකර්ම අමාත්‍යාංශයේ සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබේ. | තොග අඩු වීම සම්බන්ධව විමර්ශණයක් කර නොතිබුණි. |
| 10. | කොවිඩ් 19 හේතුවෙන් ජන ජීවිතය පවත්වාගෙන යාමට අපහසු වූ පවුල් සඳහා රු.5,000 දීමනාව සඳහා 2020 වර්ෂය තුලදී කරන ලද ගෙවීම් පිලිබඳව නගර සහ කඩවත්, | | | |

| | | | |
|---|---|---|---|
| කින්නියා, තඹලගමුව සහ කන්තලේ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 04 හි සිදු කරන ලද නියැදි විගණන පරික්ෂාවේදී පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය. | | | |
| (අ) එක් පවුලකට මාසයකට එක් වරක් පමණක් ගෙවිය යුතු මෙම සමාජ ප්‍රතිලාභ දීමනාව, විවිධ ලැයිස්තුවලින් එක් වරකට වඩා ගෙවා තිබීම නිසා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 04 හි අවස්ථා 861 කදී රු.4,305,000 ක් වැඩිපුර ගෙවා තිබුණි. | දීමනා ගෙවීම චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කල යුතුය. | දැනටමත් දෙවරක් ගෙවා ඇති දීමනා නැවත අයකරගෙන ඇත. | වැඩිපුර ගෙවීම් අයකරගෙන නොතිබුණි. |
| (ආ) 2020 අප්‍රේල් 17 හා 2020 අප්‍රේල් 03 දිනැති අග්‍රාමාත්‍ය ලේකම්ගේ චක්‍රලේඛ අංක PTF/03/2020(III) හා PTF/03/2020(I) චක්‍රලේඛ වලට පටහැනිව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 4කට අදාළව ප්‍රතිලාභීන් 527 ක් සඳහා 2020 වර්ෂයේදී රු.5,255,000 ක් ගෙවා තිබුණි. | - එම - | නැවත අයකර ගැනීමට කටයුතු කර ඇත. | - එම- |
| (ඇ) කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ | ප්‍රතිලාභීන්ගේ සත්‍ය ලේඛණ මත ගෙවීම් | ග්‍රාමීය කමිටු සාමජිකයින් සමිති | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| | සමෘද්ධි ලාභීන්ගේ ලේඛණය අනුව ප්‍රතිලාභීන් සඳහා රු.5,000 දීමනාව ගෙවීමේදී ගෙවිය යුතු සංඛ්‍යාව 1,519 වුවත් එම ප්‍රමාණයට වඩා වැඩිපුර රු.1,275,000 ක් සමෘද්ධි සංවර්ධන නිලධාරීන් හා සමෘද්ධි ගම්මාන සමිති වෙත 2020 වර්ෂයේ අවස්ථා 10 කදී ලබා දී තිබුණි. | කල යුතුය. | සමාජිකත්වය දැරීම හේතුවෙන් මෙම තත්ත්වය උද්ගත වී ඇත. ඉදිරියේදී එවැනි වැරදි සිදු නොකරන ලෙස ට දන්වා ඇත. | |
| 11. | තිරසාර ඉලක්කයන් පිළිබඳ නිලධාරින් ප්‍රමාණවත් පරිදි දැනුවත් වී නොතිබුණු අතර තිරසාර සංවර්ධන ඉලක්කයන් හඳුනා ගැනීම සිදුවී නොමැති නිසා සමාලෝචිත වර්ෂයේ ඉලක්කයන් සපුරා ගැනීම පිලිබඳ ඇගයීමක් කිරීමට නොහැකි විය. | තිරසාර සංවර්ධන ඉලක්කයන් හඳුනා ගෙන ක්‍රියාත්මක කිරීම සිදු කළ යුතුය. | දිස්ත්‍රික්කයට අදාලව තිරසාර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන ඒවා සපුරා ගැනීමට කටයුතු කරනු ලැබේ. | තිරසාර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන නොතිබුණි. |
| 12. | ජ්‍යේෂ්ඨ මට්ටමට අයත් නිළධාරි තනතුරු පුරප්පාඩු 18 ක්ද තෘතික මට්ටමට අයත් නිළධාරි තනතුරු පුරප්පාඩු 19 ක්ද ද්විතික මට්ටමට අයත් නිළධාරි තනතුරු පුරප්පාඩු 166 ක් හා ප්‍රථමික මට්ටමට අයත් නිළධාරි තනතුරු පුරප්පාඩු 35 ක්ද වශයෙන් 2021 වර්ෂය අවසානය වන විට මුළු පුරප්පාඩු ප්‍රමාණය | අත්‍යවශ්‍ය තනතුරු පුරප්පාඩු පිරවීමට කඩිනම් පියවර ගත යුතුය. | අදාල පුරප්පාඩු තනතුරු පිරවීම සඳහා අවස්ථා ගණනාවකදී ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ඉල්ලීම් කර ඇත. | 2022 පෙබරවාරි 23 දිනට මුළු පුරප්පාඩු ගණන 257 ක් විය |

238 ක් විය.

**මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**-----------------------------------------**

2018 **තත්ත්වාගණනය කළ මතය**

2019 **තත්ත්වාගණනය කළ මතය**

2020 **තත්ත්වාගණනය කළ මතය**

| විගණකාධිපති වාර්තාවේ ඇතුළත් ප්‍රධාන අඩුපාඩු | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| 01. මඩකලපුව දිස්ත්‍රික්කයේ පිහිනුම් ශූරශූරියන්ට පිහිනුම් පුහුණුවීම් ලබාදීම මගින් ඔවුන්ගේ හැකියාවන් හෙලිදරව් කිරීමේ අපේක්ෂාවන් ක්‍රීඩා අමාත්‍යාංශය විසින් 2017 වර්ෂයේදී රු.මිලියන 197.47 ක් පිරිවැයකින් පිහිනුම් තටාකයක් ඉදිකර තිබුණි. මඩකලපුව මහනගර සභාවට භාරදී තිබුණු මෙම පිහිනුම් තටාකය ශූර ශූරියන්ට පිහිනුම් පුහුණුවීම සඳහා අවස්ථා සලසා නොදී, ආදායම් ඉපැයීමේ අරමුණෙන්, පෞද්ගලික පිහිනුම් පුහුණු | ඉදිකිරීමේ අරමුණු ලඟාකර ගැනීමට හැකිවන පරිදි පිහිනුම් තටාකය භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. | මෙම පිහිනුම් තටාකය මඩකලපුව මහනගර සභාවට භාරදී තිබුණි. මෙය පිරිසිදුවටත්, සෞඛ්‍යාරක්ෂිතවත්, නඩත්තු කිරීමට මහනගර සභාව මාසිකව රු.76,220 ක් වැය වේ. මෙම වියදම හිලව් කිරීම සඳහා අර්ධ කාලීන කාර්යයන්වලින් ආදායම් ඉපැයීම සඳහා මෙම තටාකය ලබාදී ඇත. | 2022 පෙබරවාරි වන විටත් එලෙසම පැවතුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | කිරීමේ ආයතනයකට බදු දී තිබුණි. මේ නිසා මෙම ව්‍යාපෘතිය මගින් අපේක්ෂා කළ ඉලක්කයන් ළඟා කර ගෙන නොතිබුණි. | | | |
| 02. | සුනාමියෙන් පීඩාවට පත් අය නැවත පදිංචි කිරීම සඳහා ඉඩම් වන්දි ගෙවීමේ කටයුතු මන්මුනේ බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2017 වර්ෂයේදී සම්පූර්ණ කර තිබුණි. ඉන් පසුව පුද්ගලයන් තිදෙනෙකු විසින් ව්‍යාජ ලියකියවිලි ඉදිරිපත් කර රු.මිලියන 6.3 ක් වන්දි ලබාගෙන තිබුණි. එසේ වුවත්, අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වගකිව යුතු නිලධාරීන් විසින් සරල ලේඛනවල නිවැරදිභාවය පිළිබඳව අවධානය යොමු නොකර මෙම වන්දි මුදල් ගෙවීමට නිර්දේශ කර තිබුණි. එසේම එම නිලධාරීන්ට විරුද්ධව කිසිදු ආකාරයක විනය පරීක්ෂණ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | නිලධාරීන් නොසැලකිල්ලෙන් රාජකාරිය සිදුකිරීම, රජයට පාඩු කිරීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගත යුතුය. | ඉඩම් කටයුතු කළ නිලධාරීන්ට එරෙහිව සුදුසු පියවර ගැනීම සඳහා ලේකම්වරයා, අභ්‍යන්තර, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට දන්වා ඇත. එසේම අවිධිමත්ව වන්දි ලබාගත් පුද්ගලයන්ට එරෙහිව කටයුතු කළ යුතු බව මන්මුනේ බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට දැනුම් දී ඇත. | 2022 පෙබරවාරි වන විටත් වැඩිපුර ගෙවන ලද වන්දි මුදල් අයකර ගැනීමට හෝ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| 03. | මඩකලපුව දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලයේ චෙක්පත් මගින් ගෙවීම් කිරීම, ලෙජර් ගිණුම් | මුදල් රෙගුලාසි විධිවිධානවලට අනුව, චෙක්පත් භාවිතා | දෛනිකව චෙක්පත් අදාල නිලධාරීන් විසින් නිවැරදිතාවය පරීක්ෂා | සිදුවූ වංචාව අයකර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කර |

| | | | | |
|---|---|---|---|---|
| | නඩත්තු කිරීම පිළිබඳව ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනයන් ඇති කිරීම සඳහා කළමනාකරණය අපොහොසත් වීම නිසා එම කාර්යාලයේ සේවය කළ සේවකයෙකු විසින් රු.5,700,000 ක් වටිනා චෙක්පත්වලට වංචනිකව මුදල් ලබාගැනීමට ඉඩ සලසා තිබුණි. | කිරීමේ පද්ධති පිළිබඳ වගකිවයුතු අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් සකස් කල යුතුය. චෙක්පත් වංචාව සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | කර සහතික කිරීම් සිදුකර නොතිබුණි. එසේ වුවත්, දැනට සම්බන්ධිත නිලධාරියා විනය පරීක්ෂණ විමර්ශනයට ලක්කර වර්තමානයේ ස්ථාන මාරුකර යවා ඇත. අනාගතයේදී මෙවැනි දෝෂ සිදුනොවන ආකාරයට ක්‍රියාමාර්ග ගෙන ඇත. | නොතිබුණි. සේවකයාට ස්ථාන මාරුවක් ලබා දී තිබුණි. |
| 04. | ඒරාවූර්පත්තු ප්‍රදේශයේ විවිධ අඩුපාඩු සහිතව පවතින ළමා උද්‍යාන නවීකරණය කිරීමේ අරමුණින් ජාතික ඒකාබද්ධතා, සහජීවනය සහ රාජ්‍ය භාෂා අමාත්‍යාංශය විසින් 2018 වර්ෂයේ සලසා තිබූ රු.6,700,000ක ප්‍රතිපාදන අදාල අරමුණු සඳහා උපයෝජනය නොකර හා යෝජිත සැලැස්මට පටහැනිව ඉඩම් නැවත ගොඩකිරීම් සංවර්ධන ආයතනයේ අනුමැතිය රහිතව ජලය රැඳී පවතින කුමාරවේලියාර් ගම්මානයේ නව ළමා උද්‍යානයක් ඉදිකිරීම සඳහා වැය කර තිබුණි. | ඒරාවූර්පත්තු ප්‍රදේශයේ ළමා උද්‍යාන නවීකරණය කිරීමේ අරමුණින් ලබාදුන් ප්‍රතිපාදන එම අරමුණු සඳහා පමණක් උපයෝජනය කළ යුතුය. | ඒරාවූර්පත්තු ප්‍රදේශයේ ළමා උද්‍යානය සම්බන්ධයෙන් වූ විගණන විමසුම පිළිබඳ තොරතුරු රැස්කරනු ලැබේ. කඩිනමින් මෙම විගණන විමසුම සඳහා පිළිතුරු යවනු ලැබේ. | අදාල අරමුණු සඳහා ප්‍රතිපාදන යොදවාගෙන නොතිබුණි. |
| 05. | ජාතික ඒකාබද්ධතා, සහජීවනය සහ රාජ්‍ය භාෂා | ව්‍යාපෘතිවල අදාල ඉලක්කයන් ළඟාකර | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු නොවන | සම්බන්ධිත නිලධාරීන්ට එරෙහිව |

| | | | | |
|---|---|---|---|---|
| | අමාත්‍යාංශය විසින් යුද්ධයෙන් ජීවනෝපාය අහිමි වූ ජනතාවගේ ආදායම් මට්ටම ඉහළ නැංවීමේ අරමුණින් එළුවන් සහ කිකිළියන් ඇති කිරීම සඳහා මන්මුනේ නිරිත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට 2018 වර්ෂයේදි රු.2,969,635 ක ප්‍රතිපාන සලසා තිබුණි. නමුත්, මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂා කළ නිමවුම් මට්ටම ළඟාකරගත හැකි පරිදි විධිමත් ආකාරයට ශක්‍යතා අධ්‍යයනය කර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක නොකිරීම නිසා මෙම ව්‍යාපෘතිය කෙටි කාලයකින් නිෂ්කාර්යවී පැවතුණි. | ගත අයුරින් ඒවා ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. | අයුරින් ක්‍රියාමාර්ග ගෙන ඉලක්කයන් ළඟාකරගත හැකි ආකාරයට පියවර ගැනීමට කටයුතු කරනු ලදි. සම්බන්ධිත නිලධාරීන්ට එරෙහිව ක්‍රියා කරන බවද දන්වා සිටිමි. | ක්‍රියාමාර්ග ගන්නා බව දන්වා තිබුණද එසේ සිදු කර නොතිබුණි. |
| 06. | කොරලේපත්තු බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාල බලප්‍රදේශයට අයත් කාවත්තමුනෙයිහි පිහිටි අත්හැර දමා තිබුණු ළිඳ මගින් අලුතින් ඉදිකළ නිවාස ව්‍යාපෘතියේ ජනතාවට පානීය ජලය බෙදාහැරීමේ වැඩසටහන සඳහා ග්‍රාමීය යටිතල පහසුකම් විශේෂ වැඩසටහන මගින් හා ජාතික ඒකාබද්ධතා, සහජීවන කාර්යාලයෙනුත් රු.2,954,000 ක් වැය කර තිබුණි. එසේ වුවත්, ජාතික ජල | මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ප්‍රථම විධිමත් ශක්‍යතා අධ්‍යයනයන් සහ ළිං ජලයේ තත්ත්ව සහතිකය ලබා ගැනීමෙන් පසුව එය ක්‍රියාතමක කළ යුතුය. එලෙස සිදු නොකර ව්‍යාපෘතිය ආරම්භ කිරීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශවයන්ට | ජනතාවට බලපාන අන්දමේ වැඩසටහන් සුදුසු තාක්ෂණික විශේෂඥයින්ගේ උපදෙස් ලබා ක්‍රියාකරන ලෙසට ප්‍රාදේශීය ලේකම්වරයාට උපදෙස් ලබාදී තිබුණි. ඉදිරි අනාගතයේදි මෙවැනි අඩුපාඩු සිදුනොවන අයුරින් සැලැසුම් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ. | ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | සම්පාදන හා මලාපවහන මණ්ඩලය විසින් ලබාදුන් තත්ත්ව සහතිකය අනුව මෙම ළිං ජලයේ අධික වශයෙන් ඇමෝනියා අම්ල පවතින බැවින් මෙම ජලය භාවිතා කරන ජනතාවට උග්‍ර පාචනය, කහඋණ, මහබඩවැල ආසාදනයන් සහ වකුගඩු රෝග ආදිය වැඩි වශයෙන් ඇතිවිය හැකි අවස්ථා පවතින බැවින් මෙම ව්‍යාපෘතිය මගින් අපේක්ෂා කළ ප්‍රතිඵල ලබාගත නොහැකි වී තිබුණි. | එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. | | |
| 07. | ඕට්ටමාවඩි ප්‍රදේශයේ කුඩා ඇඟළුම් කර්මාන්ත ශාලා දෙකක් ස්ථාපිත කිරීම සඳහා 2016 වර්ෂයේ ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් සහ 2017 වර්ෂයේ කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයෙන් රු.4,912,500 ක් වැය කර තිබුණි. නමුත් ඉදිකළ මෙම ඇඟළුම් කර්මාන්ත ශාලා දෙකම වර්ෂ 2 කට අධික කාලයක් අදාල අරමුණු සඳහා භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණි. | කර්මාන්ත ශාලා දෙක අදාළ අරමුණු සඳහා නොපමාව භාවිතා කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | ඕට්ටමාවඩි ප්‍රදේශයේ ඇඟළුම් කර්මාන්ත ශාලා දෙකක් ස්ථාපිත කිරිම පිළිබඳ විගණන විමසුමට අදාල තොරතුරු රැස් කෙරේ. කඩිනමින් මෙම විගණන විමසුමට පිළිතුරු ඔබ වෙත ලබාදෙමි.. | 2022 පෙබරවාරි වනවිටත් භාවිතයට ගෙන නොතිබුණි. |
| 08. | ආර්ථිකය ශක්තිමත් කිරීමේ සහ සමාජ යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ ඒරාවූර් පත්තු ප්‍රාදේශීය | අදාල ව්‍යාපෘතියේ ඉලක්ක ළඟාකර ගැනීමට හැකි අයුරින් වැඩසටහන් | ජල සැපයුම් පද්ධතියේ අළුත්වැඩියා කටයුතු සිදුකර ජලය සැපයීමට සූදානම් වූ අවස්ථාවේදි | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| | ලේකම් කොට්ඨාශයේ වෙළෙඳ පොල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.මිලියන 16.96 ක ප්‍රතිපාදන සලසා තිබුණ ද. යෝජිත සැලැසුම වෙනස් වීම මත පිරිවැය රු. මිලියන 2.6 ක ඉදිනිරීම් සිදුකර නොතිබුණු අතර ගොඩනැගිල්ල එලදායීව භාවිතයට ගෙන ද නොතිබුණි. | ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුය. | Covid – 19 වාතාවරණය නිසා ක්‍රියාකාරකම්වල ප්‍රමාදයන් සිදුවී තිබේ. | |
| 09. | කර්මාන්ත අමාත්‍යාංශයේ “නංවමු ලංකා වැඩසටහන” යටතේ කර්මාන්ත ව්‍යවසායකයන් දිරිගැන්වීමේ වැඩසටහන සඳහා 2019 වර්ෂයේදි කෝරලෙයිපත්තු දකුණ ප්‍රාදේශීය ලේකම් කොටඨාශයේ ව්‍යවසායකයන් 79 ක් දිරිගැන්වීම වෙනුවෙන් රු.1,705,000 ක මූල්‍ය ප්‍රතිපාදන සලසා තිබූ නමුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ප්‍රතිලාභීන් තේරීමේදී සිදු වූ අඩුපාඩු මත මෙම වැඩසටහන අත්හැර දමා තිබුණි. | නිවැරදිව ප්‍රතිලාභීන් හඳුනාගෙන මූල්‍ය ප්‍රතිපාදන සලසන ලද වැඩසටහන් නියමිත කාලවකවානු තුළ ඉටු කිරීමට පියවර ගත යුතුය.<br>ප්‍රතිලාභීන් නිවැරදි ව තේරීම් නොකිරීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුය. | මුදල් අමාත්‍යාංශයේ අංක BD/GPS155/09/01/HA-2019 දරන 2019 නොවැම්බර් 20 දිනැති ලිපියෙහි උපදෙස් ප්‍රකාරව මෙම ව්‍යාපෘතියට අදාල සියළුම මෙහෙයුම් අත්හිටුවන ලදි. | නිවැරදිව ප්‍රතිලාභීන් තෝරාගෙන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට 2022 දක්වා කටයුතු කර නොතිබුණි. |

අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

-------------------------------------

2018 තත්ත්වාගණනය කළ මතය

2019 තත්ත්වාගණනය කළ මතය

2020 තත්ත්වාගණනය කළ මතය

| **විගණකාධිපති වාර්තාවේ ඇතුළත්** | **විගණකාධිපතිගේ** | **ආයතනය විසින් ගනු** | **ඒ සම්බන්ධයෙන් වූ** |
|---|---|---|---|

| ප්‍රධාන අඩුපාඩු | නිර්දේශය | ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වර්තමාන තත්ත්වය |
| --- | --- | --- | --- |
| 01. ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 කට අයත් ඉඩම් තක්සේරු කර, ගිණුම්ගත කර නොතිබුණි. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් සියළුම ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර ගිණුම්ගත කළයුතුය. | 2019.07.15 දින තක්සේරු දෙපාර්තමේන්තුව මෙම කාර්යාලය වෙත පැමිණ තක්සේරු කළ අතර, වාර්තාව ලබාදීමට නියමිතය. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12 කට අයත් ඉඩම් තක්සේරු කර, ගිණුම්ගත කර නොතිබුණි. |
| 02. කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සංවර්ධන අංශය විසින් කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම සඳහා සුළු පරිමාණ ඇඟළුම් කර්මාන්ත පිහිටුවීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණි. ඒ අනුව 2017 වර්ෂයේදී අම්පාර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක් සඳහා ලබා දී තිබුණු රු.19,525,600 ක් වටිනා මහන මැෂින් හා උපකරණ 2019 පෙබරවාරි 11 වන දින වන විටත් නිෂ්කාර්යව පැවතුණි. | සියළු වත්කම්වලින් අපේක්ෂිත උපරිම ප්‍රතිලාභ ලැබෙන පරිදි උපයෝජනය කළ යුතුය. | ප්‍රතිලාභීන් විසින් එම සමිති හා එක්ව කටයුතු කිරීමට අකමැත්ත ප්‍රකාශ කිරීම නිසා ක්‍රියාත්මක කිරීමේ දී ගැටළු මතුවිය. | 2021 දෙසැම්බර් 31 වන දින වන විටත් මහන මැෂින් හා උපකරණ නිෂ්කාර්යව පැවතුණි. |
| 03. 2018 වර්ෂය තුල වත්කම් අපහරණයක් හෝ විනාශ කිරීමක් හෝ සිදුකර නොතිබුණ ද මූල්‍ය | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම අදාල ගනුදෙනුවේ ස්වභාවය අනුව | යම්කිසි වත්කමක් පරිගණකයට (Cigass) ඇතුළත් කිරීමේදී යම් | 2021 දෙසැම්බර් 31 දින වන විටත් නිවැරදි කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රකාශනයෙහි (ඒසීඒ 6) රු.26,316,881 ක් වටිනා වත්කම් විකුණුම් වශයෙන් දක්වා තිබුණි. 2020 වර්ෂයේදී ද එය නිවැරදි කර නොතිබුණි. | වාර්තා කළ යුතුය. | වැරැද්දක් සිදුවුවහොත් එය නිවැරදි කිරිම සඳහා වැඩසටහන තුල අලෙවියක් හෝ විනාශ කිරීමක් ලෙස සඳහන් කිරීමට සිදුවේ. | |
| 04. | පරිපූරක ඇස්තමේන්තු මගින් රු.4,050,000 ක් ග්‍රීන් ක්ලබ් (Green Clubs) වැඩසටහන සඳහා අනුමත කර තිබුණි. නමුත් ලැබුණු මූල්‍ය ප්‍රතිපාදනයෙන් රු.2,675,592 පමණක් අදාළ අරමුණ සඳහා වියදම් කර තිබුණි. | පරිපූරක ඇස්තමේන්තු යටතේ අනුමත වී ඇති සම්පූර්ණ ප්‍රතිපාදන අදාල වැඩසටහන සඳහා භාවිතා කළ යුතුය. | එවකට පැවති දේශපාලන බලපෑම් හේතුකොට ගෙන තාවකාලිකව කල් දමා ඇත. | සම්පූර්ණ ප්‍රතිපාදන අදාළ වැඩ සටහනට යොදාගෙන නොමැත. |
| 05. | දිගුකාලීන අවතැන් වූවන් නැවත පදිංචි කිරීම හා සමූපකාර සංවර්ධන සඳහා අමාත්‍යාංශ යටතේ ලබා දෙන ලද රු.මිලියන 13 ක් වටිනා වැඩ 12 ක් හා රු.මිලියන 3.5 ක් වටිනා වැඩ 05 ක් අක්කරපත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විගණන දිනය වන 2020 ජනවාරි 23 වන තෙක් ආරම්භ කර නොතිබුණි. | අමාත්‍යාංශයෙන් ලබාදෙන මුදල් අවතැන්වූවන් පදිංචි කිරීමේ කටයුතු සඳහා භාවිතා කර නැවත පදිංචි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. | ව්‍යාපෘති 03 ක් ආරම්භ කර ඇති අතර ව්‍යාපෘති 02 ක වැඩ ආරම්භ කර නොමැත. | වටිනාකම රු. මිලියනයක ව්‍යාපෘති 02 ක් ආරම්භ කර නොතිබුණි. |
| 06. | දේවාලය ප්‍රතිසංස්කරණය, ක්‍රීඩා උපකරණ, සති පොළ, කොන්ක්‍රීට් පාර | විවිධ ව්‍යාපෘති සඳහා වෙන් කරන ලද මුදල් ඒ පිළිබඳව පවතින | විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ දෙහිඅත්තකණ්ඩිය, | එකතුව රු.මිලියන 1.14 ක ව්‍යාපෘති 09 ක් ක්‍රියාත්මක කර |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රතිසංස්කරණය වැනි විවිධ වැඩසටහන් සඳහා RIDP, ONUR, Task Force on Resettlement of Protected IDPS, Lagoon Conservation and Development, Let's together for nation හා DCB යන ව්‍යාපෘති යටතේ මුදල් ප්‍රතිපාදන මඟින් රු.170,631,000 ක සමස්ත වැඩසටහන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 කට අනුමත කර තිබුණ ද ඉඩම් ගැටළු, වැරදි තේරීම් හා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය නොලැබීම වැනි හේතූන් මත සමාලෝචන වර්ෂයේ දී අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමට නොහැකි වී තිබුණි. | ගැටලු විසඳාගෙන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. | කල්මුණ , සම්මන්තුර, තිරුක්කෝවිල් හා පොතුවිල් යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 05 තුළ ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලද රු.මිලියන 1.14 ක වටිනාකමින් යුතු ව්‍යාපෘති 09 පමණක් 2019 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත. | නොතිබුණි. |
| 07. | සම්මන්තුරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ "සපූර්" සණස සමිතියට 2000 මාර්තු 23 වන දින රජයේ ඉඩම් පනත යටතේ ආදර්ශ ගොවිපළ සකස් කිරීම සඳහා දීර්ඝ කාලීන බදු (වසර 30) පදනම මත සෙන්නල් ග්‍රාමය 01 හි පිහිටා ඇති හෙක්ටයාර 0.847 පරිමිතියෙන් යුත් රජයේ ඉඩම ලබා දී තිබුණි. එම ඉඩම අදාළ අරමුණට භාවිතා නොකර බොහෝ කැබැලිවලට වෙන්කර ඒවායේ සම්පූර්ණ | දිගුකාලීන බදු ඔප්පු ලබාදීමේ දී අදාල අරමුණු වෙනුවෙන් භාවිතා කරනු ලබන්නේද යන්න සහතික කරගත යුතු අතර, එසේ ක්‍රියා නොකරන්නේ නම් එයට විරුද්ධව කඩිනම් පියවර ගත යුතුය. | පළාත් ඉඩම් කොමසාරිස් මෙම බදු අවලංගු කිරීමට ක්‍රියාමාර්ග ගැනීම සඳහා ලේඛන ලබා දෙන ලෙස 2020.05.26 දිනැති EP/28/LB/Ls/Amp/ Gen දරන ලිපිය මඟින් දන්වා ඇත. ඒ අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාමාර්ග ගෙන ඇත. | දීර්ඝ කාලීන බද්ධ අවලංගු කිරීමට පියවර ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | කරන ලද නිවාස 22 ක් ද කොටසක් සම්පූර්ණ කරන ලද නිවාස 04 ක් ද අඩිතාලම දමන ලද ස්ථිර ගොඩනැගිලි 03ක් ද තිබෙන බව ග්‍රාම නිලධාරි හා ජනපද නිලධාරි විසින් 2011 ජූලි මස වාර්තා කර තිබුණි. එහෙත් මෙම ඉඩම නැවත ලබා ගැනිමට 2020 පෙබරවාරි 18 දක්වා පියවර ගෙන නොතිබුණි. | | | |
| 08. | දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් "දැයට කිරුළ 2013" සංවර්ධන ව්‍යාපෘති යටතේ ක්‍රියාත්මක කිරීමට ගිවිසුම් අත්සන් කරන ලද ව්‍යාපෘති 05 ක් ක්‍රියාත්මක කිරීමේදී රු.6,512,909 ක මුදලක් අවභාවිත කර තිබුණි. | අදාල ගැටලු සහිත තත්ත්වය පිළිබඳ දැනට සිදුවන විමර්ශන කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතුය. | පොලිස් විශේෂ අපරාධ විමර්ශන අංශය මඟින් මේ සම්බන්ධව විශේෂ විමර්ශනයක් සිදුකරන අතර, වැඩිදුර විමර්ෂන කටයුතු සඳහා අදාල ලිපිගොනු ඔවුන් භාරයට ගෙන ඇති බව කාරුණිකව දන්වමි. | විමර්ෂන කටයුතු අවසන්ව නොමැත. |
| 09. | 2020 වර්ෂයේ දී ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද රු.522,734 ක් වෙනත් ආදායම් ශීර්ෂය යටතේ (2006-0-2-0-20) රු.218,830 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර සියලු ආදායම් අදාළ ආදායම් ශීර්ෂයට සටහන් කර ඇත්දැයි බලා නිවැරදි කිරීමට පියවර ගත යුතුය. | 2020 මෙවැනි වැරදි ආදායම් ශීර්ෂයට සටහන් නොකර අදාළ ආදායම් ශීර්ෂයට තබන ලෙස අදාළ ප්‍රා.ලේ.කාර්යාවල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | නිවැරදි කර නොතිබුණි. |
| 10. | 2020 වර්ෂයේ දෙසැම්බර් 31 | හිඟ මුදල අයකර | අදාළ ණය | ශේෂ 2021 දෙසැම්බර් 31 |

| | | | | |
|---|---|---|---|---|
| | දිනට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක නිලධාරීන් තුන්දෙනෙකුගෙන් අයවිය යුතු රු.776,750 ක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගැනීමට කටයුතු කළ යුතුය. | අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | දිනට 572,750 ක් අය කර ගත යුතුව පැවතුනි. |
| 11. | 2020 වර්ෂයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක් විසින් භාවිතා කරනු ලබන කාර්යාල ගොඩනැගිලි 32 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | කාර්යාල ගොඩනැගිලිවල වටිනාකම තක්සේරු කිරීමට කටයුතු කළ යුතුය. | ගොඩනැගිලිවලට අදාළ තක්සේරු වටිනාකම තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලබා දී නැත. සිහිකැඳවීම් කර ඇත. ලද වහාම ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. |
| 12. | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව බැරකම් ලේඛනයක බැරකම් සටහන් කළ යුතුය. | බැරකම් පිළිබඳ ලේඛනය මු.රෙ. ප්‍රකාරව පවත්වාගෙන යාමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | බැරකම් ලේඛනයක් නඩත්තු නොකරයි. |
| 13. | ජංගම නොවන වත්කම් ප්‍රකාශය ඒ.සී.ඒ.-6 හි දක්වා තිබූ 2020.01.01 දිනට ආරම්භක ශේෂය සංශෝධනය කිරීම මත වත්කම්වල වටිනාකමට එකතු වූ රු.35,949,298 ක් පිළිබඳ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන සමග ආරම්භක ශේෂ සංශෝධනයට අදාළ සැසඳුම් ප්‍රකාශයන් ඉදිරිපත් කළ යුතු ය. | ඉදිරි වර්ෂයේදී ආරම්භක ශේෂ සඳහා ප්‍රකාශයන් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | ශේෂ සංශෝධනයට අදාළ සැසඳුම් ප්‍රකාශයක් සකස් කර නොමැත. |
| 14. | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අංක | චක්‍රලේඛයට පටහැනිව සිදුකරන | සමෘද්ධි ප්‍රතිලාභීන්ට වැඩියෙන් ලබාදුන් | 2022 පෙබරවාරි වනවිටත් රු.937,840 |

| | | | | |
|---|---|---|---|---|
| | 08/2017 දරන 2017 මාර්තු 29 දිනැති දිවිනැගුම චක්‍රලේඛය සහ අංක ඩීඑස්ඩී/එච්ඕ/එස්ඩබ්ලිව්/14/16 දරන 2019 සැප්තැම්බර් 10 දිනැති සංශෝධිත චක්‍රලේඛය ප්‍රකාරව, පවුලේ සාමාජිකයන් සංඛ්‍යාව පදනම් කරමින් සමෘද්ධි සහනාධාර මුද්දර ලබාදිය යුතු වුවද, එයට පටහැනිව සමෘද්ධි බැංකු 10 ක් විසින් පවුල් 43 ක් සඳහා වැඩිපුර ගෙවා තිබූ රු.2,993,215 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලද වැඩිපුර ගෙවීම් අයකර ගැනීමට පියවර ගත යුතුය. | සහනාධාර මුදල කොටස් වශයෙන් අය කිරීමට කටයුතු කර ඇත. | ක් අයකර ගැනීමට කටයුතු කර නොමැත. |
| 15. | උහන ප්‍රදේශයේ සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා බුද්ධශාසන, සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශය විසින් 2020 පෙබරවාරි 02 දින රු.4,026,559 ක මූල්‍ය ප්‍රතිපාදන ලබාදී තිබුණ නමුත්, මෙම ඉදිකිරීමට අදාල ප්‍රසම්පාදන කටයුතු සිදු නොකිරීම නිසා මෙම ප්‍රතිපාදන ආපසු හරවා යවා ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි. | ප්‍රතිපාදන ලැබී ඇති ඉදිකිරීම් කටයුතු කඩිනමින් සිදුකිරීමට පියවර ගත යුතුය. | කොවිඩ් - 19 ව්‍යාප්ත වීම හේතුවෙන් කාර්යාල ක්‍රියාවලියන් මන්දගාමී තත්ත්වයක පැවති නිසා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | ඉදිකිරීම් කටයුතු අතහැර දමා තිබුණි. |
| 16. | කල්මුනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි කාර්මෙල් පාතිමා ජාතික පාසලේ ගෘහස්ථ මණ්ඩපය ඉදිකිරීම | නියමිත කාලය තුල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුය. | මෙම ව්‍යාපෘතිය 2020 වර්ෂයේ අවිච්ඡේද වැඩසටහන් යටතේ | ව්‍යාපෘතිය අත්හැර දමා තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | සඳහා ආර්ථික සවිබල ගැන්වීම සහ සමාජ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය විසින් 2019 වර්ෂයේ දී රු.1,000,000 ක මුල්‍ය ප්‍රතිපාදන සලසා තිබූ නමුත් මෙම ව්‍යාපෘතිය අදාල කාලපරිච්ඡේදයේ දී ආරම්භ නොකර අතහැර දමා තිබුණි. | | ඇතුලත් කිරීම සඳහා අනුමැතිය හා අදාළ මුදල නිදහස් කරන ලෙස ඉල්ලීම් කළ ද ඒ සඳහා අනුමැතිය නොලැබීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය අත්හැර දමා ඇත. | |
| 17. | දීර්ඝකාලීන බදු පදනමින් ඉඩම් ලබාදීමේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක් අයකළ යුතුව තිබූ හිඟ බදු රු.5,271,471 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | බදු ආදායම් කාලීනව අයකිරීමට පියවර ගත යුතුය. | අදාළ බදු තැන්පත්කරුවන් ගෙන් හිඟ මුදල අයකිරීමට උපදෙස් ලබා දී ඇත. | 2022 පෙබරවාරි වනවිටත් රු.2,400,078 ක් අයකර ගත යුතුව ඇත. |
| 18. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් රජයේ නිවාස 6 කින් අයකළ යුතු කුලි රු.338,531 ක් 2002 වර්ෂයේ සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රජයේ නිවාස වලින් අයවිය යුතු කුලී කඩිනමින් අය කිරීමට පියවර ගත යුතුය. | අයකිරීමට පියවරගෙන ඇත. | 2022 පෙබරවාරි වනවිටත් හිඟ කුලී මුදල අයකර ගෙන නොමැත. |
| 19. | 2015 වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යලායට අයත් වාහනයකට සිදු වූ අනතුරක් සම්බන්ධයෙන් රක්ෂණ සංස්ථාවෙන් ලබා ගත හැකිව තිබූ රු.මිලියන 4.8 ක වාහන රක්ෂණ හිමිකම, නියමිත කාලවකවානුව තුළ ඉල්ලීම් | රක්ෂණ සංස්ථාවෙන් ලබාගත හැකි වන්දි මුදල් ලබා ගැනීමට කටයුතු නොකල වගකිව යුතු පාර්ශවයන්ට විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළයුතුය. | වන්දි ලබා ගැනීම සඳහා 2021.10.08 දිනැති අමාත්‍යාංශ අනුමැතිය ඉල්ලා ඇත. | 2022 පෙබරවාරි වනවිටත් රක්ෂණ හිමිකම ලබා ගැනීමට කටයුතු කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ලබා ගැනීමට නොහැකි වී තිබුණි. | වන්දි මුදල් ලබාගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | | |
| 20. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වාහනයක් වර්ෂ 20 කට අධික කාලයක සිට අළුත්වැඩියා කිරීමට ගරාජයකට භාරදී තිබුණත්, එය ආපසු ලබාගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ගරාජයට භාරදී ඇති වාහනය පිළිබඳව පසුවිපරම් නොකිරීම පිළිබඳව අදාළ වගකිවයුතු පාර්ශවයන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගතයුතුය. එහි වර්තමාන තත්ත්වය පරීක්ෂා කර අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගතයුතුය. | 42-8880 අංක දරන වාහනය නැවත මෙම කාර්යාලය වෙත රැගෙන ඒම සඳහා මෝටර් රථ පරීක්ෂකගේ වාර්තාවක් ඉල්ලා ඇත. | 2022 පෙබරවාරි වනවිටත් වාහනය ආපසු ලබාගෙන නොමැත. |
| 21. | 2020 වර්ෂය අවසානයට පුරප්පාඩුව පවතින ග්‍රාමසේවක තනතුරු 76 ක් සඳහා ස්ථිර බඳවාගැනීම් සිදුනොකිරීම නිසා ග්‍රාම සේවක වසම්වල පරිපාලන කටයුතු මන්දගාමී තත්ත්වයක පැවතුණි. | සේවා අවශ්‍යතා සැලකිල්ලට ගෙන සේවක පුරප්පාඩු පිරවීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය. | ග්‍රාම නිලධාරී පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳව අමාත්‍යාංශය දැනුවත් කිරීමට කටයුතු කර ඇත. | 2022 පෙබරවාරි වනවිටත් පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොමැත. |
| 22. | 2020 වර්ෂයේ අනුමත කාර්ය මණ්ඩලය 2,364 ක් වුවද තථ්‍ය කාර්ය මණ්ඩලය 2,163ක් විය. එසේ වුවත්, | සේවා අවශ්‍යතා මත ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් පවතින පුරප්පාඩු පිරවීමට පියවර ගත | ස්වදේශ කටයුතු අමාත්‍යාංශය දැනුවත් කර ඇත. | 2022 පෙබරවාරි වනවිටත් පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොමැත. |

| | | | |
|---|---|---|---|
| පුරප්පාඩුව පවතින තනතුරු 201 ක් බඳවා ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | යුතුය. | | |

කිලිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

-----------------------------------------------

2018 තත්ත්වාගණනය කළ මතය

2019 තත්ත්වාගණනය කළ මතය

2020 තත්ත්වාගණනය කළ මතය

| විගණකාධිපති වාර්තාවේ ඇතුළත් ප්‍රධාන අඩුපාඩු | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| 01. කන්දාවලෙයි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වාහනයකට 2017 ජුනි 16 දින සිදු වූ අනතුරක් නිසා අලුත්වැඩියාවට රු.1,348,904 ක් වැය වී තිබුණි. මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු සම්පූර්ණ කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | පත් කළ විමර්ශන කමිටුවේ වාර්තාව ලද විගස ඉදිරි කටයුතු සිදු කෙරේ. | 2022 පෙබරවාරි දක්වාම අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. |
| 02. පල්ලිකුඩා වලර්මති වරායේ ඉදි කිරීම්වල දී කර්මාන්ත සංවර්ධන අධිකාරියේ 2007 ජනවාරි 02 දිනැති මාර්ගෝපදේශවල පොදු කොන්දේසි 01 හි 11.1, 11.3 | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතුය. | ඉදිරියේදී වැඩ අවසන් නොකිරීම නිසා සිදුවන අලාභ ගණනය කිරීමට හා අඩු කිරීමට පියවර ගනු ලැබේ. | 2022 පෙබරවාරි වනවිටත් මෙම මුදල් අය කිරීමට පියවර ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | හා 11.4 වගන්තිවලට පටහැනිව, නිම නොකළ වැඩ සඳහා රු.368,929 ක් ගෙවා තිබුණි. | | | |
| 03. | විවිධ සේවා සමුපකාර සමිති 04කට ලබා දී තිබුණු රු.28,756,571 ක් වූ ගොඩනැගිලි සහ උපකරණ පසුගිය වසර 01ත් 02 ත් අතර කාලයක සිට අභාවිතව පැවතිණි. | භාවිතයට අවශ්‍ය පියවර ගත යුතුය. | මෙහි වගකීම අදාළ විවිධසේවා සමුපකාර සමිතිවලට පැවරෙන බැවින් ඔවුන්ගේ අවධානයට යොමු කර ඇත. | 2022 පෙබරවාරි දක්වාම ගොඩනැගිලි 02 ක් භාවිතයට ගෙන නොතිබුණි. |
| 04. | කරච්චි උතුරු විවිධසේවා සමුපකාර සමිතියේ සහල් මෝල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය රු.2,001,500 ක යන්ත්‍රෝපකරණ ලබා දී වසර 2 කට වැඩි කාලයක් ගත වී තිබුණ ද, එම උපකරණ භාවිතා කර නොතිබුණි. | සහල් මෝල සඳහා ලබාදී ඇති උපකරණ උපයෝගී කරගෙන සහල් මෝල ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. | අවශ්‍ය පහසුකම් සමිතිය විසින් සපයනු ඇතැයි යන පදනම මත මෙම ව්‍යාපෘතියට අරමුදල් සපයන ලදී. | 2022 පෙබරවාරි වන විටත් එම උපකරණ භාවිතයට ගෙන නොතිබුණි. |
| 05. | නියඟයක දී ජලය සැපයීම සඳහා 2018 වර්ෂයේදී වාරිමාර්ග, ජල සම්පාදන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් පරිත්‍යාග කර තිබුණු ලීටර් 1000 ක ධාරිතාවකින් යුතු ජල ටැංකි 50 ක් සහ ජල පෙරන 40 ක් වසරකට වැඩි කාලයක සිට අභාවිතව පවතී. | භාවිතයට පියවර ගත යුතුය. | අවශ්‍යතාව පරිදි ප්‍රමුඛතා පදනමින් බෙදා හරින අතර පෙරන යන්ත්‍ර සතියක් ඇතුළත නිකුත් කරනු ලැබේ. | 2022 පෙබරවාරි වන විටත් ජල ටැංකි 50 භාවිතයට ගෙන නොතිබුණි. |
| 06. | ප්‍රසම්පාදන කමිටුවේ සහ | තාක්ෂණික ඇගයීම් | තාක්ෂණික සහතිකය | 2022 පෙබරවාරි |

| | | | | |
|---|---|---|---|---|
| | තාක්ෂණික ඇගයීම් කමිටුවේ තීරණයට පටහැනිව විනයගපුරම් ගොවි සමුපකාර සමිතියේ පළතුරු හා එළවළු සැකසුම් කර්මාන්ත ශාලාවට රු.11,595,798 ක වියළන උපකරණ හා ජෙනරේටර් ලබා දී තිබුණි. | කමිටුවේ නිර්දේශවලට අනුව යන්ත්‍රෝපකරණ මිල දී ගත යුතුය. | තවමත් නිකුත් කර නොමැති නිසා ප්‍රසම්පාදන කටයුතු මේවන තෙක් ඉටුකර නොමැති අතර තාක්ෂණික අවශ්‍යතා තවමත් සම්පූර්ණ කර නොමැත. | වනවිටත් අදාළ අවශ්‍යතා ඉටුකර නොතිබුණි. |
| 07. | වී මිල දී ගැනීම සඳහා කිළිනොච්චි දිස්ත්‍රික්කයේ විවිධ සේවා සමුපකාර සමිති 3 කට ලබාදුන් රු.මිලියන 3.42 ක අත්තිකාරම් වර්ෂ 7 කට වැඩි කාලයක සිට පියවා නොතිබුණි. | නොපියවන ලද අත්තිකාරම් මුදල් පියවා ගැනීමට හෝ මුදල් ගෙන්වා ගැනීමට වහාම පියවර ගත යුතුය. | මාසිකව ගෙවීම් සම්පූර්ණ කිරීමට උපදෙස් දී ඇත. | 2022 පෙබරවාරි වනවිටත් රු.700,000 ක අත්තිකාරම් පියවා නොතිබුණි. |
| 08. | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය අනුව සේවයෙන් ඉවත්ව ගිය සහ සේවය අත්හිටවූ නිලධාරීන්ගෙන් අයකර ගතයුතු වර්ෂ 10 කට වඩා පැරණි රු.820,425 ක ශේෂයක් අයකර ගැනීමට මේ දක්වා පියවර ගෙන නොතිබුණි. | හිඟ ශේෂ නියමිත කාලයේදි අය කර ගැනීමට පියවර ගැනීම. | නිලධාරීන්ගේ හිඟ ණය අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | හිඟහිටි ශේෂ 2022 පෙබරවාරි දක්වාම අයකර නොතිබුණි. |
| 09. | වර්ෂ 2 කට වඩා පැරණි එකතුව රු.5,424,688 ක තැන්පතු 36 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ගෙවීම් සිදුකර සහ ගෙවීම් සිදුකිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. | 2022 පෙබරවාරි දක්වාම නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | කටයුතු කිරිමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පියවර ගෙන නොතිබුණි. | | | |
| 10. | වෙනත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවලින් ලද රු.3,274,966 ක් අදාළ අරමුණු සඳහා භාවිතා නොකර පසුගිය වර්ෂ 01ත් 03ත් අතර කාලයක් තැන්පතු ගිණුමේ රඳවා තිබුණි. | වෙනත් ආයතන වලින් ලද මුදල්වලින් ඊට අදාළ කාර්යයන් ඉටු කර දීමට කටයුතු කළ යුතු අතර එසේ නොවන්නේනම් එම මුදල් ආපසු යැවීමට අදාළ කටයුතු සිදුකළ යුතුය. | සමහර තැන්පත් නිදහස් කිරීමටත්, තවත් තැන්පතු ආදායමට බැර කිරීමටත් ඉතිරි තැන්පතුවලින් ව්‍යාපෘති ආරම්භ කිරීමටත් කටයුතු කරනු ලැබේ. | 2022 පෙබරවාරි වනවිටත් රු.1,299,448 ක ශේෂයක් පැවතුණි. |
| 11. | 2017 ජූලි 04 දිනැති අංක 2017/01 දරන ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තු චක්‍රලේඛය පරිදි රජය විසින් ප්‍රදානය කළ දේපළ භාවිතා කර ව්‍යාපාරික ආයතන 169 ක් වර්ෂ 08 - 10 අතර කාලයක සිට පවත්වාගෙන යන නමුත් එම දේපළලාභීන් සමග ගිවිසුම්වලට එළැඹ බදුකුලී අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. | පිඹුරුපත් සැකසීමට මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත. ඒ අනුව ඉදිරි පියවර ගනු ලැබේ. | 2022 පෙබරවාරි දක්වාම කටයුතු කර නොතිබුණි. |
| 12. | 1996 අගෝස්තු 01 දිනැති | හිඟ බදු කුලී අයකර | අයකර ගැනීමට | 2022 පෙබරවාරි |

| | | | | |
|---|---|---|---|---|
| | අංක 96/05 දරන ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 5 (iii) සහ 6(ඇ) ඡේද පරිදි, බදු දුන් ඉඩම්වලින් 2014 සිට 2020 වර්ෂ දක්වා රු. 7,875,400 ක හිඟ බදුකුලී අයකර නොතිබුණි. | ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. | ක්‍රියාමාර්ග ගෙන ඇත. | දක්වාම කටයුතු කර නොතිබුණි. |
| 13. | පාසැලක් වටා ඉදි කළ තාප්පයක් වෙනුවෙන් රු.142,988ක් වැඩියෙන් ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවීම් ආපසු අය කර ගැනීමට කටයුතු කළ යුතුය. | ආපසු අයකිරීමට කටයුතු කරමින් පවතී. | 2022 පෙබරවාරි රු.63,429 ක් අයකළ යුතුව පැවතුණි. |
| 14. | පූනකරි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.3,960,000ක් වැයකර 2020 වර්ෂයේදි ඉදිකළ බොරලු මාර්ග 03ක් කෙටි කලක දී එනම්, 2021 මාර්තු මාසය වන විට දැඩි ලෙස අබලන්ව මහජනතාව දුෂ්කරතාවන්ට පත්කර තිබුණද, ඒ වෙනුවෙන් සාධනීය පියවරක් ගෙන නොතිබුණි. | මාර්ග විධිමත්ව ඉදිකරවා ගත යුතු අතර එලෙස ඉදිනොකිරීම සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | මෙම මාර්ග ප්‍රාදේශීය සභාවේ අධික්ෂණය යටතේ ක්‍රියාත්මක වූ බැවින් ප්‍රාදේශීය සභාවෙන් වාර්තාවක් කැඳවා ඇත. | 2022 පෙබරවාරි වනවිටත් ක්‍රියාමාර්ගගෙන ගෙන නොතිබුණි |

යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

---------------------------------------

2018 තත්ත්වාගණනය කළ මතය

2019 තත්ත්වාගණනය කළ මතය

2020 තත්ත්වාගණනය කළ මතය

| **විගණකාධිපති වාර්තාවේ ඇතුළත් ප්‍රධාන අඩුපාඩු** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ** | **ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය** |
|---|---|---|---|

| | | | ක්‍රියාමාර්ග | |
|---|---|---|---|---|
| | ------------------------ | --------------------- | ------------------------ | --------------------- |
| 01 | කරෙයිනගර් ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල රු.මිලියන 58 ක් වැයකර පුද්ගලික ඉඩමක ඉදිකර තිබුණි. මෙම ඉඩමේ වටිනාකම රු. මිලියන 02 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණ ද, 2020 ජූනි 30 දින දක්වාම එම ඉඩමේ අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩමේ අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | ඉඩම පවරා ගැනීමට ඉල්ලීම් කර ඇත. | මෙම දේපළ පවරා ගැනීමට කටයුතු කරමින් පවතී. |
| 02. | වලිකාමම් නිරිත ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ වූ මනිප්පායි වෙළදපොළ සංකීර්ණය ඉදිකිරීම | | | |
| | (i) ඉදි කිරීම් වෙනුවෙන් රු.348,998 ක් වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවීම් අයකිරීමට කටයුතු කළ යුතුය. | වැඩිපුර ගෙවීම් කොන්ත්‍රාත්කරුගෙන් අය කිරීම සඳහා කටයුතු යොදා ඇත. | මෙම මුදල් අයකළ ද, කොන්ත්‍රාත්කරු විසින් කළ අභියාචනයක් නිසා පත් කළ විමර්ශන කමිටුව විසින් ගත් තීරණය පරිදි මෙම මුදල ආපසු ගෙවීමට කටයුතු කරමින් පවතී. |
| | (ii) මෙම ඉදි කිරීම් නිම කිරීමට ප්‍රමාද වූ දින 145 ක් සඳහා දඩ ගාස්තු රු.මිලියන 1.09 | ගිවිසුම් ප්‍රකාරව වැඩ නියමිත කාලය තුල නිම නොකිරීමට අදාලව ප්‍රමාද ගාස්තු | මානිප්පායි ප්‍රාදේශීය සභාව විසින් මෙම ගොඩනැගිල්ල භාවිතා කිරීම පිළිබඳ | මෙම මුදලින් රු. 377,109 අයකළ ද, කොන්ත්‍රාත්කරු විසින් කළ |

| | | | | |
|---|---|---|---|---|
| | ක් කොන්ත්‍රාත් ගිවිසුමේ අංක 6.4 ඡේදය අනුව කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගෙන නොතිබුණි. | අයකල යුතුය. | ක්‍රියාමාර්ග ගනිමින් පවතී. එමෙන්ම, කාල ප්‍රමාදය සඳහා ගාස්තු කොන්ත්‍රාත්කරුගෙන් අයකිරීමට කටයුතු කර ඇත. | අභියාචනයක් නිසා පත් කළ විමර්ශන කමිටුව විසින් ගත් තීරණය පරිදි මෙම මුදල ආපසු ගෙවීමට කටයුතු කරමින් පවතී. |
| 03. | වඩමාරච්චි උතුර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ සාලම්බෙයි ව්‍යාපාරමූලෙයි මාර්ගය ප්‍රතිසංස්කරණයේදී රු.115,169 ක් වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවීම් අය කළ යුතුය. | පිලිතුරු ලබා දී නැත. | අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. |
| 04. | නල්ලූර් ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම නිසි පරිදි ඉටු නොවීම නිසා 2018 ඔක්තෝබර් 21 දින කොන්ත්‍රාත්තුව අවසන් කර තිබුණි. එහෙත්, මාස 03 ක කාල ප්‍රමාදය සඳහා රු.මිලියන 1.65 ක් කොන්ත්‍රාත් ගිවිසුම් 4.9.1 ඡේදය පරිදි කොන්ත්‍රාත්කරුගෙන් අයකර නොතිබුණි. | ව්‍යාපෘතිය අදාළ කාලය තුළ නිමකිරීමට කටයුතු කළ යුතු අතර ගිවිසුම ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අයකල යුතුය. | කාල ප්‍රමාදය සඳහා ගාස්තු කොන්ත්‍රාත්කරුගෙන් අයකිරීමට කටයුතු කර ඇත. | අදාළ කොත්ත්‍රාත්කරු සමග ගිවිසුමගත වූ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත. ඊට ලැබෙන පිළිතුරු පරිදි ඉදිරි කටයුතු සිදු කෙරේ. |
| 05. | වඩමාරච්චි උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉදි කළ මාර්ග 02 ක් සඳහා රු.466,000 ක් වැඩියෙන් | වැඩිපුර ගෙවූ මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතුය. | ව්‍යාපෘති ක්‍රියාත්මක කළ අයගෙන් පැහැදිලි කිරීම් ලබාගෙන ඒ සඳහා | මෙම මුදල් අය කිරීම සඳහා කටයුතු කරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | ගෙවා තිබුණි. | | ක්‍රියාමාර්ග වහාම ගනු ලැබේ. | |
| 06. | වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ වූ නිර්වේලි කෙසෙල් කැන් වගාකරුවන්ගේ සමූපකාර සමිති ගොඩනැගිල්ල හා කෙසෙල් වගා කිරීමේ මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමේ කාර්යයන් සඳහා රු.10,223,189 ක් වැයකර තිබුණි. 2018 දෙසැම්බර් 31 දිනට පෙර අවසන් විය යුතු මෙම කාර්යයන් 2019 ජුලි 31 දින වන විටත් අවසන්ව නොතිබුණි. | ව්‍යාපෘතිය අදාළ කාලය තුළ නිමකිරීමට කටයුතු කළ යුතුය. | ව්‍යාපෘතිය සඳහා යන්ත්‍ර සහ පිරියත විදේශ රටකින් ආනයනය කර ඇත. යන්ත්‍ර ස්ථාපිත කර එහි තාක්ෂණික වාර්තා ලැබීමෙන් පසුව අඛණ්ඩව මෙහෙයුම් කටයුතු තවදුරටත් අප විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. | මෙම ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම අසාර්ථක වී තිබුණි. |
| 07. | යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් රැකියා සොයන්නන්ට පුහුණුව ලබාදීමේ අරමුණින් SMART Sri Lanka ව්‍යාපෘතිය යටතේ රු.මිලියන 13.75 ක වටිනාකමින් 2019 ජුලි මාසයේ ඉදිකළ ගොඩනැගිල්ල සහ උපකරණ අදාළ අවශ්‍යතා සඳහා මේ දක්වා භාවිතා කර නොතිබුණි. | නිෂ්කාර්යව පවතින වත්කම් භාවිතයට සුදුසු ආකාරයට පත්කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. | මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වැඩිදුර උපදෙස් සහ මූල්‍ය ප්‍රතිපාදන වෙන්කිරීම් නොලැබීම නිසා ගොඩනැගිල්ල අදාල අරමුණ සඳහා භාවිතා කළ නොහැකි විය. | අදාළ අරමුණ වෙනුවෙන් මෙම ගොඩනැගිල්ල භාවිතා නොකෙරෙන අතර යාපනය තරුණ සංගමයකට එය භාවිතා කිරීම සඳහා ලබා දී තිබුණි. |
| 08. | වලිකාමම් උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ විදුලි | ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර | ඇතැම් අඩුපාඩු නිවැරදි කරදීමේදී | භාවිතා කිරීමට කටයුතු කරමින් |

| | | | | |
|---|---|---|---|---|
| | බලවේග යන්ත්‍ර ගොඩනැගිල්ල ඉදිකිරීම හා යන්ත්‍ර මිල දී ගැනීම් සඳහා රු. මිලියන 8.32ක් වැය කර තිබුණද, ඒවා මේ දක්වා අදාළ අරමුණු සඳහා භාවිතා කර නොතිබුණි. | විධිමත්ව සැලැසුම් සහ තාක්ෂණික ඇගයීම් සිදුකළ යුතු අතර අදාළ අරමුණු සඳහා යොදාගැනීමට කටයුතු කළයුතුය. | කාල ප්‍රමාදයක් සිදු විය. දැනට උතුරු පළාත් කම්කරු දෙපාර්තමේන්තුවේ පුහුණු කළ කාර්ය මණ්ඩලය මගින් ක්‍රියාත්මක කිරීමට නියමිතය. | පවතී. |
| 09. | වලිකාමම් උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල රු.56,023,874 ක් වැයකර අන්සතු ඉඩමක ඉදිකර තිබුණි. එහි අයිතිය පවරා ගැනීමට 2021 මාර්තු 31 දින දක්වා කටයුතු කර නොතිබුණු අතර ඉඩමේ වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි හෙළිදරව් කර නොතිබුණි. | ඉඩම පවරාගෙන ඉඩමෙහි වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. | පවරා ගැනීමට කටයුතු කරමි. | අදාළ පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී. |
| 10. | යාපනය ප්‍රාදේශීය ලේකම් කාර්යාල ව්‍යාපෘති කිහිපයක් නියමිත කාලය තුළ අවසන් කර නොතිබුණි. එහෙත්, ඒ සඳහා රු.547,766 ක් වූ ප්‍රමාද ගාස්තු ගිවිසුම පරිදි අදාළ කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකර නොතිබුණි. | ව්‍යාපෘති නියමිත කාලය තුළ ඉටුකර ගැනීමටත්, ප්‍රමාදවන අවස්ථාවල දී ගිවිසුම් පරිදි ප්‍රමාද ගාස්තු අය කිරීමටත් පියවර ගත යුතුය. | කොන්ත්‍රාත් රඳවා ගැනීමේ මුදලින් හෝ සෘජුව මෙම මුදල් ගෙවන ලෙස හෝ අදාළ කොන්ත්‍රාත්කරු වෙත දන්වා යවා තිබුණි. එමෙන්ම, දක්වා ඇති ප්‍රමාද ගාස්තුවලින් යම් මුදලක් අයකර ගැනීමට ද පියවර ගෙන ඇත. | මෙම මුදල අයකිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 11. | චුන්නාගම් තැපැල් කාර්යාලය සහ තැපැල් ස්ථානාධිපති නිල නිවාසය ඉදි කිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශ නොකළ ලංසුකරුවෙකුට ප්‍රසම්පාදනය පිරිනමා තිබුණි. ඔහු විසින් එම කාර්යයන් නිම නොකිරීම නිසා ඉටුකළ කාර්යයන්ට පමණක් ගෙවීමේ පදනම යටතේ 2019 දෙසැම්බර් 31 දින දෙපාර්ශවයේ එකඟතාවෙන් ගිවිසුම අවසන් කර තිබුණි. එසේ වුවත්, ගිවිසුමේ කොන්ත්‍රාත් දත්ත 60.1 අනුව, සහතික කළ වැඩ සඳහා ගෙවීම් කිරීමේදී නොකළ වැඩවලින් සියයට 25ක් එනම්, රු. 1,169,074ක් අයකර නොතිබුණි. | කොන්ත්‍රාත් දත්ත 60.1 අනුව, අදාළ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | දෙපාර්ශවයේ එකඟතාවෙන් ගිවිසුම අවසන් කළ බැවින් මෙම මුදල අයකර නොතිබුණි. | මෙම මුදල අයකිරීමට කටයුතු කර නොතිබුණි. |
| 12. | තෙන්මාරච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 56 දෙනෙකුට රු.5,000 බැගින් ලබා දුන් බවට කරුණු දක්වා සිදුකළ රු.280,000 ක මූල්‍ය වංචාව සම්බන්ධයෙන් විමර්ශන පවත්වා නොතිබුණි. | වංචා වැළැක්වෙන පරිදි සුදුසු අභ්‍යන්තර පාලන ක්‍රමවේද ඇති කළ යුතු අතර වැඩිපුර ගෙවන ලද මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | සමෘද්ධි සංවර්ධන නිලධාරීගේ රාජකාරිය අත්හිටුවා ඇති අතර අනෙකුත් නිලධාරීන්ට අවවාද සහිත ස්ථාන මාරුවීම් ලබා දී ඇත. අදාළ මුදල් නියමිත නිලධාරීන්ගෙන් අයකර ගැනීමට පියවර ගනිමින් පවතී. | 2022 පෙබරවාරි දක්වාම එම මුදල් අයකර නොතිබුණි. |
| 13. | ව්‍යාපෘතියක් සඳහා ලද | අදාළ තැන්පතු ශේෂ | මෙම තැන්පතු | කාර්යයන් 03 ක් |

| | | | | |
|---|---|---|---|---|
| | රු.13,458,697 ක් නිසි උපයෝජනයක් නොමැතිව වර්ෂ 3 කට වැඩි කාලයක සිට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තැන්පතු ගිණුමේ රඳවා තිබුණි. | නොපමාව නිරවුල් කිරීමට පියවර ගත යුතුය. | නොපමාව නිරවුල් කිරීමට පියවර ගෙන ඇත. | සහිත මෙම ව්‍යාපෘතියේ එක් කාර්යයක් අවසන් කර ඇත. එහි ප්‍රගතිය පරීක්ෂා කර ඉතිරි කාර්යයන් 02 ඉටු කිරීමට අපේක්ෂිතය. |
| 14. | කුඩා කර්මාන්ත ශාලා 50 ක් ස්ථාපිත කිරීමේ වැඩසටහන යටතේ නල්ලූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වූ යෝගට් නිෂ්පාදන ආයතනයක් වෙත ලබා දුන් රු.1,336,300 ට මිල දී ගත් යන්ත්‍රය (Batch Pasteurizer) වර්ෂයකට අධික කාලයක සිට අක්‍රීයව පැවතුණි. | කොටස් නොමැති යන්ත්‍රයක් මිල දී ගැනීම සම්බන්ධයෙන් විමර්ශනයක් කළ යුතුය. යන්ත්‍රය ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකල යුතුය. | මෙම යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රධාන අමතර කොටස් අදාළ සැපයුම්කරු විසින් මේ දක්වා සපයා නොමැති නිසා එය අක්‍රීය තත්ත්වයේ පවතී. එම අමතර කොටස් ලද වහාම එම යන්ත්‍රය යථා තත්ත්වයට පත් කිරීමට කටයුතු කරනු ලැබේ. | තව දුරටත් මෙම යන්ත්‍රය අක්‍රීයව පවතී. |
| 15. | ධීවර පවුල් වෙත ලබා දීම සඳහා 2017 වර්ෂයේදී ලද රු.690,849 ක් වටිනා දැල් 152 ක් වර්ෂ 03ක කාලයක සිට වඩමාරච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රඳවා තිබුණි. | මිල දී ගැනීමට පෙර අවශ්‍යතාව හොඳින් හඳුනාගතයුතු අතර නිෂ්කාර්ය වත්කම් ඵලදායි ලෙස භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. | මෙම දැල් ගැඹුරු මුහුදේ මාළු ඇල්ලීම සඳහා සුදුසු බව දන්වන ලදී. මේ නිසා එම දැල් අවශ්‍ය ප්‍රතිලාභීන් වෙත ලබාදීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කටයුතු කරමින් පවති. | එම දැල් අවශ්‍ය ප්‍රතිලාභීන් වෙත මේ දක්වාම ලබා දී නොතිබුණි. |

වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
---------------------------------------

2018 තත්ත්වාගණනය කළ මතය
2019 තත්ත්වාගණනය කළ මතය
2020 තත්ත්වාගණනය කළ මතය

| විගණකාධිපති වාර්තාවේ ඇතුළත් ප්‍රධාන අඩුපාඩු | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| 01. උපකරණ හා ගෘහ භාණ්ඩ අයිතම 280 ක් වර්ෂයක් පුරා භාවිතයට නොගෙන අනාරක්ෂිතව ගබඩා කර තිබුණි. | වත්කම් භාවිතා කිරීමට හා ආරක්ෂා කිරීමට කටයුතු කළ යුතුය. | ගෙවීම් කටයුතු සඳහා ප්‍රතිපාදන නොමැති බැවින් මුරකරුවන් යොදා නොමැත. | 2022 පෙබරවාරි වනවිටත් මෙම භාණ්ඩ භාවිතයට ගෙන නොතිබුණි. |
| 02. වෙංගාලසෙට්ටිකුලම් ගොඩනැගිල්ල ඉදි කිරීමේදී රු.116,157 ක් වැඩිපුර ගෙවා තිබුණි. | කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කළ රේටය පරිදි ගෙවීම් කිරීම හා වැඩිපුර ගෙවන ලද මුදල් අයකළ යුතුය. | ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල නොකිරීම නිසා මෙලෙස සිදු වී ඇති අතර අනාගතයේදී මෙලෙස සිදු නොවීමට සටහන් කර ගතිමි. | 2022 පෙබරවාරි වනවිටත් වැඩිපුර ගෙවීම් අයකරගෙන නොතිබුණි. |
| 03. ඒ-9, ඕමන්ත, වවුනියාව යන ස්ථානයේ පිහිටි රජයේ ඉඩමක අනවසර ඉදි කිරීමක් සිදුකර තිබුණ ද, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග වවුනියාව ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ගෙන නොතිබුණි. | අනවසර ඉදි කිරීම් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියා මාර්ග ගත යුතුය. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අනුමැතිය ලබා දෙනු නොලැබේ. | 2022 පෙබරවාරි දක්වාම නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| 04. 2018 ඔක්තෝබර් මාසයේදී රු.12,956,898 ක වියදමින් ඉදිකළ ඕමන්ත සංස්කෘතික | මෙම ස්ථානය මහජනයාගේ භාවිතය සඳහා විවෘත | විවෘත කිරීමට කටයුතු කරනු ලැබේ. | 2022 පෙබරවාරි දක්වාම විවෘත කිරීමට පියවර ගෙන |

| | | | | |
|---|---|---|---|---|
| | මධ්‍යස්ථානය 2020 ජුලි මාසය වන විටත් මහජන භාවිතය සඳහා විවෘත කර නොතිබුණු අතර, මධ්‍යස්ථාන භූමිය වල් බිහි වී පැවතුණි. | කිරීමට කටයුතු කළ යුතුය. | | නොතිබුණි. |
| 05. | වවුනියාව දකුණ සිංහල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2014 වර්ෂයේදී ඉරට්ටපෙරියකුලම ගම්මානයේ ඉඩම් නොමැති වූ 57 දෙනෙකු සඳහා පර්චස් 80 බැගින් බිම් කොටස් ලබා දී තිබුණ ද, 2019 අගෝස්තු මාසය දක්වාම 08 දෙනෙකු පමණක් ඉඩම් සංවර්ධනය කර නිවාස ඉදිකර පදිංචි වී තිබුණි. | ඉඩම් සංවර්ධනය කිරීමට කටයුතු නොකල ප්‍රතිලාභීන් පිළබඳව කරුණු විමසා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | පදිංචිවී නොමැති ඉඩම් සොයා බලා ඉදිරියේදී අවශ්‍ය කටයුතු කරමි. | 2022 වනවිටත් මෙම ගැටළුව විසඳී නොතිබුණි. |
| 06. | වවුනියාව දකුණ සිංහල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2011 වර්ෂයේදී ඉරට්ටපෙරියකුලම වේරගම රජයේ සේවක නිවාස ව්‍යාපෘතිය යටතේ රජයේ සේවකයින් 113 දෙනෙකු වෙත පර්චස් 40 බැගින් බිම් කොටස් ලබා දී තිබුණි. එහෙත්, 2019 වර්ෂය වන විට වසර 08 ක් ගත වී තිබුණද, එම ඉඩම් කැබලි 113 න් ඉඩම් කැබලි 45 ක පමණක් නිවාස ඉදිකර පදිංචි වී තිබුණි. | ව්‍යාපෘතියේ ප්‍රගතිය සමාලෝචනය කර අදාළ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු නොකළ ඉඩම්ලාභීන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | පදිංචිවී නොමැති ඉඩම් සොයා බලා ඉදිරියේදී අවශ්‍ය කටයුතු කරමි. | මෙම ගැටළුව විසඳී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 07. | වටිනාකම රු. මිලියන 291.64 ක ඇස්තමේන්තුවක් මත ඉදිකළ වවුනියා ආර්ථික මධ්‍යස්ථානය 2018 වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට භාර දී තිබුණි. නමුත් එම මධ්‍යස්ථානය මේ දක්වා භාවිතා කිරීමට පියවර ගෙන නොතිබුණි. | මධ්‍යස්ථානය ඉදිකළ අරමුණු වෙනුවෙන් භාවිතා කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. | මෙම මධ්‍යස්ථානය විවෘත කිරිම සඳහා වූ රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය මේ දක්වා ලැබී නොතිබුණි. | 2022 පෙබරවාරි වන විටත් මෙම මධ්‍යස්ථානය භාවිතා කිරීමට පියවර ගෙන නොතිබුණි. |
| 08. | දිස්ත්‍රික් සැලැසුම් ලේකම් කාර්යාලයට අයත් වාහන 03 ක් වර්ෂ 10 කට අධික කාලයක සිට භාවිතයට ගෙන නොතිබුණි. | වාහන අපහරණය කිරීමට හෝ භාවිතයට ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය. | අළුත්වැඩියා කිරීම ඵලදායී නොවන බවට ලද නිර්දේශ මත අපහරණය කිරීමට කටයුතු කර ඇත. | 2022 පෙබරවාරි වන විටත් අපහරණය සඳහා කටයුතු කර නොතිබුණි. |
| 09. | වවුනියා උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමේදී ඉටු නොකළ වැඩ විෂයයන් 02 ක් සඳහා රු.223,200 ක් ගෙවා තිබුණි. එමෙන්ම, වැඩ බිමේ පැවැති අමුද්‍රව්‍ය සඳහා රු.3,338,560 ක් ගෙවා තිබුණ ද, එම තොග ප්‍රමාණ සම්බන්ධයෙන් නිසි වාර්තා පවත්වා නොතිබුණි. | ඉටු නොකළ කාර්යයන්ට කළ ගෙවීම් අයකරගත යුතු අතර අමුද්‍රව්‍ය තොග සඳහා විධිමත් වාර්තා නඩත්තු කළ යුතුය. | ඉටු නොකළ වැඩ විෂයයන්ගෙන් සමහර වැඩ කොටස් ඉටුකර ඇති අතර ඉතිරි වැඩ ඉටු කෙරෙමින් පවතී. | 2022 පෙබරවාරි දක්වාම වැඩිපුර කළ ගෙවීම් අයකර ගැනීමටත්, නිවැරදි තොග වාර්තා ඉදිරිපත් කිරීමටත් කටයුතු කර නොතිබුණි. |

මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

----------------------------------------

2018 - තත්ත්වාගණනය කළ මතය

2019 - තත්ත්වාගණනය කළ මතය

2020 - තත්ත්වාගණනය කළ මතය

| විගණකාධිපති වාර්තාවේ ඇතුළත් ප්‍රධාන අඩුපාඩු | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
| --- | --- | --- | --- |
| 01. මාන්තායි නැගෙනහිර, ඔඩ්ඩුසුඩාන්, තුනුක්කායි හා කරෙයිතුරෙයිපත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ක්‍රියාත්මක කළ එකතුව රු. මිලියන 183.9 ක් වූ නිවාස ඉදි කිරීම් 118 ක් ඉකුත් වර්ෂ 02 ත් වර්ෂ 06ත් අතර කාලයක සිට ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | මෙම නිවාස ඵලදායී ලෙස උපයෝජනය කිරීම සඳහා පියවර ගත යුතුය. | මෙම දෝෂ ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | මේ දක්වාම මෙම නිවාස ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. |
| 02. කැබ් රථ 07 ක්, ලොරි 02 ක් හා යතුරුපැදි 06 ක් පසුගිය වර්ෂ 01 ත් වර්ෂ 06 ත් අතර කාලයක් නිසි නඩත්තුවක්, අලුත්වැඩියාවක් නොමැතිව කාර්යාල පරිශ්‍රයේ රඳවා තිබුණි. | අලුත්වැඩියා හා නඩත්තු නිසි පරිදි ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ඉදිරිපත් කර නොතිබුණි. | 2022 පෙබරවාරි වනවිටත් මේ සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන නොතිබුණි. |
| 03. විදුලිජනක යන්ත්‍රයක් පසුගිය වර්ෂ 04 කට අධික කාලයක සිට ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. එය භාවිතා කිරීම වෙනුවට අවශ්‍ය මාසික සාමාන්‍යය විදුලි පරිභෝජනයට වඩා අධික කිලෝවොට් 502 ක විදුලි බල ශක්තියක් සහිත නව විදුලි ජනක යන්ත්‍රයක් රු.මිලියන 9.80 කට විදේශ | විදුලිජනක යන්ත්‍රය අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කල යුතු අතර විදුලිජනක යන්ත්‍රය තිබියදී අවශ්‍ය ධාරිතාවය ඉක්මවා ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය නොකර මිලදී ගැනීම | ඉදිරි අනාගතයේදි ක්‍රියාමාර්ග ගනු ලැබේ. | පැරණි යන්ත්‍රය ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.. |

| | | | | |
|---|---|---|---|---|
| | රටකින් (තුර්කිය) ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රියාවලිය ද අනුගමනය නොකර මිල දී ගෙන තිබුණි. | සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | | |
| 04. | සේවය අත්හිටවූ, විශ්‍රාම ගිය, සේවය අත්හැර ගිය හා මියගිය නිලධාරීන්ගේ සේවක ණය ශේෂ එකතුව රු.321,560 ක් අයකර ගැනීම සඳහා ආයතන සංග්‍රහයේ XXIV පරිශිෂ්ඨයේ 4 වගන්තිය ප්‍රකාරව පසුගිය වර්ෂ 05 සිට 26 ක කාලයක් දක්වා ඵලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හිඟ ණය නියමිත කාලපරිච්ඡේදය තුළ අයකර ගැනීමට පියවර ගතයුතු වේ. | නිලධාරීන් දෙදෙනෙකුගේ හිඟ ණය අයකරනු ලබන අතර අනෙකුත් නිලධාරීන්ගේ ණය ශේෂ පිළිබඳව අදාළ අමාත්‍යාංශ හා භාණ්ඩාගාරය වෙත විස්තර යවා ඇත. | එකතුව රු.223,057 ක ණය ශේෂ තවදුරටත් අයකළ යුතුව පවතී. |
| 05. | වී මිල දී ගැනීම සඳහා 2014 හා 2015 වර්ෂවල දී විවිධ සේවා සමූපකාර සමිති 02 කට ලබා දුන් රු.17,929,775 ක අත්තිකාරම් වර්ෂ 05 කට අධික කාලයක සිට නිරවුල් කර නොතිබුණි. | ලබාදී ඇති අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු කළ යුතුය. | ආපසු ලබාගැනීමේ කටයුතු අඛණ්ඩව සිදු කෙරෙමින් පවතී. | ලබාදුන් අත්තිකාරම් වලින් රු.17,829,785 ක ණය ශේෂ තවදුරටත් අයකළ යුතුව පවතී. |
| 06. | ඉදිකිරීම් පැහැර හරින ලද කොන්ත්‍රාත්තුවක් අවලංගු කර තිබුණ ද, එම කොන්ත්‍රාත්තුව සඳහා 2018 වර්ෂයේදී ලබාගත් රු.1,458,504 ක රැඳවුම් මුදල ආදායමට බැරකර නොතිබුණි. එමෙන්ම, වී මිල දී ගැනීම වෙනුවෙන් 2017 වර්ෂයේදී ලද | කොන්ත්‍රාත් අවලංගු කර තිබුණු කොන්ත්‍රාත්වලට අදාළ තැන්පතු ආදායමට ගතයුතු අතර ලබාගත් අත්තිකාරම් පියවීමට කටයුතු කළ යුතුය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරමින් පවතී. | 2022 පෙබරවාරි දක්වාම නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | රු.1,800,000 ක් නිරවුල් කිරීමට මේ දක්වා පියවර ගෙන නොතිබුණි. | | | |
| 07. | තුනුක්කායි සහ පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට 2019 වර්ෂයේදී ලබා දුන් ජල බවුසර් 02 ක් මේ දක්වාම භාවිතයට ගෙන නොතිබුණි. මෙම වාහනවලට අදාළ රක්ෂණ සහතික සහ ආදායම් බලපත්‍ර විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | අරමුණු සඳහා භාවිතා කිරීමටත්, ආදායම් බලපත්‍රය සහ රක්ෂණ සහතිකය ලබාගැනීමටත් පියවර ගත යුතුය. | අළුත්වැඩියා කිරීමටත් ආදායම් බලපත්‍ර හා රක්ෂණ සහතික ලබා ගැනීමටත් පියවර ගෙන ඇත. | අවශ්‍ය කටයුතු මේ දක්වාම ඉටුකර නොතිබුණි. |

**මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

-----------------------------------------

2018 - තත්ත්වාගණනය කළ මතය

2019 - තත්ත්වාගණනය කළ මතය

2020 - තත්ත්වාගණනය කළ මතය

| විගණකාධිපති වාර්තාවේ ඇතුළත් ප්‍රධාන අඩුපාඩු | | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 01. | රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයාගේ හා උතුරු පළාත් ආණ්ඩුකාරවරයාගේ උපදෙස්වලට පටහැනිව මාන්තායි බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ප්‍රතිලාභීන් 08 දෙනෙකුට පශු සම්පත් ලබා දිය යුතු වුවත්, ඒ වෙනුවට රු. 685,000ක් මුදල් ගෙවා තිබුණි. | අදාළ චක්‍රලේඛ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතු අතර ඊට පටහැනිව ක්‍රියාකිරීම සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශවයන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය. | අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී මෙවැනි දෝෂ වලකාලීමට කටයුතු කරනු ලැබේ. | විගණන කමිටුවේ තීරණය පරිදි විමර්ශන කමිටුවක් ස්ථාපනය කිරීමට තීරණය කර තිබුණ ද, 2022 පෙබරවාරි දක්වාම එහි ප්‍රගතියක් නොවුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 02. | මාන්තායි බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මිල ගණන් තීරණය නොකර, රු.11,900,000කට ගවයන් මිල දී ගෙන තිබුණි. | අදාළ චක්‍රලේඛ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතුය. | - එම - | - එම - |
| 03. | මාන්තායි බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.199,800 කට ද, නානාට්ටාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.2,160,000 කට ද, මිල ගණන් තීරණය නොකොට එළුවන් මිල දී ගෙන තිබුණි. | අදාළ චක්‍රලේඛ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතුය. | - එම - | - **එම -** |
| 04. | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 හා 8.9.1(ආ) මාර්ගෝපදේශවලට පටහැනිව, පිළිවෙලින් අනුමත සීමාව ඉක්මවා රු.මිලියන 22 ක පශු සම්පත් මිල දී ගැනීමටත්, ගිවිසුම්වලට නොඑළැඹීමටත් නානාට්ටාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කටයුතු කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කර ගිවිසුම්වලට එළඹීමට කටයුතු කළ යුතුය. | ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ දැනුම ලබා දී මෙවැනි දෝෂ වළක්වා ගැනීමට කටයුතු කෙරේ. | මාර්ගෝපදේශවලට අනුව කටයුතු නොකිරීමට හේතු විමර්ශනය කර අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. |
| 05. | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශයට පටහැනිව, රු. මිලියන 10 ක අනුමත සීමාව ඉක්මවා | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුව කටයුතු කළ යුතුය. | ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ දැනුම ලබා දී මෙවැනි දෝෂ වළක්වා ගැනීමට කටයුතු කෙරේ. | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| | රු.15,499,800 ක පශු සම්පත් සහ අනෙකුත් මිලදී ගැනීම් සිදු කිරීමට මාන්තායි බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය කටයුතු කර තිබුණි. | | | |
| 06. | මුරුංගන් රජයේ පශු වෛද්‍ය අධිකාරීවරයා විසින් කිරි ගවයින් 151 දෙනෙකු රු.13,212,500 කට මිල දී ගෙන තිබුණ ද, ඒ සඳහා මිල ගණන් තීරණය කර නොතිබුණි. නානාට්ටාන්, මුසලි පශු සම්පත් අභිජනන සංගමයේ නමට චෙක්පත් ලියා ගෙවීම් සිදු කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුව කටයුතු කළ යුතුය. | ක්‍රියාමාර්ග ගෙන ඇත. යථා කාලයේදී පිළිතුරු ලබාදෙනු ලැබේ. | විගණන කමිටුවේ තීරණය පරිදි විමර්ශන කමිටුවක් ස්ථාපනය කිරීමට තීරණය කර තිබුණ ද, 2022 පෙබරවාරි දක්වාම එහි ප්‍රගතියක් නොවුණි. |
| 07. | මුරුංගන් රජයේ පශු වෛද්‍ය අධිකාරිවරයාගේ උපදෙස් අනුව, ඔහුගේ සේවකයන් තිදෙනෙකුගේ නමින් රු.7,525,000 ක චෙක්පත් ලියා ඔවුන් මගින් ඒවා මුදල් කරගෙන තිබුණි. | සැපයුම්කරුගේ නමට සෘජුවම චෙක්පත් ලිවිය යුතු අතර සේවකයින්ගේ නමට චෙක්පත් ලිවීම සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශවයන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගතයුතුය. | - එම - | - **එම -** |
| 08. | ප්‍රතිලාභීන් 07 දෙනෙකුගේ නමින් රු.4,025,000 ක චෙක්පත් ලියා, මුරුංගන් රජයේ පශු වෛද්‍යවරයා විසින් මුදල් ලබාගෙන තිබුණි. | ප්‍රතිලාභීන්ගේ නමට චෙක්පත් ලිවිය නොහැකි අතර සැපයුම්කරු වෙත පමණක් චෙක්පත් | - එම - | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| | | සෘජුවම ලිවිය යුතුය. | | |
| 09. | මාන්තායි බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පශු සම්පත් මිල දී ගැනීම සඳහා නානාට්ටාන්, මුසලි පශු සම්පත් සමූපකාර සමිතියට 2016 වර්ෂයේදී ගෙවීම් සිදු කළ බවට දැක්වුවද, මාන්තායි බටහිර පශු වෛද්‍යවරයාගේ පෞද්ගලික නමට රු.2,206,750ක චෙක්පත් ලියා තිබුණි. | සැපයුම්කරු වෙත පමණක් චෙක්පත් සෘජුවම ලිවිය යුතු අතර පෞද්ගලික නමට චෙක්පත් ලියා ගෙවීම් කිරීම සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශවයන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතුය. | - එම - | - එම- |
| 10. | සැපයුම්කරුගේ නමට සෘජුව චෙක්පත් ලිවිය යුතු වුවත්, පශු වෛද්‍ය අධිකාරීවරයාගේ නමට 2016 පෙබරවාරි 28 දින රු.318,000 ක් තැන්පත් කර තිබුණු බව තැන්පතු රිසිට්පත මඟින් තහවුරු වී තිබුණි. | සැපයුම්කරුගේ නමට පමණක් චෙක්පත් ලිවිය යුතුය. තවද, විධිමත් විමර්ශනයක් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු යුතුය. | - එම - | - එම - |
| 11. | මාන්තායි බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කළමනාකරණ සහකරුවෙකු විසින් එකතුව රු.2,516,812 ක චෙක්පත් 121 ක් 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුළ වංචනිකව ලබා ගෙන තිබුණි. | වංචාව සම්බන්ධයෙන් පරීක්ෂා කර වගකිවයුතු පාර්ශවයන්ට එරෙහිව වහාම ක්‍රියාමාර්ග ගත යුතුය. | මූලික පරීක්ෂණ ආරම්භ කර ඇත. අමාත්‍යාංශයෙන් උපදෙස් ලද වහාම වැඩිදුර ක්‍රියාමාර්ග ගනු ලැබේ. | වර්තමාන තත්ත්වය පිළිබඳ තහවුරු කිරීම් ඉදිරිපත් නොවුණි. |
| 12. | එරික්කලම්පිටිය මුහුදු මාර්ගය සහ එරික්කලම්පිටිය | විධිමත් විමර්ශනයන් සිදු කර වැඩිපුර | විමර්ශන සිදු කර වැඩිපුර ගෙවීම් අයකර | වැඩිපුර ගෙවීම් අයකර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ආමෙයිපඩුක්කෙයි පඩගුතුරෙයි මාර්ගය ඉදි කිරීමේදී මන්නාරම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.1,674,732 ක් වැඩිපුර ගෙවා තිබුණි. | ගෙවීම් අය කළ යුතුය. | ගැනීමට කටයුතු කෙරේ. | |
| 13. | සමාලෝචිත වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 ක පිහිටි එකතුව රු.334,900,000 ක් වූ නිවාස සංකීර්ණ 33 ක් එකී නිවාස අයිතිකරුවන් විසින් නඩත්තු නොකිරීම, ඔවුන් වෙනත් ස්ථානවල පදිංචිව සිටීම, නුසුදුසු පහත් බිම්වල නිවාස ඉදිකර තිබීම යනාදී හේතු මත වර්ෂ 01ත් වර්ෂ 09ත් අතර කාලයක සිට නිෂ්කාර්යව හානියට පත් වී තිබුණි. | මෙම නිවාස භාවිතා නොකිරීම සම්බන්ධයෙන් පවතින තත්වය පරීක්ෂා කර නිෂ්ක්‍රීය හා හානියට පත්වීම සම්බන්ධයෙනි අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | විවිධ වූ පුද්ගලික හේතු කාරණා නිසා අදාළ ඉඩම්වල පදිංචි වී නොතිබුණි. | 2022 පෙබරවාරි වනවිටත් පවතින ගැටලුවලට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණ අතර නිවාස නිෂ්ක්‍රීයව පැවතුණි. |
| 14. | මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක භාවිතයේ හා පාලනයේ පවතින එකතුව රු.30,358,345 ක් වටිනා ගොඩනැගිලි, හා යන්ත්‍ර ඒකක 17 ක් වර්ෂ 02ත් වර්ෂ 07ත් අතර කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි. | මෙම ගොඩනැගිලි උපයෝජනය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගතයුතුය. | ගොඩනැගිලි අලුත්වැඩියා කර මූලික පහසුකම් ලබා දී මුළුමනින්ම උපයෝජනය කිරීමට පියවර ගෙන ඇත. | 2022 පෙබරවාරි වනවිටත් ගොඩනැගිලි නිෂ්කාර්යව පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| 15. | මුසලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සිලාවතුර ගම්මානයේ රජයේ ඉඩම්, ප්‍රතිලාභීන් 18 දෙනෙකුට ලබාදීමට අනුමත කර පසුව එම ඉල්ලීම් කිසිඳු හේතුවකින් තොරව ප්‍රතික්ෂේප කොට පුද්ගලික ආයතනයට ජල ජීවී අභිජනනය සඳහා දිගුකාලීන බදු පදනමින් ලබා දී තිබුණි. | විමර්ශන සිදු කර ප්‍රතිලාභීන්ට සහන සැලසිය යුතුය. | මූලික විමර්ශන සිදු කර අමාත්‍යාංශය දැනුවත් කර ඇත. | 2022 පෙබරවාරි දක්වාම මෙම ගැටළුව විසඳී නොතිබුණි**.** |
| 16. | මන්තායි බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ශාන්ත තෝමස් ක්‍රීඩා පිටිය ප්‍රතිසංස්කරණයේ කටයුතු ඉටු නොවීම නිසා ගෙවූ රු.96,955ක අත්තිකාරම නිෂ්ඵල වියදමක් වී තිබුණු අතර ඒ සඳහා මිල දී ගත් රු. 388,040 ක ක්‍රීඩා උපකරණ අනාර්ථික වියදමක් වී තිබුණි. | කොන්ත්‍රාත් වැඩ නියමිත කාල සීමාව තුළ නිම කළ යුතුය. | අයකර ගැනීමට පියවර ගෙන තිබුණි. | 2022 පෙබරවාරි වනවිටත් මේ සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන නොතිබුණි. |
| 17. | මන්තායි බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2017 වර්ෂයේදී මහජන ශාලාවක් ඉදිකිරීමට රු.495,000 ක් ගෙවා තිබුණද, එම ඉදි කිරීම් නිමකර නොතිබුණු නිසා වැය කළ මුදල නිෂ්ඵල වියදමක් වී තිබුණි. | නියමිත කාල සීමාව තුළ වැඩ නිම කර එය භාවිතා කිරීමට පියවර ගත යුතුය. | මූල්‍ය ප්‍රතිපාදන ලද විගස වැඩ නිම කරනු ඇත. | - එම - |
| 18. | කාර්යය නිම කළ බවට වූ වාර්තා (Completion Report) | මුදල් රෙගුලාසි 780 අනුව කටයුතු කළ | තාක්ෂණික නිලධාරිගේ අධික | 2022 පෙබරවාරි වනවිටත් කාර්යය |

| | | | | |
|---|---|---|---|---|
| | සකස් කර නොතිබුණු බැවින් එකතුව රු.3,914,565කට අදාළ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සනාථ කිරීමට නොහැකි විය. | යුතුය. | කාර්ය බහුලත්වය මෙයට හේතු වී තිබුණි. | නිම කළ බවට වූ වාර්තා විගණනය වෙත ඉදිරිපත් නොවීය. |
| 19. | අංක 08/2019 හා 2019 මාර්තු 27 දිනැති ස්වදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛයට පටහැනිව, දිස්ත්‍රික් ලේකම්වරයා විසින් 2019 මැයි මාසයේ සිට 2020 අගෝස්තු මාසය දක්වා කාලය වෙනුවෙන් අනුමත සීමාව ඉක්මවා රු.260,119ක් සංග්‍රහ වියදම් දීමනා ලෙස ලබාගෙන තිබුණි. | මාසික සංග්‍රහ දීමනාවට අමතරව සිදුකළ ගෙවීම් අදාළ නිලධාරියාගෙන් අය කළ යුතු ය. | රැස්වීම් පැවැත්වීම බහුල වීම හේතුවෙන් අමතර වියදම් ඇති විය. | සංග්‍රහ දීමනාවට අමතරව ලබාගත් මුදල අයකර නොතිබුණි. |
| 20. | අංක 11/2006 හා 2006 ජූලි 14 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3(ix) වගන්තියට අනුකූලව දිස්ත්‍රික් ලේකම්වරයා විසින් 2019 ජනවාරි සිට 2020 අගෝස්තු මාසය දක්වා කාලය තුළ මාසික ඉන්ධන දීමනා ලෙස රු.470,045 ක් ලබාගෙන තිබුණි. එහෙත්, ඊට අමතරව හා එම චක්‍රලේඛයට පටහැනිව, රජයේ ඉන්ධන ඇණවුම් මගින් ද රු.444,875 ක ඉන්ධන ලබා ගෙන තිබුණි. | චක්‍රලේඛයට පටහැනිව ගෙවනලද ඉන්ධන වියදම් නිලධාරියාගෙන් අයකර ගත යුතුය. | පැවැති වසංගත තත්ත්වය, කොළඹ පැවැති අමතර රැස්වීම් ආදී කරුණු මත අමතර ඉන්ධන ලබා දී තිබුණි. | 2022 පෙබරවාරි වනවිටත් එම මුදල් අයකර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 21. | වර්ෂ 02 ක් ඉක්මවූ එකතුව රු.1,585,834 ක් වූ කොන්ත්‍රාත් වෙනුවෙන් රඳවාගත් තැන්පතු 20 ක් පොදු තැන්පත් ගිණුමේ ශේෂව පැවතිණි. | තැන්පතු ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට පියවර ගැනීම. | රඳවා ගැනීමේ තැන්පතු ආපසු ගෙවීමට හෝ රජයේ ආදායමට මාරු කිරීමට කටයුතු කරමින් පවතී. | 2022 පෙබරවාරි වනවිටත් ශේෂ නිරවුල් කර නොතිබුණි. |
| 22. | එකතු කළ අගය මත බදු ගෙවීම සඳහා ලියාපදිංචි නොවුණු කොන්ත්‍රාත්කරුවන් වෙනුවෙන් එම බදු ගෙවිය යුතු බව සලකා රු.425,752 ක බදු මුදල් තැන්පතු ගිණුමට බැර කර තිබුණි. ප්‍රමාණවත් කාලයක් ගත වී තිබුණ ද, ඒවා නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි. | ලියාපදිංචි නොවුණු කොන්ත්‍රාත්කරුවන් සඳහා බදු හිමිකමක් නොමැති බැවින් එම මුදල් රජයේ ආදායමට බැර කිරීමට පියවර ගත යුතුය. | බදු සඳහා ලියාපදිංචි වීම් ලබාගෙන ඉදිරිපත් කිරීමට හිමිකරුට උපදෙස් ලබා දී ඇත. | බදු සඳහා ලියාපදිංචි වී නොමැති කාලයට අදාල වූ බදු මුදල් ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| 23. | ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 10 ක් වූ මාර්ගයක ඉදි කිරීම් 2019 නොවැම්බර් මාසයේ දී නිම කළ යුතු ව තිබුණ ද, 2021 මාර්තු මාසය දක්වාම එය නිමකර නොතිබුණි. මේ සඳහා දින දීර්ඝ කිරීම් ද ඉල්ලා නොතිබුණු බැවින් හා ගිවිසුම්ගත පරිදි කාර්යයන් ඉටු නොවීම නිසා ගිවිසුම අවලංගු කර කාර්යසාධන බැඳුම්කරය රජයේ ආදායමට බැර කිරීමට අප්‍රමාදව තීරණයක් ගෙන නොතිබුණි. ඒ හේතුවෙන් එම | රජයේ අරමුදල්වලට කිසිදු පාඩුවක් නොවන පරිදි නියමිත කාලය තුල එම ඉදි කිරීම් කාර්යයන් නිම කළ යුතු අතර එසේ නොකිරීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමට ක්‍රියා නොකළ වගකිවයුතු පාර්ශවයන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය. | මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් විමර්ශන කමිටුවක් ස්ථාපිත කර ඇත. කමිටු වාර්තාව අනුව ක්‍රියාමාර්ග ගෙන ඉදිරි කාලයේදි පිළිතුරු ලබාදෙනු ලැබේ. | විමර්ශනය අවසාන කර තිබුණ ද, 2022 පෙබරවාරි වනවිටත් අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | බැඳුම්කරය කොන්ත්‍රාත්කරු විසින් නිදහස් කරගෙන තිබුණි. වැඩබිමට ගෙන ආ අමුද්‍රව්‍ය වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට ගෙවීම් කළ ද, ආරක්ෂා කර ගැනීම සඳහා නිශ්චිත වැඩපිළිවෙලක් නොතිබීම හේතුවෙන් ඒවා අස්ථාන ගත වෙමින් හා විනාශ වෙමින් පැවතිණි. අත්හැර දමා ඇති මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් වූ කාර්යසාධන බැඳුම්කර වටිනාකම, අමුද්‍රව්‍ය පිරිවැය හා කොන්ත්‍රාත්කරුට කළ ගෙවීම් ලෙස එකතුව රු.1,995,318 ක පාඩුවක් රජයට සිදු වී තිබුණි. | | | |
| 24. | එකතුව රු. 1,371,155 ක් වූ ගෙවීම් 49 ක් හඳුනාගත නොහැකිව 2015 වර්ෂයේ සිට පවතින නමුත් ඒවා හඳුනාගෙන නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි. | විමර්ශනය කඩිනමින් අවසන් කර සුදුසු පියවර ගත යුතුය. | මේ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කිරීමට පියවර ගෙන ඇත. | මූලික විමර්ශන අවසාන කර චෝදනා පත්‍ර ලබා දී තිබුණි. |

**පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

----------------------------------------

2018 - තත්ත්වාගණනය කළ මතය

2019 - තත්ත්වාගණනය කළ මතය

2020 - තත්ත්වාගණනය කළ මතය

| විගණකාධිපති වාර්තාවේ ඇතුළත් ප්‍රධාන අඩුපාඩු | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|

| | | | | |
|---|---|---|---|---|
| | ------------------------------------ | ---------------------- | ------------------------- | ---------------------- |
| 01. | වාහන අනතුරු 19 කට අදාල වූ ලිපිගොනු දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නොතිබීම නිසා එකතුව රු.1,318,233 ක අලාභහානි පිළිබඳ සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | විධිමත් පරීක්ෂණයක් පවත්වා වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | අදාල ලිපිගොනු පිළිබදව සොයා බැලීමට කමිටුවක් පත්කර ඇත. | 2022 පෙබරවාරි වනවිටත් අදාල පරීක්ෂණ සිදුකර නැත |
| 02. | දිස්ත්‍රික් ලේකම් භාරයේ ඇති නිල නිවාස 71 න් නිල නිවාස 10 ක් භාවිතයට නුසුදුසු තත්ත්වයේ පැවති නමුත්, ඒ සම්බන්ධව විධිමත් ක්‍රියාමාර්ගයක් නොගැනීම නිසා ඒවා විනාශයට භාජනය වෙමින් නිශ්ක්‍රීයව තිබුණි. | නිල නිවාසවල පවතින අඩුපාඩු සකස්කර ඒවා ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | ප්‍රතිපාදන ලැබුණ සැනින් මෙම නිල නිවාස කඩා ඉවත් කිරීමට කටයුතු කෙරේ. | 2022 පෙබරවාරි වනවිටත්, නිළ නිවාස කඩා ඉවත් කිරීම හෝ අලුත්වැඩියා කටයුතු නිමකර නොමැත. |
| 03. | සමාජසේවා දෙපාර්තමේන්තුව මඟින් පුත්තලම ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ ආබාධිත 79 දෙනෙකු සඳහා 2018 වර්ෂයේ දී ආබාධිත දීමනා (ජීවනාධාර) ලෙස රු.2,844,000 ක් ගෙවා තිබුණි. නමුත්, සත්‍ය වශයෙන් තවත් ආබාධිත පුරවැසියන් 66 දෙනෙකු සඳහා ආබාධිත ජීවනාධාරය ලබාදෙන ලෙස ඉල්ලීම් කර පොරොත්තු ලේඛන ගතවී ඇත. | මහජන අවශ්‍යතා කඩිනමින් සපුරාලීමට අවශ්‍ය විධිවිධාන යෙදිය යුතුය. | පොරොත්තු ලේඛන ගතව දැනට 66 දෙනෙකු සුදුසුකම් ලබා සිටිය ද ප්‍රතිපාදන නොමැති බැවින්, එම ප්‍රතිලාභීන් වෙත ගෙවීම් කිරීමට නොහැකි වී ඇත. අවශ්‍ය ප්‍රතිපාදන ලබාගැනීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. | මෙම තත්ත්වය සෑම වර්ෂයකම නිරීක්ෂණය වේ. |
| 04. | 2019 ගම්පෙරළිය වැඩසටහන යටතේ මහවැව | ව්‍යාපෘති සඳහා රජයේ මුදල් වැය | විශාලත්වය අක්කර 47 ක් වන අතර අදාල | මේ වනවිට මෙම වැව ජලජ ශාකවලින් පිරී |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කුඩාවැවෙන් ජලජ ශාක ඉවත් කිරීම සඳහා රු.1,923,000 ක කලවැඩ වටිනාකමකට මුදල් ගෙවා තිබූ මුත්, 2020 ජනවාරි 04 දින විගණන පරීක්ෂාවට අනුව වැවෙහි විශාල ප්‍රදේශයක සැල්වීනියා වැසී ජලජ ශාක වර්ධනය වී තිබීමෙන් දරන ලද වියදම නිශ්කාර්ය වී තිබුණි. | කිරීමේ දී උපරිම ඵලදාවක් ජනතාවට ලැබෙන පරිදි කටයුතු කළ යුතුය. | ඇස්තමේන්තුව අනුව අක්කර 17 ක ජලජ ශාක ඉවත් කිරීම සිදු කළ යුතු වුවත් අක්කර 20 ක ජලජ ශාක ඉවත් කර ඇත. | පවතී. |
| 05. | 2014 වර්ෂයේ ක්‍රියාත්මක කල දැයට කිරුළ වැඩසටහන යටතේ ඉදිකල නවගත්තේගම රංග ශාලාව නිසි පරිදි ප්‍රයෝජනයට ගැනීමට අදාල බලප්‍රදේශයේ පළාත් පාලන ආයතනයට පවරා දිය යුතු බව තීරණය කර තිබූ නමුත්, එසේ නොකිරීමෙන් අදාල රංග ශාලාව නිශ්කාර්යව විනාශ වෙමින් පැවතුණි. | අදාල පළාත් පාලන ආයතනයට පවරා ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. | නවගත්තේගම රංග ශාලාව පිහිටි ඉඩම ප්‍රාදේශීය සභාවට පවරාදීමට අදාලව පිඹුර (රේඛා චිත්‍රය) ලබා ගැනීම සඳහා කටයුතු කර ඇත. | 2022 පෙබරවාරි වනවිට ද මෙම රංග ශාලාව නිෂ්කාර්යව විනාශවෙමින් පවතී |
| 06. | හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 30 දෙනෙකුගේ නිවෙස් වෙත විදුලිය ලබාදීම සඳහා එක් ප්‍රතිලාභියෙකුට රු.20,000 ක් බැඟින් ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර, ගම්පෙරළිය වැඩසටහන යටතේ නිවාස | නිවැරදිව ප්‍රතිලාභ හදුනාගෙන ප්‍රාදේශීය සංවර්ධනයට වෙන්කල මුදල්වලින් උපරිම ඵලප්‍රයෝජන ලබාගැනීමට කටයුතු කළ යුතුය. | නිවාස ආධාර ලාභී 46 දෙනාම නිවස ඉදිකිරීම 2019.12.31 වන දින වන විට නිම කර ගැනීමට නොහැකි බව පවසා ආධාර මුදල් ලබා ගැනීම ප්‍රතික්ෂේප කර | මෙම තත්ත්වයන් වර්තමානයේද නිරීක්ෂණය වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | ආධාර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී එක් ප්‍රතිලාභියෙකුට රු.100,000 ක් බැගින් ප්‍රතිලාභීන් 46 දෙනෙකු සඳහා 2019 වර්ෂයේ රු.4,600,000 ක ආධාර මුදල් අනුමත වී තිබුණ ද, ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ ක්‍රියාවලියේ තිබූ අඩුපාඩු හේතුවෙන් එකී ආධාර අවශ්‍යම පුද්ගලයන් හඳුනා නොගැනීම නිසා එම ව්‍යාපෘති ක්‍රියාත්මක වී නොතිබුණි. | | ඇත. මුදල් අමාත්‍යාංශයේ භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කරන ලද අංක BD/GPS 155/09/01/HA-2019 හා 2019.11.20 දිනැති ලිපිය මඟින් දැනට වැඩ ආරම්භ කර නොමැති සියළුම ව්‍යාපෘති නැවත දන්වන තෙක් අත්හිටුවීම නිසා මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | |
| 07. | මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2019 අයවැය යෝජනා අනුව 2019 සැප්තැම්බර් 30 දිනට පූර්වයෙන් අනුමත වූ ව්‍යාපෘති 33 ක් 2019 වර්ෂයේ ක්‍රියාත්මක කර නොතිබුණි. | ප්‍රාදේශීය සංවර්ධනයට වෙන්කල මුදල්වලින් උපරිම ඵලප්‍රයෝජන ලබාගැනීමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදී වෙන්කරන මුදල්වලින් උපරිම ප්‍රයෝජන ලබාගැනීමට හැකිවන පරිදි ව්‍යාපෘති සලසුම් කරමි. | මෙම තත්ත්වයන් වර්තමානයේද නිරීක්ෂණය වේ. |
| 08. | මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 557 සී තඹගල්ල බටහිර ග්‍රාම නිලධාරී වසමේ සුභසෙත ප්‍රජාමූල සංවිධානය මඟින් ක්‍රියාත්මක කර තිබූ ජල ව්‍යාපෘතිය සඳහා 2014, 2015 සහ 2017 වර්ෂවල රු.2,674,434 ක මුදලක් වැයකර තිබූ නමුත්, | ව්‍යාපෘති සඳහා රජයේ මුදල් වැය කිරීමේ දී උපරිම ඵලදාවක් ජනතාවට ලැබෙන පරිදි කටයුතු කළයුතුය. | ඉදිරියේදී වෙන්කරන මුදල්වලින් උපරිම ප්‍රයෝජන ලබාගැනීමට හැකිවන පරිදි ව්‍යාපෘති සලසුම් කරමි. | 2022 පෙබරවාරි වනවිටත්, මෙම ගැටලුව නිරාකරණය වී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | දෙපාර්ශවයක් අතර ඇති වූ ගැටළුවක් නිසා අධිකරණ ක්‍රියාමාර්ගයකට යොමුව තිබීම 2019 වර්ෂය අවසාන වනවිටත්, උක්ත ව්‍යාපෘතියේ වැඩ අවසන් කිරීමට නොහැකි වී තිබුණි. | | | |
| 09. | මහකුඹුක්කඩවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංචිත වාහනය ඉතා අබලන් තත්ත්වයේ පවතින අතර, එය නිසි පරිදි අළුත්වැඩියා කර ධාවනය සඳහා කටයුතු කර නොතිබුණි. ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් ලද ට්‍රැක්ටර් රථය හා ජල බවුසරය නිසි පරිදි ප්‍රයෝජනයට නොගැනීමෙන් නිශ්කාර්යව දිරාපත් වෙමින් පැවතුණි. | රජයේ දේපල නිසි අයුරින් ප්‍රයෝජනයට ගත යුතුය. | ට්‍රැක්ටර් බවුසර්වල ටැංකි දෙක අව්වට හා වැස්සට නිරාවරණය වන පරිද්දෙන් ගාල් කර ඇත්තේ ඒවා ගාල් කිරීමට ආරක්ෂිත ස්ථානයක් නොමැති බැවිනි. රථගාල් ඉදිකිරීමට ප්‍රතිපාදන ඉල්ලා ඇත. | 2022 පෙබරවාරි වනවිටත් ගැටලුව නිරාකරණය වී නොමැත. |
| 10. | ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් නියඟයෙන් පීඩාවට පත් ජනතාවට පානීය ජලය බෙදාහැරීම සඳහා ලබාදෙන ලද ට්‍රැක්ටර්, බවුසර් සහ ලොරි බවුසර් පිළිවෙලින් 25 ක්, 09 ක් සහ 08 ක් ලෙස එකතුව රථ 42 ක් ලබාදී තිබූ | අදාල වාහන පවරාගෙන ගිණුම් ගතකල යුතුය. | පුත්තලම් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත පවරාගෙන ඇති වාහන සියල්ල 2020 වර්ෂය වන විට ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත. ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් ලබාදුන් වාහන මෙතෙක් පවරා නොමැති බැවින්, | 2022 පෙබරවාරි වනවිටත් මෙම ගැටලුව සම්පූර්ණයෙන්ම නිරාකරණය වී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | අතර, එම බවුසර් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට පවරාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | | පවරා ගැනීමට කටයුතු කරමින් පවතී. | |
| 11. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල පහක වර්ෂ දෙකකට වැඩි කාල පරිච්ඡේදයක් කිසිදු ප්‍රයෝජනයකට ගෙන නොතිබූ රු.5,650,000 ක් වටිනාකමැති වාහන 11 ක් වෙන්දේසියේ විකිණීමට හෝ කිසිදු ප්‍රයෝජනයකට ගත නොහැකි නම් මුදල් රෙගුලාසි ප්‍රකාරව පොත්වලින් කපා හැරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | වර්ෂ දෙකකට වැඩි කාලයක් නිෂ්ක්‍රියව පැවති වාහන පවරා ගැනීමේ කටයුතු සඳහා මුදල් අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. | - එම - |
| 12. | ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගම්පෙරළිය කඩිනම් වැඩසටහන යටතේ ග්‍රාමීය මාර්ග බොරළු දමා සංවර්ධනය කිරීමේ දී බොරළු ලබාගැනීම සම්බන්ධයෙන් අධි ඇස්තමේන්තු පිළියෙල කිරීම නිසා අවස්ථා 42 ක දී රු.3,667,149 ක් වැඩිපුර ගෙවා තිබුණි. | නියමිත වැඩ විෂයයට අනුව නිවැරදිව ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කර ගෙවීම් කළයුතු අතර නිසි වෘත්තීය සැළකිල්ලකින් තොරව ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කිරීමෙන් සිදුවී ඇති සම්පූර්ණ පාඩුව වගකිව යුතු පාර්ශවයන්ගෙන් ආපසු අයකර ගත යුතුය. | මේ සම්බන්ධයෙන් පරීක්ෂා කර වාර්තා කිරීමට මවිසින් පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරුතුමාගේ සභාපතීත්වයෙන් ත්‍රි පුද්ගල විමර්ශන කමිටුවක් පත්කර ඇත. එම වාර්තාව ලද පසු අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. | මුදල් ආපසු අයකර ගැනීමට තීරණය කර තිබුණ ද, 2022 පෙබරවාරි වනවිටත් මුදල් ආපසු අයවීම සම්පූර්ණ වී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| 13. | මහකුඹුක්කඩවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්තව සේවය කල ග්‍රාම නිලධාරී වරයෙකු අල්ලස් ලබා ගැනීම හේතුවෙන් සේවය අත්හිටුවා අධිකරණ ක්‍රියාමාර්ග ගෙන තිබූ නමුත්, ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII පරිච්ඡේදය 27.11 වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තු පරීක්ෂණයක් වෙනම පවත්වා වැරදි හෝ නිවැරදි කර නිශ්චය කලයුතු වුවත්, එසේ සිදුකර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ විධි විධානවලට අනුකූලව කටයුතු කළයුතුය. | දෙපාර්තමේන්තු පරීක්ෂණය සිදු කිරීමට අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇත. | 2022 පෙබරවාරි වනවිටත් පරීක්ෂණයක් සිදුකර නොමැත. |
| 14. | 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත යටතේ පස්, බොරළු සහ වැලි කැපීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ බලය භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මඟින් සිදුවන අතර, බලපත්‍ර නිකුත් කිරිමට පෙර කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් නිර්දේශ කර නොතිබූ අවස්ථාවක විවිධ ආයතනවල අනුමැතිය යටතේ පස් බොරළු සහ වැලි නීති විරෝධීව කැපීම් සිදුකර තිබුණි. | නීති විරෝධීව සිදුවන පස් බොරළු හා වැලි කැනීම් කටයුතු පාලනය සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මඟින් නිකුත් කරන බලපත්‍ර සම්බන්ධව ප්‍රාදේශීය ලේකම් දැනුවත් කළයුතුය. | ප්‍රාදේශීය ලේකම්වරුගෙන් නිර්දේශ නොසළකා කැණීම් බලපත්‍ර ලබාදීම සම්බන්ධයෙන් අදාල අමාත්‍යාංශ ලේකම් දැනුවත් කිරීමට කටයුතු කරමි. | ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ නිර්දේශ නොසළකා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය බලපත්‍ර නිකුත් කරන බව නිරීක්ෂණය විය. |
| 15. | තැන්පත් කළ දින සිට වසර දෙක ඉක්ම වූ තැන්පතු ගිණුම් වර්ග 07 කට අදාල එකතු | තැන්පත් කළ දින සිට වසර දෙක ඉක්ම වූ තැන්පත් | ඉදිරි වර්ෂය තුළ නිරවුල් කිරීමට කටයුතු කරනු ලබන | 2022 පෙබරවාරි වන විටත් නිරවුල් කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | වටිනාකම රු.50,679,629 ක් වූ පොදු තැන්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කළයුතුය. | බව. | |
| 16. | ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනයක් කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ස්ථාපිත කිරීම සඳහා 2019 වර්ෂයේ ගම්පෙරළිය වැඩසටහන යටතේ 2019 ඔක්තෝබර් 15 දින ප්‍රවේශ මාර්ගයට බොරළු දැමීමට රු.1,374,333 ක් ද, 2019 නොවැම්බර් 29 දින උක්ත ස්ථානය එළිපෙහෙළි කිරීම සඳහා රු.251,991 ක් ද, වැයකර තිබුණි. එනමුත් එකී කර්මාන්තය ඉදිකිරීම සඳහා නිශ්චිත සැලසුම් නොතිබිය දී ඒ සඳහා ගම්පෙරළිය වැඩ සටහනින් උක්ත මුදල් වියදම් කර තිබූ අතර, ඉන්පසු කිසිදු ඉදිරි කටයුත්තක් සිදුනොවීම නිසා අදාල ප්‍රදේශය නැවත වල් බිහි වී තිබුණු බැවින්, වැයකර තිබූ සම්පූර්ණ මුදල ම නිශ්කාර්ය වියදම් වී තිබුණි. | මේ සම්බන්ධව වගකිව යුතු පාර්ශව දැනුවත් කිරීමට කටයුතු කළ යුතුය. | යෝජිත විශ්ව විද්‍යාලය හා ගුරු අභ්‍යාස විද්‍යාලය ඉදිකිරීම් භූමියේ පිවිසුම් මාර්ග තැනීම හා ඉඩම වෙන්ව හදුනා ගැනීමේ අවශ්‍යතාවය මත එවකට පැවති රජයේ සැලසුම් මත මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කළ අතර, ඉදිකිරීම් කටයුතු සම්බන්ධ වගකීම ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනය සතු බවත්, එය මාගේ රාජකාරි වපසරියෙන් බැහැර පවතින බව කාරුණිකව පෙන්වා දෙමි. | යෝජිත විශ්ව විද්‍යාලය ඉදිකිරීම සිදු නොවන බව දන්වා ඇති අතර, වෙනත් ව්‍යාපෘතියක් සඳහා ප්‍රාදේශීය සංවර්ධන කමිටුව අනුමැතිය දී ඇති බව දන්වා ඇත. |
| 17. | දංකොටුව ජල සම්පාදන මණ්ඩලයට අයත් පීඩන තුලන ටැංකිය ස්ථාපිත කිරීමට නියමිතව ඇත්තේ | විශාල භූමි ප්‍රදේශයක් ආවරණය වන පරිදි ක්‍රියාත්මක කළ | වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව, ජාතික ජල සම්පාදන හා ජලාපවහන | 2022 පෙබරවාරි වනවිටත් ගැටලුව නිරාකරණය වී නොමැත. |

| | | |
|---|---|---|
| දංකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ම/කහටවිල ග්‍රාම නිලධාරී වසම තුළය. මේ සඳහා එම ග්‍රාම නිලධාරී වසමෙහි ප්‍රාදේශීය සභාවට අයත් දෙල්ගහවත්ත නමැති ඉඩමෙන් හෙක් 0.2023 ක ප්‍රමාණයක් (රූඩ 02) අත්පත් කර ගැනීමට අංක 1716/15 දරන 2011 ජුලි 26 දරන අති විශේෂ ගැසට් නිවේදනයට අනුව අත්පත් කර ගැනීමේ කටයුතු සිදුකර තිබුණි. අත්පත් කර ගැනීමේ මූලික කටයුතු හා වන්දි ගෙවීම් කටයුතු රු.773,220ක මුදලක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කර තිබූ අතර, වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව මඟින් ඉඩමේ භුක්තිය බාර නොදීම හේතුකරගෙන දංකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම් 28 ක් ද, නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම් 07 ක් ද, වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම් 52 ක් ද වශයෙන් විශාල ප්‍රදේශයක් ආවරණය වන මෙම ව්‍යාපෘතියට | හැකි ව්‍යාපෘති කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමුඛතාවය ලබාදිය යුතුය. | මණ්ඩලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය නිලධාරීන් එක්ව දංකොටුව පීඩන තුලන ඉදිකිරීමේ ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳ සාකච්ඡා කරන ලදී. ඒ අනුව දංකොටුව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් පීඩන තුලන ටැංකිය ඉදිකිරීම සඳහා බ/කහටවිල වසම තුල රූඩ 2 ක් වන දෙල්ගහවත්ත ඉඩමේ භුක්තිය භාර දීමට වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව කැමැත්ත පළ කර ඇත. එසේම පීඩන තුලන ටැංකිය ඉදිකිරීම් කටයුතු සඳහා ජල සම්පාදන මණ්ඩලය සූදානමින් සිටී. ඒ අනුව දංකොටුව, නාත්තන්ඩිය, හා වෙන්නප්පුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසවල ග්‍රාම නිලධාරී වසම් 52 ක් |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රමුඛස්ථානය ලබාදීමට බලධාරීන් කටයුතු කර නොතිබුණි. | | මැදින් ජල පහසුකම් සැපයීමේ හැකියාව ඉදිරියේදී ඇති වන බව | |
| 18. | මහවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මුහුදුකර ජනතාවගේ විවේක කාලය ගත කිරීම සඳහා ක්‍රියාශීලි දරු පරපුරක් ඇති කිරීමේ අරමුණින් බටහිර ඉරණවිල ළමා උද්‍යානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාවට නංවා තිබුණු අතර, එය බටහිර ඉරණවිල අනුරේඛා අංක PU/MHW/2016/122 නම් බිම් කොටසේ ඉදිකර තිබුණි. මෙය වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව අයත් වන අතර, විගණිත දින වනවිට මුහුදු ජලය ව්‍යාපෘතිය ඉදිකල ස්ථානයටම පැමිණ ඇති බව නිරීක්ෂණය විය. තවදුරටත් වෙරළ ඛාදනය වුවහොත් ව්‍යාපෘතිය වෙනුවෙන් වැයකල රු.927,000 ක මුදල නිශ්කාර්ය වියදමක් වන බවත්, වෙරළ ඛාදනය වැළැක්වීමට ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවත්, ව්‍යාපෘතිය සඳහා භූමිය තෝරා ගැනීමේ දෝෂයක් පවතින බව නිරීක්ෂණය විය. | මෙවැනි අඩුපාඩු නැවත ඇති නොවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතු අතර, විධිමත් අධ්‍යනයක් කර වැයකල මුදල් වලින් ඉහළ ප්‍රතිලාභය ලබා ගැනීමට කටයුතු කළයුතුය. | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බටහිර වෙරළ තීරය මුහුදු ඛාදනයට ලක් විය. විගණන විමසුමට ලක් ව ඇති ළමා උද්‍යානය ද බටහිර වෙරළ තීරයේ පිහිටා ඇති බැවින් ඉහත සඳහන් කළ ස්වාභාවික කාලගුණ ව්‍යසනයේ බලපෑම මෙම ළමා උද්‍යානය පිහිටි භූමිය සඳහා ද බලපාන ලදී. ඉදිකිරීම සඳහා භූමිය තෝරා ගැනීමේ දී මේ ආකාරයෙන් දැඩි මුහුදු ඛාදනයකට මෙම මුහුදු තීරය ලක් නොවී තිබූ බැවින්, භූමියේ ශක්‍යතාවය ඒ වන විට ප්‍රශස්ත මට්ටමක පැවතීම හේතුවෙන් අදාළ ව්‍යාපෘතිය තෝරා ගැනීමට කටයුතු කර ඇත. | වර්තමානයේ දී ශක්‍යතා අධ්‍යයනයකින් පසුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන බව දන්වා තිබුණ ද, මෙම ව්‍යාපෘතිය සැලසුම් කිරීමේ දී එපරිදි කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 19. | ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කුමාරකට්ටුව ජල ව්‍යාපෘතිය සඳහා 2014 වාර්ෂික අයවැය යෝජනා යටතේ රු.3,884,248 ක වැයකර තිබූ අතර, කුමාරකට්ටුව ප්‍රජාමූල සමිතිය මඟින් ද, රු.2,204,798 ක් ද දරා තිබුණි. 2021 වර්ෂය වනවිටත්, එම ප්‍රදේශයේ ජනතාවට පානීය ජලය ලබාදීමට හැකිවී නොමැති බව නිරීක්ෂණය විය. | ඉතිරි අඩුපාඩු සම්පූර්ණ කර ප්‍රතිලාභ ලබාදීමට කටයුතු කළයුතුය. | 2021 වර්ෂයේ ප්‍රතිපාදන උපයෝගී කරගෙන ජනතාවට ප්‍රතිලාභ කඩිනමින් ලබාදීම සඳහා කටයුතු කරමින් පවතී. | 2022 පෙබරවාරි වනවිට ද මෙම ගැටලුව විසඳී නොමැත. |
| 20. | වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි දකුණ සායන මධ්‍යස්ථානය රු.4,646,356 ක වියදමින් 2014 වර්ෂයේ ඉදිකර තිබුණි. 2021 වර්ෂය වනවිටත්, භාවිතයෙන් තොරව නිශ්කාර්යව පැවතුණි. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අරමුණු ඉටුකර ගැනීමට වගකිව යුතු නිලධාරීන් අවශ්‍ය පියවරගත යුතුය. | මෙම ඉදිකිරීම ප්‍රාදේශීය සෞඛ්‍ය අධ්‍යක්ෂ කාර්යාල වෙත භාරදී ඇත. වෛද්‍යවරුන්ගේ හා කාර්ය මණ්ඩල පුරප්පාඩු වීම නිසා මෙම සායන මධ්‍යස්ථානය පවත්වාගෙන යාමේ අපහසුතාවයක් ඇති බව දන්වා ඇත. | 2022 පෙබරවාරි වන විටත් සායන පැවැත්වීමක් සිදු නොවේ. |
| 21. | ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2017 වර්ෂයේ දී ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ විශේෂ වැඩසටහන යටතේ රු.1,500,000 ක ප්‍රතිපාදන මත ඉදිකර තිබූ පවර්ලුම් රෙදි | ප්‍රතිපාදන ලබාගෙන ඉතිරි වැඩ නිම කර භාවිතයට ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | මෙම ඉදිකිරීම ආණමඩුව වි.සේ.ස.සමිතිය වෙත පැවරීමට කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී. | ඉතිරි වැඩ 2022 පෙබරවාරි දක්වාම සම්පූර්ණ කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | විවීමේ මධ්‍යස්ථානය ගොඩනැඟිල්ල අත්තිවාරම දක්වා පමණක් ඉදිකර තිබූ අතර, 2021 වර්ෂය දක්වා ම එහි ඉතිරි වැඩ සම්පූර්ණ කර නොතිබුණි. | | | |
| 22. | ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වර්ෂ 2015 සිට 2019 දක්වා කාලය තුළ රු.7,725,000 ක මුදලක් වියදම් කර ආරම්භ කර තිබුණු ව්‍යාපෘති 18ක් නිම නොකර අත්හැර දමා තිබුණු අතර, එම ව්‍යාපෘති නිමකිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ගේ අවධානය යොමු වී නොතිබුණි. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීමට අදාල හේතු සොයා බලා ව්‍යාපෘති සම්පූර්ණකර ගැනීමට කටයුතු කළ යුතුය. | අදියර වශයෙන් ඉදිකිරීමේ අපේක්ෂාව මත ලැබෙන ප්‍රතිපාදන මුදලට ඇස්තමේන්තු සකස් කරනු ලැබීය. නමුත් නැවත මුදල් වෙන් නොකිරීම නිසා මෙම ව්‍යාපෘති අඩක් නිමවූ ව්‍යාපෘති බවට පත්ව ඇත. | 2022 පෙබරවාරි වනවිටත් ගැටලුව මේ වන විට ද, විසඳී නොමැත. |
| 23. | උතුරු සිරිගම්පල හා දකුණු කොලින්ජාඩිය ඉඩම්වල පිහිටි නිල සෙවන කාර්යාල ඉදිකර තිබුණ ද, අදාල ඉඩම් වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් වෙත පවරාගෙන නොතිබුණි. | ඉඩම් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | උ/සිරිගම්පල හා ද/ කොලින්ජාඩිය රජයේ ඉඩම්වල ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ඉදිකර තිබූ නිල සෙවන ගොඩනැගිලි වේ. මෙම ඉඩම් රජය සතු වුවද, ප්‍රාදේශීය ලේකම් වෙත භුක්තිය භාරදී ඇති ඉඩම් නොවන බව | 2022 පෙබරවාරි වන විටත්, පෙන්වා දී ඇති තත්ත්වය පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | | | දන්වා සිටිමි. එහෙත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුල ඇති සියළුම රජයේ ඉඩම්, ඉඩම් අංශය මගින් නඩත්තු කරනු ලබන රජයේ ඉඩම් ලේඛනයේ සටහන් කර ඇති බව දන්වා සිටිමි. | |
| 24. | “සපිරිගමක්” ප්‍රජාපාදක ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ 2020 වර්ෂයේ දී රු.990,184 ක මුදලක් වියදම්කර කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉලන්තඩිය ධීවර තොටුපොලට යන කස කැලේ වැල්ල පාර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ ඇස්තමේන්තුව අනුව මාර්ගයේ දිග ප්‍රමාණය මීටර් 155 ක් පළල මීටර් 2.74 ක් ලෙස දක්වා තිබුණ ද, ඇස්තමේන්තු කළ ප්‍රමාණයට වඩා මාර්ගයේ පළල තැනින් තැන මීටර් 2.5 ත් මීටර් 2.6 ත් අතර, අගයක් ලෙස පැවතුණි. මාර්ගය සඳහා නිසි ප්‍රමිතියට අනුව තාර නොදමා තිබීම හේතුවෙන් මාර්ගයේ ගල් පැදී තිබීම සහ මාර්ගය දෙපස පුරවා තිබුණු පස් සේදීයාමට | භෞතික මිනුම් ප්‍රමාණ අනුව ගෙවීම් කළයුතු අතර, ඇස්තමේන්තු පරිදි ඉදිකිරීම් කිරීමට නිසි අධීක්ෂණයක් තිබිය යුතුය. ඉදිකිරීම් අඩුපාඩු හඳුනා ගෙන කොන්ත්‍රාත්කරුගෙන් ඉටුකරවා ගැනීමට කටයුතු කළ යුතුය. | විගණනයේ දී හඳුනාගත් අඩුපාඩු කොන්ත්‍රාත්කරු මගින් ඉටුකරවා ගෙන රැඳවුම් මුදල් සඳහන් කිරීමට කටයුතු කරමි. | ව්‍යාපෘතියේ අඩුපාඩු කොන්ත්‍රාත්කරු වෙතින් ඉටුකර ගන්නා බව දන්වා තිබුණ ද, අධීක්ෂණ නිලධාරීන් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ලක්ව තිබුණු බැවින්, මාර්ගය දෙපස ගල් ගැලවී යාමේ අවදානමකට ලක් ව තිබූ අයුරු නිරීක්ෂණය විය. | | | |
| 25. | පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අනුමත කාර්ය මණ්ඩලය තුළ තනතුරු 13 කට අදාලව සේවක පුරප්පාඩු සංඛ්‍යාව 25 ක් විය. පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අනුමත කාර්ය මණ්ඩලය තුල තනතුරු 18 කට අදාලව සේවක පුරප්පාඩු 390 ක් පවතින බව නිරීක්ෂණය විය. | අවශ්‍යතා විශ්ලේෂණයක් කර අත්‍යවශ්‍ය නම් පමණක් බඳවා ගැනීම් කළයුතු අතර, පුරප්පාඩු බහුල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ප්‍රමුඛතාවය අනුව හඳුනා ගෙන අනුයුක්ත කිරීම් කළයුතු වීම. | දැනට පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා අදාල අංශ වෙත තොරතුරු දැනුම් දී ඇත. | මෙම තත්ත්වය 2022 වනවිටත් පවතී. |

**කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

-----------------------------------------

2018 - තත්ත්වාගණනය කළ මතය

2019 - තත්ත්වාගණනය කළ මතය

2020 - තත්ත්වාගණනය නොකළ මතය

| | **විගණකාධිපති වාර්තාවේ ඇතුළත් ප්‍රධාන අඩුපාඩු** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග** | **ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය** |
|---|---|---|---|---|
| | ------------------------------------ | --------------------- | ------------------------ | --------------------- |
| 01. | කෘෂිකර්ම අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පළතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ මෙහෙයවීමෙන් දිස්ත්‍රික් ලේකම් හරහා සිදුකර | අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. | • කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හරහා අදාල නිලධාරීන්ට ක්‍රමවේදයන් හා නියමිත ප්‍රමිතීන්ට | ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණද, කැවෙන්ඩිස් පැල විනාශ වීම හේතුවෙන් ව්‍යාපෘතිය අසාර්ථක වී තිබුණි. 2021 වර්ෂයේදීද |

තිබූ පළතුරු නිෂ්පාදන පොකුරු ව්‍යවසායකත්ව ආදර්ශ ව්‍යාපෘතිය යටතේ මහව ප්‍රදේශයේ අක්කර 50 ක වපසරියක වගා කිරීමට ලබාදුන් රු.මිලියන 03 ක් වටිනා කැවෙන්ඩිස් කෙසෙල් පැල 37,500 න් පැල 3,350 ක් නිසි ප්‍රමිතියෙන් තොර වීම නිසා විනාශ වී තිබුණි. රු.මිලියන 4.8 ක ප්‍රතිපාදනයෙන් කැවෙන්ඩිස් කෙසෙල් වගාවට ජල අවශ්‍යතාවය ලබාදීමට යෝජිතව තිබුණද විසුරුම් ජල පද්ධතිය ලබා නොදීම හේතුවෙන් රු.මිලියන 1.18 ක් වටිනා පැල 11,800 ක් ක්ෂේත්‍රයේ සිටුවා නොතිබුණි. බිම් සැකසීම හා වෙනත් කටයුතු වෙනුවෙන් ගොවීන් 09 දෙනෙකු විසින් රු.මිලියන 5.70 ක වියදමක් දරා තිබුණු නමුත් වගාවට අවශ්‍ය ජල අවශ්‍යතා සපුරා ගැනීමට නොහැකි වීමෙන් වගාව පැවතිය යුතු අවම වර්ධන මට්ටමවත් ලබා නොතිබුණි. අස්වනු නෙලූ පසු මිලදී ගැනීම සඳහා සුදුසු වෙළඳපලක් හෝ පුද්ගලයෙක් හෝ ආයතනයක් සමඟ ගිවිසුම් ගතවී නොතිබීමෙන් අපේක්ෂිත අරමුණ ඉටුකර ගැනීමේ

අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට උපදෙස් ලබාදීම.

- අමාත්‍යාංශය ප්‍රතිපාදන ලබාදීමේදී කාර්යය නියමිත වේලාවට අවසන් කිරීමට සුදුසු පරිදි ප්‍රතිපාදන ලබාදීම, ප්‍රතිලාභ අවශ්‍ය ප්‍රමාණය හිඟයකින් තොරව ලබාදීමට කටයුතු කරන ලෙස දැන්වීම.
- මෙවැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පෙර ව්‍යාපෘතිය සැලසුම් කිරිම, ක්‍රියාත්මක කරන ආයතනයෙන්ම සිදු කිරිම පෙන්වා දීම.

මෙවැනි ව්‍යාපෘතියක් මහව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ආරම්භ කර තිබුණද එයද නිසි පරිදි ක්‍රියාත්මක නොවීම හේතුවෙන් අසාර්ථක වී තිබුණි.

| | | | | |
|---|---|---|---|---|
| | ගැටලුවක් පැවතුණි. | | | |
| 02. | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය විසින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 10 ක මධ්‍යස්ථාන 10 ක කුඩාකර්මාන්ත ඇඟලුම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට රු.122,264,445 ක් වටිනා යන්ත්‍ර හා උපකරණ ලබාදී තිබුණි. මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් 2017 හා 2018 වර්ෂවල මෙහෙයුම් වියදම් ලෙස රු.3,776,180 ක්ද වැයකර තිබුණි.<br><br>මේ සම්බන්ධව නිරික්ෂණය වූ කරුණු පහත දැක්වේ.<br><br>(i) දිස්ත්‍රික් ලේකම් විසින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් තෝරාගත් ස්ථාන හා පුද්ගලයින් පිළිබඳ විස්තර කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ වෙත යොමු කළද ඊට වෙනස් ස්ථාන හා පුද්ගලයින් කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් තෝරා එවා | • ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ළඟාකර ගැනීම සඳහාත් වැයකළ මුදලින් උපරිම ප්‍රතිලාභ ළඟා කරගත හැකිවන පරිදි ව්‍යාපෘති සාර්ථක කර ගැනිමට කටයුතු කළ යුතුය. | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය වෙත මේ සම්බන්ධයෙන් දැනුවත් කර තිබූ අතර අදාල ප්‍රාදේශීය ලේකම්වරු වෙත උපදෙස් ලබාදී ඇත.<br><br>මහව, පඩුවස්නුවර (බටහිර), රිදීගම, උඩුබද්දාව යන මධ්‍යස්ථාන විවෘත කර සාර්ථකව කරගෙන ගිය අතර, යම් යම් අවස්ථාවලදී මතු වූ අතිශයින් සාධාරණ ප්‍රායෝගික කරුණු මත තාවකාලිකව වසා තැබීම් සියලු මධයස්ථානවල දක්නට ලැබුණු බව දන්වා ඇත. | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 10 ක් තුළ මධ්‍යස්ථාන 10 ක් සඳහා රු.122,264,445 ක් වටිනා යන්ත්‍ර සහ උපකරණ ලබාදී තිබුණි. මෙයින් මධ්‍යස්ථාන 04 ක කටයුතු සාර්ථකව ක්‍රියාත්මක කළද මේ වන විට කුරුණෑගල මධ්‍යස්ථානය හැර අනෙකුත් සියලුම මධ්‍යස්ථාන අසාර්ථක බැවින් අක්‍රීයව පැවතුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | තිබීමෙන් රු.138,290 ක අතිරේක විදුලි වියදම් දැරීමට සිදුවීමත් පුහුණු කටයුතු ආරම්භ කිරීම් ප්‍රමාදයනුත් සිදුවී තිබුණි.<br><br>(ii) මාස 06 ක පුහුණුවෙන් පසු ස්වශක්තියෙන්ම කර්මාන්ත ශාලා ලෙස පවත්වාගෙන යාමට යෝජනා කර තිබුණත් විගණන දිනය වූ 2019 පෙබරවාරි 26 දින වන විට පොල්ගහවෙල, කුරුණෑගල, පඬුවස්නුවර (බටහිර), මහව, රිදීගම හා උඩුබද්දාව ඇඟලුම් කර්මාන්ත ශාලා වසා දමා මැෂින් අක්‍රීයව පැවතුණි. | | | |
| 03. | හෙට්ටිපොල නල්ලූර් මහ වැවෙන් රොන්මඩ ඉවත් කිරීමට වයඹ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ උපදෙස් හා පෙන්නුම් කර ඇති පරිදි වැව් තාවුල්ලේ ඉහලම කෙළවරින් පස් ඉවත් කර තිබුණ අතර රොන්මඩ වැඩිපුර තැන්පත් වී ඇති වැකන්දට සමීප කොටස් හාරා නොතිබුණි. ගොවිජන | වැව් ගැඹුරු කිරීමේදී ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 9/2017 චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළයුතුය. | වැව් ගැඹුරු කිරීමේදී ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 9/2017 චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කරන ලෙස ප්‍රාදේශීය ලේකම්වරු වෙත දන්වා ඇත. වැව් ප්‍රතිසංස්කරණ කටයුතු සියල්ල එම | ඉවත් කරන ලද පස්වලින් රු.264,668 ක මුදලක් පාඩුව ලෙස අය කර ගෙන ඇති අතර, පස් ඉවත් කර ඇති ස්ථාන පස්වලින් පුරවා නිසි පරිදි සකස් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 2017 ජූනි 07 දිනැති අංක 9/2017 චක්‍රලේඛයේ උපදෙස් සැලකිල්ලට නොගෙන තාවුල්ලේ ඉහල කෙලවරින් ඇස්තමේන්තු අනුව මීටර් 1 ½ ක් පමණ ගැඹුරට මීටර් 35 x 35 පමණ ප්‍රදේශයක පස් ඉවත් කර තිබුණ අතර, අසාමාන්‍ය ලෙස ගැඹුරු වීම නිසා රැඳෙන ජලය බැසයාමට තාවුල්ලේ සිට වැව මැදින් ඇලක් කපා ඇති බව අනාවරණය විය. | | තාක්ෂණික දැනුම තිබෙන ආයතනවලින් පමණක් සිදු කරන ලෙස දන්වන ලදී. | |
| 04. | ගම්පෙරළිය සංවර්ධන වැඩසටහන යටතේ ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව ප්‍රතිසංස්කරණය කරන වාරිමාර්ග ව්‍යාපෘති 05 ක ඉංජිනේරු ඇස්තමේන්තු නිවැරදි ලෙස සකස් කර නොතිබුණි. මේ හේතුවෙන් රු.2,457,550 ක අධි ඇස්තමේන්තුගත වීමක් සිදුවීම මත රජයට පාඩුවක් සිදුවී ඇත. | නිවැරදිව ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කර ගෙවීම් කළ යුතුවේ. තවද, නිවැරදි නොවන ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කිරීම මගින් සිදුවී ඇති සම්පූර්ණ පාඩුව වගකිව යුතු පාර්ශවයන්ගෙන් ආපසු අයකර ගත යුතු වීම. | ඇස්තමේන්තු සකස් කිරීමේදී සිදුව ඇති පාඩුව වගකිව යුතු පාර්ශවන්ගෙන් අය කිරීම. ඉදිරි ඇස්තමේන්තු සකස් කිරීමේදී නිවැරදිව ඇස්තමේන්තු සකස් කරන ලෙස දන්වා ඇත. මෙම අධි ඇස්තමේන්තු මුදලින් රු.170,253 ක් පමණක් අය කර ඇත. | වැඩිපුර ගෙවීම් රැඳවුම් මුදලින් අයකරන බව දන්වා තිබුණද, රු.170,253 ක් පමණක් අය කර තිබූ අතර, ඉතිරි රු.2,287,297 ක මුදල අය කර නොතිබුණි. |
| 05. | ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මැදගෙදර ග්‍රාම නිලධාරී වසමේ හීන පාමුල වැව රු.1,261,000 ක මුදලකට | -එම- | වාරි මාර්ග ඇස්තමේන්තු සකස් කිරීමේදී අධි ඇස්තමේන්තු මත | රු.431,165 ක මුදලකින් රු.11,412 ක් පමණක් අය කර ඇති අතර ඉතිරි |

ප්‍රතිසංස්කරණය සඳහා ඉහළ පැරකුම් ගොවි සංවිධානයත් සමඟ ගිවිසුම් අත්සන් කර තිබුණි. වැඩ විෂයය 1.1 වාන සහ සොරව්ව සෑදිම සඳහා වැව් බැම්ම කැපීම බැකෝ යන්ත්‍ර මඟින් සිදුකර ඒ සඳහා මිනිස් ශ්‍රමය යෙදවීමට අදාල ඝන මීටරයකට රු.1,615 බැගින් වූ රේටය පදනම් කර රු.80,750 ක් ගෙවා ඇත. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2019 වර්ෂයට අදාල වාරිමාර්ග මිල සම්මත අනුපාතයන්ට අනුව පස් ඝන මීටරයක් කැපීමට අනුමත මිල රු.109කි. මෙම අනුපාතය භාවිතා කරන ලද්දේ නම් වියදම රු.5,450 ක් බැවින් රජයට රු.75,300 ක ඉතිරියක් සිදුවන බව නිරීක්ෂණය කෙරේ. තවද, වැඩ විෂයය 1.5 අනුව වැව් බැම්ම සකස් කිරීම සඳහා ඝණ මීටර් 58.85 ක් බැහැරින් ගෙනා බව දක්වා රු.595 බැගින් රු.35,015 ක් ගෙවා තිබුණද, යොදාගත් පස් බැහැරින් නොව වැවෙන්ම ලබාගත් බව නිරීක්ෂණය විය. වැවේ පස් ඉවත් කිරීමේදී නිවැරදි නොවන රේට භාවිතා කිරීම හේතුවෙන් රු.431,165 ක මුදලක් වැඩිපුර ගෙවීම් කර ඇති බව නිරීක්ෂණය විය.

ඇස්තමේන්තු සකස් නොකරන ලෙස දන්වා ඇත. ඇස්තමේන්තු ඉතාමත් නිවැරදිව සකස් කළ යුතු බව දන්වා ඇත. පාඩුව රු.11,412 ක් ගෙවීම් කිරීමේදී අඩු කර ඇත.

රු.419,753 ක මුදලක් අය කර නොතිබුණි.

| | | | | |
|---|---|---|---|---|
| 06. | බැහැරින් ලබා ගත් පස් ට්‍රැක්ටර් මගින් වැකන්දට දමා තැලීම් සඳහා පළාත් වාරිමාර්ග සම්මත අනුපාත අංක (ISR) 12 මගින් වැට් බදු රහිතව හා සහිතව පිළිවෙලින් ඝන මීටරයට රු.580 හා රු.595 රේට භාවිතා කරමින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක වැව් 40 ක් සඳහා එකතුව පස් ස.මීටර් 20,194 ක් සඳහා භාවිතා කර ඇස්තමේන්තු සකසා තිබුණි. එසේ වුවද වැට් රහිත රු.580 ක රේටය ගණනය කිරීමේදී නිවැරදි රේටය රු.447 ක් වීම නිසා රු.2,426,429 ක් වැඩිපුර ඇස්තමේන්තු ගත වී තිබෙන බව නිරීක්ෂණය විය. | -එම- | ඇස්තමේන්තු සකස් කිරීමේදී සිදුව ඇති පාඩුව වගකිව යුතු පාර්ශවයන්ගෙන් අය කිරීම සහ ඉදිරියේදී ඇස්තමේන්තු සකස් කිරීමේදී ඉතාමත් නිවැරදිව සකස් කිරීම සඳහා උපදෙස් ලබාදී ඇත. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 කින් අය විය යුතු රු.2,426,429 ක වැඩිපුර ගෙවීමකින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක් සඳහා රු.1,909,775 ක මුදලක් අය වී තිබුණද, ඉතිරි ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක් සඳහා රු.516,654 ක මුදලක් අය කර නොතිබුණි. |
| 07. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක වැව් ගැඹුරු කිරීමට අදාල ඉවත් කරන ලද පස් වෙන්දේසි කිරීමේදී වෙන්දේසි කළයුතු පස් ප්‍රමාණයට වඩා අඩුවෙන් වෙන්දේසි කිරීමෙන් වැව් 31 කින් රු.3,160,338 ක් පාඩුවක් රජයට සිදුවී තිබුණි. | ලිහිල් පස් ප්‍රමාණය නිවැරදිව ගණනය කර වෙන්දේසි කිරීමට කටයුතු කළ යුතුය. | ඇස්තමේන්තු සකස් කිරීමේදී සිදුව ඇති පාඩුව වගකිව යුතු පාර්ශවයන්ගෙන් අය කිරීමට කටයුතු කරමින් පවතී. ඉදිරියේදී ඇස්තමේන්තු සකස් කිරීමේදී ඉතාමත් නිවැරදිව සකස් කිරීම සඳහා උපදෙස් ලබාදී ඇත. | 2022 පෙබරවාරි වනවිට සම්පූර්ණ පාඩුව රු.3,160,338 කින් රු.536,069 ක් අය කර තිබුණද ඉතිරි රු.2,624,269 ක අය කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 08. | එකතු කළ අගය බදු පනතට අනුව ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන්ගෙන් ලබාගන්නා සේවා සඳහා ගෙවීම් කිරීමේදී වැට් බදු රහිත රේට භාවිතා කළ යුතු වුවත්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11 ක වැව් 59 ක එකතුව ස.මීටර් 87,582 ක් පස් කපා පටවා ප්‍රවාහනය කර ගොඩ ගැසීමේ කාර්යය සඳහා ISR 60.16 හි සඳහන් ස.මීටරයට රු.392 ක රේටය වෙනුවට වැට් බදු සහිත රු.450 රේටය භාවිතා කර තිබුණි. මේ හේතුවෙන් ස.මීටරයට රු.58 බැගින් එකතුව රු.5,079,756 ක් කොන්ත්‍රාත්කරුවන් වෙත වැඩිපුර ගෙවීමක් සිදු වීම මගින් රජයට පාඩු සිදු වනු ඇත. | යන්ත්‍ර සඳහා ගෙවීම් කිරීමේදී එකතුකල අගය මත බදුගෙවීමට ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ට පමණක් එකතුකළ අගය මත බදු ඇතුලත්ව ගෙවීම් කළ යුතුය. එකතු කළ අගය මත ලියාපදිංචිය තහවුරු නොවූ අයට බදු සහිතව ගෙවීම් සිදු කිරීම සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශවයන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය. | කොන්ත්‍රාත්කරුවන් වැට් සඳහා ලියාපදිංචි වී නොමැති නම් වැට් බදු නොගෙවන ලෙසත් වැඩිපුර ගෙවා ඇති වැට් බදු මුදල අය කරන ලෙසත් රේටය දළ වැට් බද්දට අනුව වෙනම ගෙවීමට කටයුතු කරන ලෙසත් ප්‍රාදේශීය ලේකම්වරු වෙත දන්වා ඇත. | වැඩිපුර ගෙවීම් සම්පූර්ණයෙන්ම ආපසු අය කර ගෙන නොතිබුණි. |
| 09. | ඉවත් කිරීමට ප්‍රමාණවත් රොන්මඩ ස්ථරයක් නොපැවති වාරියපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මැදගම තල්ගහමුල වැවෙන් රොන්මඩ ඉවත් කිරීමේ මුවාවෙන් වැලි කැට ගල් සහිත පස් ස.මීටර 6,000 කට වැඩි ප්‍රමාණයක් ඉවත් කර ඇති බව කාර්මික නිලධාරිගේ මැනුම් වාර්තා හා සටහන් මගින් තහවුරු කර ඇත. ඉවත් කළ පස්වලට මීටර් | වැව් සම්බන්ධ කර්මාන්තවලදී වැවෙන් පස්, වැලි ඉවත් කිරීම මනාව අධීක්ෂණය කළ යුතු අතර ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් 2017 ජූනි 07 දිනැති 9/2017 චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 2017 ජූනි 07 දිනැති අංක 9/2017 චක්‍රලේඛය අනුව කටයුතු කරන ලෙසත්, මනා අධීක්ෂණයෙන් යුතුව කටයුතු කරන ලෙසත්, වැව් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී වැව් තාක්ෂණය තිබෙන | ගොවි සංවිධාන විසින් ඉවත් කර තිබූ රු.2,650,176 ක පස් තොගයෙන් රු.848,000 ක මුදලක් අය කර ඇති අතර ඉතිරි රු.1,802,176 ක මුදල අය කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | 500 ක් පමණ දුරින් ගොඩ ගසා සම්පූර්ණ පස් තොගයම ඉවත් කර ඇත. දිස්ත්‍රික්කයේ වැලි සහ කැට ගල් සහිත පස් කියුබ් 01 ක් රු.1,000 කට වැඩි මිලකට වෙන්දේසි වීම අනුව $\frac{6,000 \times 125 \times 1,000}{2.83 \times 100}$ ක් වශයෙන් රු.2,650,176 ක් වටිනා පස් තොගයක් ගොවි සංවිධානය විසින් ඉවත් කරගෙන තිබුණු බව නිරීක්ෂණය විය. | | ආයතන විසින් සිදු කළ යුතු බවටත් උපදෙස් ලබාදී ඇත. | |
| 10. | ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය ක්‍රියාත්මක කිරීම සඳහා 2017, 2018 හා 2019 වර්ෂවල රු.35,568,218 ක ප්‍රතිපාදන ලබාදී ඇත. මෙම ව්‍යාපාරයේ අරමුණ 2020 වන විට ප්‍රජාපාලිත හා නිෂ්පාදන සේවා අභිමුඛ ග්‍රාම නිලධාරී වසම් 5000 ක් ඇති කිරීම තුළින් එකී ග්‍රාම ශක්ති තුළ ජීවත්වන ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීමයි. ඒ සඳහා ජනතාවගේ මාසික ආදායම දෙගුණ කිරීම මෙම වැඩසටහනේ අරමුණක් වුවද, එය ඉටුවී නොතිබුණි. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ග්‍රාම ශක්ති සමිති 360 ක් වෙත ලබාදුන් මුදලින් බැංකු | රජයේ මුදල් නිෂ්ක්‍රීයව නොතබා හැකිතාක් අදාල වැඩසටහනේ අරමුණ කරා ළඟා විය හැකි පරිදි වැය කළ යුතුය. | ග්‍රාම ශක්ති අරමුදලේ සම්පත් නියමිත අරමුණට හා ඵලදායීව යොදවන ලෙසත්, ප්‍රාදේශීය ලේකම්වරු වෙත උපදෙස් ලබාදී ඇත. ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘතිවලට අදාල චක්‍රීය ණය වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලෙස දන්වා ඇත. මෙහි ක්‍රියාකාරිත්ව ඉතාමත් හොඳින් සිදු වන බව කාර්යාලවලින් දන්වා ඇත. ග්‍රාම ශක්ති ව්‍යාපෘති කටයුතුවලට අදාල පුහුණු වීම් ලබාදී ඇත. | 2022 පෙබරවාරි වනවිට මෙම මුදලින් රු.මිලියන 42 ක පමණ චක්‍රීය ණය වශයෙන් ලබාදී ඇත. ඉතිරි රු.මිලියන 127 ක පමණ මුදලක් බැංකු ගිණුම් තුල රඳවා තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ගිණුම් තුළ 2019 දෙසැම්බර් 30 දින වන විට රු.169,669,778 ක් නිෂ්කාර්යව පැවතුණි. | | | |
| 11. | 2015 දෙසැම්බර් 30 දිනැති මුදල් කොමිෂන් සභා චක්‍රලේඛ 2016/1 ප්‍රකාරව ඉදිකරනු ලබන සියලු මාර්ග ජාතික මාර්ග පද්ධතිය හා සම්බන්ධ කළ යුතු බව දක්වා තිබුණි. එසේ වුවද, ජාතික ප්‍රතිපත්ති කටයුතු, නැවත පදිංචි කිරීමේ හා යටිතල පහසුකම් අමාත්‍යාංශය ප්‍රතිපාදන යටතේ නාරම්මල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ක්‍රියාත්මක කළ ඇස්තමේන්තු වටිනාකම රු.1,200,000 ක් වූ මාර්ග ව්‍යාපෘති 02 කට අදාල ඉදිකිරීම් ජාතික මාර්ග පද්ධතිය හා සම්බන්ධ නොවන අයුරින් තැනින් තැන කොටස් ලෙස ඉදි කිරීම් කර තිබුණි. | චක්‍රලේඛවලට අනුගතව කටයුතු කළ යුතුය. | මෙවැනි ව්‍යාපෘති සඳහා ජාතික මාර්ග පද්ධතියට සම්බන්ධ වන ලෙස වැඩ කොටස් ඉටු කරන ලෙස දන්වා ඇත. ප්‍රතිපාදන සීමිත වීම හේතුවෙන් අත්‍යවශ්‍ය සංවර්ධන කටයුතු කළ බවත්, මීළඟ ප්‍රතිපාදනවලින් එම අසම්පූර්ණ වැඩ කොටස් ඉටු කරන ලෙසත් උපදෙස් දී ඇත. | ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් එම කොටස් නිමකර නොතිබුණි. |
| 12. | 2012 ජනවාරි 05 දිනැති අංක 1/2012 දරන චක්‍රලේඛය ප්‍රකාරව, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 විසින් ලියාපදිංචි ප්‍රජාමූල සංවිධාන 60 කට සෘජු ක්‍රමය යටතේ ප්‍රදානය කර තිබූ | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතු අතර උපකොන්ත්‍රාත් ලබාදීම සම්බන්ධයෙන් | ප්‍රජා මූල සංවිධානවල අධීක්ෂණ කටයුතු වඩාත් විධිමත් අයුරින් ඉදිරියේදී සිදු කරන ලෙස උපදෙස් දී ඇත. උපකොන්ත්‍රාත් ලබා | උපකොන්ත්‍රාත් ලබාදුන් ප්‍රජාමූල සංවිධාන සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණ අතර |

| | | | | |
|---|---|---|---|---|
| | මිල එකතුව රු.93,827,150 ක් වූ කොන්ත්‍රාත් 72 ක්, එම චක්‍රලේඛයට පටහැනිව කළ වැඩ වටිනාකම සඳහා ලැබෙන මුදලින් සියයට 5 ක් තමන්ගේ සංවිධානයන්ට ලබා ගැනීමේ අරමුණෙන් උපකොන්ත්‍රාත් ලබා දී තිබුණි. | ක්‍රියාමාර්ග ගත යුතුය. | නොදීමට කටයුතු කරන ලෙස ප්‍රාදේශීය ලේකම්වරු වෙත උපදෙස් ලබාදී ඇත. | වර්තමානයේදීද මේ ආකාරයෙන් කටයුතු කරන බව නිරීක්ෂණය විය. |
| 13. | 2019 ගම්පෙරළිය වැඩසටහන යටතේ ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මැද ගෙදර වසමේ රු.2,000,000 ක ප්‍රතිපාදනයෙන් ඉදිකළ අත්පන්දු ක්‍රිඩාංගනයේ ආරක්ෂක වැට ඉදිකිරීම සඳහා යොදාගන්නා ඇතුළත විශ්කම්භය මි.මී.50 ගැල්වනයිස් බට සිරස්ව හා මි.මී.40 ගැල්වනයිස් බට තිරස්ව සවිකිරීම සඳහා ඇස්තමේන්තු සකස් කර තිබුණි. සවිකළ බටවල විශ්කම්භය 2019 BSR රේට අනුව මි.මී.50 බටයක තිබිය යුතු විශ්කම්භයයට වඩා මි.මී.8.7 කින් අඩු වී තිබු අතර හරස් අතට සවිකරන ලද මි.මී.40 ගැල්වනයිස් බටවල පිටින් පිට විශ්කම්භය මි.මී.5.7 කින් අඩුවී තිබූ නිසා ශක්තිය ඉතා දුර්වල විය. තවද මෙම බටවල මල නිවාරණ ආලේප කර ඇති බව තහවුරු නොවු | නිවැරදි නොවන මිනුම් වාර්තා ඉදිරිපත් කළ පාර්ශව සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුය. සංශෝධනය කිරීම්ද නිවැරදිව සිදුකර නොමැති බැවින් වැඩිපුර ගෙවූ මුදල නැවත ගණනය කර ආපසු අයකළ යුතුය. | අදාල ව්‍යාපෘතියේ අඩුපාඩු ඇති නොවන පරිදි කටයුතු කරන ලෙස ප්‍රාදේශීය ලේකම් වෙත උපදෙස් ලබාදි ඇත. අය කිරීම් කරන ලෙස ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා ඇත. | පෙන්වා දුන් අඩුපාඩු නිවැරදි කර නොතිබූ අතර අදාල පාර්ශවයන් සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | අතර කණු සවිකළ පදනමේ ස්ථාන 09 ක් සෑම පැත්තකින්ම පුපුරා ගොස් ඇත. | | | |
| 14. | අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශයට අයත් ඕතර තිරුවම්පොල වසමේ බොරළු කැණීම් කළ ස්ථාන 17 ක් සම්බන්ධයෙන් සිදුකළ භෞතික විගණන පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය. | | | |
| | (i) භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මඟින් නිකුත් කරන කැණීම් බලපත්‍ර කොන්දේසි අනුව කැණීම් භූමිය මතුපිට ඇති පස් ස්ථරය කැණීම් කර පසෙකින් ගොඩගසා ගබඩා කළ යුතු අතර, කැණීම් කිරීමෙන් පසු එම පස් පුනරුත්ථාපන කටයුතු සදහා යොදා ගත යුතු නමුත්, බොරළු කැණීම් කළ ඉඩම් අයිතිකරුවන් මතුපිට පස් ස්ථරය ඉවත් කර කැණීම් කර නොතිබුණි. | පරිසර හානි අවම වෙන ලෙස කටයුතු කළ යුතු වීම හා ඊට වගකිව යුතු ආයතන දැනුවත් කිරීමට නිරන්තරයෙන් හා අවශ්‍ය පියවර ගැනීම කළ යුතු වීම. | මේ සදහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන ලෙස දන්වා ඇත. තවදුරටත් මෙවැනි තත්ත්වයන් ඇති නොවන ලෙස කටයුතු කරන ලෙස අදාල රාජ්‍ය ආයතනවලට දන්වා ඇත. | නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර තිබුණද තවදුරටත් අනවසරයෙන් බොරළු කැපීම සිදු වන බව නිරීක්ෂණය විය. |

(ii) කැණීම් භූමියේ එක් රැස්වන ජලය ඉවත් කිරීම සඳහා සුදුසු ජල වහන ක්‍රමයක් සකස් කර ආනතිය අංශක 45 ක් ලෙස පවත්වා ගෙන යා යුතු වුවද එසේ කර නොතිබුණි. - එම -

(iii) මෙම ඉඩම් සියල්ලම රජය විසින් වගා කටයුතු හා නිවාස ඉදිකර ගැනීම සඳහා ලබාදුන් රජයේ ඉඩම් වන බැවින් ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දෙනු ලබන බලපත්‍රයෙහි දෙවන උප ලේඛනයේ වන 1 කොන්දේසිය යටතේ ඛනිජ කැණීම ඉවත් කිරීම සඳහා බලපත්‍රලාභියා හට අධිකාරියක් නොමැත. එසේ වුවද මෙම කොන්දේසි කඩකර පස් ඉවත් කර තිබුණි. - එම -

(iv) මෙම බොරළු කැණීම් කළ ස්ථාන 17 ම භූ විද්‍යා හා පතල් කාර්යාංශයේ - එම -

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රාදේශීය කැණීම් ඉංජිනේරු විසින් නිකුත් කළ බලපත්‍රලාභීන්ගේ ලැයිස්තුවේ සඳහන් නොවන අනවසර බොරළු කැණීම් කළ ස්ථානයන් වීම. | | | |
| | (v) විල්ගමුව වත්ත ග්‍රාම නිලධාරින් වසම් තුළ රජයේ ව්‍යාපෘති සඳහා සහ නිවාස අවශ්‍යතා සඳහා අසාමාන්‍ය ලෙස බොරළු කැපීම සිදුකිරිම හේතුවෙන් අවස්ථා 04 කදී නායයාම් අවදානම් ඇති වූ බව නිරීක්ෂණය විය. | - එම - | | |
| 15. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක ගම්පෙරළිය සංවර්ධන වැඩසටහන යටතේ ඉදි කරන ලද මාර්ග 15 කට අදාල කුට්ටිගල්වල සම්පින්ඩණතාවය (නිවටන් ප්‍රමාණය) පරික්ෂා කිරීමේදී මාර්ග 10 ක කුට්ටිගල්වල පැවතිය යුතු නියමිත සම්පිණ්ඩණතාවය නොතිබුණි. කුට්ටිගල්වල පැවතිය යුතු | කුට්ටිගල්වල සම්පිණ්ඩණතාවය පෙර පරික්ෂා කිරීම පිළිබඳව සැක කටයුතුභාවයක් නිරීක්ෂණය වන බව හා මේ පිළිබඳව විධිමත් කමිටුවක් පත් කර විශේෂ පරික්ෂණයක් සිදු කිරීම සුදුසු වීම. | විගණන අංශය දන්වා ඇති පරිදි සියලුම අය කිරීම් කරන ලෙස ප්‍රාදේශීය ලේකම්වරුන්ට දන්වා ඇත. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 න් මාර්ග 15 කට අදාල කුට්ටිගල්වල ප්‍රමිතියක් නොමැති වීම හේතුවෙන් මාර්ග නිසි පරිදි ඉටු කර නොතිබූ අතර මෙම අක්‍රමිකතාවය පිළිබඳව වගකිව යුතු නිලධාරින් |

| | | | | |
|---|---|---|---|---|
| | නියමිත ප්‍රමිතිය නොමැතිවීම හේතුවෙන් අදාල මාර්ගවල සාර්ථකත්වය කෙරෙහි අවදානම් තත්ත්වයක් පැවතිය හැකිය. | | | සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොමැත. |
| 16. | යටිතල පහසුකම් සංවර්ධන විශේෂ වැඩසටහන යටතේ 2018 වර්ෂයේදී ව්‍යාපෘති 34 ක් ක්‍රියාත්මක කිරීම සඳහා පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත රු.62,922,034 ක ප්‍රතිපාදන මුදලක් අනුමත කර තිබුණි. මෙම මුදලින් වැව් 17 ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු.32,937,462 වෙන් කර තිබුණ අතර, එයින් ව්‍යාපෘති 05 ක් 2018 වර්ෂය තුළ සම්පූර්ණයෙන් ඉටු කර තිබුණි. එසේම ව්‍යාපෘති 04 ක් 2019 වර්ෂය සඳහා අවිච්ඡේද කර ක්‍රියාත්මක කර තිබුණු අතර ව්‍යාපෘති 08 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. ඊට අමතරව 2019 වර්ෂයේද නැවත වැව් 07 ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රුපියල් 13,790,000 ක ප්‍රතිපාදනයක් ලැබී එම ප්‍රතිසංස්කරණයන් සිදු කර තිබුණි. | නියමිත වැඩ විෂයයට අනුව නිවැරදිව ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කර ගෙවීම් කළ යුතු අතර නිවැරදි නොවන ලෙස ඇස්තමේන්තු සකස් කිරීමෙන් සිදුවී ඇති සම්පූර්ණ පාඩුව වගකිව යුතු පාර්ශවයන්ගෙන් ආපසු අයකර ගත යුතුය<br><br>ගොවිජන සේවා කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛ උපදෙස් පරිදි වැව් ගැඹුරු කැනීම් සිදු කළ යුතුය. | ඇස්තමේන්තුවල වැඩිපුර දක්වා ඇති සියලුම මුදල් අය කරන ලෙස දන්වා ඇත. ඉදිරියේදී ව්‍යාපෘතිවලට ඇස්තමේන්තු කිරීමේදී නිවැරදි රේට භාවිතා කරන ලෙස දන්වා ඇත .<br><br>මේ සම්බන්ධයෙන් විශේෂ පරීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කර ඇත. | වැඩිපුර ගෙවීම් සම්පූර්ණයෙන් අයකර ගෙන නොමැති අතර, වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් මෙතෙක් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| | i. යථොක්ත වැඩසටහන | | | |

යටතේ වැව් ප්‍රතිසංස්කරණයට අදාලව සිදු කර තිබූ වැව් 16 ක් විගණන පරීක්ෂණයේදී අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

- ඉංජිනේරු ඇස්තමේන්තු සදොස්ව සකස් කිරීමෙන් රු.9,863,754 ක්ද, නොකළ වැඩ සඳහා රු.3,576,953 ක්ද, වැඩිපුර ගෙවා තිබුණි.

- ගිවිසුමේ 17 වගන්තියට පටහැනිව අධිකාරී බලයන්ගෙන් තොරව සියලුම කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කළ ප්‍රජාමූල සංවිධාන විසින් උපකොන්ත්‍රාත් දී තිබුණි.

- වැලි නිස්සාරණය සඳහා උචිත පස් තිබූ වැව් 03 කින් ඝනමීටර් 8,562 ක් ඇස්තමේන්තු ප්‍රමාණය ඉක්මවා කපා තිබුණි.

- වැව් 06කට සොරොව්

| | | | | |
|---|---|---|---|---|
| | සම්පූර්ණයෙන් සවිකිරීම සඳහා ගෙවීම් කර තිබුණද, ඇතැම් වැඩ විෂයයන් හා උපාංග ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.<br><br>• අංක 9/2017 දරන ගොවිජන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛ උපදෙස් උල්ලංඝනය කරමින් වැව් ගැඹුරු කර තිබුණ අතර, වැව් දෙකක වැව් බැම්මට දැඩි ලෙස හානි කර තිබුණි.<br><br>• රොන්මඩ ඉවත්කිරීම සඳහා ඩෝසර් යන්ත්‍ර පමණක් භාවිතා කළයුතු වුවත්, මෙම සියලුම වැව් ගැඹුරු කිරීම සඳහා බැකෝ යන්ත්‍ර භාවිතා කර තිබුණි. | | | |
| 17. | 2009 මැයි 06 අංක 1600/18 දරන අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ රජයේ ඉඩමක වූ කළුගලක් බදු දී තිබුණද, 2015 සිට කළුගල් | ගැසට් නිවේදනය පරිදි බදුදීමේදී, ගාස්තු අයකළ යුතු වීම. | හිඟ බදු මුදල් අය කර ගැනීම සම්බන්ධයෙන් කුරුණෑගල ප්‍රාදේශීය ලේකම්වරයා වෙත උපදෙස් ලබාදී ඇත. ඒ අනුව, රු.110,000 ක | කළු ගල් බදුදීමට අදාලව කළුගල් කියුබ් 8,087 ක් සඳහා රු.110,000 ක මුදලක් අය කර ඇතත් මුළු මුදලට අය කර |

| | | | | |
|---|---|---|---|---|
| | කියුබ් 8,087 ක් සඳහා ගාස්තුව අයකරගෙන නොතිබුණි. | | මුදලක් අය කර ගෙන තිබුණි. | නොතිබුණි. |
| 18. | ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන කිරීමේ වැඩසටහන යටතේ 2019 වර්ෂයේ කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදුන් ප්‍රතිපාදනයන් මත ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 611.13 ක් වන මාර්ග සංවර්ධන ව්‍යාපෘති 09 ක් වයඹ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සෘජු කම්කරු පදනම මත ඉටුකර තිබුණි. මේ සම්බන්ධයෙන් සිදුකරනු ලැබූ විගණන පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.<br><br>i. තරඟකාරී ප්‍රසම්පාදනයන්ගෙන් බැහැරව සෘජු කම්කරු පදනම මත මෙම ව්‍යාපෘති ඉටුකර ගැනීම සඳහා විධිමත් අනුමැතියක් ලැබී නොතිබුණි.<br>ii. සෘජු කම්කරු පදනම මත මෙම ව්‍යාපෘති ඉටුකිරීම සඳහා අවශ්‍ය කම්කරුවන්, | රජයට සිදුවී ඇති පාඩුව වගකිව යුතු නිළධාරීන්ගෙන් ආපසු අයකර ගතයුතු අතර ප්‍රසම්පාදන නීති රීති වලට අනුවත් ප්‍රසම්පාදන ක්‍රමවේදත් යොදාගත යුතුය. | වයඹ පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වෙත මේ සම්බන්ධයෙන් දැනුවත් කර ඇතත් පිළිතුරු ලබාදී නොතිබුණි. | පාඩුව වගකිව යුතු නිලධාරින්ගෙන් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර. ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

යන්ත්‍රෝපකරණ ඇතුළු පහසුකම් වයඹ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව තුළ නොතිබුණු වාතාවරණය තුළ මෙම ව්‍යාපෘති එම ආයතනය වෙත ලබාදී තිබුණි.

iii. මෙම මාර්ග ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය හා යන්ත්‍ර සපයා ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය, විනිවිදභාවයකින් සිදුකර නොතිබීම, තරඟකාරීත්වය සීමා කර තිබීම, මිලදී ගැනීම් සඳහා විධිමත් අධිකාරී බලතල ලැබී නොතිබීම ඇතුළු රජයේ ප්‍රසම්පාදන විධිවිධානවලින් හා වයඹ පළාත් මූල්‍ය රෙගුලාසි 419 න් බැහැරව සිදුකර තිබුණි.

iv. ව්‍යාපෘතින් සඳහා ප්‍රධානම අමුද්‍රව්‍ය වර්ග 04 ක් මිලදී ගැනීමේදී සාමාන්‍ය වෙළෙඳපොල මිල ගණන්වලට වඩා

| | | | | |
|---|---|---|---|---|
| | ඉතාමත් ඉහළ මිල ගණන්වලට මිලදී ගැනීම් කර තිබීම හේතුවෙන් රජයට රුපියල් මිලියන 153.75 කට ආසන්න පාඩුවක් සිදුකර තිබුණි. | | | |
| 19. | ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය යටතේ පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය අයත් වැව් එකොළහක් ප්‍රතිසංස්කරණය කිරීමේදී කොන්ක්‍රීට් දැමීම, වැකන්ද මතුපිට පස් ඉවත් කිරීම වැකන්දට පස් දැමීම රොන්මඩ ඉවත් කිරීම, ගැටි කාණු කැපීම, තණකොල පිඩැලි ඇල්ලීම යන කාර්යයන් ඉටුකිරීමේදී කාර්මික නිලධාරී සහ අනෙකුත් වගකිව යුතු නිලධාරින්ගේ නොසැලකිල්ල මත නොකළ වැඩ හා සාවද්‍ය මිල අනුපාතයන් භාවිතා කිරීම වෙනුවෙන් රු.6,928,609 ක් වැඩිපුර ගෙවා තිබුණි. | අධි ගෙවීම් පිළිබඳව පරීක්ෂා කර බලා, මුදල් රෙගුලාසි 156(1) හි සඳහන් විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. | වැඩිපුර ගෙවා ඇති මුදල් අය කර ගැනීම සම්බන්ධයෙන් පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් සහ අදාල වගකිව යුතු නිලධාරින්හට උපදෙස් ලබාදී ඇත. ඒ අනුව රු.2,684,771 ක මුදලක් අය කර ඇත. | මෙම මුදලින් රු.2,684,771 ක මුදලක් රාජ්‍ය ආදායමට බැර කර ඇති අතර, ඉතිරි රු.4,243,838 ක මුදල අය කර නොතිබුණි. වගකිව යුතු නිලධාරින්ගේ නොසැලකිල්ල මත හා නොකළ වැඩ හා සාවද්‍ය මිල ගණන් භාවිතා කිරීම සම්බන්ධයෙන් එම නිලධාරින්හට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |
| 20. | කුලියාපිටිය (බටහිර) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශයට අයත් රජයේ ඉඩමක වසර දහයකට | රජයට ලැබිය යුතු මුදල් ආපසු අයකරගත යුතු අතර අනවසර | අනවසර කළුගල් කැඩීම සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් වෙත | 2021 පෙබරවාරි 25 දින සිට රාජ්‍ය භාගය අය කිරීමට කටයුතු කරන බව දක්වා |

| | | | | |
|---|---|---|---|---|
| | ආසන්න කාලයක් අනවසරයෙන් කළුගල් කැඩීමක් සිදුකර තිබුණද, ඒ සම්බන්ධව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දැනුවත් වී නොතිබුණි. මේ හේතුවෙන් වර්ෂ 10 ක් තුළ ඒ සඳහා රජයට ලැබීමට තිබූ රාජ්‍ය භාගය අහිමි වී ඇති බව නිරීක්ෂණය විය. | කළුගල් කැඩීම් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු ය. | දැනුම් දීම සඳහා සහ රජයට ලැබිය යුතු රාජ්‍ය භාගය අය කර ගැනීම සඳහා කුලියාපිටිය (බටහිර) ප්‍රාදේශීය ලේකම් දැනුවත් කර ඇත. එසේම මේ සම්බන්ධයෙන් භූවිද්‍යා පතල් කාර්යාංශය දැනුවත් කර ඇත. | තිබුණද අය කර නොතිබුණි. |
| 21. | සපිරිගමක් සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ මහව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලැබූ ප්‍රතිපාදනවලින් මාර්ග ඉදිකිරීම් ව්‍යාපෘති හතරක් වයඹ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කර තිබුණි. මෙම ව්‍යාපෘති වලින් ඇස්තමේන්තු වටිනාකම රුපියල් මිලියන දෙකක් වන නාගොල්ලාගම වතුයාය පාර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය පරීක්ෂා කිරීමේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.<br><br>i. 2012 ජනවාරි 05 දිනැති අංක 1/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන වලින් බැහැරව සමිති බල සීමාවෙන් පිටත පිහිටි හා ප්‍රමාණවත් මූල්‍ය | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළයුතු අතර සකස් කළ එම ප්‍රමාණයට ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුය. | මෙම ව්‍යාපෘති වයඹ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ඉටු කර තිබූ බැවින් ඔවුන්ගෙන් කරුණු විමසන ලෙස මහව ප්‍රාදේශීය ලේකම් වෙත උපදෙස් ලබාදී ඇත. | රඳවුම් මුදලින් රු.300,000 ක මුදල රඳවා ගෙන ගෙවීම් කර ඇති අතර, රාජ්‍ය මුදල් චක්‍රලේඛ අනුව කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | හා අනෙකුත් පහසුකම් නොමැති ගොවි සංවිධානයකට මෙම කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබීම.<br><br>ii. එසේම එකී චක්‍රලේඛයේ විධිවිධාන වලින් බැහැරව ගොවි සංවිධානය විසින් සියයට 05 ක කොමිස් මුදලකට ව්‍යාපෘතියේ පිරිවැය ඇස්තමේන්තු සකස් කිරීම, හා අධීක්ෂණය කිරීම හා මැනුම් පත් සකස් කිරීම කළ කාර්මික නිළධාරිට උපකොන්ත්‍රාත්තුවක් ලෙස ලබාදී තිබීම.<br><br>iii. ගෙවීම් සඳහා ඉදිරිපත් කර තිබූ බිල්පතට අනුව ව්‍යාපෘතියට අවශ්‍ය පස්, බොරළු, ABC ඇතුළු අමුද්‍රව්‍ය ප්‍රවාහන වියදම සාවද්‍ය ලෙස දක්වා රු.298,893 ක් වැඩිපුර ගෙවීම් ලබා ගැනීම සඳහා ඉල්ලීම් කර තිබීම. | | | |
| 22 | රු.10,000,000 ක මුදලක් වැය කරමින් නිමකළ යුතු බව දක්වා තිබූ කුලියාපිටිය (බටහිර) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් වඩුගෙදර | ශක්‍යතා අධ්‍යනයක් සිදුකර ව්‍යාපෘති ඉටු කළයුතුය. | වඩුගෙදර ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස කුලියාපිටිය | වඩුගෙදර ජල ව්‍යාපෘතිය 2022 වනවිටත් නිසි පරිදි ක්‍රියාත්මක නොවේ. |

| | | | | |
|---|---|---|---|---|
| | ජල ව්‍යාපෘතියේ වගා ළිඳක් හා ජල ටැංකියක් ඉදිකර තිබුණද, එම ළිඳ ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | | (බටහිර) ප්‍රාදේශිය ලේකම් සහ සැලසුම් අධ්‍යක්ෂ ඇතුළු වගකිව යුතු නිලධාරින්හට උපදෙස් ලබාදී ඇත. දැනට මෙම ළිඳෙන් ජලය පාවිච්චියට ගැනීමට ක්‍රමයක් නොමැති බැවින් ළිඳ අපිරිසිදු වී ඇති නමුදු බීමට ජලය සපයා ගැනීම සඳහා ඉදිකරුණු ලැබූ ළිඳක් එම ළිඳ ආශ්‍රය කර ගනිමින් ජල ව්‍යාපෘතිය සැලැසුම් කරන බව. | |
| 23. | කොන්ක්‍රීට් කැටගල් යොදා මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩ විෂය සඳහා (RS1-017) මාර්ග සම්මත අනුපාතය දෝෂ සහගත ලෙස සකස් කර තිබීම හේතුවෙන් ගම්පෙරළිය වැඩසටහන යටතේ ප්‍රජාපාදක සංවිධාන මඟින් ඉටුකරන ලද ව්‍යාපෘති 100 කින් රු.5,508,631 ක පාඩුවක් රජයට සිදුවී තිබුණි. | රජයට සිදු වී ඇති පාඩුව අය කර ගැනීමට ක්‍රියාමාර්ග ගතයුතුය. | වයඹ පළාත් සභාවේ ප්‍රධාන ලේකම්ගෙන් තොරතුරු විමසා ඇත. | රජයට සිදුවී ඇති පාඩුව වන රු.5,508,631 ක මුදලක් අය කර ගෙන නොතිබුණි. |
| 24. | බහු කාර්යය සංවර්ධන කාර්ය සහායක තනතුර සඳහා කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා තෝරාගත් අයදුම්කරුවන් 73 දෙනා | බඳවා ගැනීමේදි චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව කටයුතු කළයුතුය. | ජනාධිපති ලේකම් කාර්යාල චක්‍රලේඛ උපදෙස් පරිදි අදාල අයදුම්පත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල | ජනාධිපති ලේකම් කාර්යාල චක්‍රෙල්ඛ උපදෙස්වලට අනුව කටයුතු කර නොමැතිව |

| | | | | |
|---|---|---|---|---|
| | අතරින් ලබා ගතයුතු අවම ළකුණු මට්ටමට වඩා අඩු ලකුණු මට්ටම ඇතුළත් අයදුම්කරුවන් 49 දෙනෙකු සේවයට බඳවාගෙන තිබුණි. | | මගින් සහ ග්‍රාම නිලධාරී කාර්යාල වෙතින් නිකුත් කිරීමේදි ක්‍රියා කළ යුතු බව සියළුම ප්‍රාදේශීය ලේකම්වරු සහ අනෙකුත් වගකිව යුතු නිලධාරින් වෙත උපදෙස් ලබාදී තිබුණි. | කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බහුකාර්ය සහයක තනතුර සඳහා බඳවා ගෙන තිබුණි. |
| 25 | කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බහුකාර්ය සංවර්ධන කාර්ය සහායක තනතුර සඳහා සුදුස්සන් තෝරාගැනීමේදී 2020 ජනවාරි 20 දින දරන පුවත්පත් දැන්වීමෙන් බැහැරව වයස අවුරුදු 40 ට වැඩි අයදුම්කරුවන් 10 දෙනෙකු බඳවාගෙන තිබුණි. | සුදුස්සන් බඳවා ගැනීමේ ක්‍රමවේදයේදි ගැටළුකාරී තත්ත්වයක් ඇති නොවන ආකාරයට බඳවා ගැනීම් කල යුතුය. | පුවත්පත් දැන්වීම සහ චක්‍රලේඛ නිකුත් කර ඇත්තේ ජනාධිපති ලේකම් කාර්යාලයෙන් වන අතර මා වෙත චක්‍රලේඛ ප්‍රකාරව පැවරුනු බලතල අනුව කටයුතු කරන ලෙස ප්‍රාදේශීය ලේකම්වරු දැනුවත් කර තිබුණි. | බඳවා ගැනීමේ ක්‍රමවේදයෙන් බැහැරව කුරුනෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බහුකාර්ය සහයක තනතුර සඳහා බඳවා ගෙන තිබුණි. |
| 26. | 2020 මැයි 14 දින අංක.20/0796/212/015-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණයෙන් බැහැරව කොවිඩ් 19 හේතුවෙන් ජන ජීවිතය පවත්වාගෙන යාමට අපහසු පවුල් සඳහා රු.5,000 ක ප්‍රතිලාභ මුදල ගෙවීමේදී දැනටමත් සමෘද්ධි සහනාධාරය ලෙස මාසිකව ලබාදෙන සහනාධාර මුදල් සහ රු.5,000 යන දෙකෙහි වෙනස පමණක් ලබාදිය යුතු වුවද, | අමාත්‍ය මණ්ඩල තීරණයට අනුකූලව ගෙවීම් කල යුතුය. | 2020 මැයි 14 දින අංක 20/0796/212/015-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ඇතුළත් උපදෙස් දිස්ත්‍රික් ලේකම් වෙත ලැබී නොමැත. සමෘද්ධි සංවර්ධන අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛ අනුව අප්‍රේල් මාසය සඳහා සහන ණය මැයි මාසය සඳහා සමාජ | අමාත්‍ය මණ්ඩල තීරණයෙන් බැහැරව මෙම ගෙවීම් සිදු කර තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | සමෘද්ධි සහනාධාර මුදල සහ රු.5,000 දීමනාව යන දෙකම ගෙවා තිබුණි. ඒ අනුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 30 යටතේ ඇති නිත්‍ය සමෘද්ධි ප්‍රතිලාභීන් 173,316 ක් සඳහා රු.424,346,960 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. | | ප්‍රතිලාභ ලෙස ගෙවීම් කර ඇත. | |
| 27. | 2020 වර්ෂයේ දී, වැඩසටහන් 22 ක් සඳහා රුපියල් මිලියන 67.3 ක මුදලක් වෙන්කර තිබුණද, ප්‍රගතියක් දක්නට නොලැබුන අතර, 2020 වර්ෂයට අදාලව ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් වූ වැඩසටහන් 12 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාකාරී සැලැස්මට අනුව ක්‍රියාත්මක කලයුතුය. | තිරසර සංවර්ධන අරමුණුවලට අනුව ක්‍රියාකාරී සැලැස්මට හැකිතාක් ඉටු කරන ලෙස සියලුම වගකිව යුතු පාර්ශවයන් දැනුවත් කර තිබුණද දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා ප්‍රතිපාදන ලැබෙන විට රටේ උද්ගතව පැවති කොරෝනා ව්‍යසන තත්ත්වය හේතුවෙන් ජනතාව/ සේවාලාභීන් ඒකරාශි කල නොහැකි විය. | තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාකාරී සැලැස්මට අනුව ක්‍රියාත්මක කර නොතිබුණි. |